

ලංකා විදුලිබල මණ්ඩලය

# වාර්ෂික වාර්තාව

# 2021



# පටුන


අපගේ ඉදිරි දැක්ම, අපගේ මෙහෙවර හා සාරධර්ම 2
අපගේ පාරිසරික ප්‍රතිපත්තිය 3
බැලූ බැල්මට 4
අපගේ කාර්ය බලකාය 5
අතීත කාර්ය සාධනයන් 6
ආයතනික තොරතුරු 7
සංවිධාන ව්‍යුහය 8
අනු-ආයතනද සහිත ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2021 10
සභාපතිතුමාගේ සමාලෝචනය 12
සාමාන්‍යාධිකාරීතුමියගේ සමාලෝචනය 14
ලං.වි.ම. සම්ප්‍රේෂණ පද්ධතිය 16
මෙහෙයුම් සමාලෝචනය
- ජනන අංශය 18
- සම්ප්‍රේෂණ අංශය 23
- බෙදාහැරීමේ අංශ 29
- ව්‍යාපෘති අංශය 36
- වත්කම් කළමනාකරණ අංශය 42
- ආයතනික ක්‍රමෝපාය අංශය 47
- මූල්‍ය අවදානම් කළමනාකරණය 51
- තාක්ෂණික අවදානම් කළමනාකරණය 53
- තිරසාරභාවය පිළිබඳ වාර්තාව 55
- ආයතනික සමාජ වගකීම් වාර්තාව 58
- මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු 61

අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව 72
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 79
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 80
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 81
සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 82
මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 84
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 85
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් 86
විගණකාධිපති වාර්තාව (සමූහ මූල්‍ය ප්‍රකාශන) 151
විගණකාධිපති වාර්තාවට පිළිතුරු 165
කෙටි යෙදුම් 208

## අපගේ දැක්ම

සසිරිමත් දිවියකට
විදුලිය

## අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට
අනුගත වෙමින් සමස්ත
ශ්‍රී ලංකාවට කාර්යක්ෂම,
සමායෝජිත සහ
සකසුරුවම් විදුලිය
සැපයුමක් සංවර්ධනය කර
පවත්වාගෙන යාම.

## අපගේ සාරධර්ම

ගුණාත්මක බව
ජාතියට සේවා සැලසීම
කාර්යක්ෂමතාව සහ
ඵලදායිතාව
කැපවීම
සුරක්ෂිත බව
වෘත්තීය නිපුණතාව
තිරසාර බව



# අපගේ පාරිසරික ප්‍රතිපත්තිය

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලු වාණිජ ක්‍රියාකාරකම් ඉටු කරන්නේ ස්වභාවික පරිසරය සහ මිනිසා විසින් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, සංවර්ධනය සඳහා චිරස්ථායි දායකත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව, පාරිභෝගිකයන්, අධිකාරීන්, සේවයකයන් සහ අයිතිකරුවන් තුළ අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් කරුණු අන්තර්ගත කර ගැනීම සහ අනුකලනය සඳහා වූ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාශීලී ලෙස අනුගමනය කරමු.





සමාරම්භය 1969



ශුද්ධ ජනනය
16,716 ගි.වො.පැ.

# බැලූ බැල්මට

24,960 සේවකයන්





පිරිවැය 18.63
රු./කි.වො.පැ.



අලෙවි කරන මිල 16.37
රු./කි.වො.පැ.

ජල විදුලි ධාරිතාවය
1,383 මෙ.වො.



තාප ධාරිතාවය
1,987 මෙ.වො.





සම්ප්‍රදායික නොවන
පුනර්ජනනීය බලශක්ති
ධාරිතාවය 817 මෙ.වො.



වහළ මත සවිකරන
විදුලි පද්ධති ධාරිතාවය
415 මෙ.වො.

පාරිභෝගික ගිණුම්
6,809,528



ආදායම
රු. මිලියන 249,089
අලෙවි පිරිවැය
රු. මිලියන 283,364



# 2021.12.31 දිනට අපගේ කාර්ය බලකාය




කාර්ය බලකාය




ස්ථිර කාර්ය මණ්ඩලයට නව බඳවා ගැනීම්

වයස් විග්‍රහය




සේවා විග්‍රහය




කාණ්ඩ විග්‍රහය



# අතීත කාර්ය සාධනයන්

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ බලශක්ති ජනනය (ගි.වො.පැ.) | 11,801 | 11,962 | 12,423 | 13,154 | 14,249 | 14,773 | 15,985 | 16,556 | 16,392 | 17,378 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය* (ගි.වො.පැ.) | 736 | 1,179 | 1,217 | 1,467 | 1,160 | 1,464 | 1,832 | 1,761 | 1,866 | 2,930 |
| උපරිම ඉල්ලුම (මෙ.වො.) | 2,146 | 2,164 | 2,152 | 2,283 | 2,453 | 2,523 | 2,616 | 2,669 | 2,717 | 2,802 |
| විදුලිය අලෙවිය (ගි.වො.පැ.) | 10,474 | 10,621 | 11,063 | 11,786 | 12,785 | 13,431 | 14,091 | 14,611 | 14,286 | 15,214 |
| පාරිභෝගික ගිණුම් (සංඛ්‍යාව) | 4,979,862 | 5,210,761 | 5,417,532 | 5,648,132 | 5,964,194 | 6,193,131 | 6,354,281 | 6,500,641 | 6,636,266 | 6,809,528 |
| පද්ධතිමය බලශක්ති හානිය (%) | 11.24 | 11.14 | 10.91 | 10.40 | 10.28 | 8.45 | 8.34 | 8.23 | 9.08 | 8.72 |
| ආදායම (ශ්‍රී ලං.රු.මි.) | 163,513 | 194,147 | 202,645 | 188,684 | 206,811 | 218,450 | 229,571 | 242,950 | 238,911 | 249,089 |
| සාමාන්‍ය විකුණුම් මිල (රු./කි.වො.පැ.)-(අ) | 15.56 | 17.93 | 18.50 | 16.00 | 16.18 | 16.26 | 16.29 | 16.63 | 16.72 | 16.37 |
| අලෙවි ලක්ෂ්‍යයේදී සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)-(අ) | 23.66 | 16.94 | 20.00 | 15.07 | 18.08 | 20.34 | 19.12 | 24.12 | 21.67 | 18.63 |
| වසර තුළ විදුලියනය කළ නිවාස (සංඛ්‍යාව) | 225,707 | 198,484 | 178,300 | 198,166 | 277,038 | 181,627 | 118,077 | 108,315 | 98,829 | 125,277 |

* - සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය - (කුඩා ජලවිදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ, ජෛවස්කන්ධ හා නාගරික අපද්‍රව්‍ය)
(අ) - තාවකාලික

# ආයතනික තොරතුරු

## නෛතික ස්වභාවය

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු 1969 අංක 31, 1979 අංක 29, 1988 අංක 32 දරණ පනත් මගින් සංශෝධිත 1969 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මගින් හා 2013 අංක 31 දරණ පනත මගින් සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ස්ථාපිත, සංස්ථාපිත මණ්ඩලයකි.

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

**සභාපති**

ඉංජිනේරු එච්.එම්. විජිත හේරත් මහතා 19.07.2021 දක්වා
එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩු මහතා 20.07.2021 සිට

**උප සභාපති**

එන්.එස්. ඉලංගකෝන් මහතා
සාමාජික/ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජික**

එස්.ඩී. ජුඩ් නිලුක්ෂාන් මහතා

**සාමාජිකයන්**

එම්.එම්. නයීමුදීන් මහතා
බී.කේ. ජගත් පෙරේරා මහතා 07.01.2021 දක්වා
ආචාර්ය බී. විජයරත්න මහතා 07.01.2021 සිට
එල්.පී. ප්‍රේමසිරි මහතා 29.01.2021 දක්වා
වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා 30.01.2021 සිට 07.07.2021 දක්වා
විශ්‍රාමික ජනරාල් දයා රත්නායක මහතා 08.07.2021 සිට 23.12.2021 දක්වා
ජී.පී.එන්.එම්. අබේසේකර මහතා 24.12.2021 සිට
ආර්. වික්‍රමාරච්චි මහතා

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**
එච්.ආර්.පී. පත්බේරිය මහත්මිය (වැඩ බලන)

**සාමාන්‍යාධිකාරී**

ඉංජිනේරු එන්.ඩබ්.කේ. හේරත් මහත්මිය 22.08.2021 දක්වා
ඉංජිනේරු එම්.ආර්. රණතුංග මහතා 23.08.2021 සිට

## ආයතනික කළමනාකරණය

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**
ඉංජිනේරු එච්.එම්.ඩී. හේරත් මහතා 25.04.2021 දක්වා
ඉංජිනේරු කේ.ඩී.ඩී. මුණසිංහ මහතා 26.04.2021 සිට 08.05.2021 දක්වා
ඉංජිනේරු ඩී.ආර්. නවමනී මහතා 09.05.2021 සිට

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**
ඉංජිනේරු එම්.එම්.එස්.එම්.කේ. ගුණරත්න මහතා 29.05.2021 දක්වා
ඉංජිනේරු පී.ජේ. අලුත්ගේ මහතා 30.05.2021 සිට 30.11.2021 දක්වා
ඉංජිනේරු පී.ඩබ්. හෙන්දහේවා මහතා 01.12.2021 සිට

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 1)**

ඉංජිනේරු ජේ. මීගොඩ මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 2)**

ඉංජිනේරු ටී.ඩී.කේ. ජයසේකර මහත්මිය

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 3)**
ඉංජිනේරු ජේ. නන්දකුමාර් මහතා 28.10.2021 දක්වා
ඉංජිනේරු පී.ඩබ්. හෙන්දහේවා මහතා 29.10.2021 සිට 30.11.2021 දක්වා
ඉංජිනේරු පී.ජේ. අලුත්ගේ මහතා 01.12.2021 දක්වා

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 4)**

ඉංජිනේරු ජී.ඩී.ඩී ආර්.පී. සෙනෙවිරත්න මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)**

ඉංජිනේරු කේ.කේ.එස්. දසනායක මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**

ඉංජිනේරු (ආචාර්ය) ඩී.සී.ආර්. අබේසේකර මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**
ඉංජිනේරු එම්.ආර්. රණතුංග මහතා 22.08.2021 දක්වා
ඉංජිනේරු එච්.එස්. සෝමතිලක මහතා 23.08.2021 දක්වා

**මූල්‍ය කළමනාකරු**
ටී.කේ. ලියනගේ මහතා

# සංවිධාන ව්‍යුහය-2021



නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
නි.සා. (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
නි.සා. (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
නි.සා. (පර්යේෂණ හා සංවර්ධන)
නි.සා. (තොරතුරු තාක්ෂණ)
ව්‍යා.අ. (ව්‍යවසාය සම්පත් සැලසුම් ව්‍යාපෘතිය)

නි.සා. (බලශක්තිය මිලදී ගැනීම්)
නි.සා. (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්)
නි.සා. (ආයතනික හා නියාමන සම්බන්ධතා)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - දකුණු)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - උතුර)
නි.සා. (වත්කම් කළමනාකරණ හා තත්ව නියාමන)
නි.සා. (පද්ධති පාලන)
නි.සා. (සන්නිවේදන)
නි.සා. (බලශක්ති අලෙවිකරණ)
නි.සා. (සම්ප්‍රේෂණ පාලන හා ආරක්ෂණ)
නි.සා. (පුද්ගලික බලශක්ති සංවර්ධන)
නි.සා. (පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්ය සාධන අධීක්ෂණ)
අ.මු.ක. (සම්ප්‍රේෂණ)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (මධ්‍යම පළාත I)
නි.සා. (මධ්‍යම පළාත II)
නි.සා. (බස්නාහිර පළාත උතුර)
නි.සා. (නැගෙනහිර පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 2)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (බස්නාහිර පළාත දකුණ I)
නි.සා. (දකුණු පළාත I)
නි.සා. (දකුණු පළාත II)
ව්‍යා.අ. (විදුලක්පාය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 4)

නි.සා. (සම්ප්‍රේෂණ නිර්මාන හා පරිසර)
නි.සා. (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
නි.සා. (සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති)
නි.සා. (ඉංජිනේරු උපදේශන සේවා)
නි.සා. (ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ)
ව්‍යා.අ. (ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය අදියර II)
ව්‍යා.අ. (පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය අදියර II ස.බ.හා සේ.ස.)
ව්‍යා.අ. (බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන ව්‍යාපෘතිය - අදියර II)
ව්‍යා.අ. (මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ඌව ස්වභාවික වායු)
ව්‍යා.අ. (පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (ව්‍යාපෘති)

අ.මු.ක. (මූලස්ථාන)
අ.මු.ක. (ආයතනික)
අ.මු.ක. (භාණ්ඩාගාර කළමනාකරණ)

නි.සා. (බලශක්ති විකුණුම්)
නි.සා. (ආයතනික කටයුතු)
නි.සා. (තාපබල සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප විදුලි)
නි.සා. (මහවැලි සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල විදුලි)
නි.සා. (ලක්ෂපාන සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප යාන්ත්‍රික)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල යාන්ත්‍රික)
නි.සා. (ජනන ව්‍යාපෘති)
නි.සා. (සමනල සංකීර්ණය)
නි.සා. (වේලි ආරක්ෂණ, පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු)
නි.සා. (ජනන ආරක්ෂණ)
බ.ක. (ලක්විජය විදුලි බලාගාරය)
අ.මු.ක. (ජනන)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (කොළඹ නගර)
නි.සා. (වයඹ පළාත I)
නි.සා. (වයඹ පළාත II)
නි.සා. (උතුරු මැද පළාත)
නි.සා. (උතුරු පළාත)
නි.සා. (බෙදාහැරීම් සම්බන්ධීකරණ)
ව්‍යා.අ. (කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය I)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (බස්නාහිර පළාත දකුණ II)
නි.සා. (සබරගමුව පළාත)
නි.සා. (ඌව පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 3)

නි.සා. (වත්කම් කළමනාකරණ හා ආයතනික)
නි.සා. (පුහුණු කිරීම්)
නි.සා. (සිවිල් කටයුතු හා ගොඩනැගිලි)
නි.සා. (වැඩපල හා උපකාරක සේවා)
නි.සා. (වෘත්තීයමය සෞඛ්‍යය හා ආරක්ෂාව)
අ.මු.ක. (වත්කම් කළමනාකරණ)

නි.සා. (සම්බන්ධීකරණ)
නි.සා. (පිරිස්)
නි.සා. (ඉංජිනේරු විගණන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ප්‍රධාන නීති නිලධාරී

කළමනාකරු විමර්ශන

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

# අනු ආයතනද සහිතව ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2021





ලක්විජය විදුලි බලාගාරය



# සභාපතිතුමාගේ සමාලෝචනය

"ඒ අනුව, (ප්‍රධාන ජල විදුලි බලාගාර හැර) ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති බලාගාර ධාරිතාව 14% කින් ඉහළ නැංවීමට ලං.වි.ම.ට හැකිවිය. මෙම බලාගාරයන්ගෙන් දායකත්වය ලබාදෙන ලද සමස්ත ජනන ප්‍රමාණය ගි.වො.පැ. 2921.2 ක් (එනම් සමස්ත ජනන ප්‍රමාණයෙන් 17.5% ක්) ලෙස වාර්තා විය. මෙතුළට මන්නාරම දූපතේ දක්ෂිණ වෙරළ තීරයට වන්නට ස්ථානගත, මෙහෙවරෙහි යොදවන ලද, ලං.වි.ම. සතු තම්බපවනී නමැති පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරයෙන් ලද දායකත්වයද ඇතුළත් වේ.

බහුවිධ අභියෝගයන්ගෙන් සමන්විත වූද, විදුලි අංශය වඩ වඩාත් පුනර්ජනනීය බලශක්තීන් වෙත සංචලනය වීමේ ගමන වඩ වඩාත් යථාර්ථයක් බවට පත් කරන ලද්දාවූද, බලශක්ති අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිඳුන්ගේ මාර්ගෝපදේශකත්වය තුළ ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ප්‍රකාශිත ප්‍රතිපත්ති රාමුව තවදුරටත් ක්‍රියාවට නංවන ලද්දාවූද 2021 වසර සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික කාර්ය සාධනය සිහිපත් කරමින් සමාලෝචනය කිරීමට හැකිවීම සතුටට කරුණකි.

ඒ අනුව, (ප්‍රධාන ජල විදුලි බලාගාර හැර) ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති බලාගාර ධාරිතාව 14% කින් ඉහළ නැංවීමට ලං.වි.ම.ට හැකිවිය. මෙම බලාගාරයන්ගෙන් දායකත්වය ලබාදෙන ලද සමස්ත ජනන ප්‍රමාණය ගි.වො.පැ. 2921.2 ක් (එනම් සමස්ත ජනන ප්‍රමාණයෙන් 17.5% ක්) ලෙස වාර්තා විය. මෙතුළට මන්නාරම දූපතේ දක්ෂිණ වෙරළ තීරයට වන්නට ස්ථානගත, මෙහෙවරෙහි යොදවන ලද, ලං.වි.ම. සතු තම්බපවනී නමැති පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරයෙන් ලද දායකත්වයද ඇතුළත් වේ.

තවද, වහළය මත සවි කරන විදුලි බල පැනලයන් මගින් විදුලි පාරිභෝගිකයන් ගේ නිවාස/පරිශ්‍රයන්හි ජනනය කරන සූර්යබල විදුලිය ජාතික විදුලි පද්ධතියට ඒකාබද්ධ කිරීම උදෙසා බලශක්ති අමාත්‍යංශය විසින් දියත් කරන ලද ව්‍යාපෘතියක් වන "සූර්ය බල සංග්‍රාමය" නමැති තේමාවෙන් යුත් විදුලි ජනන ව්‍යාපෘතියෙහිද ලං.වි.ම. සක්‍රියව නිරත විය. උක්ත ව්‍යාපෘතිය යටතේ මෙ.වො. 415 ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් දක්වා අළුතින් වහළය මත සවි කරන ලද සූර්ය විදුලි සම්බන්ධතාවයන් 6,727 ක් අනුමත කරන ලදී.

2021 වසර තුළ "සියලු දෙනා සඳහා විදුලිය" වැඩසටහන ආරම්භ කරන ලද ලං.වි.ම. විසින් වසර අවසානය වනවිට නිවාස 33,302 ක් වෙත නොමිලයේ විදුලිය සම්බන්ධතා සපයා දෙන ලදී.

උක්ත කරුණුවලට අමතරව, ශ්‍රී ලංකාව විසින් වඩාත් ව්‍යසනකාරී වසංගත තත්ත්වයකින් හිස එසවීමට යත්න දරමින් සිටින නිමේෂයක තිරසර ලෙස ජීවිත හා ආර්ථිකයන් නැවත ගොඩනැගීමේ හදිසි අවශ්‍යතාවයක් පැවතිණි. මෙම අසාමාන්‍ය හා දුෂ්කර සමයේදී, ඉහළම මෙහෙයුම්ගත කාර්යක්ෂමතාවයක් තුළ අපගේ සේවා නියුක්තිකයන්ගේ ආරක්ෂාව හා යහ සාධනයද සහතික කරමින් සිය පාරිභෝගිකයන් වෙත ආරක්ෂිත හා විශ්වසනීය විදුලිය සැපයුමක් ලබාදීමට ලං.වි.ම.ට හැකිවිය. ලං.වි.ම. සියලු සේවා නියුක්තිකයන්ගේ සහයෝගී ප්‍රයත්නය තුළ මෙම කටයුත්ත ඉටු කිරීමට හැකිවිය.

නොකඩවා පැවති අභියෝගාත්මක පරිසර තත්වයන් යටතේ පවා, 2021 වසර තුළ ලං.වි.ම. විසින් රු. බිලියන 249 ක ආදායමක් වාර්තා කරන ලදී. මෙය වූකලි වසංගත තත්ත්වය හේතුකොට ඇතිවූ අවිනිශ්චිතතාවයන් හා අස්ථාවරත්වයන් මැඩ පැවැත්වීමේ සුවිශේෂී ප්‍රයත්නයන් පිළිබිඹු කරමින් 2020 වසරට සාපේක්ෂව අත්කරගත් 4% ක වර්ධනයකි. වසංගත සමය තුළ 2020 වසරේදී පහත වැටුණු තොග සැපයුම් අයක්‍රම කාණ්ඩයන්ගේ ඉල්ලීමෙහි වර්ධනය හා ගෘහස්ථ පරිභෝජනයේ වර්ධනයද ආදායම් වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වූ අතර රටේ සමස්ත විදුලිය ඉල්ලුමේ 6% ක සමස්ත වර්ධනයක් පිළිබිඹු කරන ලදී.

ලං.වි.ම. මුදල් කළමනාකරණය දුෂ්කර කටයුත්තක් විය. රටේ නව සාමාන්‍යකරණය හා රට වසා දැමීමේ තත්ත්වයෙන් නිදහස් කිරීමත් සමඟ විදුලියේ සාමාන්‍ය ඉල්ලුම් රටාව ප්‍රතිස්ථාපනය විය. අඩු විදුලි පරිභෝජනය හේතුකොට මහා භාණ්ඩාගාරය වෙත සිදු වූ සහනදායී බලපෑම ඉවත් විය. ලෝක වෙළඳපොලේ ගල් අඟුරු මිල ඉහළ යෑම හේතුකොට තත්ත්වය වඩාත් අයහපත් විය. කෙසේ වුවද, රු. බිලියන 20 ක් ලෙස 2021 අප්‍රේල් මස නිකුත් කරන ලද විශාලතම ලැයිස්තුගත ණයකර නිකුතුව සම්පූර්ණ කිරීමත් සමගින් මෙම අභියෝගය සාර්ථක ලෙස කළමනාකරණය කරන ලදී. ලැයිස්තුගත ණය සුරැකුම් නිකුත් කිරීමේ කාර්යයට පිවිසි පළමු රජය සතු ව්‍යවස්ථාපිත මණ්ඩලය බවට ලං.වි.ම. පත්විය. මේ අතර, විදුලි ජනනයට අදාළ සියලු පිරිවැය සාධක සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කලද රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව 2014 සිට අයක්‍රම ව්‍යුහය නොවෙනස්ව පැවතිණි.

ප්‍රධාන වශයෙන් ජල විදුලි ජනන සහායෙන් සැකසුණු සුභදායී ජනන මුහුවෙහි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසරට සාපේක්ෂව ශුද්ධ අලාභය ශ්‍රී ලං.රු. බිලියන 21.95 ක් ලෙස 68% කින් වාර්තාගත අගයකට පහත වැටිණි. පිරිවැය පිළිබිඹු නොකරන අය ක්‍රම මධ්‍යයේ වුව සුභදායී ජනන තත්ත්වයන් හරහා යෙදවුම් මිල ගණන්හි සිදුවූ සැලකිය යුතු විචලනයන් දරා සිටීමට ලං.වි.ම.ට හැකිවිය. වසර අවසානය වනවිට, පසුගිය වසර හා සාපේක්ෂව (කුඩා ජල විදුලි බලාගාරද අන්තර්ගතව) ජල විදුලි ජනනයෙහි 45% ක වර්ධනයක් වාර්තා විය.

තවද, නවීන තාක්ෂණය යොදා ගනිමින් ලං.වි.ම. විසින් මෙහෙයුම් සුවිශිෂ්ඨතාවයන් සාක්ෂාත් කරගැනීමේ සිය ප්‍රයත්නයන්හි නොකඩවා නිරත වූ අතර, විදුලිය ඇණ හිටීම් ඉල්ලීම්, විදුලිය ඇණ හිටීම් සැලසුම්කරණයන්, විදුලිය ඇණ හිටීම් ලැයිස්තුගතකරණය හා නව විදුලිය ඇණ හිටුවීම් මොඩියුල සමග වැඩ ක්‍රියාවලි අවසරයන් සහිතව ඩිජිටල්කරණ හා ස්වයංක්‍රීයකරණ ක්‍රියාමාර්ගයන් ඔස්සේ “CEBAssist” සම්මානලාභී තොරතුර තාක්ෂණ විසඳුම් ක්‍රමය තවදුරටත් සංවර්ධනය කිරීමට හැකිවිය.

ආයතනයේ ප්‍රධාන කටයුතු වලට අමතරව, ලං.වි.ම. විසින් ඌණ උපයෝජිත මූලාශ්‍රයන් වෙතින් ආදායම් ජනන ක්‍රමයන් ගවේෂණය කරන ලදී. ඒ අනුව පාවෙන යානා හා බෝට්ටු සේවා ක්‍රියාත්මක කිරීම වැනි සංචාරක හා විනෝදාස්වාද කටයුතු සඳහා ජලාශ බදු දීමටද ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගන්නා ලදී.

අවසන, මාගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා සාමාන්‍යාධිකාරීවරයාගේ නායකත්වයෙන් යුත් ලං.වි.ම. සමස්ත සේවක මණ්ඩලය විසින් කැපවීමෙන් ලබාදුන් සේවය හේතුකොට මෙකී සියලු සාර්ථකත්වයන් අත්පත් කරගැනීමට හැකිවූ බව සතුටින් සඳහන් කරමි. ඒ සියලු දෙනා හට ස්තුති පූර්වක සුභ පැතුම් පිරිනමමි.



**එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩු**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය





# සාමාන්‍යාධිකාරීතුමියගේ සමාලෝචනය

“2021 වසර සඳහා වූ ජනන මුහුව විග්‍රහ කොට බලන කල, සමස්ත ජනනයෙන් ගල් අඟුරු ජනනය 33% ක අගයකද කුඩා ජල විදුලි බලාගාරද ඇතුළුව ජල විදුලි ජනනය 43% ක අගයකද විය. ඒ අනුව, තාප තෙල් ජනනය 16% ක් දක්වා අඩුවූ වටපිටාවක ලං.වි.ම. ට සිය මූල්‍ය අලාභයන්හි සැලකිය යුතු අඩුවීමක් වාර්තා කිරීමට හැකිවිය. 2030 වසර සඳහා ස්ථාපිත රජයේ පුනර්ජනනීය ඉලක්ක කරා වූ අඛන්ඩ සංචලනයක් පෙන්වමින් ඉතිරි 8% ක දායකත්වය සුළං හා සෙසු පුනර්ජනනීය මූලාශ්‍රයන් වෙතින් ලබාගන්නා ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ (ලං.වි.ම.) සාමාන්‍යාධිකාරී හා ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් වූ මාගේ විෂය ක්ෂේත්‍රය තුළ, 2021 වසරේදී ආයතනය විසින් අත්පත් කරගන්නා ලද ප්‍රගතිය සමාලෝචනය කිරීමට හැකිවීම සතුටට කරුණකි.

2021 වසර ලං.වි.ම. සම්බන්ධයෙන් අභියෝගාත්මක මෙන්ම සතුටුදායක වසරක්ද විය. පෙර වසර හා සාපේක්ෂව වසරට අදාළ ශුද්ධ අලාභයෙහි සැලකිය යුතු පහත වැටීමක් වාර්තා වූ අතර, එය මූල්‍ය කාර්ය සාධනයෙහි සැලකිය යුතු ප්‍රවර්ධනයක් සේ සැලකිය හැක. 2021 වසර සඳහා වූ සමස්ත ආදායම ශ්‍රී ලං.රු. බිලියන 261.91 ක් වූ අතර, සමස්ත වියදම ශ්‍රී ලං.රු. බිලියන 283.36 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ ඇතිවූ අවසන් සමස්ත අලාභය ශ්‍රී ලං.රු. බිලියන 21.95 ක් වූ අතර, එය 2020 වසර හා සාපේක්ෂව 68% ක අඩුවීමකි.

ලං.වි.ම. ලාභදායකත්වයෙහි හා මූල්‍ය ශක්‍යතාවයෙහි ප්‍රමුඛතම සාධකය වනුයේ නිසි විදුලි ජනන මුහුවයි. මේ සියලු කාල පරිච්ඡේදයන් තුළ, ලං.වි.ම. ඍජු ජනන පිරිවැය බොහෝ සෙයින් ජල විදුලි හා ගල් අඟුරු විදුලි ජනනය මත රඳා පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජල විදුලිබල තත්ත්වයන් දුර්වල වූ අවස්ථාවන්හි ජනන මුහුව තුළ තාප තෙල් විදුලි මූලාශ්‍රයන් මගින් සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කරන ලදී. මෙලෙසින්, ඉන්ධන පිරිවැයෙන් බලපෑමට ලක්වූ ඍජු ජනන පිරිවැය වර්ධනය විය. ශ්‍රී ලංකාවේ විශාලතම සුළං විදුලි බලාගාරය වන “තම්බපවනි” මගින් වාර්ෂික ශුද්ධ ජනනයට 2% ක දායකත්වයක් ලබාදෙන ලදී. එමගින් නිසැකවම නිසි ජනන මුහුවක් සඳහා වූ ඉදිරි තල්ලුවක් ලබාදෙන ලදී.

2021 වසර සඳහා වූ ජනන මුහුව විග්‍රහ කොට බලන කල, සමස්ත ජනනයෙන් ගල් අඟුරු ජනනය 33% ක අගයකද කුඩා ජල විදුලි බලාගාරද ඇතුළුව ජල විදුලි ජනනය 43% ක අගයකද විය. ඒ අනුව, තාප තෙල් ජනනය 16% ක් දක්වා අඩුවූ වටපිටාවක ලං.වි.ම. ට සිය මූල්‍ය අලාභයන්හි සැලකිය යුතු අඩුවීමක් වාර්තා කිරීමට හැකිවිය. 2030 වසර සඳහා ස්ථාපිත රජයේ පුනර්ජනනීය ඉලක්ක කරා වූ අඛන්ඩ සංචලනයක් පෙන්වමින් ඉතිරි 8% ක දායකත්වය සුළං හා සෙසු පුනර්ජනනීය මූලාශ්‍රයන් වෙතින් ලබාගන්නා ලදී.

2021 වසර තුළ ගි.වො.පැ. 16,716 ක් වූ සමස්ත විදුලි ජනනයක් වාර්තා වූ අතර, එතුළ පසුගිය වසර හා සාපේක්ෂව 6.4% ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. 2021 වසර තුළ ජනිත ගි.වො.පැ. 16,716 අතරින් 24% ක් ස්වාධීන විදුලි නිෂ්පාදනායතනයන් වෙතින් මිලදී ගන්නා ලදී. එම අගය 2020 වසර තුළ 29% ක් විය. පෙර වසරේ 9.08% ක් වූ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානිය 2021 වසර තුළ 8.72% ක් ලෙස වාර්තා විය. 2021 වසර සඳහා වූ සාමාන්‍ය ජනන පිරිවැය රු. 11.74 ක් වූ අතර 6% කින් ජනන ඒකක ප්‍රමාණය ඉහළ නැංවූ වටපිටාවෙක පවා එය 2020 වසර හා සාපේක්ෂව 16% ක පහත වැටීමක් වේ. ජනන මුහුවට ප්‍රමුඛ සහයෝගයක් ජල විදුලි ජනනය තුළින් ලැබීම හේතුකොට ප්‍රධාන වශයෙන් මෙම ඉතිරිය ඇතිවිය. අලෙවි ලක්ෂ්‍යයේදී විදුලි ඒකකයක සමස්ත පිරිවැය රු. 18.63 ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ රු. 21.67 ක් විය. රු. 3.04 ක පහත වැටීමක් පෙන්වන මෙහි ප්‍රතිශතාත්මක පහත වැටීම 14% කි.

තවද, වසරේ සමස්ත විදුලි පරිභෝජනය ගි.වො.පැ. 15,214 ක් වන අතර එතුළ පෙර වසර හා සාපේක්ෂව 6.5% ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. සාමාන්‍ය අලෙවි මිල රු. 16.37 ක් ලෙස වාර්තා වූ අතර, එයද 2020 වසර හා සාපේක්ෂව 2.1% ක පහත වැටීමකි. වසංගත තත්ත්වය හේතුකොට ඇතිවූ අවිනිශ්චිතතාවයන් හා අස්ථාවරත්වයන් මැඩ පැවැත්වීමෙහි ලා දක්වන ලද කැපී පෙනෙන ප්‍රයත්නයන් පිළිබිඹු කරමින් 2020 වසර හා සාපේක්ෂව 4% ක වර්ධනයක් ප්‍රකට කරමින් 2021 වසර තුළ ලං.වි.ම. විසින් ශ්‍රී ලං.රු. බිලියන 249 ක ආදායමක් වාර්තා කරන ලදී. රටේ සමස්ත විදුලිය ඉල්ලුමෙහි 6% ක සමස්ත වර්ධනයක් පිළිබිඹු කරමින් 2020 වසරේ වසංගත සමය තුළ පහත වැටුණු තොග සැපයුම් අයක්‍රම කාණ්ඩ ඉල්ලුමෙහි වර්ධනය හා ගෘහස්ථ පරිභෝජනයෙහි වර්ධනයද ආදායමේ ප්‍රධාන දායකත්ව අංශ අතරට ඇතුළත් වේ.

විදුලිය ජනනයට අදාළ සියලු පිරිවැය සාධක සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන තත්ත්වයක් තුළ රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව 2014 වසරේ සිට අයක්‍රම ව්‍යුහය නොවෙනස්ව පවතී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ජනන පිරිවැයට වඩා අඩු අගයකට ජාතිය වෙත විදුලිය සම්පාදනය සිදුකරන ලදී.

සියල්ලන් හට විදුලිය සපයා දීමේ රජයේ ප්‍රතිපත්තිය මගින් ලද ජවයද සමගින් ලං.වි.ම. විසින් වසර තුළ සිය අපේක්ෂිත සියලු පාරිභෝගික භවතුන්ගේ විදුලිය ඉල්ලීම් සපුරාලීම සඳහා වූ ප්‍රයත්නයන්හි ප්‍රාණවත් ලෙස නිරත විය. වසර අවසානය වනවිට සමස්ත පාරිභෝගිකයන් සංඛ්‍යාව 6,809,528 ක් වන පරිදි වසර තුළ පාරිභෝගිකයන් සංඛ්‍යාව 173,262 කින් වර්ධනය විය. නොවැළැක්විය හැකි කෙටි කාලීන බිඳ වැටීම් අවස්ථාවන්හි හැර සිය පාරිභෝගිකයන් වෙත දවසේ පැය 24 පුරා විදුලිය ලබාදීමට ගතහැකි සියලු ක්‍රියාමාර්ග ලං.වි.ම. විසින් වසර පුරා ගන්නා ලදී. කෙසේ වුවද, 2021 දෙසැම්බර් මස 3 වන දින දීප ව්‍යාප්ත පූර්ණ විදුලිය බිඳ වැටීමක් සිදුවිය.

වසංගත තත්ත්වයෙන් හිස ඔසවන අතරම, සිය පාරිභෝගිකයන්ගේ මෙන්ම සිය සේවා නියුක්තිකයන්ගේද ආරක්ෂාව හා යහසාධනය සහතික කරමින් ජාතිය වෙත ගුණාත්මක හා විශ්වසනීය විදුලිය සැපයුමක් ලබාදීමේ සිය ප්‍රයත්නයන්හි ලං.වි.ම. විසින් නොකඩවා නියැලෙන ලදී. මන්නාරම් දූපතේ දක්ෂිණ වෙරළ තීරයට වන්නට පිහිටි නව තාක්ෂණයෙන් යුත් සුළං ටර්බයින ජනන යන්ත්‍රයන් තිස් තුනක් (33) සහිතව මෙ.වො. 103.5 ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිතව “තම්බපවනි” නම් වූ සිය පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරය 2020 දෙසැම්බර් මස 8  වන දින ලං.වි.ම. විසින් පූර්ණ වශයෙන් මෙහෙවරෙහි යොදවා ඇත. තවද, රටේ විදුලි සැපයුම් ආරක්ෂාව සහතික කරනු පිණිස උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය, බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය, මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය හා ද්‍රව ස්වභාවික වායු ව්‍යාපෘතිය වැනි ජනන සංවර්ධන ව්‍යාපෘති ද මනා සේ ඉදිරියට ගෙනයන ලදී. මෙයට අමතරව, සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති අටක් නොකඩවා ඉදිරියට ගෙනයන ලදී. අභියෝගාත්මක පරිසරය මධ්‍යයේ වුව එම ව්‍යාපෘති පිළිගත හැකි සමස්ත ප්‍රගතියක් වාර්තා කරන ලදී.

උක්ත සංවර්ධනයනට අමතරව, කැළණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය නැවත මෙහෙවරෙහි යෙදවීම, කැලණිතිස්ස විදුලි බලාගාරයේ “රාමුව V” වායු ටර්බයිනය ප්‍රතිසංස්කරණය, සමනලවැව ජල විදුලි බලාගාරයේ ජනන යන්ත්‍ර 2 හි හදිසි අළුත්වැඩියාව සහ ජනන ධාරිතා හා ජීව කාල ප්‍රවර්ධනයන්හි අලුත්වැඩියාවන් සාර්ථකව සපුරන ලදී. ලක්විජය විදුලි බලාගාරයේ ගල් අඟුරු අංගනයේ ගල් අඟුරු කාර්ය ධාරිතා වර්ධනයද නොකඩවා සිදුකරන ලදී.

තාක්ෂණික සංවර්ධනයනට අමතරව, ආයතනය පුරා සියලු කාණ්ඩයන්හි කාර්ය මණ්ඩල අතිරික්තයන් හා හිඟතාවයන් හඳුනාගනු ලැබ ඔවුන් ආයතනයේ කාර්ය සාධනය වැඩිදියුණු වන ආකාරයෙන් ප්‍රති-ව්‍යාප්ත කරලනු පිණිස සියලු සේවා නියුක්තික වර්ගයන් ආවරණය වන පරිදි සමස්ත ලං.වි.ම. වෙනුවෙන් මානව සම්පත් විගණනයක් සිදු කරන ලදී. මෙයට අමතරව, බලශක්තිය සංරක්ෂණය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයන් හා ලං.වි.ම. මාර්ගගත පහසුකම් ප්‍රවර්ධනය පිණිස නව, අඩු පිරිවැය වෙළඳ දැන්වීම් ව්‍යාපාරයන්ද ආරම්භ කරන ලදී.

පෙර මුදල් වර්ෂය හා සාපේක්ෂව සිය වත්කම් පදනම 5% කින් එනම් ශ්‍රී.ලං.රු.බිලියන 48 කින් වර්ධනය කරගනිමින් සමස්ත වත්කම් ප්‍රමාණය ට්‍රිලියනයේ අගය දක්වා ප්‍රවේශ වෙමින් ආයතනය විසින් කැපී පෙනෙන කඩඉමක් සාක්ෂාත් කරගන්නා ලදී. වසර තුළ ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් පිළිවෙලින් 4% කින් හා 13% කින් වර්ධනය වූ අතර දේපළ, පිරියත හා උපකරණ සහ භාණ්ඩ තොග එහි ප්‍රධාන දායක අංශ විය. කෙසේ වුවද, 2021 වසර අවසානය වනවිට ලං.වි.ම ණය/ සම කොටස් අනුපාතයෙහි අයහපත් තත්ත්වයක් සනිටුහන් කරමින්, සමස්ත පොළී සහිත ණය හා ණය ගැනීම් ප්‍රමාණය සම කොටස් ප්‍රමාණයට වඩා සැලකිය යුතු අගයක පවත්වා ගනිමින්,පසුගිය වසර හා සාපේක්ෂව සමස්ත බැරකම් ප්‍රමාණය 7% කින් වර්ධනය විය.

අවසන, රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව, පොදු කාර්ය කාණ්ඩය හැර ගෘහස්ථ කාණ්ඩයේ අඩු පරිභෝජන මට්ටමේ පාරිභෝගිකයන් හා අනෙකුත් කාණ්ඩ බොහොමයක් වෙතද ලං.වි.ම. විසින් අලෙවි ලක්ෂ්‍යයේදී වන සැබෑ පිරිවැයට වඩා අඩු මිලකට විදුලිය ලබාදෙන්නේය යන කරුණ උද්දීපනය කොට දැක්වීමට කැමැත්තෙමි. එබැවින්, ගෘහස්ථ කාණ්ඩයේ ඉහළ පරිභෝජනයක් සහිත පාරිභෝගිකයන් හා පොදුකාර්ය කාණ්ඩයට මෙකී අතිරේක පිරිවැය දැරීමට සිදුවේ. 2021 වසර අවසානය වනවිට, මෙකී පවත්නා අයක්‍රම ක්‍රමය හේතුකොට වාර්තාවූ සමස්ත අලාභය ශ්‍රී ලං.රු. බිලියන 59.7 ක් වූ අතර, ඉහළ පරිභෝජනයක් සහිත පාරිභෝගිකයන් වෙතින් අයකරන ලද අතිරේක මුදල් ප්‍රමාණය ශ්‍රී ලං.රු. බිලියන 25.4 ක් විය. එබැවින්, සෙසු ආදායම් හැරුණු කොට ලං.වි.ම. විසින් වාර්තා කරන ලද පාඩුව ශ්‍රී ලං.රු.බිලියන 34.3 ක් ලෙස ප්‍රකාශ විය. සෙසු ආදායම්ද සමගින් ශුද්ධ අලාභය ශ්‍රී ලං.රු. බිලියන 21.96 ක් ලෙස ගණනය කෙරිණි.

අවසන, රටතුළ පැවති අභියෝගාත්මක සමාජාර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුව, සෘජු ජනන පිරිවැය අඩුවීම හා බලශක්ති ඉල්ලුමෙන් වර්ධිත දායකත්වය තුළින් ලද දායකත්වය මූලික කොටගෙන 2020 වසරට සාපේක්ෂව ලං.වි.ම. ට එහි ශුද්ධ අලාභය අවම කරගැනීමට හැකිවිය. මාගේ පූර්වගාමීන්, අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්, මුදල් කළමනාකරු හා ලං.වි.ම. අන් සියලු සේවා නියුක්තිකයන් විසින්ද පෞද්ගලිකව සිය රාජකාරි මට්ටමින් ලබාදෙන ලද කැපවීම හා උද්‍යෝගය නොවන්නට මෙම අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වන්නට තිබිණි. ඒ සියල්ලන් හට මාගේ ප්‍රණාමය පළ කරමි.

ලබාදෙන ලද මාර්ගෝපදේශකත්වය හා උපදෙස් සම්බන්ධයෙන් ගරු බලශක්ති අමාත්‍යතුමා, ගරු සූර්ය, සුළං හා ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් හා එතුමියගේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද මාගේ කෘතවේදිත්වය පළ කළ යුතුය. එක්සත්ව එක් ඒකකයක් ලෙස කටයුතු කිරීම සඳහා ලබාදෙන ලද සුවිශිෂ්ට සහයෝගය 2021 සාර්ථකත්වයෙහි ප්‍රධාන සාධකය විය.



**ඉංජිනේරු එන්. ඩබ්. කේ. හේරත්**
සාමාන්‍යාධිකාරී

ලංකා විදුලිබල මණ්ඩලය

# ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ සිතියම
# 2021





මාඋස්සාකැලේ ජලාශය

# ජනන අංශය

ජනන අංශය විසින් ලං.වි.ම. සතු සියලු විදුලි බලාගාර මෙහෙයුම්කරණය, නඩත්තුව හා ප්‍රතිසංස්කරණය සිදුකරනු ලබයි. මෙ.වො. 1,383 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ජල විදුලි බලාගාර දහ හතක්ද, මෙ.වො. 654 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ඛනිජතෙල් බල තාප විදුලි බලාගාර හතක්ද, මෙ.වො. 900 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත එක් ගල් අඟුරු බලාගාරයක්ද, මෙ.වො. 103 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත එක් සුළං විදුලි බලාගාරයක්ද මෙම අංශය සතුවේ. යාපනය අර්ධද්වීපය වටා වූ දූපත්හි ඩීසල් බලාගාර කිහිපයක්ද ලං.වි.ම. විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2021 වසර අවසානය වනවිට ලං.වි.ම සතු විදුලි බලාගාරයන්හි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 3,040 ක් විය.

## විදුලි බලාගාරයන්හි කාර්ය සාධනය

විදුලි ජනනය පාර්ශ්වයෙන් ගත්කල 2021 වසර මහවැලි සංකීර්ණයට සතුටුදායක වසරක් විය. මහවැලි සංකීර්ණයේ විදුලි බලාගාරයන් වෙතින් ගි.වො.පැය 2,985.85 ක් ජනනය කරන ලද අතර එය ලං.වි.ම. සමස්ත ජල විදුලි ජනනයෙන් 53% ක් පමණ වේ. එය 2021 වසර තුළ රටේ සමස්ත ජනනයෙන් 18% ක් පමණ විය. වික්ටෝරියා, කොත්මලේ, ඉහළ කොත්මලේ, රන්දෙණිගල, උකුවෙල හා බෝවතැන්න විදුලි බලාගාරයන් විසින් ඒවාහි වාර්ෂික සැලසුම්ගත ජනන ඉලක්ක ඉක්මවා යන ලද අතර, රන්ටැඹේ හා නිල්ලඹේ විදුලි බලාගාරයනට ඒවාහි සැලසුම්ගත ජනන ඉලක්කයෙන් 87% කට වැඩි ප්‍රමාණයක් ජනනය කිරීමට හැකිවිය.

2021 වසර තුළ ලක්ෂපාන සංකීර්ණයෙන් ජනිත සමස්ත වාර්ෂික ජනනය (ගි.වො.පැය 1,813.12) එහි ඉතිහාසයේ ජනිත ඉහළම ප්‍රමාණය වේ. 2021 වසර තුළ පැරණි ලක්ෂපාන (ගි.වො.පැය 351.9) හා සමනල (ගි.වො.පැය 530.1) විදුලි බලාගාරයන් විසින්ද ඒවාහි ඉහළම වාර්ෂික ජනනය වාර්තා කරන ලදී.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලද පරිදි වාරිමාර්ග ඉල්ලුම සපුරාලීම සඳහාද ක්‍රියාත්මක වෙමින්, සමනල සංකීර්ණයේ සමනලවැව, කුකුලේ ගඟ හා උඩවලව විදුලි බලාගාරයන් විසින් වාර්ෂික අපේක්ෂිත බලශක්තිය ප්‍රමාණය ඉක්මවා ජනනය කරන ලදී.

වසර තුළ තාප (තෙල්) බලාගාරයන් වෙතින් ගි.වො.පැ. 1,234.04 ක ප්‍රමාණයක් ජනනය කෙරිණි. 2021 වසර අභියෝගාත්මක වසරක් වුවද, ලක්විජය විදුලි බලාගාරය විසින් ජාතික විදුලි පද්ධතියට ලබාදෙන ලද දායකත්වය ලං.වි.ම. පද්ධති පාලන මධ්‍යස්ථානය විසින් ලබාදෙන ලද ඉලක්කයට වඩා සියයට එකකින් ඉහළ අගයක විය (බලශක්ති මුදාහැරීම් පිළිබඳ 2021 ජනවාරි වියළි තත්ත්වයට අදාළ පුරෝකථනය). 2021 වසර තුළ ලක්විජය විදුලි බලාගාරය වෙතින් ජනිත ශුද්ධ බලශක්තිය ප්‍රමාණය ඒ සඳහා ලබාදෙන ලද ගි.වො.පැ. 5477.13 ක ඉලක්කයට සාපේක්ෂව ගි.වො.පැ. 5,519.04 ක් විය. 2021 වසර තුළ ලක්විජය විදුලි බලාගාරය වෙතින් ජනිත විදුලිය ප්‍රමාණය ජාතික ඉල්ලුමෙන් 33% ක් පමණ වේ.

2021 වසර තුළ විදුලි බලාගාර මගින් ජනිත විදුලිය හා ආශ්‍රිත සෙසු සාධක පහත ලැයිස්තුගත කර ඇත.

### ජල විදුලි බලාගාරයන්හි දායකත්වය

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|
| වික්ටෝරියා | 210 | 973.00 | 97.99 | 52.97 |
| කොත්මලේ | 201 | 565.14 | 99.79 | 32.23 |
| ඉහළ කොත්මලේ | 150 | 507.95 | 99.89 | 38.80 |
| රන්දෙණිගල | 122.60 | 424.58 | 99.87 | 39.88 |
| රන්ටැඹේ | 50 | 193.81 | 99.68 | 45.61 |
| උකුවෙල | 40 | 212.60 | 99.38 | 60.78 |
| බෝවතැන්න | 40 | 94.13 | 99.73 | 26.97 |
| නිල්ලඹේ | 3.20 | 14.64 | 99.36 | 50.36 |
| **මහවැලි සංකීර්ණයේ එකතුව** | **816.80** | **2,985.85** | | |
| සමනලවැව | 120 | 405.19 | 92.66 | 42.32 |
| කුකුලේගඟ | 75 | 399.69 | 94.17 | 65.42 |
| උඩවලව | 6 | 13.67 | 92.93 | 47.05 |
| ඉඟිනියාගල | 11.25 | 22.46 | 98.22 | 22.95 |
| **සමනල සංකීර්ණයේ එකතුව** | **212.25** | **841.01** | | |
| පැරණි ලක්ෂපාන අදියර I | 28.80 | 351.92 | 99.80 | 74.50 |
| පැරණි ලක්ෂපාන අදියර II | 25 | | | |
| නව ලක්ෂපාන | 100 | 610.19 | 99.70 | 60.60 |
| සමනල | 90 | 530.08 | 99.30 | 66.50 |
| විමලසුරේන්ද්‍ර | 50 | 142.51 | 99.60 | 32.60 |
| කැනියන් | 60 | 178.42 | 100.00 | 34.10 |
| **ලක්ෂපාන සංකීර්ණයේ එකතුව** | **353.80** | **1,813.12** | | |
| **ජලවිදුලිය එකතුව** | **1,382.85** | **5,639.98** | | |

## තාප (තෙල්) විදුලි බලාගාරයන්හි දායකත්වය

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | පවත්නා උපරිම සමස්ත ධාරිතාවය (මෙ.වො.) | ජනනය කළ බලශක්තිය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) | දෝෂ සාධකය (%) |
|---|---|---|---|---|---|---|
| සපුගස්කන්ද - A | 80 | 70 | 238.86 | 93.9 | 40.3 | 0.09 |
| සපුගස්කන්ද - B | 80 | 72 | 333.01 | 94.3 | 55.1 | 0.07 |
| කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - වායු තලබමන | 110 | 110 | 133.25 | 53.74 | 37.71 | 33.11 |
| කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - වාෂ්ප තලබමන | 55 | 55 | | 46.61 | 32.07 | 32.99 |
| කැළණිතිස්ස වායු තලබමන - 07 | 115 | 115 | 78.75 | 86.26 | 10.19 | 6.95 |
| කැළණිතිස්ස Frame V වායු තලබමන | 80 | 54 | 10.96 | 65.81 | 8.21 | 25.61 |
| හදිසි විදුලිය | 50 | 40 | 41.35 | 95.6 | 13 | 3.5 |
| උතුරු ජනනි | 24 | 24 | 88.59 | 87.93 | 49.35 | 5.85 |
| යාත්‍රාවක නැංවූ බලාගාරය | 60 | 62.4 | 306.57 | 96.13 | 58.37 | 3.76 |
| කුඩා දූපත් | | | 2.70 | | | |
| **තාප (තෙල්) එකතුව** | **654** | **602.4** | **1,234.04** | | | |

## ලක්විජය විදුලි බලාගාරයේ දායකත්වය

| | | ඒකකය 01 | ඒකකය 02 | ඒකකය 03 | එකතුව |
|---|---|---|---|---|---|
| ස්ථාපිත ධාරිතාවය | මෙ.වො. | 300 | 300 | 300 | 900 |
| ජනනය කරන ලද දළ බලශක්තිය | ගි.වො.පැ. | 2,103.03 | 2,082.59 | 1,925.31 | 6,110.93 |
| පිටකරන ලද ශුද්ධ බලශක්තිය | ගි.වො.පැ. | 1,901.93 | 1,876.56 | 1,740.55 | 5,519.04 |
| උපකාරක පරිභෝජනය | ගි.වො.පැ. | 201.10 | 206.03 | 184.76 | 591.88 |
| උපයෝජ්‍යතා සාධකය | % | 98.55 | 96.15 | 86.87 | 93.85 |
| ධාරිතා සාධකය | % | 80.02 | 79.25 | 73.26 | 77.51 |

## උද්දීපනයන්

විදුලි බලාගාරයන්හි ජනන ඒකකවල හා උපකාරක පද්ධතිවල එදිනෙදා නඩත්තු කටයුතුවලට අමතරව, විදුලි බලාගාරයන්හි හා ආශ්‍රිත උපකරණයන්හි ජනන ධාරිතාව හා විශ්වසනීයත්වය නංවාලනු පිණිස ජනන අංශය විසින් පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතු හා ව්‍යාපෘති සිදුකරන ලදී.

### පොල්පිටිය ජනන යන්ත්‍රයන්හි දෝෂ හේතු සම්බන්ධයෙන් අනුගමනය කළ විකල්ප ක්‍රියාමාර්ග



රූපය 1: අලුත්වැඩියාවට පෙර හා පසු පිවිසුම් තිරය

ලක්ෂපාන තටාකයේ පොල්පිටිය පිවිසුම් පෙරනයේ සිදුව පැවති දැඩි අලාභහානි පොල්පිටිය ජනන යන්ත්‍රයන්හි බරපතල දෝෂයන් ඇතිව තිබිණි. අලුත්වැඩියා පිරිවැය වශයෙන් මෙන්ම අහිමිවන ජනන හැකියාව අතින්ද මෙම ගැටලුව මගින් ලං.වි.ම. වෙත සැලකිය යුතු අලාභයක් සිදුකරන ලදී. යන්ත්‍රවල විශ්වසනීයත්වය සහතික කරනු පිණිස ලක්ෂපාන තටාකයෙහි රොන්මඩ ඉවත් කොට පොල්පිටිය පිවිසුම් පෙරනය අලුත්වැඩියා කරනු පිණිස 2021 සැප්තැම්බර් මස දින තුනක තටාක ඇණ හිටුවීම් කාල සීමාවක් ලබාගන්නා ලදී.

### පැරණි ලක්ෂපාන 4 ඒකකයෙහි ජනක යන්ත්‍ර පැටවුම් ධාරිතාව යථාතත්වයට පත්කිරීම



රූපය 2: පැරණි ලක්ෂපාන 4වන ඒකකයෙහි ජනන යන්ත්‍රය

සංවාතනයේ අධික ලෙස බැඳී තිබූ දුහුවිලි හේතුකොට පැරණි ලක්ෂපාන 4 ඒකකයෙහි ජනක යන්ත්‍ර පැටවුම් ධාරිතාව මෙ.වො. 10.5ක් දක්වා සීමාවී තිබිණි. 2021 ජූලි මස යන්ත්‍රය පූර්ණ පිරිසිදුකරණයකට ලක් කිරීම මගින් ජනක යන්ත්‍ර පැටවුම් ධාරිතාව මෙ.වො. 12.5 ක් දක්වා යථාතත්වයට පත්කරන ලදී.

## කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරයේ වායු තලබමර භ්‍රමකය අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව ජාලය වෙත මෙ.වො. 165 ක් නැවත සම්බන්ධ කරන ලදී



රූපය 3 : රොටරය අලුත්වැඩියා කටයුතු සිදු වෙමින්

කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරයේ වායු තලබමර භ්‍රමකය රොටරය පිටිසැණෙලීම හේතුකොට හානියට පත්ව තිබිණි. අනතුරුව, ජාතික ජාලයෙන් මෙ.වො. 165 ක් අහිමි විය. 2021 අප්‍රේල් මස හානියට පත් භ්‍රමකය අලුත්වැඩියා කොට සාර්ථකව මෙහෙවරෙහි යොදවා අහිමි වූ ජනන ධාරිතාව නැවත සම්බන්ධ කරන ලදී.

## ලක්විජය විදුලි බලාගාරයේ ගල්අඟුරු අංගනයේ කාර්ය ධාරිතාව ප්‍රවර්ධනය



රූපය 4: ගල් අඟුරු අංගන ව්‍යාප්ති කටයුතු සිදු වෙමින්

ගල් අඟුරු විදුලි බලාගාරයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අතීතයෙන් ලද අත්දැකීම් සමගින්, රඳවාගත හැකි ගල් අඟුරු තොග ප්‍රමාණය වර්ධනය කොටගත හොත් බලාගාරයේ විශ්වසනීයත්වය තවදුරටත් වැඩිදියුණු කළ හැකි බව හඳුනා ගන්නා ලදී. එබැවින්, අයහපත් කාලගුණයේ, ගල් අඟුරු ප්‍රසම්පාදන ප්‍රමාදයන්ගේ හා ගල් අඟුරු කාර්ය පද්ධතියේ ගැටලු ආශ්‍රිත හානිකර බලපෑම් වළකාලනු පිණිස, පවත්නා ගල් අඟුරු අංගනයේ ගල් අඟුරු ගබඩා හා කාර්ය ධාරිතාව මෙ.ටො.මි. 1.21 දක්වා වර්ධනය කිරීමට තීරණය කෙරිණි.

ව්‍යාපෘතිය 2023 පෙබරවාරි මාසයේදී සම්පූර්ණ කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයනට අදාළ භෞතික ප්‍රගතිය දළ වශයෙන් පහත පරිදි වේ:

| | |
|---|---|
| බැර නඩත්තු ගොඩනැගීම – | 40% |
| අවකාශ ගොඩනැගීම – | 60% |
| ගල් අඟුරු අංගන ව්‍යාප්තිය – | 62% |

## කැළණිතිස්ස විදුලි බලාගාරයේ රාමුව V වායු තලබමරයේ ආයු කාලය වැඩි කිරීම



රූපය 5: ප්‍රතිසංස්කරණය කළ රාමුව V වායු තලබමරය

කොළඹ නගර කළාපයේ ජනන හිඟයට පිළියම් යෙදීම හා වෝල්ටීයතා නියාමනය සඳහා රාමුව V වායු තලබමරය ක්‍රියාකාරිත්වය අවම වශයෙන් අවුරුදු හයකින් (06) දීර්ඝ කිරීමට තීරණය කොට ඇත.

ඒ අනුව, ප්‍රමාණවත් අමතර කොටස් ලබාගැනීමෙන් අනතුරුව GT-01, GT-02, GT-04 හා GT-05 ලෙස වූ රාමුව V වායු තලබමර හතරේ ඒකකයන්හි ප්‍රධාන නඩත්තු / ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. එම කාර්යය සාක්ෂාත් කරගැනීම උදෙසා ව්‍යාපෘතියක් පිහිටුවා ඇත. වසර අවසානය වන විට ව්‍යාපෘතියේ කටයුතුවල 95% ක ප්‍රගතියක් දිස්විය. එය 2022 මාර්තු අවසානය වනවිට අවසන් කිරීමට අපේක්ෂිතය.

## කැළණිතිස්ස විදුලි බලාගාරයේ ධාරිතා ප්‍රවර්ධනය

කැළණිතිස්ස විදුලි බලාගාරයේ මෙ.වො. 3x35 වායු තලබමර ස්ථාපනය කිරීමට තීරණය කර ඇත. මෙම අවශ්‍යතාවය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2015-2034 තුළ හඳුනා ගන්නා ලදී. මෙම බලාගාරය ඩීසල් ඉන්ධනයෙන්ද, ඉනික්බිති කැළණිතිස්ස වෙත ද්‍රව ස්වභාවික වායු ලද විටදී ද්‍රව ස්වභාවික වායුවලින්ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘති ප්‍රසම්පාදන කාර්යයන්හි වර්තමාන ප්‍රගතියට අනුව, 2022 අප්‍රේල් මස කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අපේක්ෂා කෙරේ.

## ජනන පිරිවැය

| සංකීර්ණය | බලාගාරය | සමුච්චිත සැබෑ ජනනය (ගි.වො.පැ.) | සමුච්චිත සැබෑ වියදම (රු. මිලියන) | සාමාන්‍ය ඒකක පිරිවැය (රු./කි.වො.පැ.) |
|---|---|---|---|---|
| තාප | කැළණිතිස්ස වි.බ. - ගෑස් ටර්බයිනය | 89.71 | 4,648.12 | 51.81 |
| | කැළණිතිස්ස වි.බ. - සංයුක්ත චක්‍රිය | 133.25 | 4,307.98 | 32.33 |
| | සපුගස්කන්ද | 571.87 | 11,962.39 | 20.92 |
| | දූපත්වල කුඩා ජනන යන්ත්‍ර | 2.7 | 186.12 | 68.93 |
| | උතුරු ජනනි | 88.59 | 2,472.67 | 27.91 |
| | යාත්‍රාවක නැංවූ වි.බ. | 306.57 | 5,361.66 | 17.49 |
| | හදිසි විදුලිය - මෙ.වො. 1 x 50 | 41.35 | 1,659.24 | 40.13 |
| | **සමස්ත තාප තෙල්** | **1234.04** | **30,598.19** | **24.80** |
| **ගල් අඟුරු** | **ගල් අඟුරු** | **5519.05** | **68,752.08** | **12.46** |
| **සමස්ත තාප** | **සමස්ත තාප** | **6753.09** | **99,350.26** | **14.71** |
| මහවැලි | වික්ටෝරියා | 973 | 671.21 | 0.69 |
| | කොත්මලේ | 565.14 | 1,102.69 | 1.95 |
| | උකුවෙල | 212.6 | 300.96 | 1.42 |
| | බෝවතැන්න | 94.13 | 503.23 | 5.35 |
| | රන්දෙණිගල/ රන්ටැඹේ | 618.39 | 1,288.22 | 2.08 |
| | නිල්ලඹේ | 14.64 | 110.42 | 7.54 |
| | ඉහළ කොත්මලේ | 507.95 | 1,529.46 | 3.01 |
| | තම්බපවනි සුළං | 318.21 | 919.01 | 2.89 |
| | **මහවැලි එකතුව** | **3304.06** | **6,425.21** | **1.94** |
| ලක්ෂපාන | පැරණි හා නව ලක්ෂපාන | 962.12 | 1,015.25 | 1.06 |
| | සමනල | 530.08 | 494.44 | 0.93 |
| | විමලසුරේන්ද්‍ර | 142.51 | 468.48 | 3.29 |
| | කැන්යන් | 178.41 | 408.05 | 2.29 |
| | **සමස්ත ලක්ෂපාන** | **1813.12** | **2,386.23** | **1.32** |
| | සමනලවැව | 405.19 | 1,434.79 | 3.54 |
| | කුකුලේ | 399.69 | 567.00 | 1.42 |
| | ඉඟිනියාගල | 22.46 | 142.31 | 6.34 |
| | උඩවලවේ | 13.67 | 170.74 | 12.49 |
| | **සමස්ත සමනල** | **841.01** | **2,314.84** | **2.75** |
| | **ජල/සුළං එකතුව** | **5958.19** | **11,126.27** | **1.87** |
| **සමස්ත ලං.වි.ම.** | **සමස්ත ලං.වි.ම. (ජනන ලක්ෂ්‍යයේදී)** | **12,711.28** | **110,476.53** | **8.69** |

මූලාශ්‍රය: බලශක්ති විකුණුම් ශාඛාව



වව්නියාව කොටුමා උපපොළ

# සම්ප්‍රේෂණ අංශය

සමස්ත රට වෙනුවෙන් අරපිරිමැසුම්දායී සම්ප්‍රේෂණ පද්ධතියක් ගොඩනඟා, ක්‍රියාත්මක කරමින් නඩත්තු කිරීමේ ව්‍යවස්ථාමය වගකීමක් ලං.වි.ම. සතුවේ. මෙයට අමතරව, රටේ පුරෝකථනීය විදුලි ඉල්ලුම සපුරාලනු පිණිස ප්‍රමාණවත් ජනනයක් පවත්වාගෙන යාමද ලං.වි.ම. ව්‍යවස්ථාපිත කාර්යයන් වේ. මෙම ව්‍යවස්ථාපිත කාර්යයන් මෙන්ම සෙසු වගකීම්ද ඇතුළත් කරමින් ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. වෙත සම්ප්‍රේෂණ බලපත්‍රයක් නිකුත් කර ඇත.

**සම්ප්‍රේෂණ අංශයේ මෙහෙයුම් අරමුණු පහත පරිදි වේ:**

- කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය හා පිරිමැසුම්දායී සම්ප්‍රේෂණ පද්ධතියක් ගොඩනඟා පවත්වාගෙන යාම.
- විදුලිය ලබාගැනීම හා පාරිභෝගිකයන් වෙත ආරක්ෂිත, විශ්වසනීය හා පිරිමැසුම්දායී විදුලිය සැපයුමක් සහතික කරනු පිණිස බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත විදුලිය අලෙවි කිරීම.
- විදුලිය සඳහා වූ සාධාරණ පුරෝකථනීය ඉල්ලුම සපුරාලනු පිණිස ජනන බලාගාරයන් වෙතින් ප්‍රමාණවත් ධාරිතාවයක් ලැබෙන බවට වගබලා ගැනීම.
- පද්ධතිමය සම්ප්‍රේෂණ වෝල්ටීයතා විචලනයන් කි.වෝ. 132 හා කි.වෝ. 220 සඳහා ±10 % වශයෙන්ද, හර්ට්ස් 50 සංඛ්‍යාතය ±1 % තුළද පවත්වා ගැනීමට වගබලා ගැනීම.

ලං.වි.ම. හි සෙසු අංශයන් වෙත සේවා සපයන අතර, ශාඛා දහතුනක් මගින් ලං.වි.ම. වෙනුවෙන් මෙකී අරමුණු සමගින් උක්ත කාර්යයන් සිදු කිරීමේ වගකීම සම්ප්‍රේෂණ අංශය සතුවේ.

සවිස්තරාත්මක අධ්‍යයනයන් සිදු කිරීමෙන් අනතුරුව, සම්ප්‍රේෂණ අංශය විසින් අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LCLTGEP) පළ කරනු ලබයි. අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම මගින් විසි වසරක කාල පරිච්ඡේදයක් සඳහා රටේ බලශක්ති පද්ධතියට සිදුකළ යුතුවන අනාගත ජනන එක් කිරීම් පිළිබඳ විස්තර සපයනු ලබයි. තවද, මෙම සැලැස්ම මත පදනම් වූ දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම (LTTDP) මගින් ඉදිරි වසර 10 ක කාල පරිච්ඡේදය සඳහා පද්ධතිය තුළ සිදුකළ යුතු සම්ප්‍රේෂණ මාර්ග හා සෙසු යටිතල පහසුකම්ද නියම කරනු ලබයි. මෙම සැලසුම් චක්‍රීය සැලසුම් ලෙස පළ කරනු ලැබේ.

කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ ජාලය උපයෝගයෙන් සම්ප්‍රේෂණ අංශය විසින්, සිය පද්ධති පාලන මධ්‍යස්ථානය හරහා, සියලු ජනන බලාගාර මගින් ජාතික ජාලය වෙත සපයනු ලබන විදුලිය බෙදා හරිනු ලබයි. විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPA) හරහා කොන්ත්‍රාත්වලට එළැඹීම මගින් ස්වාධීන විදුලිය නිෂ්පාදකයන්ගේ විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම, පුද්ගලික අංශය සමගින් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) බලාගාර සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම්ද අංශය සතුවේ. මෙයට අමතරව, මෙම අංශය විසින් ජනන බලපත්‍රලාභීන් වෙතින් විදුලිය මිලදී ගෙන ලංකා විදුලි පෞද්ගලික සමාගමද ඇතුළත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) පස් දෙනෙකු වෙත අලෙවි කිරීමේ කාර්යයෙහිද නිරත වේ. 2015 දී අනුමත අයකුම ක්‍රමවේදය ප්‍රකාර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත සෑම මාස 6 කට වරක්ම තොග සැපයුම් අයකුමය (BST) ඉදිරිපත් කිරීමද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

සම්ප්‍රේෂණ ජාලය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව අංශයේ මූලික වගකීම වේ. වත්කම් කළමනාකරණය හා නඩත්තු කළමනාකරණය පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියක් (CMMS) මත පදනම්ව සිදු කරනු ලබයි. මෙහෙයුම් හා නඩත්තු කටයුතු විමධ්‍යගත කොට ඇත.

තවද, අවශ්‍ය ආරක්ෂණ දර්ශනයන් හඳුනා ගනිමින් ඒවා විදුලි ජාලය ආරක්ෂා කිරීම හා අනාගත සංවර්ධනයන් සඳහා හෝ විදුලි ජාලය ප්‍රතිසංස්කරණය සඳහා යෙදවීමද සිදු කරනු ලබයි. ලං.වි.ම. ඇතුළත හඬ හා දත්ත සන්නිවේදන අවශ්‍යතා සම්පාදනයද සම්ප්‍රේෂණ අංශය විසින් සිදුකරනු ලබයි. මෙතුළට හඬ හා දත්ත ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව, ආරක්ෂණ සංඥාකරණය හා කටහඬ හා දත්ත පරිපාලනයද ඇතුළත් වේ.

මෙයට අමතරව, පවරන ලද මානව සම්පත් හා මූල්‍ය කටයුතුද අංශය විසින් සිදුකරනු ලබයි.

## සම්ප්‍රේෂණ අංශයේ කාර්ය සාධනය

වසර අවසානය වනවිට සම්ප්‍රේෂණ පද්ධතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අයිතමය | ඒකකය | ප්‍රමාණය |
|---|---|---|
| කි.වෝ. 220 උඩිස් සම්ප්‍රේෂණ රැහැන් | කි.මී. | 807 |
| කි.වෝ. 220 භූගත රැහැන් | කි.මී. | 22 |
| කි.වෝ. 132 උඩිස් රැහැන් | කි.මී. | 2335 |
| කි.වෝ. 132 භූගත රැහැන් | කි.මී. | 55 |
| කි.වෝ. 220/132/33 කොටුමා උපපොළ | සංඛ්‍යාව | 4 |
| කි.වෝ. 220/132/33 තරාපැවි | සංඛ්‍යාව | 8 |
| | මෙ.වෝ.ඇ. | 1600/380 |
| කි.වෝ. 220/132 කොටුමා උපපොළ | සංඛ්‍යාව | 7 |
| කි.වෝ. 220/132 තරාපැවි | සංඛ්‍යාව | 12 |
| | මෙ.වෝ.ඇ. | 3010 |
| කි.වෝ. 132/33 කොටුමා උපපොළ | සංඛ්‍යාව | 60 |
| කි.වෝ. 132/33 තරාපැවි | සංඛ්‍යාව | 154 |
| | මෙ.වෝ.ඇ. | 4757.5 |
| කි.වෝ. 132/11 කොටුමා උපපොළ | සංඛ්‍යාව | 8 |
| කි.වෝ. 132/11 තරාපැවි | සංඛ්‍යාව | 22 |
| | මෙ.වෝ.ඇ. | 792 |
| කි.වෝ. 220/33 කොටුමා උපපොළ | සංඛ්‍යාව | 5 |
| කි.වෝ. 220/33 තරාපැවි | සංඛ්‍යාව | 8 |
| | මෙ.වෝ.ඇ. | 498 |

වගුව T1 : 2021 දෙසැම්බර් මස 31වන දිනට සම්ප්‍රේෂණ පද්ධතිය

## විදුලිය පද්ධතියේ කාර්ය සාධනය

2021 වසර සඳහා වූ ශුද්ධ විදුලිය ජනනය ගි.වො.පැ. 16,715.6 ක් ලෙස වාර්තා විය. එය පසුගිය වසර හා සාපේක්ෂව 6.4% ක වර්ධනයකි.

2021 වසර තුළ ලං.වි.ම. සතු ජල විදුලි බලාගාරයන්ගෙන් ලද ශුද්ධ විදුලිය ජනනය ගි.වෝ.පැ. 5,640 ක් ලෙස වාර්තා වූ අතර එතුළ 2020 වසරට සාපේක්ෂව 44.2% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

සම්පූර්ණයෙන් මෙහෙවරෙහි යොදවන ලද තම්බපවනි සුළං විදුලි බලාගාරයද සමගින් ලං.වි.ම. සතු සුළං ජනනය ගි.වො.පැ. 318.2 ක් ලෙස වාර්තා වූ අතර, එම බලාගාරය විසින් සමස්ත ජනනයෙන් 1.9% ක් ලබාදෙන ලදී.

ශ්‍රී ලංකාවේ එකම ගල් අඟුරු බලාගාරය වන ලක්විජය විදුලි බලාගාරයේ වාර්ෂික ජනනය ගි.වො.පැ. 5,519 ක් වූ අතර එමගින් සමස්ත ජනනයෙන් 33% ක දායකත්වයක් ලබාදෙන ලදී.

ස්වාධීන විදුලිය නිෂ්පාදකයන්ගේ තාප (තෙල්) ජනනය ගි.වො.පැ. 1,400.3 ක් වූ අතර එය සමස්ත ජනනයෙන් 8.4% ක අගයක් ගනී. ඇඹිලිපිටිය ACE Power, මාතර ACE Power හා Asia Power යන නම්වලින් ලියාපදිංචිව පැවති ස්වාධීන විදුලිය නිෂ්පාදන බලාගාරයන්හි කොන්ත්‍රාත් කාලයන් පිළිවෙලින් 2021 අප්‍රේල් මස 6, 8 හා 11 දිනයන්හිදී අවසන් වීම මත එම නිෂ්පාදනායතන විශ්‍රාම ගන්වන ලදී. වාලච්චේන V Power නමැති ස්වාධීන විදුලිය නිෂ්පාදන බලාගාරය 2021 අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා මාස 6 ක කෙටි කාලීන කොන්ත්‍රාත් පදනමින් ක්‍රියාත්මක වූ අතර, එමගින් වාර්ෂික ශුද්ධ ජනනයට ගි.වො.පැ. 5.846 ක දායකත්වයක් ලබාදෙන ලදී.




රූපය T1 : 2021 වසරේ ශුද්ධ බලශක්ති ජනන මුහුව

සුළං. කුඩා ජලවිදුලි, සූර්ය, නාගරික ඝණ අපද්‍රව්‍ය, ඩෙන්ඩ්‍රෝ හා ජෛවස්කන්ධ වූකලි මේවන විට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති කාණ්ඩය යටතේ කාණ්ඩගත ශ්‍රී ලංකාවේ විදුලිය ජනන මූලාශ්‍රයන් වේ. වහළය මත සවිකරන සූර්ය පද්ධතිද ඇතුළත්ව ස්වාධීන විදුලිය නිෂ්පාදකයන්ගේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනනය ගි.වො.පැ. 2,604 ක් ලෙස වාර්තා විය. මෙය වූකලි සමස්ත ජනනයෙහි 15.6% ක දායකත්වයක් වන අතර, පෙර වසර හා සාපේක්ෂව 40.1% ක වර්ධනයක් වාර්තා කරයි.

සමාලෝචිත වසර තුළ සමස්ත පුනර්ජනනීය බලශක්ති දායකත්වය සමස්ත ජනනයෙන් 51.2% ක් ලෙස වාර්තා විය.




රූපය T2 : 2021/2020 විවිධ විදුලිබල මූලාශ්‍රයන්ගේ දායකත්වයන් සන්සන්දනය (ගි.වො.පැය වලින්)




රූපය T3 : 2021 වසර තුළ මාසික ශුද්ධ ජනනය (ගි.වො.පැය වලින්)

වසර පුරා මාසික විදුලි ජනනයේ වෙනස ප්‍රධාන කොටම කාලගුණ තත්ත්වයන්ගේ වෙනස්වීම් හා මාසයේ දින ගණන හේතුකොට ඇතිවූවකි. කෙසේ වුවද, ජනවාරි, පෙබරවාරි හා සැප්තැම්බර් මාස කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට රටතුළ බලපවත්වන ලද පාර්ශ්වීය අගුලු දැමීම් තත්ත්වය මගින් බලපෑමට ලක්විය. මෙය සාමාන්‍ය දෛනික ජනන රටාව තුළද නිරීක්ෂණය කළ හැක.




රූපය T4 : 2021 හා 2020 වසරවල මාසික සාමාන්‍ය දෛනික ජනන විචලනය (ගි.වො.පැයවලින්)

2021 වසරේ රාත්‍රී කාලයේ උපරිම ඉල්ලුම 2021 අප්‍රේල් මස 06 වන දින පැය 19:00 ට වාර්තා විය. එදින විදුලි ඉල්ලුම මෙ.වො. 2801.6 ක අගයකට පිවිසිණි. එදිනම දිවා කාලයේ උපරිම ඉල්ලුම මෙ.වො. 2407.7 ක් සනිටුහන් වූ පැය 16:00 වේලාව වූ අතර එය 2021 වසරේ දිවා කාලයේ උපරිම ඉල්ලුම විය. 2021 වසරේ අඩුම වාර්තාගත පද්ධතිමය ඉල්ලුම මෙ.වො. 964.2 ක් වූ අතර එය 2021 මැයි මස 27 වන දින පැය. 03:00 ට වාර්තා විය.



රූපය T5 : 2021 උපරිම රාත්‍රී කාල කාර්ය බහුල වේලාව සටහන් වූ දින පැය කාලෙන් කාල ජනන වක්‍රය

උපරිම දෛනික ජනනය වූ ගි.වො.පැ. 50.1 ප්‍රමාණය 2021 අප්‍රේල් මස 06 වන දින වාර්තා විය. අවම දෛනික ජනනය ලෙස ගි.වො.පැ. 28.3 ක අගයක් 2021 අප්‍රේල් මස 14 වන දින හෙවත් සිංහල හා හින්දු අලුත් අවුරුදු දින වාර්තා විය. ඉහත සඳහන් කළ උපරිම හා අවම දෛනික ජනනය අගයන් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනනය රහිතව ගණන් බලා ඇත.




රූපය T6 : වාර්ෂික රාත්‍රී කාල උපරිමය වාර්තා වූ දින බැර වක්‍රය (2019 - 2021)

## දිවයින පුරා විදුලිය ඇණ හිටීම

2021 දෙසැම්බර් මස 3 වන දින පැය 11:27 ට දිවයින පුරා විදුලිය ඇණ හිටීමක් සිදුවිය. කොත්මලේ-බියගම පරිපථ අංක 02 හි සිදුවූ බිඳවැටීම හේතුකොටගෙන පද්ධති දෝෂය ආරම්භ විය. ඉන් අනතුරුව තවත් පරිපථ කිහිපයක් බිඳවැටුණු අතර, 34% ක ජනනයන් අහිමි වීම නිසා අනෙකුත් ජනනයන්ද අහිමි වීම හේතුටකාටගෙන සමස්ත පද්ධතියම බිඳ වැටිණ. සුවිශාල කණ්ඩායම් ප්‍රයත්නයකින් අනතුරුව පැය 5 කට ආසන්න කාලයක් තුළ පද්ධතිය සාර්ථකව යථා තත්ත්වයට පත් කරන ලදී. සියලු ජාල උපපොළයන් වෙත පැය 16:47 වනවිට නැවත බලශක්තිය සම්පාදනය කෙරිණි. මෙම දෝෂය හේතුවෙන් සැපිරිය නොහැකිවූ සමස්ථ බලශක්ති ප්‍රමාණය ගි.වො.පැ. 10.4 ක් ලෙස ඇස්තමේන්තු කෙරිණි.

## ජලාශ කාර්ය සාධනය

2021 වසර ගි.වො.පැ. 893.2 ක සමස්ත ජල විදුලි ගබඩාකරණයක් සමගින් ආරම්භ විය. මෙය ගි.වො. පැය 1,207.3 ක් වූ පද්ධතියේ සම්පූර්ණ ගබඩා ධාරිතාවයෙන් 74% ක් විය. ගි.වො.පැ. 5,647.2 ක් ලෙස වූ එදා මෙදාතුර වාර්තා වූ ඉහළම ආගලනය වසර තුළ ජල පෝෂක ප්‍රදේශයනට ලැබිණි. වසරේ අඩුම ගබඩා මට්ටම 2021 මැයි මස 02 වන දින ගි.වො.පැ. 743 ක් ලෙස වාර්තා විය. වාර්ෂාවසාන ගබඩාකරණය ගි.වො.පැ. 888.2 ක් වූ අතර, එය සමස්ත පද්ධති ගබඩාකරණ මට්ටමින් 73.6% කි.

නිරිතදිග මෝසම් සමය හා අන්තර් මෝසම් සමය (ඔක්තෝබර් - නොවැම්බර්) පුරා ලද ඉහළ ජල ආගලනයන් හේතුකොට 2021 නොවැම්බර් මස 16 වන දින ගි.වො.පැ. 1,154.07 ක් වූ ඉහළම ගබඩාකරණ මට්ටම වාර්තා විය. එය සමස්ත ගබඩාකරණ මට්ටමින් 95.6% කි. 2021 වසර ඉහළ ආගලනයක් සහිත වසරක් ලෙස සැලකිය හැක.

2021 වසරේ ඉහළම ආගලනය ගි.වො.පැ. 25 ක උපරිම සාමාන්‍ය දෛනික ආගලනයක් සහිතව මැයි මාසයේදී වාර්තා විය. වසරේ දෙවන අර්ධය තුළ පද්ධතියට ගි.වො.පැ. 3.417 ක ආගලනයක් ලැබිණි.




රූපය T7 : 2019 සිට 2021 දක්වා පද්ධති ගබඩාකරණ විචලනය

## සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘතිවල කාර්ය සාධනය

| කාණ්ඩය | 2021දී මෙහෙවරෙහි යොදවන ලද | | 2021 වසර අවසන් වනවිට සමුච්චිත මෙහෙවරෙහි යොදවන ලද ව්‍යාපෘති | |
|---|---|---|---|---|
| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාවය (මෙ.වො.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාවය (මෙ.වො.) |
| කුඩා ජලවිදුලි | 3 | 4.6 | 211 | 414.15 |
| ජෛවස්කන්ධ | - | - | 13 | 40.09 |
| සුළං | - | - | 17 | 148.45 |
| සූර්ය | 25 | 25 | 57 | 100.36 |
| නාගරික ඝණ අපද්‍රව්‍ය | - | - | 1 | 10.00 |
| **එකතුව** | **28** | **29.6** | **299** | **713.05** |

වගුව T2 : මෙහෙවරෙහි යොදවන ලද සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති

## ප්‍රමිතිගත අයකුම යටතේ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කළ මෙහෙවරෙහි නොයොදවන ලද ව්‍යාපෘති

විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට නොමැති ඇතැම් ව්‍යාපෘති ඉඩම්, පාරිසරික හා සමාජ ගැටලු හේතුකොට මේ දක්වා මෙහෙවරෙහි යොදවා නොමැත. ඒවා පිළිබඳ සාරාංශයක් පහත දී ඇත:

| කාණ්ඩය | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) |
|---|---|---|
| කුඩා ජලවිදුලි | 51 | 91.20 |
| ජෛවස්කන්ධ | 17 | 75.63 |
| සුළං | 1 | 1.10 |
| නාගරික ඝණ අපද්‍රව්‍ය | 3 | 20.40 |
| සූර්ය තාප | 2 | 20.00 |
| **එකතුව** | **74** | **208.33** |

වගුව T3 : ප්‍රමිතිගත අයකුම යටතේ වන මෙහෙවරෙහි නොයොදවන ලද ස.නො.පු.බ. ව්‍යාපෘති

## ටෙන්ඩර් පරිපාටිය ක්‍රියාත්මක වෙමින් පවත්නා ව්‍යාපෘති සාරාංශය

2013 විදුලිබල පනත සංශෝධනය කිරීමත් සමගින්, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන කාර්යයෙහි තරගකාරී ලංසුකරණය හරහා ගෙන ආ යුතුව පවතී. 2015 දී මෙ.වො. 10 සුළං විදුලි බලාගාර දෙකක් සඳහා වූ පළමු ටෙන්ඩරය කැඳවන ලදී. ඉන් පසු ටෙන්ඩර් කිහිපයක් කැඳවනු ලැබ ඇත. ඒ පිළිබඳ සාරාංශයක් පහත දී ඇත.

| ටෙන්ඩරය | බලාගාර සංඛ්‍යාව | සමස්ත ධාරිතාව (මෙ.වො) | වෙනත් කරුණු |
|---|---|---|---|
| වුන්නාකම් සුළං | 2 | 20 | මෙහෙවරෙහි යොදවන ලදී |
| මෙ.වො. 60x1 සූර්ය | 35 | 35 | ව්‍යාපෘති 35 ක් පිරිනමනු ලැබ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදී. ව්‍යාපෘති 34 ක් මෙහෙවරෙහි යොදවන ලදී. එක් ව්‍යාපෘතියක් ඉදි වෙමින් පවතී. |
| මෙ.වො. 90x1 සූර්ය | 68 | 68 | ව්‍යාපෘති 3 ක් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කළ යුතුව පවතී. ව්‍යාපෘති 15 ක් මෙහෙවරෙහි යොදවන ලදී. ව්‍යාපෘති 50 ක් ඉදි වෙමින් පවතී |
| මෙ.වො. 2x10 සූර්ය | 2 | 20 | ඉදි වෙමින් පවතී. |
| ගොවිපල සහිත වහළ මත සවිකරන සූර්ය පද්ධති | 1 | 10 | අභිප්‍රාය ලිපිය නිකුත් කරන ලදී. විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළ යුතුව පවතී. |
| මෙ.වො. (1~10) සුළං බලාගාර | 5 | 35 | ව්‍යාපෘති 3 ක් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කළ යුතුව පවතී. ව්‍යාපෘති 2 ක් පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂාවෙන් පවතී. |
| මෙ.වො. (1~10) සූර්ය බලාගාර | 23 | 147 | ව්‍යාපෘති 19 ක් සඳහා අභිප්‍රාය ලිපි නිකුත් කර ඇත. ව්‍යාපෘති 4 ක් සඳහා අභිප්‍රාය ලිපි නිකුත් කළ යුතුව පවතී. |
| **එකතුව** | | **335** | |

වගුව T4 : 2021 අවසානය වනවිට ටෙන්ඩර් ක්‍රියාවලිය සිදුවෙමින් පැවති ස.නො.පු.බ. ව්‍යාපෘති විස්තර

| ටෙන්ඩරය | (2021 වසර තුළ) සූර්ය විදුලිය මිලදී ගැනීම් ගිවිසුම් අත්සන් කළ | | (2021 වසර තුළ) අභිප්‍රාය ලිපි නිකුත් කරන ලද | |
|---|---|---|---|---|
| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) |
| සූර්ය | 39 | 66 | *20 | 124 |
| සුළං | - | - | 3 | 25 |

වගුව T5 : (2021 වසර තුළ) විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් හා අභිප්‍රාය ලිපි අදියරයන්හි පැවති ව්‍යාපෘති විස්තර

*2021 වසර තුළ අභිප්‍රාය ලිපි අත්සන් කළ ව්‍යාපෘති අතරින්, එක් (මෙ.වො. 10) සූර්ය බල ව්‍යාපෘතියක විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමද එම වසර තුළම අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2021 වසරේ අත්සන් කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් 39 තුළට ඇතුළත් කර ඇත.

තවත් මෙ.වො. 140 සූර්ය හා මෙ.වො. 40 සුළං බලාගාරයක් සඳහා ටෙන්ඩර් කැඳවීමට අපේක්ෂා කළද, අවාසනාවන්ත ලෙස මෙම ටෙන්ඩර් කාර්යයන් ආරම්භ නොකරන ලදී.

## සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා අතීත කාර්ය සාධනය




රූපය T8 : මෙහෙවරෙහි යොදවන ලද සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සමුච්චිත එකතුව (වහළය මත සවිකරන සූර්ය පැනල හැර)




රූපය T9 : සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මගින් බලශක්ති ජනනයට (වහළය මත සවිකරන සූර්ය පැනල හැර)




රූපය T10: ජාතික බලශක්ති ජනනයට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති දායකත්වය (වහළය මත සවිකරන සූර්ය පැනල හැර)




රූපය T11: 2021 වසර සඳහා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියෙහි තාක්ෂණයට අනුව බෙදුණු දායකත්වය (වහළය මත සවිකරන සූර්ය පැනල හැර)




රූපය T12 : 2021 වසරේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියෙහි සාමාන්‍ය පිරිවැය (වහළය මත සවිකරන සූර්ය පැනල හැර)

## සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයන්හි අනාගතය

ඉහත සඳහන් සංවර්ධනයනට අමතරව, පහත සඳහන් ව්‍යාපෘති වලද වැඩකටයුතු සිදුවෙමින් පවතී:

- පුනරින් මෙ.වො. 233 සුළං උද්‍යානය
- සියඹලාණ්ඩුව මෙ.වො. 100 සූර්ය උද්‍යානය
- මන්නාරම් දූපතේ අදියර II - මෙ.වො. 100 සුළං ව්‍යාපෘතිය
- මෙ.වො. 190 සූර්ය හා සුළං ටෙන්ඩරය (මෙ.වො. 150 සූර්ය හා මෙ.වො. 40 සුළං)

## උද්දීපනයන්

2021 වසර තුළද, මෙම අංශයට හා එහි කාර්ය බලකායට මුහුණ පෑමට සිදුවූ ප්‍රධානතම ගැටලුව වූයේ කොවිඩ් - 19 වසංගත තත්ත්වයයි. ප්‍රායෝගිකව ඉතා දුෂ්කර කාර්යයක් වූ දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශයනට යටත්ව විශේෂයෙන් නඩත්තුව ආශ්‍රිත කටයුතු සිදු කිරීමට සිදුවීම තුළ මෙම අභියෝගය වඩාත් තීව්‍ර විය.

## අනාගතය සඳහා වූ නව සැලසුම්

විදුලිබල අංශය සඳහා රජයේ නව ප්‍රතිපත්තිය මගින් අපේක්ෂිත කැපකිරීම් සපුරාලීමේදී කිසිදු බාධාවක් ඇති නොකෙරෙන සංවර්ධනයන් පමණක් සිදුකිරීමේ කොන්දේසිය සහිතව 2021 ඔක්තෝබර් මස 5 වන දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LCLTGEP) 2022-2041 අනුමත කරන ලදී. මෙලෙස කොන්දේසි මත අනුමත කරන ලද 2022-2041 අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම තුළ, ජලවිදුලි, තාප හා (සුළං, සූර්ය, කුඩා ජලවිදුලි හා ජෛවස්කන්ධ වැනි) සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගේද මුහුවක් සමගින් එළැඹෙන වසර 20 ක කාල පරිච්ඡේදය තුළ මෙ.වො. 13,184 ක ධාරිතාවයක් එක් කිරීමට සැලසුම් කර ඇත.

2030 වනවිට 70% ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවයක් සාක්ෂාත් කරගනිමින්, ගල් අඟුරු විදුලි බලාගාර ධාරිතා එක් කිරීමකින් තොරව, 2050 වනවිට කාබන් ශූන්‍යකරණය හෙවත් උදාසීනකරණ ඉලක්කයද සපුරා ගැනීම කළ යුතු බවට රජයේ නව ප්‍රතිපත්ති මාර්ගෝපදේශය තුළ සඳහන් වේ. රජයේ නව ප්‍රතිපත්ති මාර්ගෝපදේශයට අවකාශ සලසනු පිණිස ලං.වි.ම. විසින් මේවන විටද නව සැලැස්ම (අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2023-2042) සැකසීම සඳහා වූ අධ්‍යයන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

## පොම්පගත ගබඩාකරණය

2030 වනවිට පුනර්ජනනීය බලශක්තිය ජනනය 70% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කය සාක්ෂාත් කරගනු පිණිස, එළැඹෙන වසර අටක කාල පරිච්ඡේදය තුළ සූර්ය හා සුළං වැනි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් සැලකිය යුතු ජනන ධාරිතාවයක් එක් කළ යුතුව පවතී. සූර්ය හා සුළං බලය මගින් අපේක්ෂිත නිමැවුම්හිදී ස්ථාවර අඛණ්ඩ නිමැවුමක් ලබා නොදෙන අතර සම්පත් තීව්‍රතාව හා පවත්නා මට්ටමට අනුව එහි නිමැවුම විචලනය කරයි. තවද, එම බලාගාර බලශක්තිය අපතේ යැවීමකින් තොරව අවශ්‍ය අවස්ථාවන්හි නතර කිරීමද සිදුකළ නොහැක. මෙම ද්වි විධාකාර ගැටලු නිරාකරණය කරගනු පිණිස, විවිධාකාර වූ සූර්ය හා සුළං සම්පත්වලින් සිදු කෙරෙන ජනනය ගළපාලනු වස් වේගවත් විදුලි ගැලපීම් සිදු කිරීමටද හැකි අධි ධාරිතා බලශක්ති ගබඩාකරණ පද්ධතියක් විදුලි පද්ධතියට ස්ථාපනය කළ යුතුව පවතී. එවන් ස්ථාවර ධාරිතාවයක් එක් කිරීම සඳහා වඩාත් යෝග්‍ය හා කල් පවත්නා විසඳුම ලෙස ලං.වි.ම. විසින් පොම්පකල ගබඩාකරණ ජලවිදුලි බලාගාරයන් ඉදිකිරීමට (PSHP) හඳුනාගෙන ඇත.

ලං.වි.ම. විසින් පෙරදී සිදුකරන ලද අධ්‍යයනයන් මගින් පොම්පගත ගබඩාකරණ ජලවිදුලි බලාගාර සංවර්ධනය සඳහා වැඩබිම් දෙකක් වෙන් කරන ලදී. මහඔය ද්‍රෝණියේ මහ ඔය වැඩබිම හා වික්ටෝරියා ජලාශයේ ඉහල කොටසේ පිහිටි වික්ටෝරියා - වැවතැන්න වැඩබිම වශයෙනි. ලං.වි.ම. විසින් උක්ත වැඩබිම් මත පදනම්ව පොම්පගත ගබඩාකරණ ජලවිදුලි බලාගාරයක් ඉදිකිරීම සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනය හා සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය සිදුකරනු සඳහා උපදේශක මණ්ඩලයක් තෝරා ගැනීමේ උපදේශන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කොට ඇත. මෙම අධ්‍යයන කටයුතු 2022 මැද භාගයේදී ආරම්භ කිරීමට සැලසුම් කොට ඇත.

## හරිත බලශක්ති මාර්ගය

2030 වසර වනවිට 70% ක් පුනර්ජනනීය බලශක්තිය වශයෙන් ලබාගැනීමේ රජයේ නව ප්‍රතිපත්ති මාර්ගෝපදේශයට අනුගතව මේවන විට අවම පිරිවැය දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම 2023 - 2032 ආශ්‍රිත අධ්‍යයන කටයුතු සිදු වෙමින් පවතී. ඒ හා සමාන්තරව, ප්‍රධාන අභියෝගයන් විමර්ශනය කරමින් ජාලය වෙත පුනර්ජනනීය බලශක්ති පදනම්ගත ජනනයන් ඒකාබද්ධ කිරීමේදී අවශ්‍යවන ප්‍රශස්ත විසඳුම් නිර්ණය කිරීමේ අදහසින් 'ශ්‍රී ලංකාවේ ජාලය තුළට පුනර්ජනනීය පදනනම්ගත ජනනයන් ඒකාබද්ධ කිරීම 2023-2042' නම් වූ අධ්‍යයනයක් සිදු වෙමින් පවතී. එය කොටස් තුනකින් සමන්විත වේ. දිගු කාලීන ජනන ව්‍යාප්තිය, විදුලි පද්ධති මෙහෙයුම් අධ්‍යයනය හා සම්ප්‍රේෂණ ජාල අධ්‍යයනයන් වශයෙනි.

ප්‍රධාන වශයෙන්ම සම්ප්‍රේෂණ ජාලය හා ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර හා දකුණු කොටස්වල පවත්නා රැස්කිරීමේ උපපොළයන් ඉලක්ක කරගනිමින් පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතු ආරම්භ කොට ඇත. මෙම අධ්‍යයන මගින් සමස්ථ විදුලි සම්ප්‍රේෂණ පද්ධතියට අදාල පහසුකම් සංවර්ධන අවශ්‍යතාවයන් සහ ඒ ආශ්‍රිත පිරිවැයන්ද හඳුනාගනු ඇත.

## නව කොටුමා උපපොළයන්

පහත සඳහන් කොටුමා උපපොළයන් මෙහෙවරෙහි යොදවන ලදුව 2021 වසර තුළ ඒවාහි මෙහෙයුම් හා නඩත්තු කටයුතු සම්ප්‍රේෂණ අංශය වෙත භාරදෙන ලදී. මෙයට අමතරව, පැරණි අනුරාධපුර කොටුමා උපපොළ වෙනුවට අනුරාධපුර කි.වෝ. 132 කොටුමා උපපොළ පිහිටුවන ලදී.

| කොටුමා උපපොළ | වෝල්ටීයතා මට්ටම | ධාරිතාවය |
|---|---|---|
| නාවලපිටිය | කි.වෝ. 132/33 | මෙ.වෝ.ඇ. 63 |
| රාගල | කි.වෝ. 132/33 | මෙ.වෝ.ඇ. 63 |
| වරාය (උප L) | කි.වෝ. 220/132 | මෙ.වෝ.ඇ. 500 |
| නාවලපිටිය | කි.වෝ. 220/33 | මෙ.වෝ.ඇ. 126 |


20'
20'

# බෙදාහැරීමේ අංශ

සමස්ත අලෙවි ධාරිතාවයෙන් 89% ක් වන පරිදි රටතුළ විදුලිය බෙදා හැරීමේ ප්‍රධාන කොටසක් ලං.වි.ම. විසින් ආවරණය කරනු ලබන අතර ඉතිරි කොටස අනු ආයතනයක් වන ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් බෙදාහරිනු ලබයි.

සමස්ත ලං.වි.ම. බෙදාහැරීමේ පද්ධතිය බෙදාහැරීමේ අංශය 1 (DD1), බෙදාහැරීමේ අංශය 2 (DD2), බෙදාහැරීමේ අංශය 3 (DD3) හා බෙදාහැරීමේ අංශය 4 (DD4) ලෙස භූගෝලීය වශයෙන් අංශ හතරකට වෙන්කර ඇත. මෙම වෙන්කිරීම ප්‍රධාන කොටම පරිපාලන හා ක්‍රියාත්මක කිරීමේ පහසුව හා සැපයුමේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු වස් උසස් මට්ටමේ තරඟකාරිත්වයක් ඇතිකර ගැනීම සඳහා සිදුකොට ඇත.

බෙදාහැරීමේ ජාලය කි.වෝ. 33 හා කි.වෝ. 11 මැදි වෝල්ටීයතා (MV) මාර්ග, වෝ. 400 අඩු වෝල්ටීයතා (LV) මාර්ග හා බෙදාහැරීමේ තරාපැව්වලින් සමන්විත වේ. කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ පද්ධති මගින් බෙදාහැරීමේ ජාලය වෙත දිවයින පුරා පිහිටි කොටුමා උපපොළයන් හරහා විදුලිය ගමන් කරවනු ලබයි.

## මෙහෙයුම් ව්‍යුහය

සෑම අංශයක්ම ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයා වෙත සෘජුව වාර්තා කරන අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ පාලනය වේ. බෙදාහැරීමේ අංශ පළාත්වලට බෙදා ඇති අතර (මෙම පරිච්ඡේදය තුළ සීමා මායිම්කොට ඇති පළාත් නිශ්චිතවම රටේ පරිපාලනමය පළාත් සීමාවන්ම නොවිය හැක), ඒ සෑම පළාතකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් දරනු ලබයි. එක් එක් අංශය යටතේ පවතින පළාත් පහත දක්වා ඇත.

| අංශයේ නම | පළාත |
|---|---|
| අංශය 1 (බෙ.අ. 1) | කොළඹ නගරය, වයඹ I, වයඹ II, උතුරු මැද පළාත හා උතුරු පළාත |
| අංශය 2 (බෙ.අ. 2) | බස්නාහිර පළාත උතුර, මධ්‍යම පළාත I, මධ්‍යම පළාත II හා නැගෙනහිර පළාත |
| අංශය 3 (බෙ.අ. 3) | බස්නාහිර පළාත දකුණ II, ඌව පළාත හා සබරගමුව පළාත |
| අංශය 4 (බෙ.අ. 4) | බස්නාහිර පළාත දකුණ I, දකුණු පළාත I හා දකුණු පළාත II |

සේවා සම්පාදනය කෙරෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව පදනම් කරගනිමින් පළාතක් ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරුවරයෙකු හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරයෙකු විසින් කළමනාකරණය කෙරෙන ප්‍රදේශ කිහිපයකට බෙදේ. ප්‍රදේශයක් තවදුරටත් විදුලි අධිකාරීවරයෙකු යටතේ පාලනය වන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSCs) ගණනාවකට බෙදේ.

## මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය I වයඹ 1, වයඹ 11, උතුරු මැද, උතුරු හා කොළඹ මහ නගර සභා ප්‍රදේශය ලෙස පළාත් පහකින් සමන්විත වේ.

උතුරු මැද පළාත ප්‍රදේශ තුනකට බෙදා ඇති අතර උතුරු පළාත ප්‍රදේශ හතරකට බෙදා ඇත. 2021 වනවිට වයඹ පළාත I ප්‍රදේශ හතරකටද, වයඹ පළාත II ප්‍රදේශ හතරකටද කොළඹ නගරය පළාත ප්‍රදේශ හතරකටද බෙදා ඇත.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | වයඹ I | හලාවත, කුලියාපිටිය, වෙන්නප්පුව, පුත්තලම |
| | වයඹ II | කුරුණෑගල, වාරියපොල, නාරම්මල හා මහව |
| | උතුරු මැද | අනුරාධපුර, කැකිරාව හා මින්නේරිය |
| | උතුරු | යාපනය, යාපනය නැගෙනහිර, කිලිනොච්චිය හා වව්නියාව |
| | කොළඹ නගරය | කොළඹ උතුර, කොළඹ දකුණ, කොළඹ බටහිර හා කොළඹ නැගෙනහිර |

බෙදාහැරීමේ අංශය 2 මගින් ප්‍රාදේශීය කාර්යාල 25 ක් හරහා සමස්ත නැගෙනහිර හා මධ්‍යම පළාත්ද බස්නාහිර හා සබරගමුව පළාත්වල කොටස් කිහිපයක්ද ආවරණය කෙරේ. 2021 වනවිට පළාත් හතර අතරින්, නැගෙනහිර පළාත ප්‍රදේශ පහකටද, මධ්‍යම පළාත I ප්‍රදේශ හයකටද, මධ්‍යම පළාත II ප්‍රදේශ හතකටද බස්නාහිර උතුරු පළාත ප්‍රදේශ හතකටද බෙදී ඇත.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 2 | නැගෙනහිර | අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වාලච්චේන හා කල්මුණේ |
| | මධ්‍යම පළාත I | දඹුල්ල, ගලගෙදර, මහනුවර නගරය, කටුගස්තොට, කුණ්ඩසාලේ, මාතලේ |
| | මධ්‍යම පළාත II | කෑගල්ල, මාවනැල්ල, පේරාදෙණිය, නුවරඑළිය, ගිණිගත්හේන, නාවලපිටිය, හඟුරන්කෙත |
| | බස්නාහිර උතුරු පළාත | ගම්පහ, කැළණිය, මීගමුව, ජා-ඇල, දිවුලපිටිය, වේයන්ගොඩ හා කිරිඳිවැල |

බෙදාහැරීමේ අංශය 3 මගින් බස්නාහිර පළාතේ කොටසක් (බස්නාහිර පළාත දකුණ II), සබරගමුව පළාත හා ඌව පළාතද ආවරණය කරනු ලබයි. 2021 වනවිට පළාත් තුන අතරින්, බස්නාහිර පළාත දකුණ II හා සබරගමුව පළාත පිළිවෙලින් ප්‍රදේශ පහ බැගින් කොටස්වලට බෙදා ඇති අතර ඌව පළාත පළාත් හතරකට බෙදා ඇත.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 3 | බස්නාහිර පළාත දකුණ II | බණ්ඩාරගම, හෝමාගම, අවිස්සාවේල්ල, ශ්‍රී ජයවර්ධනපුර හා හොරණ |
| | සබරගමුව | රත්නපුර, කහවත්ත, රුවන්වැල්ල, ඇහැලියගොඩ හා ඇඹිලිපිටිය |
| | ඌව | බදුල්ල, දියතලාව, මොණරාගල හා මහියංගනය |

බෙදාහැරීමේ අංශය 4 මගින් බස්නාහිර පළාතේ කොටසක්ද (බස්නාහිර පළාත දකුණ I), සමස්ත දකුණු පළාතම හා සබරගමුව හා ඌව පළාත්හි කොටස් කිහිපයක්ද ආවරණය කරනු ලබයි. 2021 වනවිට බස්නාහිර පළාත දකුණ I මගින් ප්‍රදේශ හතරක්ද, දකුණු පළාත I මගින් ප්‍රදේශ තුනක්ද ආවරණය කරනු ලබයි.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 4 | දකුණු පළාත I | අම්බලන්ගොඩ, ගාල්ල, අකුරැස්ස හා බද්දේගම |
| | දකුණු පළාත II | තංගල්ල, හම්බන්තොට හා මාතර |
| | බස්නාහිර පළාත දකුණ I | රත්මලාන, කළුතර, දෙහිවල හා මතුගම |

පළාත්වලට අමතරව, ඒ එක් එක් අංශයෙහි මෙහෙයුම් කටයුතු තිරසරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහාය සේවා සිදු කරනු පිණිස සියලු ප්‍රදේශයන්හි වෙන් වෙන් වශයෙන් වූ ශාඛා තුනක් ස්ථාපනය කොට ඇත. ඒවා නම්, ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව, සැලසුම් හා සංවර්ධන ශාඛාව සහ වාණිජ හා ආයතනික ශාඛාව වේ. බෙදාහැරීමේ අංශය 1 බෙදාහැරීමේ සම්බන්ධීකරණ ශාඛාවකින්ද සමන්විත වේ.

## බෙදාහැරීමේ අංශයන්හි ප්‍රධාන අරමුණු

- අංශය තුළ සියලු පාරිභෝගිකයන් වෙත විශ්වසනීය හා ගුණාත්මක විදුලිය සැපයුමක් සම්පාදනය.
- විදුලිය අලෙවි කිරීම හා වර්තමාන ඉල්ලුම සපුරාලමින් අනාගත ඉල්ලුම සඳහා සැලසුම් කරන අතර වියදම් සපුරාලනු සඳහා සැලසුම්ගත ආදායම් සාක්ෂාත් කරගැනීම.
- වර්තමාන කර්මාන්තයේ වඩාත් දෘඪතර ප්‍රමිතීන් සපුරාලමින් උසස් ගුණාත්මකභාවයෙන් යුත්, ඵලදායී හා ආරක්ෂක තාක්ෂණයන් සමගින් උපරිම පාරිභෝගික තෘප්තිය සහතික කරමින් සියලු දෙනා හට විදුලිය සම්පාදනය.
- පද්ධති අලාභ අවම කරන අතර ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුගත වනු පිණිස විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරනු වස් විදුලිය බෙදාහැරීමේ පද්ධතියේ සංවර්ධනය සහතික කිරීම.
- නඩත්තු සේවා හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඒකාබද්ධ කරමින් වැඩිදියුණු කිරීම.
- විදුලිය බෙදාහැරීම සඳහා නව තාක්ෂණයක් සංවර්ධනය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඒකාබද්ධ කරමින් වැඩිදියුණු කිරීම.
- නිසි කාර්ය බලකායක් ලබාගනිමින් ආරක්ෂාකාරී, සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් පවත්වා ගනිමින් ඔවුන්ගේ සාර්ථකත්ව අපේක්ෂාවන් උපරිම කිරීම.
- මෙහෙයුම් කටයුතු සිදුවන ස්ථානයන්හි පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය සඳහා කැපවීම.
- පවත්නා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාර පුනර්ජනනීය අවශෝෂණයන් සඳහා පහසුකම් සැලසීම.

## ලං.වි.ම. බෙදා. අංශ

**අංශය - 1**

උතුරු
N1 යාපනය
N2 කිලිනොච්චි
N3 වව්නියාව
N4 යාපනය නැගෙනහිර

උතුරු මැද
NC1 අනුරාධපුර
NC2 කැකිරාව
NC3 මින්නේරිය

වයඹ I
NW1-1 වෙන්නප්පුව
NW1-2 කුලියාපිටිය
NW1-3 හලාවත
NW1-4 පුත්තලම

වයඹ II
NW2-1 නාරම්මල
NW2-2 කුරුණෑගල
NW2-3 වාරියපොල
NW2-4 මහව

කොළඹ නගර
CO කොළඹ උතුර
කොළඹ දකුණ
කොළඹ නැගෙනහිර
කොළඹ බටහිර

**අංශය - 2**

බස්නාහිර උතුර
WN1 මීගමුව
WN2 වේයන්ගොඩ
WN3 ජා - ඇල
WN4 කැළණිය
WN5 ගම්පහ
WN6 දිවුලපිටිය
WN7 කිරිඳිවැල

මධ්‍යම පළාත I
CP1-1 මාතලේ
CP1-2 කටුගස්තොට
CP1-3 කුණ්ඩසාලේ
CP1-4 මහනුවර නගරය
CP1-5 දඹුල්ල
CP1-6 ගලගෙදර

මධ්‍යම පළාත II
CP 2-1 ගිනිගත්හේන
CP2-2 නාවලපිටිය
CP2-3 නුවරඑළිය
CP2-4 පේරාදෙණිය
CP2-5 හඟුරන්කෙත
SA1 කෑගල්ල
SA2 මාවනැල්ල

නැගෙනහිර
E1 ත්‍රිකුණාමලය
E2 මඩකලපුව
E3 අම්පාර
E4 කල්මුනේ
E5 වාලච්චේන

**අංශය - 3**

බස්නාහිර දකුණ II
WS1 ශ්‍රී ජයවර්ධනපුර
WS2 අවිස්සාවේල්ල
WS5 හෝමාගම
WS6 හොරණ
WS7 බණ්ඩාරගම

සබරගමුව
SA3 රුවන්වැල්ල
SA4 ඇහැලියගොඩ
SA5 රත්නපුර
SA6 කහවත්ත
SA7 ඇඹිලිපිටිය

ඌව
U1 දියතලාව
U2 බදුල්ල
U3 මොණරාගල
U4 මහියංගනය

**අංශය - 4**

බස්නාහිර දකුණ I
WS3 දෙහිවල
WS4 රත්මලාන
WS8 කළුතර
WS9 මතුගම

දකුණ I
S1-1 අම්බලන්ගොඩ
S1-2 බද්දේගම
S1-3 ගාල්ල
S1-4 අකුරැස්ස

දකුණ II
S2-1 මාතර
S2-2 තංගල්ල
S2-3 හම්බන්තොට



## බෙදාහැරීමේ අංශවල විහිදුම් පරාසය

| විස්තරය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ.3 | බෙ.අ.4 |
|---|---|---|---|---|
| සේවා ප්‍රදේශය (වර්ග කි.මී.)* | 26,929 | 17,935 | 12,178 | 6,870 |
| ප්‍රදේශ (සංඛ්‍යාව) | 19 | 25 | 14 | 11 |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 58 | 91 | 53 | 42 |
| ලංකා විදුලිබල මණ්ඩලය මෙහෙයවන එකතු කිරීමේ මධ්‍යස්ථාන(සංඛ්‍යාව) | 21 | 21 | 13 | 27 |
| පාලන මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 3 | 3 | 0 |
| ඇමතුම් මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 3 | 3 | 2 |
| තොග පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 4,846 | 3,901 | 2,357 | 1,953 |
| සිල්ලර පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 1,961,369 | 2,335,704 | 1,381,462 | 1,117,934 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් දර්ශකය (SAIDI) (විනාඩි/වර්ෂය) | 3,215 | 3,995 | 5,041 | 3,896 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් වාර දර්ශකය (SAIFI) (වර්ෂයකට/අතුරු බිඳුම්/පාරිභෝගිකයන්) | 17 | 38.4 | 48.6 | 28.7 |

*විදුලි ජාලයක් නොමැති වනාන්තර හා දූපත් හැර

## 2021 වසර තුළ බෙදාහැරීමේ යටිතල පහසුකම් සංවර්ධනය

වසර තුළ බෙදාහැරීමේ රැහැන්/උපපොළ එක් කිරීම් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත. ගෝලීය ස්ථානගතකරණ පද්ධති පදනම්ගත නිවැරදි දත්ත රැස්කිරීමේ ක්‍රියාවලියකින් අනතුරුව රැහැන් දිග නිවැරදි කිරීම්ද සිදුකර ඇති බවට නිරීක්ෂණය වී ඇත.

| විස්තරය | ඒකක | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | සමුච්චිත එකතුව |
|---|---|---|---|---|---|---|
| බෙදාහැරීමේ රැහැන් (උඩිස්) | | | | | | |
| කි.වෝ. 33 | කි.මී. | - | 126 | 215 | - | 33,269 |
| කි.වෝ. 11 | කි.මී. | 19 | - | - | 44 | 1,413 |
| අඩු වෝල්ටීයතා | කි.මී. | - | 1,033 | 395 | - | 149,205 |
| යටිබිම් බහන් | | | | | | |
| කි.වෝ. 33 | කි.මී. | - | - | 0.2 | 0.4 | 48 |
| කි.වෝ. 11 | කි.මී. | 23 | 4 | - | 5 | 1,036 |
| අඩු වෝල්ටීයතා | කි.මී. | 12 | - | 5 | - | 817 |
| උපපොළ | | | | | | |
| කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ | සංඛ්‍යාව | 1 | 1 | - | 02 | 137 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උපපොළ | සංඛ්‍යාව | - | 376 | 257 | 185 | 35,290 |
| වෙනත් | | | | | | |
| අටලු අංගන | සංඛ්‍යාව | 8 | 31 | 0 | 0 | 292 |
| A/R | සංඛ්‍යාව | 61 | - | 10 | 17 | 1,351 |

## 2021 වර්ෂයේ සුවිශේෂ කාර්යසාධනයන්

| විස්තරය | ඒකක | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | සමුච්චිතඑකතුව |
|---|---|---|---|---|---|---|
| අංශය විසින් මිලදී ගත් ඒකක | ගි.වො.පැ. | 4,381 | 4,987 | 2,876 | 2,153 | 14,397 |
| අංශය තුළ අලෙවි කළ ඒකක | ගි.වො.පැ. | 4,129 | 4,766 | 2,675 | 2,010 | 13,580 |
| අලෙවි කළ ඒකකවලින් උපයාගත් ආදායම | ශ්‍රී ලං.රු.මි. | 73,868 | 75,522 | 43,254 | 33,528 | 226,172 |
| සාමාන්‍ය විකුණුම් මිල | ශ්‍රී ලං.රු. | 17.89 | 15.85 | 16.17 | 16.68 | 16.65 |
| බෙදාහැරීමේ අලාභය | % | 6.08 | 5.17 | 7.55 | 6.75 | 6.16 |
| වර්ෂය තුලදී ලබාදුන් නව සම්බන්ධතා | සංඛ්‍යාව | 49,311 | 62,890 | 35,870 | 25,191 | 173,262 |

## මෙහෙයුම් දත්ත

### අයකුම වර්ගය අනුව ගිණුම් සංඛ්‍යාව - 2021

(සංඛ්‍යාව)

| අයකුමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,659,019 | 2,025,000 | 1,212,250 | 979,289 | 5,875,558 |
| ආගමික | 14,308 | 14,445 | 7,833 | 6,052 | 42,638 |
| කර්මාන්ත | 38,102 | 15,676 | 9,099 | 6,723 | 69,600 |
| හෝටල් | 113 | 240 | 39 | 159 | 551 |
| රජයය | 2,163 | 2,880 | 2,813 | 1,507 | 9,363 |
| පොදු කාර්ය | 252,510 | 281,364 | 151,785 | 126,157 | 811,816 |
| **එකතුව** | **1,966,215** | **2,339,605** | **1,383,819** | **1,119,887** | **6,809,526** |

### අයකුම කාණ්ඩයට අනුව අලෙවිය 2021

(ගි.වො.පැ.)

| අයකුමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,531 | 1,789 | 1,016 | 902 | 5,238 |
| ආගමික | 32 | 25 | 12 | 12 | 81 |
| කර්මාන්ත | 1,065 | 2,059 | 1,110 | 588 | 4,822 |
| හෝටල් | 101 | 49 | 6 | 63 | 219 |
| රජයය | 95 | 60 | 25 | 46 | 226 |
| පොදු කාර්ය | 1,267 | 747 | 502 | 380 | 2,896 |
| වීථි ලාම්පු | 38 | 37 | 4 | 19 | 98 |
| **එකතුව** | **4,129** | **4,766** | **2,675** | **2,010** | **13,580** |

### අයකුම කාණ්ඩයට අනුව ආදායම - 2021

(ශ්‍රී ලං.රු.මි.)

| අයකුමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 24,140 | 25,771 | 14,475 | 13,694 | 78,080 |
| ආගමික | 239 | 177 | 81 | 85 | 582 |
| කර්මාන්ත | 15,935 | 29,874 | 16,241 | 8,709 | 70,759 |
| හෝටල් | 1,726 | 928 | 123 | 1,125 | 3,902 |
| රජයය | 1,774 | 1,104 | 459 | 806 | 4,143 |
| පොදු කාර්ය | 30,054 | 17,666 | 11,875 | 9,109 | 68,704 |
| වීථි ලාම්පු | 0 | 2 | 0 | 0 | 2 |
| **එකතුව** | **73,868** | **75,522** | **43,254** | **33,528** | **226,172** |

### පාරිභෝගික ගිණුම්වල වසර පහක ප්‍රගතිය




| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| බෙ.අ. 1 | 1,782,105 | 1,832,829 | 1,875,852 | 1,916,904 | 1,966,215 |
| බෙ.අ. 2 | 2,122,740 | 2,178,082 | 2,229,774 | 2,276,715 | 2,339,605 |
| බෙ.අ. 3 | 1,260,090 | 1,291,700 | 1,320,826 | 1,347,949 | 1,383,819 |
| බෙ.අ. 4 | 1,028,194 | 1,051,668 | 1,074,187 | 1,094,696 | 1,119,887 |




රූපය D 1 : විදුලියන මට්ටම වසර 2020/2021

## ප්‍රගති මිනුම්-2021 වසර

### විදුලියනය සඳහා වූ ප්‍රවේශය

විදුලිය සඳහා සරල, පහසු ප්‍රවේශයක් සහිත, දෙනලද පළාතක වාසය කරන ජන ප්‍රතිශතය අදාළ පළාතේ සංවර්ධන මට්ටමට අනුව වෙනස් වේ. පළාත් පහළව අතරින්, කොළඹ නගර, බස්නාහිර පළාත උතුර, බස්නාහිර පළාත දකුණ I හා දකුණු පළාත I සහ දකුණු පළාත II යන පළාත් පහ සඳහා 100% ක විදුලිය ප්‍රවේශයක් පවතී. විදුලියන ප්‍රතිලාභ සලකා බැලීමේදී, ප්‍රදානකරු නියෝජිතායතන, ශ්‍රී ලංකා රජය හා ලං.වි.ම. මූල්‍ය කැපකිරීම් හරහා 100% ක විදුලිය ප්‍රවේශයක් සාක්ෂාත් කරගනු පිණිස ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.

### විදුලියන යෝජනාක්‍රම හා ව්‍යාප්ති

ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරනු පිණිස ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම හඳුන්වා දී තිබිණි. 2021 වසර තුළ ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම 30 ක් පමණද, ව්‍යාප්ති යෝජනාක්‍රම 650 කට වැඩි සංඛ්‍යාවක්ද රු. මිලියන 466 ක සමස්ත පිරිවැයක් යොදා සම්පූර්ණ කෙරිණි.

### වහළය මත සවි කරන සූර්ය පැනල

ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා ශුද්ධ ධන (Net Plus) යන යෝජනාක්‍රම තුනක් යටතේ බලශක්තිය පරිභෝජනය කරන අතරම අපනයනය කරන ආකාරයෙන් සිය පරිශ්‍රයන් තුළ වහළය මත සවි කරන සූර්ය පැනල මගින් විදුලිය ජනනය කරමින් සිය ජනන යන්ත්‍ර ලං.වි.ම. පද්ධතිය හා ඒකාබද්ධ කිරීමට විදුලිය පාරිභෝගිකයන් හට අවසර ලබාදී ඇත.

| | බෙ.අ. 1 | | බෙ.අ. 2 | | බෙ.අ. 3 | | බෙ.අ. 4 | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාරිභෝගික (සංඛ්‍යා) | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | පාරිභෝගික (සංඛ්‍යා) | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | පාරිභෝගික (සංඛ්‍යා) | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | පාරිභෝගික (සංඛ්‍යා) | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | පාරිභෝගික (සංඛ්‍යා) | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) |
| ශුද්ධ මානනය | 3,342 | 26 | 2,225 | 16 | 2,243 | 12 | 1,961 | 14 | 9,771 | 68 |
| ශුද්ධ ගිණුම්කරණය | 4,256 | 39 | 4,394 | 40 | 3,002 | 25 | 3,579 | 32 | 15,231 | 136 |
| ශුද්ධ ධන | 860 | 52 | 428 | 71 | 357 | 49 | 421 | 38 | 2,066 | 210 |
| **එකතුව** | **8,458** | **117** | **7,047** | **127** | **5,602** | **86** | **5,961** | **84** | **27,068** | **415** |

## උද්දීපනයන්

### සැමට විදුලිය

රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ශ්‍රී ලංකාවේ විදුලිය රහිත සියලු නිවාස වෙත නොමිලයේ විදුලි සම්බන්ධතාවයන් ලබාදීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් "සැමට විදුලිය" වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සඳහා 2021 ජාතික අයවැය මගින් රු. මිලියන 750 ක් වෙන්කර ඇත.

සමෘද්ධි නිලධාරීන් හරහා සිදුකරන ලද සමීක්ෂණයකින් අනතුරුව සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් විදුලිය රහිත නිවාස පිළිබඳ ලැයිස්තුව ලබාගෙන තිබූ අතර, නිවාස 115,925 ක් හඳුනා ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2021 මාර්තු මස 6 වන දින මෙම වැඩසටහන යටතේ පළමු විදුලි සම්බන්ධතාවය ගිරිබාව ප්‍රදේශයේදී ලබාදෙන ලදී. වසර අවසානය වනවිට, පනවන ලද රෙගුලාසිය ප්‍රකාර සිය අභ්‍යන්තර රැහැන් ඇදීමේ කටයුතු සම්පූර්ණ කොට තිබූ නිවාස වෙත විදුලි සම්බන්ධතා ලබාදෙන ලදී.





## සූර්ය බල සංග්‍රාමය

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) හා ලංකා විදුලි (පෞද්ගලික) සමාගම යන ආයතනයන්හි සහාය සහිතව විදුලිය පාරිභෝගිකයන්ගේ නිවාස/පරිශ්‍රයන්හි විදුලිය වහළය මත සවිකරන සූර්ය පැනලයන් ඔස්සේ ජාතික ජාලය වෙත ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රජා පාදක සූර්ය විදුලි ජනන වැඩසටහනක් වන සූර්ය බල සංග්‍රාමය නමැති විදුලි ජනන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

මෙමගින් නිවාස, ආගමික ස්ථාන, හෝටල්, වාණිජ ආයතන හා කර්මාන්තවල කුඩා සූර්ය බලාගාර ස්ථාපනය කිරීමේ කාර්යය ප්‍රවර්ධනය කරනු ලබයි. මෙම මැදිහත්කරණය හරහා 2025 වනවිට ජාතික ජාලය වෙත සූර්ය විදුලිය මෙ.වො. 1000 ක් ද 2030 වනවිට මෙ.වො. 1500 ක්ද එක් කිරීමට අපේක්ෂිතය. මෙම වැඩසටහන යටතේ, පාරිභෝගිකයන් හට සිය පරිශ්‍රයන් තුළ විදුලිය ජනනය කොට පරිභරණය කිරීමේ විකල්පයන් විවර වනු ඇත. ජනිත විදුලිය ප්‍රමාණය සිය අවශ්‍යතාවය ඉක්මවා ඇති විටෙකදී, ඔවුනට අතිරික්තය ජාතික ජාලයට අලෙවි කිරීම හෝ පසු කාලීන පරිභරණය සඳහා බැංකුගත කිරීම සිදුකළ හැක. විදුලිය පරිභරණයට අනුව, පාරිභෝගිකයා හට ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා ශුද්ධ ධන (Net Plus) යන යෝජනාක්‍රම තුන අතරින් වඩා කැමති විකල්පයක් තෝරාගත හැක. ස්ථාපන සේවය ලියාපදිංචි සූර්ය සේවා සම්පාදනායතනයක් වෙතින් ලබාගත යුතුවේ.

2021 දෙසැම්බර් මාසය වනවිට උක්ත වැඩසටහනේ ප්‍රගතිය පහත පරිදි වේ:

| | ශුද්ධ මානනය | ශුද්ධ ගිණුම්කරණය | ශුද්ධ ධන | එකතුව |
|---|---|---|---|---|
| සූර්ය බල පාරිභෝගිකයන් සංඛ්‍යාව | 9,771 | 15,231 | 2,066 | 27,068 |
| ස්ථාපිත සූර්ය ධාරිතාව (මෙ.වො.) | 68.5 | 136.3 | 210.4 | 415.1 |



තම්බපවණී සුළං බලාගාරය

# ව්‍යාපෘති අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශය (විදේශ අරමුදල්ගත/ශ්‍රී ලංකා රජයේ/ලං.වි.ම. අරමුදල්ගත) ප්‍රධාන ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2010 වසරේදී පිහිටුවන ලදී. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් ධාරිතා ප්‍රවර්ධනය හා සමස්ත විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සම්බන්ධ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. ව්‍යාපෘති අංශය අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ පාලනය වේ. ඔහු යටතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් පස් දෙනෙකුද, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් එකොළොස් දෙනෙකුද එක් අතිරේක මූලය කළමනාකරුවෙකුද ව්‍යාපෘති අංශයේ අරමුණු ඉටු කිරීම සඳහා කටයුතු කරනු ලබයි.

ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක සම්ප්‍රේෂණ නිර්මාණ ශාඛාව සවිස්තරාත්මක කාර්ය විෂය පථය හා මණ්ඩලය විසින් අනුමත ව්‍යාපෘති පිරිවිතරයන් සැකසීම, පාරිසරික අනුමැතීන් ලබාගැනීම, ටෙන්ඩර්කරණ අවධියේදී තාක්ෂණික ඇගයීම් කමිටුවලට (TEC) සහාය වීම, නිර්මාණ ලේඛන සමාලෝචනය හා අනුමැතිය, කර්මාන්තශාලා පිළිගැනුම් පරීක්ෂණ ප්‍රොටෝකෝලයන් හා කර්මාන්තශාලා පිළිගැනුම් පරීක්ෂණ ප්‍රතිඵල සමාලෝචනය හා අනුමැතිය සහ ව්‍යාපෘති ඉදිකිරීම් අදියරේදී ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට සහාය වීම හා සැලසුම් ආශ්‍රිත ගැටලුවලට අවධානය යොමු කිරීමද සිදුකරයි.

වසංගත තත්වයන් යටතේ වුවද අංශය විසින් රු. බිලියන 34.4 ඉක්මවූ ව්‍යාපෘති කටයුතු කළමනාකරණය කිරීමට සිදුවූ බැවින් 2021 වසර ව්‍යාපෘති අංශයට තවත් අභියෝගාත්මක වසරක් විය.

2021 වසර තුළ සිදුකරන ලද ව්‍යාපෘති කටයුතු පිළිබඳ විස්තරයක් පහත ඇත.

### මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය - අදියර I

මෙ.වො. 103.5 ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිතව "තම්බපවනි" නමැති සිය පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරය 2021.05.18 දින ලං.වි.ම. විසින් පූර්ණ වශයෙන් මෙහෙවරෙහි යොදවන ලදී. මෙම බලාගාරය සතුව මන්නාරම දූපත් වෙරළ තීරයට වන්නට පිහිටි නවීන තාක්ෂණයෙන් යුත් සුළං තලබමර ජනන යන්ත්‍ර තිස් තුනක් (33) පවතී.

ජාතික ජාලය වෙත මහා පරිමාණ සුළං විදුලි බලය අන්තර්ග්‍රහණය කිරීමේ මෙහෙයුම් කටයුතු පිළිබඳ අවබෝධයක් ලබාදීමේ පූර්වගාමී ව්‍යාපෘතිය බවට පත්වෙමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළ ශ්‍රී ලංකාවේ සුළං විදුලි බල ජනනයේ සංදිස්ථානයක් සනිටුහන් කෙරිණි. ව්‍යාපෘතියට අවශ්‍ය සම්ප්‍රේෂණ යටිතල පහසුකම්ද සමගින් ආසියානු සංවර්ධන බැංකුව විසින් සමස්ත ව්‍යාපෘතියට අරමුදල් සම්පාදනය කරන ලදී.

නවීන සුළං පුරෝකථන පද්ධතියක සහාය ලබන්නාවූ තම්බපවනි විදුලි බලාගාරය අර්ධ වශයෙන් වෙළඳපල අවශ්‍යතාවනට අනුව ගැලපිය හැකි ආකාරයෙන් ක්‍රියාත්මක වීමේ හැකියාවද සහිතය. තවද, එක් එක් තලබමර ජනන යන්ත්‍රය ජාල කේත තත්ත්වයන් හා අනුගත වේ. පක්ෂීන් ගැටීමේ හැකියාවක් පිළිබඳ සංවේදනය වන විටදී ස්වයංක්‍රීයව සුළං තලබමරය තෝරා ඒවා වසා දැමෙන ආකාරයෙන් ක්‍රියාත්මක නවීන තාක්ෂණයෙන් යුත් පක්ෂි පරීක්ෂක රේඩාර් පද්ධතියක්ද මෙම බලාගාරය සතුවේ.



රූපය P1: මන්නාරම වැඩබිම

### බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය

මෙය වූකලි කිතුල්ගල නගරය ආසන්නයේ කොළඹින් කි.මී. 90 ක් පමණ ඊසාන දිගට වන්නට පිහිටි, කැළණි නදිය මත ගොඩනගන ලද ගලන නදී දියෙන් ක්‍රියාත්මක වර්ගයේ ව්‍යාපෘතියකි.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ පවත්නා පොල්පිටිය විදුලි බලාගාරයේ පහළ ධාරාවේ ජල විභවයෙන් ඵල නෙළා ගැනීමයි.

| ස්ථාපිත ධාරිතාව මෙ.වො. 2 X 17.5 | |
|---|---|
| කොන්ත්‍රාත්කරු | China National Electric Equipment Corporation Ltd, (CNEEC) |
| ඇස්තමේන්තුගත පිරිවැය | එ.ජ.ඩො. මිලියන 97 |
| ව්‍යාපෘති අරමුදල්කරණය | 85% : චීනයේ Industrial & Commercial බැංකුව (ICBC)<br>15% : හැටන් නැෂනල් බැංකුව |

ප්‍රධාන වේල්ල, ප්‍රධාන උමග, විහිදුම් උමග හා විදුලි බලාගාර හා ස්විච් අංගන වැඩබිම්හි ප්‍රධාන ඉදිකිරීම් කටයුතු 2021 වසර තුළ සම්පූර්ණ කර ඇති අතර, බලාගාර පරීක්ෂක මෙහෙයුම් කටයුතු ආරම්භ වී ඇත.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය වූකලි ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් සැලසුම් හා කළමනාකරණ රෙගුලාසි (CDM) ලියාපදිංචිය ලද පළමු මහා පරිමාණ ව්‍යාපෘතියයි.



රූපය P4: බ්‍රෝඩ්ලන්ඩ්ස් බලාගාර ගොඩනැගිල්ල



රූපය P2: බ්‍රෝඩ්ලන්ඩ්ස් ජනන යන්ත්‍ර ධාරාව



රූපය P3: බ්‍රෝඩ්ලන්ඩ්ස් ප්‍රධාන වේල්ල හා ජලාශය

## මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය

| ස්ථාපිත ධාරිතාව මෙ.වො. 30.5 | |
|---|---|
| කොන්ත්‍රාත්කරු | |
| ආරම්භක කටයුතු | වී.වී. කරුණාරත්න සහ සමාගම |
| ප්‍රධාන සිවිල් කටයුතු | චීනයේ Gezhouba Group සමාගම |
| යාන්ත්‍රික හා විදුලි පහසුකම් | චීනයේ Dongfang Electric International Corporation ආයතනය |
| ඇස්තමේන්තුගත පිරිවැය | රු. මිලියන 18,553 |
| ව්‍යාපෘති අරමුදල්කරණය | ආසියානු සංවර්ධන බැංකුව |
| මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත | 2023 නොවැම්බර් 30 |
| සමස්ත ප්‍රගතිය | 30% |

2021.12.31 දිනට එක් එක් ව්‍යාපෘති අංගයට අදාළ වාර්තාගත ප්‍රගතිය රූපය 5 තුළ දී ඇත.

| | |
|---|---|
| ඉඩම් අත්පත් කරගැනීම (95.5%) | |
| පාරිසරික අනුමැතීන් (100%) | |
| සූදානම් කටයුතු (73.5%) | |
| ප්‍රධාන සිවිල් කටයුතු (23.5%) | |
| යාන්ත්‍රික හා විදුලි පහසුකම් (12.3%) | |

රූපය P5: මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ ප්‍රගතිය

## උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය (UOMDP) දැනට වාරිමාර්ග අමාත්‍යාංශයේ විෂය පථය යටතට වැටෙන්නාවූ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතියේ විද්‍යුත් යාන්ත්‍රික කටයුතුවලට අදාළ තාක්ෂණික උපදේශනාත්මක සහාය ලබාදෙනු පිණිස ලං.වි.ම. තාක්ෂණික කාර්ය මණ්ඩලය උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත යොමුකර ඇත.

| ස්ථාපිත ධාරිතාව මෙ.වො. 120 | |
|---|---|
| කොන්ත්‍රාත්කරු | ඉරානයේ FARAB සමාගම |
| ඇස්තමේන්තුගත පිරිවැය | එ.ජ.ඩො. මිලියන 530 |
| මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත දිනය | මැයි 25, 2022 |
| සමස්ත ප්‍රගතිය | 97.7% |



රූපය P6: උමා ඔය ව්‍යාපෘතිය යටතේ ඉදිකළ ඒකස්ථම්භ කුලුණ

## ද්‍රව ස්වභාවික වායු ව්‍යාපෘතිය (LNGP)

2020 ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ද්‍රව ස්වභාවික වායු ස්ථානගතකරණ ව්‍යාපෘතිය අනුමත කරන ලදුව, පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය (FSRU) හා නැවතුම් පද්ධතිය සහ පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය වෙත ද්‍රව ස්වභාවික වායු ප්‍රසම්පාදනය සඳහා ලං.වි.ම. වෙත බලය පවරා දෙන ලදී. මෙම ව්‍යාපෘතියට අදාලව ඉදිකිරීමට නියමිත කෙරවළපිටියෙන් කි.මී. 5 ක් අක් වෙරළට වන්නට නවතා ඇති පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය වෙතින් සැපයෙන ස්වභාවික වායු මගින් දැනට කැළණිතිස්ස හා කෙරවළපිටිය ස්ථාපිත ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාර සහ 2024 වසරින් පසුව ඉදිකිරීමට නියමිත ඒකාබද්ධ බලාගාර ක්‍රියාත්මක කර රටට ආර්ථික හා පාරිසරික ප්‍රතිලාභ ලබාදීමට සැලසුම් කර ඇත.

රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව (Public Private Partnership) පදනමින් අපේක්ෂිත ආයෝජකයන් වෙතින් යෝජනා ඉල්ලුම් ලබාගන්නා ලදුව අපේක්ෂිත ආයෝජක සමගින් පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය හා නැවතුම් පද්ධතිය සඳහා වූ කොන්ත්‍රාත් ගනුදෙනු කටයුතු සිදු වෙමින් පවතී. කොන්ත්‍රාත්තුව කඩිනමින් ස්ථාපනය කොට 2024 මැද භාගය වනවිට ද්‍රව ස්වභාවික වායු ලබාගනිමින් ස්වභාවික වායු සැපයීම සඳහා සූදානම්ව පවතිනු ඇත.

ද්‍රව ස්වභාවික වායු සැපයුම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නුදුරේදීම ආරම්භ වනු ඇත.

## සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති

2021.12.31 දින වනවිට සිදු වෙමින් පවත්නා සම්ප්‍රේෂණ සංවර්ධන කර්තව්‍යයන්හි ප්‍රගතිය වගුව P1 තුළ දී ඇති අතර, එහි සැලසුම්ගත ප්‍රගතියට සාපේක්ෂව ලැබූ සැබෑ ප්‍රගතියෙහි වෙනස ප්‍රගති තීර වර්ණයන්ගෙන් දැක්වේ.

වෙනස < 10% නම්

10% < වෙනස < 25% නම්

25% < වෙනස < 50% නම්

50% < වෙනස < 100% නම්

සැලසුම් කොට මේ දක්වා ආරම්භ කොට නොමැති සම්ප්‍රේෂණ ව්‍යාපෘතීන්හි 2021.12.31 දිනට තත්ත්වය පහත වගුව P2 තුළ දී ඇත.

## වසර තුළ මුහුණ පෑ අභියෝග

අංශයේ විෂය පථය යටතේ එන ව්‍යාපෘතිවල ප්‍රගතියට හා කටයුතු සම්පූර්ණ කිරීමට බලපාන අයුරු වසර තුළ මුහුණ දීමට සිදුවූ ප්‍රධාන ගැටලු හා අභියෝග පහත දක්වා ඇත.

- දේශීය වෙළඳපල තුළ සිමෙන්ති හා වානේ කම්බි වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම.
- දේශීය වෙළඳපල තුළ ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහළ යාම.
- වසංගත තත්ත්වය හා සමගින් පනවන ලද සීමාවන් හේතුකොට විදේශීය වැඩබිම් පුද්ගලයනට මෙරටට පැමිණීමට සිදුවූ ප්‍රමාදයන්.
- වසංගත සමය තුළ නාවික හා රේගු නිෂ්කාශන කටයුතු සීමාවීම හේතුකොට දේශීය හා ජාත්‍යන්තර ප්‍රසම්පාදන කටයුතුවල සිදුවූ ප්‍රමාදයන්.
- සම්ප්‍රේෂණ මාර්ග කොරිඩෝ හා ඉඩම් ලබාගැනීමේදී ඉස්මතුවූ මහජන විරෝධතා.

## දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | පැකේජය | පිරිවැය (ශ්‍රී ලං.රු. මිලියන) | 2021.12.31 දිනට භෞතික ප්‍රගතිය | සම්පූර්ණ කිරීමට නියමිත දිනය |
|---|---|---|---|---|
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා හානි අවමකරණ ව්‍යාපෘතිය | කෙරවලපිටියේ සිට කොළඹ L දක්වා කි.වෝ. 220 දෙවන කේබලය ඉදිකිරීම | 9,119 | 5% | 2024 අප්‍රේල් |
| | කොළඹ E හා F හි පරිපථ හා බස්බාර් ආරක්ෂණ ව්‍යාපෘතිය මාරු කිරීම | 122 | 45% | 2022 මැයි |
| ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලි සංවර්ධන ව්‍යාපෘතිය | කොටස A : නව හබරණ කොටුමා උපපොළ ඉදිකිරීම හා වේයන්ගොඩ කොටුමා උපපොළ විශාලනය | 3,200 | 97% | 2022 මැයි |
| | කොටස B : වේයන්ගොඩ සිට නව හබරණ කොටුමා උපපොළ දක්වා කි.මී. 148 හා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම හා ආශ්‍රිත රැහැන් හැරවීම් | 7,100 | 95% | 2022 ජූලි |
| හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර II | පැකේජය 1/ කොටස A - හම්බන්තොට කි.වෝ 220 සංවර්ධනය | 1,866 | 95% | 2022 පෙබරවාරි |
| | පැකේජය 1/ කොටස B - නව පොල්පිටිය - හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය | 5,794 | 78% | 2022 මැයි |
| | පැකේජය 2/ කොටස A - නාඩුකුඩා ඉදිකිරීම හා මන්නාරම කි.වෝ. 220/33 කොටුමා උපපොළ විශාලනය | 2,698 | 100% | 2021 අප්‍රේල් |
| | පැකේජය 2/ කොටස B 2 - පාඩුකුඩා-හොරණ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 592 | 45% | 2022 අප්‍රේල් |
| | පැකේජය 2/ කොටස B 2 B - කි.වෝ 132 හබරණ - වාලච්චේන සම්ප්‍රේෂණ මාර්ගයේ 2වන පරිපථ රැහැන් එළීම | 502 | 96% | 2022 ජනවාරි |
| | පැකේජය 3/ කොටස A1 - කොළඹ B කොටුමා උපපොළ, තනි ඇතුළත හා පිටත සම්බන්ධතාවයට අදාළ කොළඹ C - කොලොන්නාව කි.වෝ. 132 කේබලය ඉදිකිරීම හා කොළඹ C සහ කොලොන්නාව කොටුමා උපපොළයන් විශාලනය | 1,261 | 84% | 2022 මැයි |
| | පැකේජය 3/කොටස A - කොටුගොඩ, කොලොන්නාව, පාදුක්ක, හොරණ, දෙහිවල හා මාදම්පේ කොටුමා උපපොළ ඉදිකිරීම | 2,316 | 90% | 2022 මැයි |
| | පැකේජය 3/කොටස B - බියගම කි.වෝ. 220/33 කොටුමා උපපොළයන් ඉදිකිරීම හා බියගම කොටුමා උපපොළ විශාලනය | 1,540 | 99% | 2022 ජනවාරි |
| විදුලි සැපයුම් විශ්වසනීයත්වය ප්‍රවර්ධනය කිරීමට සහාය දීමේ ව්‍යාපෘතිය (SESRIP) | පැකේජය 7 - කොටස A1 - මෙ.වෝ.ඇ. 100 බ්‍රේකර් ස්විච ධාරිත්‍රකයක් පන්නිපිටිය කොටුමා උපපොළයන්හි ස්ථාපනය | 1,104 | 71% | 2022 අප්‍රේල් |
| | පැකේජය 7 - කොටස A2 - බියගම උපපොළෙහි ස්ථිතික වාර පද්ධතිය (SVS) ස්ථාපනය | 1,595 | 35.5% | 2022 ඔක්තෝබර් |
| ද්‍රව ස්වභාවික වායු විදුලි ව්‍යාපෘතිය | පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය (FSRU) හා නැවතුම් පද්ධතිය ස්ථානගත කිරීම | PPP | 28% | 2024 පෙබරවාරි |
| ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය | පැකේජය 1 - කි.වෝ. 400, කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම | 13,003 | 50% | 2022 ජූලි |
| | පැකේජය 2 - කොටුමා උපපොළයන් ඉදිකිරීම හා විශාලනය | 7,418 | 59% | 2022 ජූනි |
| | පැකේජය 3 - කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම | 12,000 | 42% | 2022 ජූනි |
| | පැකේජය 4 - දෙහිවල, ගල්කිස්ස හා බත්තරමුල්ලේ ප්‍රාථමික උපපොළ, බෙදාහැරීමේ උපපොළ හා කේබල ඉදිකිරීම | 4,594 | 31% | 2022 සැප්තැම්බර් |
| හරිත විදුලි සංවර්ධන හා බලශක්ති කර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර 1 | කප්පල්තුරේ කොටුමා උපපොළ ඉදිකිරීම හා කෙරවලපිටිය, කටුනායක හා ත්‍රිකුණාමලය කොටුමා උපපොළයන් විශාලනය | 2,525 | 99.9% | 2021 නොවැම්බර් |
| | කැස්බෑව හා කළුතර කොටුමා උපපොළයන් ඉදිකිරීම හා නව අනුරාධපුර හා පැරණි අනුරාධපුර කොටුමා උපපොළයන් විශාලනය | 2,738 | 98% | 2022 පෙබරවාරි |
| | හරිත විදුලි සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන වැඩසටහන් ව්‍යාපෘතිය (GDPEEIP) අදියර 2 - පැකේජය 9 - කෙරවලපිටියේ කි.වෝ. 220 ස්විච් ස්ථානය | 2,910 | 34% | 2022 අගෝස්තු |
| සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති ශාඛාව | නව අනුරාධපුර කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 100 ප්‍රතිවාරකය හා මන්නාරම කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 50 ප්‍රතිවාරක ස්ථාපනය | 1,463 | 97% | 2022 අප්‍රේල් |
| | වගවත්ත කොටුමා උපපොළ ඉදිකිරීම | 1,898 | 60% | 2022 ජූලි |
| | රන්දෙනිය (උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය) කි.වෝ. 132 ස්විච් අංගනය ඉදිකිරීම | 350 | 65% | 2022 ජූනි |
| | මැදගම - අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | 3,206 | 4% | 2025 ජනවාරි |
| | වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 1,400 | 4% | 2024 දෙසැම්බර් |
| | පුනරින් - කිලිනොච්චි කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 3,450 | 3% | 2025 දෙසැම්බර් |

වගුව P1: 2021.12.31 දිනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ව්‍යාපෘතිය | අනු - ව්‍යාපෘතිය | පිරිවැය ඇස්තමේන්තුව (ශ්‍රී ලං.රු. මිලියන) | තත්ත්වය |
|---|---|---|---|
| හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය අදියර II | පැකේජය 8/කොටස A - නාඩුකුඩා කි.වෝ. 220/33 කොටුමා උපපොළ විශාලනය, ආනියාකන්ද කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය හා චුන්නාකම් කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය | 1,382 | පිරිනැමීමට සූදානම් |
| | පැකේජය 8 - /කොටස B - අම්බලන්ගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය, පන්නල කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය හා කි.වෝ. 132/33 මෙ.වෝ.ඇ. 31.5 අමතර තරාපැවි 2 ක් සැපයුම | 1,494 | |
| විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය නංවාලීමට සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP) | පැකේජය 7- කොටස A3 කොළඹ නගර කොටුමා උපපොළයන්හි මෙ.වෝ.ඇ. 123 කැඩුම් ස්විච ධාරිත්‍රක කැන් ස්ථාපනය හා තුල්හිරිය කොටුමා උපපොළෙහි අවිසුසරගත කැඩුම් ස්විච ධාරිත්‍රක කැන් මාරු කිරීම | 1,705 | කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂිතයි |
| විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය | පැකේජය 1 - (කොටස A) - කලවාන හා මීගමුව කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | 3,638 | අරමුදල්කරණ කටයුතු අවසන් කිරීමට නියමිතය |
| | පැකේජය 1 - (කොටස B) - මීරිගම කි.වෝ. 220/33 කොටුමා උපපොළයන්, නව අනුරාධපුර කොටුමා උපපොළෙහි කි.වෝ. 220 මාර්ගය, හම්බන්තොට කොටුමා උපපොළෙහි කි.වෝ. 132 මාර්ග රාක්ක 2 ක් ඉදිකිරීම, මාතර කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය | 4,655 | |
| | පැකේජය 2 - (කොටස A) - කි.වෝ. 132 බෙදාහැරීමේ පරිපථ (DC) මාතර-හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය (කි.මී.77), කි.වෝ. 132 බෙදාහැරීමේ පරිපථ හම්බන්තොට - තිස්සමහාරාම සම්ප්‍රේෂණ මාර්ගය (කි.මී. 23), කි.වෝ. 132 බෙදාහැරීමේ පරිපථය හොරණ - පාදුක්ක සම්ප්‍රේෂණ මාර්ගයේ සිට හෝමාගම කොටුමා උපපොළ දක්වා (කි.මී. 8), කි.වෝ. 132 බෙදාහැරීමේ පරිපථ අම්බලන්ගොඩ - ගාල්ල සම්ප්‍රේෂණ මාර්ගයේ සිට බද්දේගම කොටුමා උපපොළ දක්වා (කි.මී. 0.5), පෑලියගොඩ කොටුමා උපපොළේ භූගත කේබල පර්යන්තය සඳහා කැළණිය කේබල පර්යන්ත කුලුණ ඉදිකිරීම | 4,396 | |
| | පැකේජය 2 - (කොටස B) - කි.වෝ. 132 හරස් බද්ධ පොලිතීන් කේබල (XLPE) පාරිභෝගික ඒකක භූගත කේබලය පෑලියගොඩ කි.වෝ. 132/22 කොටුමා උපපොළ වෙත ඉදිකිරීම | 200 | |
| | පැකේජය 3 - කි.වෝ. 132/33 තිස්සමහාරාම, බද්දේගම, හෝමාගම හා පෑලියගොඩ කොටුමා උපපොළයන් ඉදිකිරීම | 2,045 | |
| | පැකේජය 4 - කි.වෝ. 220, බෙදාහැරීමේ පරිපථ නව අනුරාධපුර - නව හබරණ සම්ප්‍රේෂණ මාර්ගය (කි.මී. 46), කි.වෝ. 132 කුකුලේ-කලවාන සම්ප්‍රේෂණ මාර්ගය, නව හබරණ-වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ගයේ සිට මීරිගම කොටුමා උපපොළ (කි.මී. 5) දක්වා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 2,921 | |

වගුව P2: 2021.12.31 දින වනවිට සකස් කොට ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති සම්ප්‍රේෂණ ව්‍යාපෘතීන්හි තත්ත්වය


චුන්නාකම් කොටුමා උපපොළ

# වත්කම් කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණය යනු යටිතල පහසුකම්ක සංවර්ධන සංක්‍රාන්තියේ එක් අංගයකි. මෙම අංශය විසින් ලං.වි.ම. හි ආර්ථික වර්ධනය, සමාජ ප්‍රගමණය හා පාරිසරික සංවර්ධනය වෙනුවෙන් එම ආයතනයේ තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. මෙම අංශය පහත විස්තර කර ඇති පරිදි ශාඛා පහකින් සමන්විත වේ.

වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාවේ වගකීම වනුයේ ප්‍රශස්ත මානව සම්පත් කළමනාකරණයක් තුළින් වත්කම් කළමනාකරණ අංශය නිවැරදිව ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීමයි. සේවා නියුක්තිකයන්ගේ මානව සම්පත් හා ආයතනික කාර්යයන් හැරුණු කොට, මෙම ශාඛාව විසින් ලං.වි.ම. හි වත්කම කළමනාකරණ කාර්යයන් සිදු කරනු ලබයි. ලං.වි.ම. ඉඩම් හා ගොඩනැගිලි වඩා යහපත් ලෙස කළමනාකරණය කරමින්, ප්‍රධාන ව්‍යවස්ථාමය කාර්යයනට බලපෑමකින් තොරව ප්‍රධාන කාර්යයන් හැරුණුකොට පවත්නා සෙසු කටයුතු සඳහා පවත්නා සම්පත් හා වත්කම් භාවිත කරමින් අතිරේක ආදායමක් ඉපැයීම ශාඛාවේ ප්‍රධාන කටයුතු වේ.

ලං.වි.ම. පුහුණු ශාඛාව උපරිම අධ්‍යාපනික සේවාවන් සැපයීම සඳහා කැපවී සිටිමින්, සේවා නියුක්තිකයන්ගේ ආකල්ප සංවර්ධනය යාවත්කාලීන කිරීමේ කාර්යයට උර දෙන අතරම වර්තමාන හා අනාගත අභියෝගයනට මුහුණ දීම සඳහා අවශ්‍ය කුසලතාවන්ගෙන් හා දැනුමින් ඔවුන් සන්නද්ධ කරන්නාවූ පුහුණුවක් ලං.වි.ම. සේවා නියුක්තිකයන් වෙත ලබාදීමේ කටයුතු නොකඩවා සිදු කරමින් පවතී.

වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව විදුලි බලාගාර ඒකකය, විදුලි සෝපාන ඒකකය, වායු සමීකරණ හා ශීතකරණ ඒකකය හා මධ්‍යම වැඩපල හා ගරාජය යන මෙහෙයුම් ඒකක හතරකින් සමන්විත වන අතර, ඉල්ලා සිටි විටදී ලං.වි.ම. තුළ හා ඉන් පිටතද අදාළ සේවා, අලුත්වැඩියා හා නඩත්තු කටයුතුවල නියැළේ.

සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව ලං.වි.ම. ආශ්‍රිත නව ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි/කාර්යාල අලුත්වැඩියාවට/පුළුල් කිරීමට අදාළ කටයුතුවල නිරත වන අතර, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා රටපුරා ලං.වි.ම. සතු සංචාරක බංගලා නඩත්තු කිරීමද සිදු කරනු ලබයි. සිවිල් කටයුතු හා ගොඩනැගිලි ශාඛාව සතුව නවීනතම මෘදුකාංග භාවිතයෙන් ව්‍යුහාත්මක සැලසුම් හා ආශ්‍රිත ඇඳීම් සිදු කිරීමේ හැකියාව සහිත ව්‍යුහාත්මක සැලසුම් ඒකකයක් පවතී. තවද, ලං.වි.ම. හි සිවිල් ඉංජිනේරුවෝ මෙම ඒකකය මගින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකත්වය සඳහා පුහුණු කෙරේ. සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව වෙත පහසුකම් සලසනු සඳහා අනුයුක්ත කොට ඇති කළමනාකරණ ඒකකය ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හා සංචාරක බංගලාවන්හි නඩත්තු කටයුතු සිදු කිරීමේ වගකීම දරයි.

සිදුවන හදිසි අනතුරු හා අනතුරු සංඛ්‍යාව අවම කරනු පිණිස සේවා නියුක්තිකයන් සඳහා ආරක්ෂිත වැඩ පරිසරයක් ඇති කරමින් හා ඔවුන් අතර සෞඛ්‍ය හා ආරක්ෂක දැනුවත්භාවය සහතික කරමින් ආයතනය තුළ ආරක්ෂක සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව 2015 වසරේදී පිහිටුවන ලදී.

මෙයට අමතරව, මෙම අංශය යටතේම පවත්නා ආරක්ෂක අංශය විසින් ජනන, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා වත්කම් කළමනාකරණ අංශ හා ලං.වි.ම. සෙසු වැදගත් ස්ථානයන්ද ඇතුළත් බලපෑමට ලක්විය හැකි සියලු ස්ථානයන්හි ජීවිත හා දේපළ ආරක්ෂාව සම්බන්ධ වගකීම දරනු ලබයි.

### මෙහෙයුම් කාර්ය සාධනය

#### පුහුණුව

2021 වසර අන් කිසිදු වසරක් හා සමාන නොවූ වසරක් විය. කොවිඩ්-19 වසංගතය හේතුකොට පුහුණු ශාඛාවට අසාමාන්‍ය අභියෝගයනට මුහුණ පෑමට සිදුවිය. වසංගත තත්ත්වයට ප්‍රතිචාර වශයෙන්, වසංගත සමය තුළ 2020 වසරේදී ආරම්භ වූ දුරස්ථ හා නම්‍යශීලී ඉගෙනීම් වෙත මාරු වීමට පුහුණු ශාඛාවට සිදුවිය.



රූපය A1: කිංචිගුණේ පුහුණු මධ්‍යස්ථානයේ සිදුකළ නායකත්ව පුහුණුව

කෙසේ වුවද, විවිධ සේවා නියුක්තික කාණ්ඩ වෙත ලබාදෙනු ලැබූ පුහුණුවේ මට්ටම, 2021 මැයි මස සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය විශේෂ කොටගෙන මෙම වසර තුළ පැවති වසංගත තත්ත්වයේ බරපතලභාවය හේතුකොට සීමා කිරීමට සිදුවිය. තවද, මධ්‍යස්ථානයේ භෞතිකවම සිදුකළ යුතුවන ප්‍රායෝගික පුහුණු පවත්නා බැවින් ක්ෂේත්‍ර සේවාවන්හි සේවා නියුක්තිකයන් හට ලබාදිය යුතුවන පුහුණුව සැලසුම් කළ නොහැකි විය.

මෙම කාල පරිච්ඡේදය තුළ රටේ පැවති තත්ත්වය හේතුකොට පිළියන්දල, කලවාන හා කිංචිගුණේ නේවාසිකාගාර ගොඩනැගිලි කොවිඩ් ප්‍රතිකාර අන්තර් මධ්‍යස්ථාන බවට පෙරළන ලදී. ඒ හේතුකොට මෙම මධ්‍යස්ථානයන්හි පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමටද නොහැකි විය.

ශාඛාවේ කාර්ය සාධනය පහත දී ඇත.




රූපය A2: පිළියන්දල කාර්මික විද්‍යාලයේ පවත්වන පුහුණු වැඩසටහන් විස්තර




රූපය A3: පිළියන්දල කාර්මික විද්‍යාලයේ පවත්වන ලද වැඩසටහන් කාණ්ඩ




රූපය A7: පවත්වන ලද විභාග




රූපය A4 : කාසල්රී කාර්මික විද්‍යාලයේ පවත්වන පුහුණු වැඩසටහන් විස්තර

## අතිරේක ඩීසල් ජනන යන්ත්‍රය නඩත්තුව හා කුලියට ලබාදීම

| කාර්ය කාණ්ඩය | කාර්ය සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය (ශ්‍රී ලං.රු. මිලියන) |
|---|---|---|
| අතිරේක ඩීසල් ජනන යන්ත්‍රයේ වාර්ෂික නඩත්තුව | 87 | 133 |
| ඩීසල් ජනන යන්ත්‍ර නඩත්තුව / ප්‍රතිසංස්කරණය | 86 | 72 |
| ලං.වි.ම. අවශ්‍යතා සඳහා ඩීසල් ජනන යන්ත්‍ර කුලියට ලබා ගැනීම | 72 | 42 |
| ඩිසල් ජනන යන්ත්‍ර කුලියට ලබාදීම - පුද්ගලික, ජනාධිපති ආරක්ෂක අංශය, අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශය හා සෙසු 3 වන පාර්ශ්ව | 58 | 94 |
| වෙනත් කටයුතු | 26 | 15 |
| විදුලි බලාගාර ඒකකයට අයත් ජනන යන්ත්‍ර සම්බන්ධ නඩත්තුව | 31 | 19 |
| **එකතුව** | **360** | **375** |




රූපය A5: කාසල්රී කාර්මික විද්‍යාලයේ පවත්වන ලද වැඩසටහන් කාණ්ඩ

## වායු සමීකරණ හා ශීතකරණ ස්ථාපනයන්, නඩත්තු හා ප්‍රතිසංස්කරණ

| කාර්ය කාණ්ඩය | බාහිර | | අභ්‍යන්තර | |
|---|---|---|---|---|
| | කාර්ය සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං. රු. මිලියන) | කාර්ය සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං. රු. මිලියන) |
| වාර්ෂික නඩත්තුව | 34 | 247.2 | 299 | 68.4 |
| නව ස්ථාපනයන් | - | - | 25 | 12 |
| අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ | 5 | 1.8 | 26 | 3.3 |
| **එකතුව** | **39** | **249.0** | **350** | **83.7** |




රූපය A6: සේවා නියුක්තික විදේශ සංචාර



රූපය A8: කොවිඩ් 19 වසංගත සමය තුළ මහනුවර රෝහලේ මෘත ශරීරාගාර සිසිලන යන්ත්‍ර නඩත්තුව

## සෝපාන ස්ථාපනයන්, අලුත්වැඩියාවන් හා ප්‍රතිසංස්කරණ

| කාර්ය කාණ්ඩය | බාහිර | | අභ්‍යන්තර | |
|---|---|---|---|---|
| | කාර්ය සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං.රු. මිලියන) | කාර්ය සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං.රු. මිලියන) |
| වාර්ෂික නඩත්තුව | 22 | 27 | 11 | 4.4 |
| නව ස්ථාපනයන් | - | - | 1 | 7.9 |
| අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ | 6 | 1.9 | 9 | 2.7 |
| වෙනත් (පරීක්ෂණ හා උපදේශන) | - | - | - | - |
| **එකතුව** | **28** | **28.9** | **21** | **15** |

## පිරිසැකසුම්, නිෂ්පාදන හා වාහන අලුත්වැඩියාවන්

| කාර්ය කාණ්ඩය | කාර්ය විස්තරය | කාර්ය සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|---|
| යාන්ත්‍රික | විවී ලාම්පු දීප්ත, ඩීසල් ජනන යන්ත්‍ර සඳහා රවුටර පරිමන්දක, ලං.වි.ම. මූලස්ථානයේ උදාසීන ධාරා තරාපැවි ව්‍යුහය හා වහළය මත සවිකරන සූර්ය පැනල සඳහා වානේ ඉනිමං පිරිසැකසුම් කටයුතු | 07 | 3.6 |
| විදුලි | ජනන අංශයේ සපුගස්කන්ද විදුලි බලාගාරයේ විදුලි මෝටර නැවත එතීම | 28 | 2.7 |
| නිෂ්පාදන | සම්ප්‍රේෂණ අංශය හා බෙදාහැරීමේ අංශ සඳහා ගැල්වනයිස් නොකළ D කරවර හා ඇලුමිනියම් කලම්ප නිෂ්පාදනය | 24 | 16.6 |
| වාහන අලුත්වැඩියා/සේවා | ලං.වි.ම. වාහන එන්ජින් අලුත්වැඩියාවන්, ධාවන අලුත්වැඩියා, බඳ ටින්කර්කරණය, සේවා හා පින්තාරු කිරීම. | 305 | 14.7 |
| **එකතුව** | | | **37.6** |

## ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියාවන්

| විස්තරය | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|
| ලං.වි.ම. ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම හා නවීකරණය | 70 |
| පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම | 100 |
| කොලොන්නාව ලං.වි.ම. පරිශ්‍රයේ ඉදිකිරීම හා නවීකරණය | 39 |
| **එකතුව** | **209** |



රූපය A9: පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය

## වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධ පුහුණු

| සහභාගීවූ කාණ්ඩය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සේවා නියුක්තිකයන් | 11 | 444 |
| විදුලි බලාගාර කාර්ය මණ්ඩලය | 02 | 74 |
| **එකතුව** | **13** | **518** |

## ආරක්ෂක පරීක්ෂාවන්

| අංශය | පරීක්ෂා කරන ලද ප්‍රාථමික උපපොළ සංඛ්‍යාව | පරීක්ෂා කරන ලද අටලු අංගන සංඛ්‍යාව | පරීක්ෂා කරන ලද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | - | 04 | - |
| බෙදාහැරීමේ අංශය 2 | 01 | 07 | - |
| බෙදාහැරීමේ අංශය 3 | - | 05 | 01 |
| බෙදාහැරීමේ අංශය 4 | 01 | - | 01 |
| **එකතුව** | **02** | **16** | **02** |

## හදිසි අනතුරු සාරාංශය



## උද්දීපනයන්

2021 වසරේදී අංශය තුළ ඉටු කරන ලද කටයුතු පිළිබඳ උද්දීපනයන් පහත දක්වා ඇත.

- ලං.වි.ම. සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වත්කම් ලේඛනය සැකසීම හා ලං.වි.ම. ඉඩම් හා ගොඩනැගිලි දත්ත පදනම යාවත්කාලීන කිරීම හා නඩත්තුව. 2021 වසර තුළ ජනන අංශයෙන් ඉඩම් කට්ටි 1710 ක්ද, බෙදාහැරීමේ අංශයෙන් 05 ක්ද වශයෙන් ජනන අංශයෙන් සමස්තය ඉඩම් කැබලි 2766 ක්ද, සෙසු අංශවලින් කැබලි 1013 ක්ද වනසේ හඳුනාගනු ලැබිණි.

- ලං.වි.ම. සියලු පළාත්වල බලයලත් පරිහරණයන් සඳහා පිවිසුම් ප්‍රවේශය වෙනුවෙන් ඉඩම් ආශ්‍රිත දත්ත ගබඩා කරනු පිණිස ජාල පදනම්ගත CEB Assist දත්ත කළමනාකරණ පද්ධතිය සඳහා කැපවූ පිවිසුමක් ස්ථාපනය කරන ලද අතර, මෙමගින් අවසන් පරිහාරක මට්ටමින් ඉඩම් ආශ්‍රිත දත්ත ගබඩාකරණය සඳහාද අවශ්‍ය පහසුකම් සම්පාදනය කරනු ලබයි.

- පාවෙන යානා හා බෝට්ටු සේවා ක්‍රියාත්මක කිරීම වැනි සංචාරක හා විනෝදාස්වාද කටයුතු වෙනුවෙන් ලං.වි.ම. ජලාශ බදු දෙන ලදී. කාසල්රී ජලාශයේ පාවෙන යානා හා බෝට්ටු සේවා ක්‍රියාත්මක කිරීම සඳහා M/s MJF Holdings and Saffron Aviation ආයතන සමග ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී.

- ඉඩම් අමාත්‍යාංශය සමගින් පවත්වන ලද සාකච්ඡා ගණනාවකින් අනතුරුව, කාලස්රී ජලාශ පරිශ්‍රයේ රජයේ විදුලිබල පවරාගැනීම් දෙපාර්තමේන්තුව වෙතින් ලං.වි.ම. වෙත ඉඩම් පවරා දෙන ලදී. පරිශ්‍රයේ අනවසර ඇතුළුවීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබ, කාසල්රී පරිශ්‍රයේ ප්‍රජා සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලදී.



# ආයතනික ක්‍රමෝපාය අංශය

අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) යටතේ ක්‍රියාත්මක ලං.වි.ම. ආයතනික ක්‍රමෝපාය අංශය ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව, ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව, තොරතුරු තාක්ෂණ ශාඛාව සහ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව නමින් යුත් ශාඛා පහකින් සමන්විත වේ. 2021 වසර තුළ අංශයේ කාර්ය සාධනයන් මෙතුළ දක්වා ඇත. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ (ERP) ව්‍යාපෘතියද අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය (B&OS) ශාඛාව මූලික වශයෙන් ලං.වි.ම. අත්‍යවශ්‍ය ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු ආශ්‍රිත ක්‍රමෝපාය සකස් කිරීමේ වගකීම දරයි. ලං.වි.ම. ආයතනික ප්‍රතිරූපය ගොඩනගා පවත්වාගෙන යාමද ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවේ විෂය පථය යටතට ගැනේ. තවද, ආයතිනක සැලැස්ම (2019-2023) තුළ ප්‍රකාශිත ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමෙහි ලා ආයතනයේ කාර්ය සාධනය නිරීක්ෂණයද ප්‍රධාන කටයුතු අතරට ගැනේ. එමෙන්ම ලං.වි.ම. ආයතනික සැලැස්ම 2019-2023 හා අනුගත වන්නාවූ ලං.වි.ම. ප්‍රධාන කාර්ය සාධන දර්ශක නිරීක්ෂණය හා සමාලෝචනයද ප්‍රධාන කටයුතු අතර විය. ලං.වි.ම. ආයතනික ප්‍රතිරූපය ගොඩනගා පවත්වාගෙන යාමට අදාළ කටයුතු වෙනුවෙන් කැපවූ ක්‍රමෝපාය සන්නිවේදන ඒකකයක් (SCU) ශාඛාව විසින් පිහිටුවා ඇත. ක්‍රමෝපාය සන්නිවේදන ඒකකය පිහිටුවීමෙන් අනතුරුව මනාසේ සම්බන්ධීකරණය කරන ලද හා සකස් කරන ලද ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩසටහන්ද නිල වශයෙන් ආරම්භ කරන ලදී. ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවේ ප්‍රකාශන ඒකකය මාධ්‍ය, මුද්‍රණ හා දැන්වීම් ආයතන හා නියෝජිතායතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු (CS&RA) ශාඛාව ලංකා විදුලිබල මණ්ඩලය වෙත නිකුත් කරන ලද ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ බලපත් ආශ්‍රිතව ඉස්මතුවන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහි හා බලපත්ලාභීන් හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින්ද සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමෙහිද නියැලේ. නියාමන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අමතරව, මෙම ශාඛාව අයක්‍රම ආශ්‍රිත අධ්‍යයනයන් හා ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හා මෙහෙයවීමේ වගකීමද දරයි. ශාඛාව විසින් ලං.වි.ම. ආයතනික ක්‍රමෝපාය සැකසීමේ කටයුතු සම්බන්ධීකරණයද සිදු කරනු ලබයි.

ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන (FS&PD) ශාඛාව විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය ක්‍රමෝපාය සංවර්ධන, ප්‍රතිපත්ති හා ක්‍රියාවලි සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි. සියලු පද්ධති හා ක්‍රියාවලීන් ලේඛනගත කොට අදාළ මෙහෙයුම් හා කාර්ය අත්පොත්හි ඇතුළත් කෙරෙන බවට වගබලා ගැනීමේ වගකීමද ශාඛාව සතුවේ.

තොරතුරු තාක්ෂණ (IT) ශාඛාව ලං.වි.ම. ව්‍යාපාර ක්‍රියාවලි වටහා ගනිමින් කාර්යක්ෂමතාවය හා පාරිභෝගික තෘප්තිය අත්පත් කරදෙනු පිණිස ඒවා හිසි තාක්ෂණය හා අනුගත කිරීමේ වගකීම දරයි. අංකිතකරණ අවශ්‍යතා සපුරාලීමේදී, තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ගෘහස්ථ සංවර්ධනය; ආයතනයේ අවශ්‍යතාවනට ගලපනු ලබන දැනට පවත්නා නිෂ්පාදන; තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් බාහිරව සංවර්ධන හා නවෝත්පාදන කාර්යයන් පෝෂණය කිරීම; හා පිටතින් සම්පත් දායකයන් ලබාගැනීම යන චතුර්විධ ක්‍රමෝපායන් යොදාගනු ලබයි.

පර්යේෂණ හා සංවර්ධන (R&D) ශාඛාව ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය, හා ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය (RCL) යන අංශයන්ගෙන් සමන්විත වේ. 2020 වසරේදී කටුනායක සුහුරු මනුකරණ අදියර 2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු පිණිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) පිහිටුවන ලදී. පර්යේෂණ හා සංවර්ධන ශාඛාව හා ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය 2021 දෙසැම්බර් මස කොලොන්නාව වෙත ගෙනයන ලදී.

## උද්දීපනයන්

2021 වසර තුළ අංශය පිළිබඳ උද්දීපනයන් පහත පරිදි වේ:

- ප්‍රකට පොදු ප්‍රදේශයන්හි පිහිටි ලං.වි.ම. සතු ඉඩම් හා කාර්යාල හඳුනා ගනිමින් විවිධ මාතෘකා හා සන්නාමයන් ආවරණය වන පරිදි බාහිර දැන්වීම්කරණයන් සඳහා භාවිත කරන ලදී. එකී බාහිර දැන්වීම්කරණ ව්‍යාපාරයන් මගින් ප්‍රධාන වශයෙන්ම CEB care යෙදවුම, ලං.වි.ම. මාර්ගගත පහසුකම්, විදුලිය බිල්පත් ගෙවීමේ විකල්ප, පුනර්ජනනීය බලශක්ති හා බලශක්ති සංරක්ෂණයන් ප්‍රවර්ධනය කෙරිණි.

- ලං.වි.ම. සතු යූටියුබ් (youtube) නාලිකාව සංවර්ධනය කරමින් මහජනතාව දැනුවත් කරනු පිණිස සියලු වීඩියෝ පට හා අධ්‍යාපනික වාර්තා වැඩසටහන් උඩුගත කරන ලදී.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් සංවර්ධනය කරන ලද ජාතික අවකාශමය දත්ත යටිතල පහසුකම (NSDI) හරහා දැනට පවත්නා ශ්‍රී ලංකා භූගෝලීය තොරතුරු සිතියම (භූ ද්වාරය) වෙත සම්ප්‍රේෂණ මාර්ග කොරිඩෝ සම්බන්ධ භූගෝලීය තොරතුරු ඇතුළත් කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණ සිදු කරන ලදී. මෙමගින් ජීවිත හා දේපළ ආරක්ෂාව තහවුරු කරමින් බොහෝ පාර්ශවකරුවන් සමගින් වඩා යහපත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමද ඇතුළත් සම්ප්‍රේෂණ ජාලයේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා පොදු ජනතාව වෙත දැනට පවත්නා සම්ප්‍රේෂණ මාර්ග සම්බන්ධ භූගෝලීය තොරතුරු වෙත ප්‍රවේශයක් ලබාදෙනු ලබයි.

- අයක්‍රම ක්‍රමවේදය ප්‍රතිශෝධනය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද අධ්‍යයන කටයුතුවල සක්‍රීයව නිරත විය. මෙම අධ්‍යයන කාර්යය තුළ දැනට පවත්නා අයක්‍රම පිහිටුවීමේ ක්‍රියාවලි හා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයක්‍රම ක්‍රමවේදය, නියාමන ගිණුම්කරණ පද්ධතිය ප්‍රකාර බලපත්ලාභීන් විසින් සිදුකරනු ලබන ගොනුගතකරණයන් හා අයක්‍රම තීරණ විශ්ලේෂණ සමාලෝචනයද ඇතුළත් විය. මෙම අධ්‍යයන කාර්යය බහු වාර්ෂික අයක්‍රම ගොනුගතකරණයට පෙර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවසන් කිරීමට සැලසුම් කර තිබිණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට නිසි කලට ප්‍රතිශෝධිත ක්‍රමවේදය සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර, අවසන එය 2021 ඔක්තෝබර් මාසයේදී ලං.වි.ම. වෙත යොමු කරන ලදී.

- "මානව සම්පත් විගණනය' සියලු සේවා නියුක්තික වර්ගයන් ආවරණය වන පරිදි සමස්ත ලං.වි.ම. වෙනුවෙන්ම සිදුකරන ලදී. විගණනයේ අරමුණ වූයේ ලං.වි.ම පුරා සියලු කාර්ය මණ්ඩල කාණ්ඩයන්ගේ අතිරික්තය හා හිඟය හඳුනා ගනිමින් ඔවුන් ආයතනික කාර්ය සාධනය වැඩිදියුණු වන අයුරින් නැවත බෙදා හැරීමයි. මෙම ව්‍යායාමය සඳහා ලං.වි.ම. කාර්ය මණ්ඩල උපයෝජනය සම්බන්ධ ගැඹුරු විග්‍රහයක් සිදු කළ යුතුව පැවති බැවින්, එතුළ පුළුල් ලෙස දත්ත රැස් කිරීම්, යාවත්කාලීන කිරීම්, විග්‍රහ කිරීම් හා නිර්දේශ නිකුත් කිරීම් අන්තර්ගත විය. මෙම පැවරුම තුළ සමස්ත වසර සඳහාම ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාවේ පවත්නා සියලු සම්පත් උපයෝජනය කිරීමට සිදුවිය.
- පාරිභෝගික තදබදයක් ඇති කරමින් ලං.වි.ම. වෙත පොදුකාර්ය පිරිවැයක් ඇති කරන ලද වෙළඳ කුළුණු හා ආසන්න ක්ෂේත්‍ර තාක්ෂණ පත් (NFC) මගින් ගෙවීම් කිරීමේ ක්‍රම පද්ධතිය තුළින් ඉවත් කරමින් දැනට පවත්නා ලං.වි.ම. සතු විදුලි වාහන ආරෝපකයන් සම්බන්ධ කිරීමේ ගෘහස්ථ මධ්‍යගත පද්ධතියක් සංවර්ධනය කිරීම. ඕනෑම අවස්ථාවක, ඕනෑම ස්ථානයක, ඕනෑම උපකරණයකට අවශ්‍ය ප්‍රවේශය ලබා දෙමින් විදුලි වාහන පාරිභෝගිකයන් හට පවත්නා සියලු ආකාරයේ ගෙවීම් එම අවස්ථාවේදීම කිරීමේ ක්‍රම සඳහා ඉඩකඩ සලසා දෙමින් මෙම නව පද්ධතිය මගින් විදුලි වාහන පාරිභෝගිකයන් හට නව අත්දැකීමක් ලබාදෙන ලදී.
- කර්මාන්තයට යෝග්‍ය වූ, මාර්ගගත යටිතල පහසුකම් ස්ථර ක්‍රියාත්මක කිරීම. නව මාර්ගගත හා ස්වයංක්‍රීය දෘඩාංග වේදිකාව මගින් දෝෂ ඉවසුම් හා ඉහළ සැපයුම් සහිත විශ්වසනීය දෘඩාංග සේවාවන් ලබාදෙන බවට සහතික කරනු ලබයි.
- විදුලිය ඇණ හිටුවීම් ඉල්ලීම්, ඇණ හිටුවීම් සැලසුම්කරණයන්, ඇණ හිටුවීම් සැකසුම් ඩිජිටල්කරණය හා ස්වයංක්‍රීයකරණය සහ CEB Assist හි නව බිඳ වැටුම් සැලසුම්කරණ මොඩියුලය සමගින් කාර්ය ක්‍රියාවලීන් වෙත අවකාශ විවර කිරීම.
- Informix දත්ත පදනමට නවීනතම 14 වන සංස්කරණය දක්වා යාවත්කාලීන වීමට අවකාශ සලසමින් නවීන සංවර්ධන තාක්ෂණික මෙවලම් අනුගත කිරීම.
- උරුමකරු පද්ධති සම්බන්ධ ඊළඟ ගෘහස්ථ ප්‍රතිසංස්කරණ කටයුතු අර්ථ නිරූපණය කොට වෙන් කිරීම හා තොරතුරු තාක්ෂණ ශාඛාව ඇතුළත ඒකකයන් සඳහා නව අංග ලක්ෂණ සංවර්ධනයන් සහ ඒවා ආයතනික සැලැස්මේ කාර්යයන් තුළට සංවිධානගත කිරීම.
- උපයෝගිතා සේවය සඳහා අවශ්‍ය පැටවුම් පැතිකඩ නිරීක්ෂණය හා ස්වයංක්‍රීය බිල්පත්කරණ ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසනු පිණිස ගෘහස්ථව සංවර්ධනය කරන ලද හෙඩ් එන්ඩ් (HES) පද්ධතිය. මෙහි පළමු අදියර කොළඹ නගරයේදී සිදුකරන ලද අතර, මෙම සංවර්ධන කාර්යය ඒකීය මනු දත්ත කළමනාකරණ පද්ධතියක් හා හෙඩ් එන්ඩ් පද්ධති විසඳුමක් තුළට සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඩිජිටල් ලේඛනාරක්ෂණ කටයුතු හැකියාවන් ලබාදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා BoardPAC සහයෝගිතා වේදිකා හැකියාවන් ලබාදීම.
- ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව හා සහයෝගීව ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ප්‍රගති වාර්තාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ගෘහස්ථව සංවර්ධනය කරන ලද ද්වාරය. මෙම ද්වාරය උපයෝගිතා ක්‍රියාකාරී සැලසුම්කරණය හා ප්‍රගති සමාලෝචනය සදහා වර්ෂ 2022 සිට භාවිත කෙරෙනු ඇත.
- කල්පිටිය අර්ධද්වීපයේ කෘෂිකාර්මික ප්‍රදේශයන්හි තරාපැවි අධි පැටවුම්ගතවීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකරන ලදී. මෙම අධ්‍යයනය වැඩබිම්ගත පරීක්ෂාවන්, ගොවියන් හා ආශ්‍රිත ලං.වි.ම. බෙදාහැරීමේ නිලධාරීන් සමග සාකච්ඡාවන්, තෝරාගත් තරාපැව්වල දත්ත රැස්කොට ගබඩා කිරීම හා පාරිභෝගික පැටවුම් සංකලනයක් මගින් සිදුකරන ලදී. මෙම තොරතුරු විශ්ලේෂණය කොට ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ක්‍රියාමාර්ග හා සැපයුම් පාර්ශ්ව කළමනාකරණ (SSM) ක්‍රියාමාර්ග සඳහා ප්‍රායෝගික විසඳුම් හඳුනාගනු පිණිස භාවිත කරන ලදී. ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ක්‍රියාමාර්ග හා සැපයුම් පාර්ශ්ව කළමනාකරණ ක්‍රියාමාර්ග කෙටි හා දිගු කාලීන යන දෙවර්ගයේම සංකලනයකින් යුක්ත විය.
- බලශක්ති කාර්යක්ෂම වීථි ලාම්පු ක්‍රමයක් සහතික කරනු පිණිස බස්නාහිර පළාත දකුණ II යටතේ හෝමාගම ප්‍රදේශයේ HM55 උපපොළෙහි වීථි ලාම්පු නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ ආලෝකකරණ සවිකෘත (luminaires) 175 ක් ස්ථාපනය කරන ලදී. ඒ එක් එක් ආලෝකකරණ සවිකෘතය වොට් 9 ආලෝක විමෝචන ඩයෝඩ පහන් දෙකකින් සන්නද්ධ විය. ආලෝකකරණ සවිකෘතයන්ද ලං.වි.ම. වැඩපළ මගින් නිෂ්පාදනය කරන ලදී.
- විදුලි බල සැපයුම් කර්මාන්ත සමුළුවේ (CEPSI) ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට ලං.වි.ම. සහභාගිත්වය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලද අතර, එහිදී ලං.වි.ම. විවිධ ආයතනවල ඉංජිනේරුවන් විසින් රචිත පූර්ණ නිබන්ධන 10 ක් ඉදිරිපත් කිරීම සඳහා ලං.වි.ම. ට අවස්ථාව ලබාගත හැකිවිය.


රූපය C1: බලශක්ති කාර්යක්ෂම වීථි ආලෝකකරණය

- ANTE - LECO එකලා සුහුරු බලශක්ති මනු හා ගැලපෙන්නාවූ සන්නිවේදන මොඩියුලයක් ගොඩනංවන ලදී. පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් ගොඩනංවන ලද සංඥා නිරීක්ෂක පද්ධතියක් සමගින් සාර්ථකව එය පරීක්ෂණයට ලක් කරන ලදී. ලං.වි.ම. තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ගොඩනගන ලද සංඥා නිරීක්ෂක පද්ධතියක් සමග ක්‍රියාත්මක වනු පිණිස 2021 වසර තුළ මෙම මොඩියුලය තවදුරටත් වැඩිදියුණු කරන ලදී. ගතික අභ්‍යන්තර ප්‍රොටෝකෝල සිම් කාඩ්පත් හා සාපේක්ෂව ක්‍රියාත්මක කිරීම වියදම් අධික වන ස්ථිතික අභ්‍යන්තර ප්‍රොටෝකෝල සිම් කාඩ්පත් අවශ්‍යතාවයකින් තොරව දෙපසට සන්නිවේදනය කිරීමේ හැකියාව වර්තමාන සැලසුම තුළ අන්තර්ගතය. මෙම සැලසුම මගින් උපකරණ භාෂා පණිවිඩ පිරිවිතරණ/බලශක්ති මනුකරණය සඳහා සහායක පිරිවිතරණ යෝග්‍ය බලශක්ති මනුවක් ලං.වි.ම. සංඥා නිරීක්ෂණ පද්ධතිය හා සම්බන්ධ කිරීමට සහාය දක්වනු ලබයි.

- කටුනායක සුහුරු මනුකරණ ව්‍යාපෘතිය - අදියර 2 සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් සකසා ඇත. මෙම පද්ධතියේ පවත්නා ප්‍රධාන සුභවාදී ලක්ෂණ වනුයේ ස්වයංක්‍රීයගත මනු කියවීමේ හා දුරස්ථ විසන්ධිකරණ පහසුකම් වන බැවින් ව්‍යාපෘතිය සම්පූර්ණ වූ පසු කටුනායක පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ක්ෂේත්‍රය සඳහා කිසිදු මනු කියවන්නෙකු හෝ විසන්ධිකරණ කණ්ඩායමක් අවශ්‍ය නොවනු ඇත. මෙයට අමතරව, බෙදාහැරීමේ උපපොළ නිරීක්ෂණ පද්ධතියක් හා පැටවුම් පැතිකඩ වැනි අගය එක්කළ සේවාද එතුළ අන්තර්ගත වනු ඇත. ලං.වි.ම. ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මගින් හඳුන්වා දීමට නියමිත මනු දත්ත කළමනාකරණ පද්ධතිය මගින් මෙම පද්ධතිය ඒකාබද්ධ කිරීමට සැලසුම් කොට ඇත. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 2 කි.

- ලං.වි.ම. ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධතිය සංවර්ධනය කෙරෙමින් පවතී. සමස්ත ආයතනය පුරා තොරතුරු ඒකාබද්ධ කිරීමේ අරමුණින් මෙමගින් ව්‍යාපාර ක්‍රියාවලි ස්වයංක්‍රීය කරනු ඇත. ජනන, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා මධ්‍යගත සේවාවන්හි වෙන් වෙන් වශයෙන් එන ව්‍යාපාර ක්‍රියාවලි සියලු මට්ටම්හිදී ආයතනය පුරා තොරතුරු ගලායන අයුරින් ඒකාබද්ධ කෙරෙනු ඇත.

## සේවාවන් සඳහා ලද පිළිගැනීම්:

2020/2021 වසර තුළ CEB Assist එහි විසඳුම්ගත අති විශිෂ්ටත්වය හේතුවෙන් තෙවරක් සම්මානයට පාත්‍ර වී ඇත. ඉහළම ජාතික ගුණාත්මක මෘදුකාංග - ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන ප්‍රදානෝත්සවය - 2021 හි ජයග්‍රාහක ලෙසද, රාජ්‍ය අංශයේ විශිෂ්ටතම තොරතුරු තාක්ෂණ සාර්ථකත්ව සම්මානය හා ඉහළම ජාතික ගුණාත්මක මෘදුකාංග - ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන ප්‍රදානෝත්සවය - 2020 හි ගෘහස්ථ කාණ්ඩයේ රිදී සම්මානය වශයෙනි.





කිලිනොච්චි - චුන්නාකම් සම්ප්‍රේෂණ මාර්ගය

# මූල්‍ය අවදානම් කළමනාකරණය

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ කාර්යයන් සම්බන්ධ සැලකිය යුතු මූල්‍යමය නොවන අවදානම් නිරාවරණයක් සහිත උපයෝගිතා ආයතනයකි. පහත සඳහන් ක්‍රම හරහා ලං.වි.ම. මූල්‍යමය අවදානම් වෙතද නිරාවරණය වේ:

1. ලංකා විදුලිබල මණ්ඩලය විවිධ වූ පොළී වියදම්වලට නිරාවරණය කරමින් ලං.වි.ම. ව්‍යාපාර මාදිලිය බොහෝ කොටම බැංකු හා මූල්‍ය වෙළඳපලයන් වෙතින් ලබාගන්නා ණය අරමුදල් මත රඳා පවතී. ලං.වි.ම. ආදායම ප්‍රධාන වශයෙන්ම සිය පාරිභෝගිකයන් වෙත විදුලිය අලෙවි කිරීමෙන් ලබාගන්නා අතර, එහි විදුලි අයකුමය 2014 වසරේ සිට නොවෙනස්ව පවතී. එබැවින්, තීව්‍ර වූ මූල්‍ය පිරිවැය ආදායමට අවදානමක් ඇති කරමින් මාරු කළ නොහැකි වේ. ශ්‍රී ලංකාවේ ණය ස්ථානගත වීම/ ශ්‍රේණිගත වීම වඩාත් අයහපත් අතට හැරීම හේතුකොට විදේශ විනිමය අරමුදල්කරණ පිරිවැය ඉහළ යා හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ලං.වි.ම. ණය ශ්‍රේණිගතකරණයද ඇද වැටිය හැක. මෙයට ප්‍රතිගාමීව, අරමුදල්කරණ පිරිවැය අඩු වුවහොත්, ලං.වි.ම. වෙත ලාභ වර්ධන ප්‍රතිලාභයක් අත්වනු ඇත. වෙළඳපල පොළී අනුපාතය අඩු වුවහොත්, ලං.වි.ම. හි සම කොටස්වලට ණය අනුපාතය පහත වැටුණහොත් හෝ ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගතකරණ මට්ටම වැඩිදියුණු වුවහොත් සිදුවන විදේශ විනිමය මගින් ණය ගැනීම් තත්ත්වයන්හිදීද අරමුදල්කරණ පිරිවැය අඩුවිය හැක.

   ස්ථාවර අනුපාත ණය ගැනීම් කල් සපිරීමේදී මුදල් ආපසු ගෙවීම වෙනුවට නැවත අලුත් කිරීමේ හැකියාවක් පවත්නා බැවින් ස්ථාවර අනුපාත ණය ගැනීමද ගතික දෘෂ්ටි කෝණයකින් ගත්කල පොළී අනුපාත අවදානමට බලපායි. පෙරදී ගත් ණය අනුපාතයනට වඩා කල් ඇදී යාමේදී අය කරනු ලබන අනුපාතයන් මගින්ද පොළී අනුපාත අවදානමක් ඇතිවිය හැක.

2. විදේශ ණය ගැනීම්, අදාළ මුදල් පිටත ගලනයන් ගැලපීම සඳහා විදේශ විනිමය ස්වරූපයෙන් සමාන ආදායම් නොමැති භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් විශේෂ කොටගෙන ලං.වි.ම. ව්‍යාපාර මාදිලිය තුළ සැලකිය යුතු විදේශ විනිමය මූල්‍ය ධාරාවන් අන්තර්ගත වන බැවින්, ලං.වි.ම. මඟහැර යා නොහැකි විදේශ විනිමය අවදානමකට නිරාවරණයව ඇත.

3. ප්‍රධාන කොටම ද්‍රව ඉන්ධන, ගල් අඟුරු, අමතර කොටස් හා ද්‍රව්‍ය හේතුකොට ගෙන පාරිභෝගික ද්‍රව්‍ය අවදානමකටද ලක්වීමේ ඉඩකඩක් ලං.වි.ම සතුවේ. පාරිභෝගික ද්‍රව්‍ය මිල ඉහළ යන්නේ නම්, ලං.වි.ම. ට වඩා ඉහළ මිලදී ගැනීමේ පිරිවැයට දරාගැනීමට සිදුවන අතර, නොඑසේ නම් එතුළ ලාභය පහත වැටීමේ බලපෑමක් අන්තර්ගත වේ. පසුව සිදුවන පාරිභෝගික ද්‍රව්‍ය කොන්ත්‍රාත්තුවේ සැලකිය යුතු වර්ධිත මිලදී ගැනීමේ පිරිවැය පියවෙන ආකාරයෙන් සිය අලෙවි මිල ගණන් ලං.වි.ම. ට සැලසුම් සහගතව ඉහළ දැමීමට නොහැකි නම් දිගු කාලීන මිලදී ගැනීමේ කොන්ත්‍රාත් තුළද පාරිභෝගික ද්‍රව්‍ය අවදානමක් පිළිබිඹු වන්නේය යන්න අවධානයට ගැනීම වැදගත් වේ.

4. ලං.වි.ම. ව්‍යාපාර මාදිලිය හා ගෙවීම් පුරෝකථන හැකියාවන් තුළ තදුවිත පදනමකින් ආවරණය කළ යුතුවන අනපේක්ෂිත මුදල් හිඟයන්ද ඇතුළත් වේ. හිඟය සැලකිය යුතු එකක් වන අතර, ආවරණය කිරීම දුෂ්කර එකක් විය හැකි අතර, නොඑසේ නම් දණ්ඩන අනුපාතයකින් පමණක් ආවරණය කළ හැකි එකක් විය හැක.

අවදානම් කළමනාකරණයෙහි අරමුණ වනුයේ පොළී අනුපාත, විනිමය අනුපාත හෝ පාරිභෝගික ද්‍රව්‍ය මිල අනාගතයේදී ස්ථානගත විය හැකි තත්ත්වයන් කවරේද යන්න නිවැරදිව පුරෝකථනය කිරීම නොව සිදුවිය හැකි පොළී අනුපාතික, විනිමය අනුපාතික හා පාරිභෝගික ද්‍රව්‍ය මිල විචලන පරාසයන් මාදිලිගත කොට මෙම විචලනයන් තුළින් ලං.වි.ම. වෙත ඇතිවන ප්‍රතිඵලයේ ඇතිවිය හැකි සෘණාත්මක (හෝ ධනාත්මක) බලපෑම් ප්‍රමාණකරණයයි.

## මූල්‍ය අවදානම් කළමනාකරණ රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ අවදානම් කළමනාකරණයේ හා විශ්ලේෂණයේ අවසන් වගකීම දරයි. කෙසේ වුවද, ලං.වි.ම. මූල්‍ය කළමනාකරු වෙත සෘජුවම වාර්තා කරන අතිරේක මූල්‍ය කළමනාකරු යටතේ පාලනය වන භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව විසින් ලං.වි.ම. මූල්‍ය අවදානම් කළමනාකරණ කාර්යයේදී තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ලං.වි.ම. මූල්‍ය අවදානම් කළමාකරණ ක්‍රියාවලිය පහත සඳහන් පියවර 7 න් සමන්විත වේ:




අවදානම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය වූකලි වාර්ෂිකව ඉහළ සිට පහළට විහිදෙන්නාවූ ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය තුළ ලං.වි.ම. ලාභාලාභ එහි ප්‍රධාන අංගයන් තුළට බන්ධනය කොට කවර තත්ත්වයන් යටතේ ආදායම් පහළ වැටිය හැකිද, කවර තත්ත්වයන් යටතේ එය ඉහළ මට්ටමක පැවතිය හැකිද යන්න ගවේෂණය කරනු ලබයි.

අවදානම් තක්සේරුකරණය (මැනීම) තුළදී, කවර ගනුදෙනු හා තත්ත්වයන් මගින් අනපේක්ෂිත ඉහළ මුදල් පිටත ගලනයන් සිදුවිය හැක්කේද යන්න ගවේෂණය කරනු ලබයි.

අවදානම් රෝචනය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුවෙන් ගත හැකිවන අවදානම් ප්‍රමාණය (අවදානම් හැකියාව) අර්ථ කථනය කෙරෙන අතර, එය වාර්ෂිකව සකස් කරනු ලැබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි. අවදානම් රුචිය සීමා පැනවීම මගින් මෙහෙයුම්ගත කරනු ලබයි. එමගින් අවදානම් රුචිය යම් යම් අවදානම් ගන්නන් හට භාර ගැනීමට අවසර ලබාදෙනු ලබන අවදානම් ප්‍රමාණය අර්ථ කථනය කරමින් අවදානම් රුචිය කළමනාකරණය කරගත හැකි ප්‍රමාණයනට කඩනු ලබයි. එක් එක් විධායක නිලධාරියා වෙත මෙන්ම ප්‍රසම්පාදන කමිටුවල විවිධ මට්ටම් සඳහාද ලබාදෙන මූල්‍ය බල සීමාවන් පනවමින් කලින් කලට චක්‍රලේඛ නිකුත් කරනු ලබයි. මෙමගින් වඩා ඉහළ අවදානම් ලබාගැනීම සඳහා අවසර ලබාදෙනු ලැබ ඇති වඩා අත්දැකීම් බහුල හා කුසලතා පූර්ණ නිලධාරීන් මගින් ඉහළ අගයන් සහිත ගනුදෙනු පරීක්ෂා කොට බලා අනුමත කරනු ලබන බවට වගබලාගනු ලබයි.

විමධ්‍යගතව අවදානම් ගැනීම නොව මධ්‍යගත අවදානම් කළමනාකරණය ලං.වි.ම. අවදානම් කළමනාකරණයට පාදක වන මූලධර්මය වේ. උපරිම නිරාවරණ ගැලපීම් හැකියාව, වැඩි ප්‍රමාණයක කුඩා ඒවාට වඩා මහා පරිමාණ අවදානම් සමන ගනුදෙනුවලට එළැඹීම හරහා සිදුකරන මහා පරිමාණ ආර්ථික කටයුතු සම්බන්ධ වාසි සහගත තත්ත්වයන් හේතුකොට අවදානම් කළමනාකරණය මධ්‍යගත කෙරේ. එක් එක් අංශයෙහි සතිපතා අවශ්‍යවන මූල්‍ය අවශ්‍යතාවය මුදල් අංශයේ ගෙවීම් ඒකකය වෙත යොමු කෙරෙන අතර, එම ඒකකය විසින් දෛනික මුදල් රැස්කිරීම් හා ගලපමින් දෛනික මුදල් අවශ්‍යතාවයන් තක්සේරු කරනු ලබයි. ඒ අනුව සමස්ත ලං.වි.ම.ට අදාළ අරමුදල්කරණ අවශ්‍යතාවයන් හඳුනාගනු ලැබ මුදල් අවශ්‍යතාවය සපුරාලමින් සිය වියදම් සඳහා එක් එක් අංශය වෙත අරමුදල් වෙන්කරනු පිණිස වාසි සහගත පොළී අනුපාත හා අරමුදල්කරණ වැඩ පිළිවෙලයන් වෙනුවෙන් බැංකු සමග සාකච්ඡා කරනු ලබයි.

අවදානම් වාර්තාකරණය වූකලි ලං.වි.ම. විසින් භාරගනු ලබන සැබෑ අවදානම හා ඉන් මිදෙනු පිණිස ලබාදෙනු ලබන නිර්දේශ සම්බන්ධ නිතිපතා සිදුවන වාර්තාකරණයයි. මුදල් අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සකස් කොට ඉදිරිපත් කරනු ලබන මාසික කාර්ය සාධන වාර්තාවක් මගින් මූල්‍ය කාර්ය සාධනය, මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ධාරාවන් චලනය වන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් ලබාදෙනු ලබයි. තවද, අවදානම් නිරීක්ෂණය උදෙසා එමගින්, අදාළ ක්‍රියාත්මක කිරීම් සඳහා අවශ්‍ය තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හැකියාව ලැබෙන පරිදි උක්ත විශ්ලේෂණය මගින් හඳුනාගනු ලබන විභව්‍ය මූල්‍ය අවදානම් හා ඒ ආශ්‍රිත නිර්දේශයන්ද උද්දීපනය කරනු ලබයි.

## මූල්‍ය අවදානම් විශ්ලේෂණය

කොවිඩ් තත්ත්වය මත රට වසා දැමීමේ තත්ත්වය ලිහිල් කිරීමත් සමගින් ඇතිවූ නව සාමාන්‍යකරණය සමගින් විදුලිය සඳහා වූ සාමාන්‍ය ඉල්ලුම් රටාව නැවත ඇතිවූ අතර, විදුලිය අඩු පරිභෝජනයෙන් භාණ්ඩාගාරය මත පැනවුණු බර උපධානය ඉවත් කෙරිණි. පාරිභෝගිකයන් වෙතින් අඩු රැස්කිරීම් මට්ටමක් සහිතව වඩා ඉහළ මිල ගණන්වලට තාප ජනනයනට අදාළ බලශක්තිය මිලදී ගැනීම් වෙනුවෙන් මුදල් යොමු කිරීමේ අභියෝගය ආයතනය වෙත පැවතිණි. තවද, ලෝකයේ ඉහළ ගල් අඟුරු මිල ගණන් හේතුකොට භාණ්ඩාගාරය වෙතද පීඩනයක් එල්ල විය.

## විදේශ විනිමය හිගය

ලං.වි.ම. විසින් විදේශ විනිමය නොමැති වීමේ ගැටලුවටද මුහුණ පාමින් සිටී. කෙසේ වුවද, මහජන බැංකුව මත රඳා පැවතීමෙන් තොරව සෙසු බැංකු වෙතින් විදේශ විනිමය මිලදී ගනිමින් එම බැංකු සමග පැවති බැංකුකරණ සම්බන්ධතාවය උපයෝගී කරගනිමින් සැලකිය යුතු මට්ටමකට එම තත්ත්වය නිරාකරණය කරගැනීමට භාණ්ඩාගාරයට හැකිවිය. තවද, විදේශ විනිමය නිරාවරණ තත්ත්වය අවම කරගැනීමක් වශයෙන් ප්‍රමුඛතාගතකරණය මගින් විදේශ විනිමය සීමාකරණ ක්‍රියාවලියකට භාණ්ඩාගාරය අවතීර්ණ විය.

## මුදල් හා ද්‍රවශීලතා කළමනාකරණය

ලං.වි.ම. විසින් නොකඩවා මෑත වසරවලදී ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. මෙවන් තත්ත්වයක් තුළ මුදල් හා ද්‍රවශීලතා කළමනාකරණය තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි. තරගකාරී පරිසරයන් මගින් සිය අභ්‍යන්තර ක්‍රියාවලි ප්‍රමිතිගත කරමින් අභ්‍යන්තර පාලනයන් සවිමත් කිරීම මගින් වඩා දියුණු මුදල් කළමනාකරණ විසඳුම් ගොඩනගා ගනිමින් සිය මුදල් රැස්කිරීම් හා ගෙවීම් සමාලෝචනය කිරීමට ආයතනයට බල කෙරී ඇත.

කොවිඩ් වෛරසය පැතිරී යාමත් සමගින්, පාරිභෝගිකයන් හට වැයකළ හැකි ආදායම පහත වැටිණි. බිල්පත් පියවීම සඳහා සහන කාලයක් ලබා දෙමින් බිල්පත් නොගෙවන ලද පාරිභෝගිකයන්ගේ විදුලිය විසන්ධි කිරීමේ කාර්යයන් කල් තැබීමේ රජයේ තීරණය මගින් ඒවන විටද බලපෑමට ලක්ව තිබූ මූල්‍ය ධාරාවනට සැලකිය යුතු බලපෑමක් ඇතිවිය. එබැවින්, භාණ්ඩාගාර කළමනාකරණ කණ්ඩායමේ නිර්දේශයද සහිතව, තත්ත්වය නිරාකරණය පිණිස මණ්ඩලය විසින් පහත සඳහන් ක්‍රමෝපායන් අනුමත කරන ලදී.

- වැදගත් මුදල් ගනුදෙනු දැඩිසේ නිරීක්ෂණය කිරීමට ඉඩ ලබාදෙමින් මුදල් ගෙවීම් දැඩිසේ ප්‍රමුඛතාගත කරමින් ප්‍රාග්ධන වියදම් අත්‍යවශ්‍ය අංශයනට පමණක් සීමා කිරීම.
- සහශ්‍රක තොරතුරු තාක්ෂණ හා මූල්‍ය තොරතුරු ජාල (MITFIN) පද්ධතියේ ගෙවීම් පිළිබඳ මොඩියුලයේ තාක්ෂණික දියුණුව මගින් මණ්ඩලයේ දෛනික ණය නිරාවරණ තත්ත්වය සම්පාදනය කරන ලද අතර එමගින් අනාගත මුදල් අවශ්‍යතා සැලසුම් කිරීමට උපකාරයක් ලැබිණි.
- ප්‍රමුඛතාගත ගෙවීම් සඳහා මුදල් පවත්වා ගැනීමේ හැකියාව පුළුල් වන පරිදි සැපයුම්කරුවන්ගේ ණය කාල සීමාව උපරිම ලෙස උපයෝජනය.
- අඩු පොළී අනුපාත හා ගෙවීම් කාල සීමාවන් දීර්ඝ කිරීම් දක්වා පවත්නා ණය ප්‍රමාණය ප්‍රතිව්‍යුහගත කිරීම.
- අලෙවි ලැබීම් නිසි කලට ඒකරාශී කරගැනීමේ වර්ධනයක් ඇති කරමින් මෙම වසංගත තත්ත්වය තුළ බිල්පත් පියවීම සඳහා ගනුදෙනුකරුවන් හට වැඩි විකල්ප අවස්ථාවන් ලබාදෙමින් මාර්ගගත මුදල් රැස් කිරීමේ පහසුකම් පුළුල් කිරීම.
- තරගකාරී පොළී අනුපාත ආකර්ශනය කරගනු පිණිස රජයේ බැංකු හැරුණු කොට පුද්ගලික වාණිජ බැංකු වෙතද මූල්‍ය විකල්ප ව්‍යාප්ත කෙරිණි.
- මූල්‍ය තත්ත්වය බලගැන්වීම පිණිස මුදල් අයකර ගැනීමේ මාදිලිය සකස් කිරීම.

# තාක්ෂණික අවදානම් කළමනාකරණය

### අවදානම් හඳුනා ගැනීම

ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරකම් ස්වරූපය හා විදුලිය හා සම්බන්ධ අවදානම් සලකා බලන කල, අවදානම් සමන ක්‍රියාමාර්ග ලං.වි.ම. ක්‍රියාකාරීත්වයෙහි කොටසක් වේ. ගුණාත්මක, විශ්වසනීය හා පිරිමැසුම්දායී විදුලි සැපයුම්කරුවෙකු වශයෙන් ආයතනයේ නිසි ක්‍රියාකාරීත්වයට බලපෑ හැකි අවදානම් පිළිබඳව ලං.වි.ම. විසින් හඳුනාගනු ලැබ ඇත.

අවදානම් හඳුනා ගනිමින් සිදුවීමේ හැකියා මට්ටමට හා ඒවාහි සෘණාත්මක හෝ ධනාත්මක ප්‍රතිවිපාක පරිමාණයට අනුව ඒවා වර්ගීකරණය කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම තීරණාත්මක වැදගත්කමකින් යුක්ත කරුණක් වේ. හඳුනා ගන්නා ලද හා වර්ගීකරණය කරන ලද ඉහළ ප්‍රතිවිපාක ඇතිවිය හැකි අවදානම් සමහරක් සැලසුම්කරණ ක්‍රියාවලිය, ආයතනික සැලැස්ම, දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම, දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම හා අයවැය තුළ ආමන්ත්‍රණය කෙරේ. සෙසු ඒවා සම්බන්ධයෙන් වගකිව යුතුවන අංශ මගින් හදිසි ක්‍රියාමාර්ග තුළ කටයුතු කරනු ලබයි.

### මූල්‍ය අවදානම් හා තාක්ෂණික කාර්ය සාධනය කෙරෙහි ඉන් ඇති කෙරෙන බලපෑම්

පිරිවැය පිළිබිඹු කරන්නාවූ/පිරිවැය පියවාගත හැකිවන අයක්‍රමයක් නොමැති වීම වූකලී දැඩි ප්‍රතිවිපාක ඇති කරන අවදානම් සාධකයකි. එම අවදානම මූල්‍ය කාර්ය සාධනයට පමණක් නොව, තාක්ෂණික කාර්ය සාධනයටද බලපෑම් කර ඇත.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30(2)(ආ) වගන්තිය යටතේ, බලයලත් කටයුතු සිදු කිරීමේදී දැරීමට සිදුවන සියලු සාධාරණ පිරිවැය පියවා ගැනීමට ලං.වි.ම. වෙත අවසර ලබාදී ඇත. ලං.වි.ම.ට මූල්‍යමය විභවයක් සහිත ආකාරයෙන් සිය බලයලත් ප්‍රධාන කටයුතු නොකඩවා සිදු කිරීමට හැකියාව ලබාදෙන බවට වගබලා ගැනීම එම වගන්තියේ අරමුණ වේ. කෙසේ වුවද, පිරිවැය පියවන සුළුවූ අයක්‍රමයක් නොමැති වීම තුළ ලං.වි.ම.ට සිය ප්‍රධාන කර්තව්‍ය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වීමේ අවදානම තවදුරටත් වර්ධනය කෙරී ඇත.

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ V කොටස යටතේ, සිය පිරිවැය පියවා ගැනීම සඳහා අයක්‍රම හා ගාස්තු ස්ථාපනය කිරීමේ බලතල ලං.වි.ම. වෙත පැවතිණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ එම බලතල අවලංගු කොට නියාමනායතනය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත එම බලතල පවරා දෙන ලදී. සමස්ත රට පුරා විහිදෙන ආකාරයෙන් "ඒකාකාර ජාතික අයක්‍රමයක්" (UNT) පවත්වාගෙන යාම රජයේ ප්‍රතිපත්තිය වන බැවින්, එවන් ඒකාකාර ජාතික අයක්‍රමයක් පවත්නා කාල සීමාවන් තුළ සියලු පාරිභෝගිකයන් වෙත අදාළ වන අවසන් පරිභාරක අයක්‍රම සැලැස්මක් පිහිටුවීම තනි බලපත්‍රලාභියෙකු හට සිදුකළ නොහැකි බැවින් එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වගකීම බවට පත් කරන ලදී. කෙසේ වුවද, 2014 අයක්‍රම අඩු කිරීම මධ්‍යයේ වුව 2013 වසරේ සිට කිසිදු අවසන් පරිභාරක අයක්‍රම වර්ධනයක් සිදු නොකරන ලදී. අඩු පිරිවැය විදුලි බලාගාර ඉදි කිරීමේ නොහැකියාව විසින්ද මූල්‍ය අලාභය තවදුරටත් අයහපත් අතට හරවනු ලැබ ඇත. ද්‍රව ස්වභාවික වායු (LNG) හඳුන්වා දීමත් සමගින් ලං.වි.ම. විසින් ජනන පිරිවැය යම්තාක් අඩු කිරීමට අපේක්ෂා කරනු ලබයි. කෙසේ වුවද, ද්‍රව ස්වභාවික වායු සහිත තත්ත්වයන් තුළද, අයක්‍රමයක් හෝ සහන සම්පාදනයක ආකාරයෙන් රජයේ මැදිහත්වීමකින් තොරව ලං.වි.ම. ආදායම පිරිවැය පියවා ගන්නා මට්ටමට පැමිණෙනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

රජයේ ප්‍රතිපත්තිමය තීන්දු මගින් අවශ්‍ය කරවන ලද පරිදි, මේ දක්වා සහන ප්‍රතිපූරණ ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් නොකඩවා ඉල්ලීම් සිදුකර ඇත.

### ප්‍රමාණවත් නොවන ජනන ධාරිතා සම්බන්ධ අවදානම

ලං.වි.ම. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලසුම් තුළ හඳුනාගනු ලැබ ඇති පරිදි (දිගු කාලීන අවශ්‍යතාවයන් හා මැදි කාලීන හිදැස් පියවීමේ අවශ්‍යතා යන දෙවර්ගයම උදෙසා වූ) විදුලි ධාරිතාවයන් සැලසුම්ගත පරිදි ක්‍රියාත්මක කොට නොමැති තත්ත්වයක, අපේක්ෂිත මට්ටමට වඩා අඩු සංචිත ධාරිතාවයක් සහිතව ක්‍රියාත්මක වීමට ලං.වි.ම.ට සිදුව ඇත. නිසි කලට සැලසුම්ගත ජනන ඒක් කිරීම් ඉදි කිරීමට නොහැකි වීම මගින් විෂම චක්‍රයක් ක්‍රියාත්මක කරවනු ලබයි. අඩු සංචිත ආන්තිකයන් මගින් දැනට පවත්නා විදුලි බලාගාර සැලසුම්ගත පරිදි වැළකුම් නඩත්තු කටයුතු සඳහා හෝ වෙනත් සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා ඉවත් කරගැනීම වළකාලනු ලබයි. එය යන්ත්‍ර සූත්‍රයන්හි විශ්වසනීයත්වයට බලපාන කරුණක් වන අතර, ඉල්ලුම සපුරාලීම සඳහා පවත්නා ධාරිතාව හෙවත් හැකියාව එමගින් තවදුරටත් පහතට ඇද දමනු ලබයි. සංචිත ධාරිතාවයක් නොමැති වීම මගින් විශාල බලාගාරයක දිගු කලක් පවත්නා විදුලිය බිඳ වැටීමකදී විදුලිය අත් හිටුවීම් සිදු කිරීමට සිදුවේ. තවද, පද්ධතිය තුළ පවත්නා අප්‍රමාණවත් සංචිත ජනන ධාරිතාව මගින්, දිගු කලක් පුරා ඇදී යන වියළි කාලගුණික තත්ත්වයන් තුළ හා/හෝ විශාල ජනන ඒකකයක විදුලි නිපැයුම බිඳ වැටීමකදී කෙටි කාලීන අනුපූරක විදුලි සම්පාදනයන් කලින් කලට ලබාගැනීමට ලං.වි.ම. යොමු කරවනු ලබයි.

### ජාල ව්‍යාප්ති අවදානම - ජාල ව්‍යාප්ති ප්‍රමාදය

අනාගත විදුලි බලාගාරයන් වෙතින් විදුලිය ගෙන යමින් වඩාත් විශ්වසනීය ආකාරයකින් ඉහළ යමින් පවත්නා බලශක්ති ඉල්ලුම සේවාකරණය පිණිස ඉහළ, මධ්‍යම හා අඩු වෝල්ටීයතා ජාල ව්‍යාප්තීන් සැලසුම් කොට ඇත. මේවා තුළට නව සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පරිපථ ඉදිකිරීම, නව උපපොළ විශාලනය/ඉදිකිරීම, ජාල ගුණාත්මකභාවය වර්ධනයන් ආදිය ඇතුළත් වේ. ජනන බලාගාරයන් වෙතින් නිපදවන විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා නව සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සමගින් නිසි කාල රටාගත කළ යුතු වන්නේ පළමු කරුණෙහි සිදුවන ප්‍රමාදය තුළ පසු කරුණ මගින් විදුලිය සම්ප්‍රේෂණය/බෙදාහැරීම කිරීම ආශ්‍රිත ප්‍රමාදයන් ඇති කරන බැවිනි. වසර 20 ක් හෝ වැඩි ගණනක් පුරා සේවා සම්පාදනය කොට ඇති මැදි වෝල්ටීයතා ජාලයන්හි සංගත වායු පරිවරණිත උපපොළයන්ද ඇතුළත් ඇතැම් ස්විච්පන්නයන්හි විශ්වසනීයත්වය විග්‍රහ කොට බැලිය යුතුවන කාලය එළැඹ ඇත. ජල සම්පාදන, ඛනිජ තෙල් වැනි කේන්ද්‍රීය උපයෝගිතා සේවාවනට හා අපනයන පිරිසැකසුම් ප්‍රදේශ වැනි කර්මාන්ත වෙතට එම උපපොළයන්හි විශ්වසනීයත්වය නව දෘෂ්ටි කෝණයකින් විමසා බැලිය යුතු වන්නේ එවන් ප්‍රධාන සේවා හා කර්මාන්ත වෙත නොකඩවා විදුලිය සැපයුම සහතික කිරීම සඳහා විදුලිබල සැපයුම් විකල්ප පවත්නේද යන්න විමසිය යුතුවන බැවිනි. තවද, ජාල විශ්වසනීයත්වය වැඩිදියුණු කරනු පිණිස මාරු කළ යුතුවන වයස්ගත, පැරණි ජාල උපකරණ පවතී. එවන් මාරුකරණයන් සඳහා අරමුදල් සොයා ගැනීම මෙන්ම සංචිත හිඟය හා ජනන හා සම්ප්‍රේෂණ

යන දෙවර්ගයේම ජාලයන්හි අතිරික්ත ධාරිතාවයද බරපතල අභියෝගයක් හා අවදානමක් ලෙස සැලකිල්ලට ගනු ලැබ ඇත. කාර්ය වියුක්ත කාල ප්‍රමාදයන් රහිතව හෝ කිසිදු ආපදාවක් සිදු නොවන පරිදි කඩිනමින් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ හැකිවන පරිදි දෝෂ සිදුවීම් කල්තබා පුරෝකථනය කිරීමේ හැකියාව ලබාදෙන අඛණ්ඩ තත්ත්ව නිරීක්ෂණ අභ්‍යාසයන් මගින් මෙම ජාල උපකරණ සමහරක් නොපවත්නා තත්ත්වය හා බැඳි අවදානම අවම කෙරේ.

## මානව සම්පත් අවදානම - කුසලතා පූර්ණ හා අභිප්‍රේරිත කාර්ය බලකායක් නඩත්තු කිරීමේ අභියෝග

කුසලතා පූර්ණ කාර්ය බලකායක් පවත්වාගෙන යාම වූකලි අස්පෘශ වත්කමක් වන අතර, එය ජාල උපකරණ මනාසේ නඩත්තු කිරීමෙහිලා තීරණාත්මක වැදගත්කමකින් යුක්ත කරුණකි. ජාතිය වෙත ගුණාත්මක භාවයෙන් යුත් සේවාවක් ලබාදීමේ අපේක්ෂාව පෙරදැරි කරගත් ලං.වි.ම. කේන්ද්‍රීය ව්‍යාපාර නඩත්තු කිරීම විෂයයෙහි සේවක අභිප්‍රේරණය වැදගත් වේ. තවද, කර්මාන්තගත ආරවුල් වළකාලනු පිණිස සේවා නියුක්තික තෘප්තිය ප්‍රධාන සාධකයක් වේ. අඛණ්ඩ පුහුණු වැඩසටහන් හා රැකියාගත පුහුණු මගින් ලං.වි.ම. විසින් කුසලතා පූර්ණ කාර්ය බලකායක් නඩත්තු කරනු ලබයි. ඇතැම් රැකියා කර්තව්‍යයන් හා බැඳි අති විශේෂීකරණ ස්වභාවය සැලකිල්ලට ගැනීමේදී, තීරණාත්මක වැදගත්කමකින් යුත් තාක්ෂණික ක්ෂේත්‍ර ආශ්‍රිත ප්‍රවීණත්වය තබාගැනීමේ අදහසින් සම්ප්‍රදායික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ නව මං සොයා බලනු ලැබේ.

## ණය දෙන නියෝජිතායතන වෙතින් එල්ලවන පීඩනය හේතුවෙන් ප්‍රමුඛතාගත ක්ෂේත්‍රයන් වෙතින් අරමුදල් ලබාගැනීමේ අවදානම

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 38 වන වගන්තිය යටතේ මණ්ඩලයේ සේවා සංවර්ධන පිරිවැයෙහි සැලකිය යුතු කොටසක් සපුරාලීම සඳහා මණ්ඩලයේ ආදායම ප්‍රමාණවත් වන්නේය යන කරුණ සහතික කිරීමේ වගකීම මණ්ඩලය වෙත ලබාදෙන ලදී. එනමුත්, අයක්‍රම හා ගාස්තු පැනවීමේ බලය ලෙස එම මුදල් ලබාගැනීම උදෙසා ලං.වි.ම. වෙත පැවතිය යුතුවන මෙවලම් 2009 වසරේදී ලං.වි.ම. වෙතින් ඉවත් කොට ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලබදෙන ලදී. ස්වකීය වූ අරමුදල් නොපැවතීම වූකලි ජාත්‍යන්තර අරමුදල් ලබාගත නොහැකිවන ක්ෂේත්‍රයන් ප්‍රධාන කොටගෙන ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම සම්ප්‍රේෂණ/ බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සම්බන්ධයෙන්ද වූ පොදු ගැටලුවකි. විදුලිබල අංශයේ ආයෝජන තීරණ විදුලි ඉල්ලුම, රජයේ ප්‍රතිපත්ති වෙනස් වීම, පාර්ශවකරු අපේක්ෂාවන්, සැපයුම් ජාල ගැටලු, ව්‍යාපාර අන්තර් ක්‍රියාවන් මෙන්ම කාලගුණික ප්‍රතිපත්ති මගින් එල්ලවන බලපෑමද ඇතුළත් සංකීර්ණ සාධක සමූහයක් මගින් හැඩ ගන්වනු ලබයි. ෆොසිල ඉන්ධන, රජය සතු උපයෝගිතා ව්‍යුහ ආදිය කෙරෙහි ලෝකයේ වෙනස් වෙමින් පවත්නා අදහස්වලට ඉඩ හසර සලසනු පිණිස අරමුදල් සම්පාදනායතනද තමාගේම වූ අරමුදල්කරණ ප්‍රතිපත්ති සකසා ඇත. මේ අනුව, අරමුදල් පවත්නේ ලං.වි.ම. සැබෑ උවමනාවන් සඳහා නොව අරමුදල් සම්පාදන නියෝජිතායතනයන්ගේ ප්‍රතිපත්ති සපුරන්නාවූ ක්ෂේත්‍රයන් සඳහා පමණි.

ණය ප්‍රඥප්ති හරහා කොන්දේසි අවධාරණය කිරීම මගින්ද, ප්‍රමුඛතාගත ක්ෂේත්‍රයනට වඩා එම ණයදෙන ආයතන ණය දීමට කැමැත්තක් දක්වන්නාවූ ක්ෂේත්‍ර කෙරෙහි සීමිත ණය ගැනීමේ අවකාශය පවා යෙදීමට ආයතනය වෙත බල කෙරී ඇත.

## මහජන අදහස් සම්බන්ධ අවදානම හා උපයෝගිතා සැලසුම් සම්බන්ධ අභියෝග

විදුලි බලය භාවිත වනුයේ රටේ සමස්ත බලශක්ති භාවිතයෙන් 12% ක අගයකට පමණි. කෙසේ වුවද, ඉතිරි 88% ට වඩා බොහෝ විට ඉහළ වාණිජමය ලැදියාව හේතුකොට, මාධ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, පාරිසරික බලපෑම් කණ්ඩායම් ආදීන් වෙතින් විදුලිබල ක්ෂේත්‍රය වෙත වඩා වැඩි අවධානයක් යොමුව පවතී. විදුලිබල පද්ධතිය යනු සාමාන්‍ය ජනතාවගේ පමණක් නොව විදුලිබල පද්ධති පිළිබඳ අත්දැකීම් රහිත මූලික ඉංජිනේරු අධ්‍යාපනයක් සහිත පිරිස්වලද වැටහීම් ක්ෂේත්‍රයෙන් ඔබ්බෙහි පවත්නා අතිශයින් විශේෂඥ ස්වරූපයේ විෂයයකි. එබැවින්, උපයෝගිතා සැලසුම් හා තීරණ සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවට හා මාධ්‍ය වෙත සාධාරණීකරණය හා ඒත්තු ගැන්වීම ඉතා දුෂ්කර කරුණක්ව ඇත. විදුලිබල ක්ෂේත්‍රය විසින් අතිශයින් ආකර්ශනීය ව්‍යාපාරික අවස්ථාවන් ලබාදෙනු ලබන බැවින්, තමාට නිරත විය හැකි ව්‍යාපාරික ක්ෂේත්‍ර වෙත සහාය වන පරිදි සැලසුම් හා ප්‍රතිපත්ති වෙනස් කොට තමා විසින් අලෙවි කරනු ලබන තාක්ෂණයනට අවශ්‍ය ඉඩ හසර විවර කරගැනීමට ව්‍යාපාරික ලැදියාවන් සහිත කණ්ඩායම් වෙතින් බලපෑම් ඇතිවීමේ සැලකිය යුතු අවදානමක් පවතී.

ලං.වි.ම. සැලසුම්, ව්‍යාපෘති හා කටයුතු සම්බන්ධ මෙකී අනවබෝධයන් යම්තාක් සමනය කරනු පිණිස, ආයතනික ප්‍රතිරූපය ගොඩනගා පවත්වාගෙන යාම ආශ්‍රිත කටයුතු වෙනුවෙන් කැපවූ ක්‍රමෝපාය සන්නිවේදන ඒකකයක් (SCU) සැකසීම සඳහා වූ යෝජනාවක් මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

## වෙනස්වන ප්‍රතිපත්ති සම්බන්ධ අවදානම

විදුලිබල ව්‍යාපෘතිවලට දිගු වර්ධන කාල පරාසයන් පවතී. මෙලෙසින්, කල්තබා සංවර්ධන කටයුතු ආරම්භ කරනු පිණිස අවශ්‍ය දිනට බොහෝ කලෙකට පෙර සැලසුම් සකස් කරනු ලැබේ. විදුලිබල ව්‍යාප්තිය සඳහා සැලසුම්කරණය සඳහාද සැලකිය යුතු කාල වේලාවක් ගතවේ. එබැවින්, රජයේ ප්‍රතිපත්ති පැහැදිලි හා නොවෙනස් වනසුළු ස්වරූපයේ ඒවා විය යුතුවේ. වෙනස් වන්නාවූ හා අඛණ්ඩ නොවන රජයේ ප්‍රතිපත්ති මගින් උපයෝගිතා සැලසුම්කරණයට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම විෂයයෙහි ප්‍රධාන පෙළේ අභියෝග නිර්මාණය කරවනු ලබයි.

## සයිබර් අවදානම

ආයතනය වඩ වඩාත් තොරතුරු තාක්ෂණ අභිමුඛ ආයතනයක් බවට පත්ව ඇත. සියලුම ශාඛාවන් පාහේ ජාලගත කරනු ලැබ අන්තර් සම්බන්ධ කොට ඇත. තනි ස්ථානයක් වෙත අනවසර සයිබර් ඇතුළු වීමක් සමස්ත ජාලය පුරා විහිද යාමට තුඩුදිය හැකි බැවින් ඉහත කී තත්ත්වය හේතුකොට එම ශාඛාවන් බාහිර සයිබර් ප්‍රහාරයන්හි බලපෑමට අතිශයින් විවෘත ස්වරූපයක් ගනී.

ලං.වි.ම. වැනි විදුලි උපයෝගිතා ආයතන විසින් බහුලව භාවිත කරනු ලබන මෙහෙයුම් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් සන්නිවේදන හා පාලන අවශ්‍යතාවයන් සඳහා තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් භාවිත කරනු ලැබ ඇත. කෙසේ වුවද, කළමනාකරණ තොරතුරු තාක්ෂණ පද්ධති මෙන් නොව මෙම මෙහෙයුම් හා පද්ධති බොහෝ කොටම තනි හුදෙකලා ඒකක වශයෙන් ක්‍රියාත්මක වන අතර බාහිර සමගින් පවත්නා සම්බන්ධතාවය ඉතා පහළ මට්ටමක පවතී. තවද, මෙහෙයුම් තොරතුරු තාක්ෂණ පද්ධති බාහිරට සම්බන්ධ වන කල්හි, ඒවා ප්‍රවේශ ද්වාර වැනි අධි වියදම්කාරී ආරක්ෂක උපකරණයන්ගෙන් සමන්විත වන්නට වේ. එබැවින්, අනවසරයෙන් ඇතුල් වී බාහිරින් සිදු කෙරෙන ප්‍රහාරයන් සම්බන්ධව ඒවාහි පවත්නා අවදානමද අවම වේ. එසේ වුවද, සයිබර් ප්‍රහාර අවදානම නිරතුරු පවතී. මෙය ප්‍රහාරකයන් විසින් ආරක්ෂක පද්ධතීන්හි පවත්නා හිදැස් ප්‍රයෝජනයට ගැනීම හේතුකොට සිදුවිය හැකි අතර මානව දෝෂ හා අත් වැරදීම් පැවතිය හැක. අතිශයින් තාක්ෂණිකව උසස් මට්ටමක පවත්නා රටවලට පවා මෙහෙයුම්ගත තොරතුරු තාක්ෂණ පද්ධති දුෂ්කරතාවනට හෙළමින් හැකර්වරුන් විසින් ඉලක්ක කොට ප්‍රහාර එල්ල කොට ඇත. එබැවින්, මෙලෙස දුෂ්කරතාවන්හි හෙළීමේ අවදානම අවම කරනු පිණිස නිසි පරිදි හැඩ ගස්වා කළමනාකරණය කරන ලද උපකරණ මෙන්ම වඩා ප්‍රබල තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක්ද අවශ්‍ය වේ.

# විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය

තිරසරබව යනු ලං.වි.ම.හි මෙහෙවර ප්‍රකාශය තුළ ඇතුළත් එක් ප්‍රධාන වටිනාකමකි. තිරසරබව යන්න සමාජ, පාරිසරික හා ආර්ථික යන කුලුනු තුන මත පිහිටා ඇත්තේය යන්න ලං.වි.ම. විශ්වාසයයි. එබැවින්, සමාජ, පාරිසරික හා ආර්ථික පැතිකඩයන් අතර නිවැරදි සමතුලනයක් පවත්වාගෙන යන අතර සිය ප්‍රධාන මෙහෙයුම් කටයුතු සියල්ල ඉටු කිරීමට ලං.වි.ම. කැපවී සිටී.

**සමාජ**

- විශ්වසනීය විදුලි සැපයුම
- නොමිලයේ විදුලි සම්බන්ධතා
- පාරිභෝගික හිතකාමී මෙහෙයුම්

**පරිසර**

- හරිත බලශක්ති ඒකාබද්ධකරණය ප්‍රශස්ත කිරීම
- අඩු විමෝචන තත්ත්වයන් සහතික කිරීම
- රුක් රෝපණය

**ආර්ථික**

- පිරිවැය පිළිබිඹු කරන අයක්‍රමය
- වර්ධිත ආදායම
- වර්ධිත අඩු පිරිවැය ජනනය
- ජනන සංරක්ෂණය
- සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් හානිය අවම කිරීම

## ආර්ථික තිරසරබව

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විදුලි අංශය තුළ ලං.වි.ම. යනු ප්‍රධාන පෙළේ ආයතනයකි. එම ආයතනය තුළින් නොකඩවා වර්ධනය වන ඉල්ලුම සපුරනු පිණිස අන් කිසිදු මූලාශ්‍රයක් මගින් ආදේශනය කිරීම දුෂ්කර වන විදුලිය නමැති අත්‍යවශ්‍ය අයිතමය සපයනු ලබයි. ලං.වි.ම. පාඩු ලබන ආයතනයක් නොවිය යුතු බව මූලික ආර්ථික න්‍යාය තුළ යෝජනා කෙරෙනු ඇත. කෙසේ වුවද, ලං.වි.ම. 1969 වසරේ ස්ථාපනය කිරීමෙන් අනතුරුව, වසර ගණනාවක් පුරා පාඩු ලබන තත්ත්වයක පැවතිණි. මක් නිසාද, සමාජ හා දේශපාලනික සන්දර්භයක් තුළ, ලං.වි.ම. යනු ජනතාවගේ සේවා ආයතනයක් ලෙස සැලකෙන බැවිනි.

ඒ අනුව, ලං.වි.ම. විසින් විදුලි ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීමට අදාළ සිය සැලසුම්කරණ කර්තව්‍යයන් සිදු කරන අතර, එයට අනුගාමීව ඒවාහි ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු අදියරයන්හි ආයෝජනයන්ද සිදු කරයි. මෙම කටයුතුවලට (සංශෝධිත) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත, 1980 අංක 47 දරන මධ්‍යම පරිසර අධිකාරිය පනත, පළාත් සභා/ මහනගර සභා/ පළාත් පාලන නීති මඟින් මග පෙන්වීම, පාලනය හා නියාමනය සිදු කෙරේ.

එහි දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) ආයතනයේ ශක්‍යතාවයට අදාළ මූල්‍ය මූලධර්මයනට ප්‍රතිවිරුද්ධව සමස්ත රට සඳහාම වූ ආර්ථික මූලධර්ම මත සකස් කරනු ලැබ ඇත. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධන ආයොජන සැලකිය යුතු ප්‍රමාණයකට වග කියනු ලබයි. අංශයේ දිගු කාලීන සම්ප්‍රේෂණ සැලැස්ම හා බෙදාහැරීමේ සැලසුම් මගින් ඉනික්බිති විදුලි බලාගාර ගෘහස්ථ, ආගමික, කර්මාන්ත හා වාණිජ කාණ්ඩයන්හි පාරිභෝගිකයන් වෙත ප්‍රශස්ත ලෙස සම්බන්ධ කරනු ලබයි.

ආයතනයේ මෙන්ම රටේද ආර්ථික තිරසරබව පවත්වාගනු පිණිස වාරිමාර්ග අවශ්‍යතාවයේ නිසි ක්‍රියාකාරිත්වයට බාධා සිදුවීමකින් තොරව හා ජනන මුහුවද නිසි පරිදි සමබර කරමින් විදුලි ජනනයන් ප්‍රශස්ත ලෙස සැපයීමේ කාර්යය ලං.වි.ම. විසින් තහවුරු කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කි.වො. පැය එකක් සඳහා ශ්‍රී ලං.රු. 18.63 ක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැයක් පවත්වා ගැනීමට ආයතනයට හැකිවිය. කෙසේ වුවද, ලං.වි.ම. විසින් කි.වො. පැය එකක් ශ්‍රී ලං.රු. 16.37 ක් වැනි අඩු අගයකට අලෙවි කළ බැවින්, පසුගිය වසර 9 පුරා විදුලි අයක්‍රම ප්‍රතිශෝධනය නොවීම තුළින් මූල්‍ය තිරසරබවට හානිකර බලපෑමක් වූයේය යන්න සටහන් කළ යුතුය.

මූල්‍යමය වශයෙන් තිරසර තත්ත්වයකට නැවත ගමන් කිරීම උදෙසා කඩිනමින් පිරිවැය පිළිබිඹු කරන්නාවූ අයක්‍රමයක් හඳුන්වා දීම, අඩු පිරිවැය විදුලි ජනනයක් ක්‍රියාත්මක වීම සහතික කිරීම, වර්ධිත ආදායම් රැස්කිරීමක් සහතික කිරීම හා සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් හානිය අවම කිරීමද ආයතනය විසින් සිදුකළ යුතුවේ.

සමාලෝචිත වසර අවසානය වනවිටද සාර්ථක වී නොමැති නමුදු පසුගිය වසර කිහිපය පුරා ප්‍රතිශෝධිත අයක්‍රමයක් අනුමත කරගැනීමට අවශ්‍ය සෑම උත්සාහයක්ම ලං.වි.ම. විසින් දරනු ලැබිණි. මෙයට අමතරව, ආයතනය විසින් එහි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් හානි වක්‍රය නැවතද පහතට චලනය කරවන්නට සාර්ථකව කටයුතු කළ අතර, සමාලෝචිත වසර තුළ 8.72% ක වෙළඳ හා සංවර්ධන ආලහයන් වාර්තා කරන ලදී. තවද, ආයතනයේ මෙන්ම රටේද ආර්ථික තිරසරබව සහතික කිරීම උදෙසා ආදායම් රැස්කිරීම් වර්ධනය කරමින් බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය පිණිස නව ප්‍රවේශයන් ආරම්භ කොට ඇත.

## පාරිසරික තිරසරබව

සම්ප්‍රදායික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන්ද ඇතුළත් සිය කටයුතුවලදී පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ ව්‍යවස්ථාවන් හා රෙගුලාසිවලට ලං.වි.ම. විසින් ප්‍රවේශම්කාරී ලෙස අනුගතව කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාව යනු කාලගුණ විපර්යාසවලින් පීඩාවට පත්වන රටක් වන අතර, සමන හා අනුවර්තන ක්‍රියාමාර්ග දෙවර්ගයම අවශ්‍ය වේ. පාරිසරික විපර්යාසයන්ගෙන් ඉස්මතුවන අභියෝගයනට ප්‍රතිචාරීව, සිදුවිය හැකි බලපෑම් ආමන්ත්‍රණය කරනු පිණිස ජාතික ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග හඳුන්වා දෙමින් ශ්‍රී ලංකා රජය විසින්

ධනාත්මක පියවර ගණනාවක් ගනු ලැබ ඇත. සම්ප්‍රදායික ෆොසිල ඉන්ධන පදනම්ගත බලශක්ති මූලාශ්‍ර හා සංයෝගයෙන් වඩ වඩාත් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් ඒකාබද්ධ කිරීම ඉන් එක් ක්‍රමෝපායකි. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය මගින් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් ප්‍රකාශයට පත්කොට එය විනිවිද යාම වර්ධනය කොට ඇත. ඒ අනුව, 2021 වසර තුළ සමස්ත ස්ථාපිත ධාරිතාවයෙන් 57% ක් දක්වා වහළය මත සවිකරන සූර්ය පැනලයන්ද ඇතුළත්ව සිය පුනර්ජනනීය බලශක්ති ධාරිතාව ලං.වි.ම. විසින් වර්ධනය කර ඇත. එය වූකලි පසුගිය වසර හා සාපේක්ෂව 5% ක වර්ධනයකි.

වඩා පවිත්‍ර පරිසර තත්ත්වයක් සහතික කරනු පිණිස මහා පරිමාණ සුළං විදුලි ගොවිපල, සූර්ය ගොවිපල ආදිය පිහිටුවීම හා සෙසු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ආදිය පවත්වාගෙන යමින් ගවේෂණය කිරීම සමාලෝචිත වසර තුළ සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙ.වො. 103.5 ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිත "තම්බපවනි" නම් සිය පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරය ලං.වි.ම. විසින් පූර්ණ වශයෙන් මෙහෙවරෙහි යොදවා ඇත.

ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා ශුද්ධ ධන (Net Plus) යන යෝජනාක්‍රම තුනක් යටතේ විදුලි පාරිභෝගිකයන් හට සිය පරිශ්‍රයන් තුළ වහළයන් මත විදුලිය ජනනය කිරීමට හා බලශක්තිය පරිභෝජනය කරමින් අපනයනය කරන අතර ලං.වි.ම. පද්ධතිය සමගින් සිය ජනන යන්ත්‍රයන් ඒකාබද්ධ කිරීමට අවසර ලබාදී ඇත. ලං.වි.ම. විසින් පසුගිය වසර හා සාපේක්ෂව ජාලයේ වහළය මත සවිකරන සූර්ය ස්ථාපිත ධාරිතාව 51% කින් සාර්ථක ලෙස වර්ධනය කරගෙන ඇති අතර, වසර අවසානය වනවිට සමස්ත වහළය මත සවිකරන සූර්ය පැනල ධාරිතාව මෙ.වො. 415 ක් ලෙස වාර්තා වේ. මෙමගින් පරිසර තිරසරබව කෙරෙහි ධනාත්මක දායකත්වයක් ලබාදෙනු ඇත.

අනෙක් අතින් අඩු පිරිවැය ජනනය ආර්ථික තිරසරබව සඳහා වූ ප්‍රධාන සාධකයයි. ආයතනයේ මෙන්ම සමස්තයක් ලෙස මුළු රටේමද ආර්ථික තිරසරබව පවත්වාගෙන යාම උදෙසා ගල් අඟුරු හා ද්‍රව ස්වභාවික වායු වැනි අඩු පිරිවැය විදුලිය ජනන මූලාශ්‍රයන් ඇතුළත් කිරීම සඳහා වූ අරගලයක ලං.වි.ම. නිරතව සිටී. මේ අතර, ජනන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේ කාර්යය තුළ ලං.වි.ම. විසින් රටට අදාළ සියලුම පාරිසරික මාර්ගෝපදේශයනටම පාහේ අනුගතව කටයුතු කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වසර තුළ ලං.වි.ම. විසින් සාමාන්‍ය විමෝචන දර්ශකය 0.555 කි.ග්‍රෑ/කි.වො.පැ. මට්ටමක පවත්වාගන්නා ලදී.  බලපත්‍රය මගින් පනවන ලද සීමාවන් තුළ එහි මෙහෙයුම් කටයුතු සහතික කරනු පිණිස ලක්විජය ගල් අඟුරු බලාගාරයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා විශේෂ සැලකිල්ලක් දක්වන ලදී. නිරිතදිග මෝසම් සමය සඳහා පැතිර පැවති අවසන් වායු ගුණාත්මකභාව මිනුමෙහි ප්‍රතිඵල වගුව 1 තුළ දක්වා ඇත.

වන හායනය හෝ ශාක කොටස් අහිමි වීම ශ්‍රී ලංකාව තුළ පවත්නා බරපතල පාරිසරික ගැටලු අතරින් එකකි. විදුලි ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, නිවාස භූමිවල හා වනගත ප්‍රදේශ වල ශාක හෙළි කිරීම වැලැක්විය නොහැකි කටයුත්තකි. වගකිවයුතු රජයේ ආයතනයක් වශයෙන්, ලං.වි.ම. ව්‍යාපෘති ආරම්භයේ සිටම ප්‍රවේශම් සහගත ලෙස සැලසුම්කරණය මගින් මෙම බලපෑම් අවම කිරීමේ ප්‍රයත්නයක නිරත වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව ප්‍රතිකර්මක ලෙස නැවත වන වගාවෙහි නිරත වීමට අමතරව, ලං.වි.ම. විසින් මේවන විටද සිය ජලවිදුලි ජලාශයන්හි දිය බස්නා ප්‍රදේශවල ශාක 30,000 කට වැඩි සංඛ්‍යාවක් රෝපණය කර ඇත. ඒ අනුව, පෙරකී වැඩසටහන හා වසර පුරා ආයතනය ඇතුළත සිදුකරන ලද සෙසු ජෛව විවිධත්ව ආරක්ෂණ වැඩසටහන් නොකඩවා ඉදිරියට ගෙන යමින් පරිසර පාරිශුද්ධත්වය හා අලංකරණය සහතික කරනු පිණිස වසර තුළ රුක් 8,000 ඉක්මවූ සංඛ්‍යාවක් රෝපණය කරන ලදී.

## සමාජ තිරසරබව

විදුලි කර්මාන්තයේ පෙර ගමන්කරු වශයෙන් ලං.වි.ම. විශ්වසනීය ක්‍රියාකාරිත්වය ජාතියේ සමාජ හා ආර්ථික තිරසර බවෙහි කොඳු නාරටිය වේ.

ආයතනය විසින් වසර කිහිපයකට පෙර 100% විදුලියන ප්‍රවේශ මට්ටම සපුරාලන ලද අතර, සමාජ තිරසරබවට අවශ්‍ය පදනම ස්ථාපනය කරන ලදී. මෙය වූකලි ලං.වි.ම.ට ආඩම්බර විය හැකි සාර්ථකත්වයකි. විවිධ ක්ෂේත්‍රයනට විදුලිය ප්‍රවේශ වන කල්හි අදාළ ජන ප්‍රජාවන්හි ජීවිතය සැලකිය යුතු විපර්යාසයකට ලක්වේ. අධ්‍යාපනය හා රැකියා අවස්ථා ජනතාවට විවර වේ. ඇති හැකි හා නැති බැරි ස්ථරයන් අතර පවත්නා පරතරය අවම වේ. ඒ අනුව, රජයේ .සෞභාග්‍යයේ දැක්ම. ප්‍රතිපත්ති රාමුව යටතේ අඩු ආදායම්ලාභී නිවාස වෙත නොමිලයේ විදුලි සම්පාදනයන් ලබාදෙනු පිණිස ලං.වි.ම. විසින් රු. මිලියන 750 ක් වෙන් කරන ලදී.

නව ලොව පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලමින් ඉනික්බිති ඔවුන්ගේ ජීවන ක්‍රමයන් පහසුකරණය සහතික කරනු පිණිස ලං.වි.ම. විසින් CEB care යෙදවුම, සෙසු ලං.වි.ම. මාර්ගගත පහසුකම් හා විදුලි බිල්පත් ගෙවීමේ විකල්පයන් පරිහරණයද ප්‍රවර්ධනය කරනු ලබයි.

වගුව 1: පැතිර ගිය වායු ගුණාත්මකභාව මිනුම්

| පරාමිතිය | සාමාන්‍ය වේලාව | ඒකක | ප්‍රතිඵල | | | | | | | | | | අවසර ලබාදිය හැකි උපරිම මට්ටම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | නියැදිය 1 | නියැදිය 2 | නියැදිය 3 | නියැදිය 4 | නියැදිය 5 | නියැදිය 6 | නියැදිය 7 | නියැදිය 8 | නියැදිය 9 | නියැදිය 10 | |
| අත් හිටුවන ලද අංශු ද්‍රව්‍ය වායුගතික විෂ්කම්භය 10µm ($PM_{10}$) | පැය 24 සාමාන්‍යය | µg/m³ | 20 | 22 | 26 | 28 | 47 | 21 | 17 | 27 | 17 | 38 | 100 |
| | පැය 1 සාමාන්‍යය | µg/m³ | 42 | 42 | 33 | 43 | 56 | 32 | 21 | 43 | 32 | 56 | නොපවතී |
| අත් හිටුවන ලද අංශු ද්‍රව්‍ය වායුගතික විෂ්කම්භය 2.5µm ($PM_{2.5}$) | පැය 24 සාමාන්‍යය | µg/m³ | 12 | 12 | 15 | 15 | 15 | 11 | 8 | 14 | 10 | 16 | 50 |
| | පැය 1 සාමාන්‍යය | µg/m³ | 24 | 19 | 20 | 27 | 19 | 15 | 14 | 28 | 14 | 22 | නොපවතී |
| සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | පැය 24 සාමාන්‍යය | ppb | 1.5 | 3.2 | - | 3.6 | 1.1 | 2.3 | 1.9 | 1.4 | 1.3 | 5.2 | 30 |
| | පැය 1 සාමාන්‍යය | ppb | 2.5 | 4 | - | 4.4 | 2.2 | 2.9 | 2.7 | 2.4 | 1.5 | 6.1 | 80 |
| නයිට්‍රජන් ඩයොක්සයිඩ් ($NO_2$) | පැය 24 සාමාන්‍යය | ppb | 3.5 | 4 | 1.1 | 2.3 | 2 | 4.6 | 3.5 | 1.9 | 5.1 | 4.2 | 50 |
| | පැය 1 සාමාන්‍යය | ppb | 8.4 | 6.7 | 2.5 | 3.2 | 2.4 | 4.9 | 10.2 | 3.2 | 5.9 | 4.8 | 130 |
| කාබන් මොනොක්සයිඩ් (CO) | පැය 24 සාමාන්‍යය | ppb | 1331 | 1302 | 931 | 972 | 870 | 1075 | 540 | 699 | 472 | 987 | නොපවතී |
| | පැය 1 සාමාන්‍යය | ppb | 1506 | 1756 | 1133 | 1196 | 988 | 1453 | 752 | 936 | 718 | 1373 | 26000 |
| ඕසෝන් ($O_3$) | පැය 24 සාමාන්‍යය | ppb | 19.8 | 21.9 | 17.3 | 23.8 | 22.8 | 21.7 | 12.6 | 14.7 | 17.9 | 21.5 | නොපවතී |
| | පැය 1 සාමාන්‍යය | ppb | 27.3 | 27.6 | 26 | 31.3 | 29.3 | 28.8 | 17.8 | 18.8 | 24.3 | 29.1 | 100 |

# ආයතනික සමාජ වගකීම් වාර්තාව

ලං.වි.ම. සමාජයේ සෞඛ්‍යය, සුභසාධනය හා තිරසර සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලබාදීම උදෙසා දැරිය හැකි සියලු ප්‍රයත්නයන්හි නිරත විය. මෙය සහතික කරනු පිණිස, ලක්විජය විදුලි බලාගාරයේ දැවී අලු අලෙවියෙන් ලැබෙන ඉපැයීම්වලින් 25% ක් ආයතනික සමාජ වගකීම් (CSR) කටයුතු සඳහා භාවිත කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී. මෙයට අමතරව, සමාජයේ හා පරිසරයේ යහ සාධනය සහතික කරනු වස් නැවත පදිංචි කිරීමේ වැඩසටහන් හා රුක් රෝපණ වැඩසටහන්ද ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

## වසංගත තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම

පුත්තලම රෝහලේ පරිපාලන අංශ වෙතින් ලද ඉල්ලීමකට අනුව, කොවිඩ් - 19 අධි රුඳා පැවතුම් ඒකකය ඉදිකිරීම හා ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු 2021 නොවැම්බර් මාසයේදී සම්පූර්ණ කරන ලදී. කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය නැවතුම් පහසුකම්ද සමගින් වාට්ටු ධාරිතාව ඇඳන් 20 ඉක්මවයි. ව්‍යාපෘතියේ සමස්ත වියදම රු. මිලියන 6.7 ක් විය.

මෙයට අමතරව, මෙම වාට්ටුව සඳහා වූ ප්‍රවේශ මාර්ගය පිළිසකර කිරීම හා වැසිකිලි ඉදි කිරීම රු. මිලියන 1.5 ක සමස්ත පිරිවැයක් දරමින් සිදුකර ඇත.





## ඊළඟ පරපුර ගොඩනැගීම

පුත්/කල්/නාරක්කල්ලිය රජයේ රෝමානු කතෝලික දෙමළ විද්‍යාලයේ 20'x40' විශාලත්වයෙන් යුත් අඩක් නිමකළ පාසැල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ලක්විජය විදුලි බලාගාරයේ දායකත්වය ලබාදෙන ලදී. සමස්ත දායකත්වය රු. මිලියන 2.19 ක් වන අතර, මෙම ව්‍යාපෘතියෙන් සිසුන් 150 දෙනෙකු හට පහසුකම් සැලසෙනු ඇත.





මෙයට අමතරව, 2021 මාර්තු මාසයේදී පුත්/කල්/දනුව ශාන්ත අන්තෝනි මහා විද්‍යාලයේ දසවන වසර පන්ති කාමර ගොඩනැගිල්ලේ විදුලි රැහැන් ඇදීම හා විදුලි ස්ථාපන කටයුතු රු. මිලියන 0.9 ක පිරිවැයක් දරා සම්පූර්ණ කරන ලද අතර, සිසුන් 400 දෙනෙකු වෙත මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රතිලාභ සැලසෙනු ඇත.

ලබාගැනීමේ හැකියාව පැවතියද, නොපැවතියද, පැතිර පැවති වසංගත තත්ත්වය හමුවේ මාර්ගගත අධ්‍යාපනය අවශ්‍යතාවයක් බවට පත් කෙරිණි. මෙකී පෙර නුවූ විරූ තත්ත්වය තුළ මාර්ගගත අධ්‍යාපන කටයුතුවල නියැළි දූ දරුවන් උදෙසා නොමිලයේ අන්තර්ජාල දත්ත (bandwidth) ලබාදීම සඳහා ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් තරගයක් පවත්වන ලදී.

## අපගේ ජනතාවගේ සුභ සාධනය සහතික කිරීම

කල්පිටිය අර්ධද්වීපයේ වෙරළ තීරයට වන්නට පිහිටි ප්‍රධාන ජන ප්‍රජාව වනුයේ ධීවර සමාජයයි. නොරොච්චෝලේ ඉලන්තාඩිය ප්‍රදේශයේ "ආරෝග්‍යා මාතා" ධීවර ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණ කටයුතු රු. මිලියන 1.64 ක පිරිවැයක් දරමින් ධීවර සමාජයේ යහපත උදෙසා 2021 දෙසැම්බර් මාසයේදී සම්පූර්ණ කරන ලදී. ධීවර පවුල් 350 කට වැඩි සංඛ්‍යාවකට මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ සැලසෙනු ඇත.

මෙයට අමතරව, ගං වතුර පාලනය පිණිස 2021 ජනවාරි මාසයේදී රු. මිලියන 1.64 ක පිරිවැයක් දරමින් ඉලන්තන්ඩිය ප්‍රදේශයේ බෝක්කු පහක් ඉදි කරන ලදී. මෙම ඉදිකිරීම් හේතුකොට කුණාටු සමයන්හිදී ගංවතුර තත්ත්වයන්ගෙන් පවුල් 500 ක් පමණ ආරක්ෂා වනු ඇත.

තවද, ප්‍රදේශය අවට ජීවත්වන ජනතාව වෙත පහසුකම් සලසනු පිණිස පාලවිය - කල්පිටිය මාර්ගයේ බස් නැවතුම්පළවල් හයක් ඉදිකිරීමේ කටයුතුද රු. මිලියන 2.15 ක පිරිවැයක් දරමින් 2021 මාර්තු මාසයේදී සම්පූර්ණ කරන ලදී.

## නැවත පදිංචි කරවූ ජන ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වයන් නංවාලීම

මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය මගින් සිංහපුර, වැලිගඟ හා උලපනේ දකුණ ප්‍රදේශයන්හි නිවාස 20 ක් පමණ නැවත පදිංචි කිරීම සඳහා, යෝජිත මොරගොල්ල වේල්ල හා ජලාශයද ඉහළ සිට දර්ශනය වන අතිශය මනකාන්ත ප්‍රදේශයක නැවත පදිංචි කිරීමේ ගම්මානයක් ඉදිකර ඇත. ව්‍යාපෘතිය ඉදිකිරීම උදෙසා මෙම නැවත පදිංචි කිරීම සිදුකළ යුතු විය.

අඩි 20 කොන්ක්‍රීට් ප්‍රවේශ මාර්ග, නල ජලය, විදුලිය, වීථි ලාම්පු වැනි සියලු යටිතල පහසුකම්වලින් මෙම නැවත පදිංචි කිරීමේ ගම්මානය සමන්විත වේ. මෙයට අමතරව, බලපෑමට ලක්වූ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලනු පිණිස ළමා සුරැකුම් මධ්‍යස්ථානය, මාතෘ සායනය, ග්‍රාම නිලධාරී කාර්යාලය, කඩ සාප්පු, ළමා උද්‍යානය හා ප්‍රජා ශාලාව වැනි ප්‍රජා පහසුකම්ද මෙම ගම්මානය වෙත සම්පාදනය කොට ඇත.




## අපගේ ලෝකය ආරක්ෂා කිරීම

පැළ සිටුවීම මගින් වායු ගෝලයේ ප්‍රමාණවත් ඔක්සිජන් සංයුතියක් පවත්නා බවට සහතික වීම, උෂ්ණත්වය අඩු කිරීම මෙන්ම මානව වර්ගයා වෙත ශාරීරික හා මානසික වශයෙන්ද සෞඛ්‍ය සම්පන්න ඵල ගෙන දෙනු ලබයි. එබැවින් එය වූකලි අසිරිමත් සමාජ සේවයකි.

ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතුවලදී ගස්වැල් හෙළි පෙහෙළි වීම නොවැළැක්විය හැකි කරුණකි. ලං.වි.ම. විසින්, සමාජමය වගකීමක් සහිත ආයතනයක් ලෙස, මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය ඉදිකිරීම හේතුකොට අහිමි වූ ශාක 1,500 කට ආසන්න ප්‍රමාණය වෙනුවෙන් වන්දි පිණිස රුක් රෝපණ වැඩසටහනක් ආරම්භ කර ඇත. ඒ අනුව එකී ව්‍යාපෘතියේ ජල පෝෂක ප්‍රදේශය තුළ පැළ 78,000 ක් රෝපණය කිරීමේ කර්තව්‍යය ආරම්භ කොට ඇත.



මෙයට අමතරව, සමාලෝචිත වසර තුළ, කල්පිටිය අර්ධද්වීපයේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහතික කරනු පිණිස මී, කුඹුක්, කොහොඹ හා කරඳ ශාක රෝපණය කරන ලදුව පාලවිය සිට කල්පිටිය දක්වා වූ ප්‍රධාන මාර්ගය දෙපස නඩත්තු කරන ලද අතර, පුත්තලම කලපු සීමාවේ ශාක 5000 ක් පමණ රෝපණය කරන ලදී.






Financial Progress as of 30.09.2021
BOQ Components
Financial progress as of 30.09.2021
Plant and mandatory spare parts supplied from abroad
99.80%
Design services
98.30%
Installation
97.00%
Civil works for wind farm
95.00%
Civil works for accommodation Buildings
99.00%
Other services
82.00%
CITIZEN CT-666N
Recurrent Expenditure
Analysis
Bulk Supply Debtors without Finalized Debtors –Tariff wise
Trade Debtors as at 31 December 2021 - Divisional
Kuala Lumpur
Malaysia

# මූල්‍ය අංශය

මුදල් අංශය විසින් ව්‍යාපාරික කටයුතුවල තිරසරබව හා වර්ධනයට අවශ්‍ය පහසුකම් සලසනු පිණිස මූල්‍ය සැලසුම්කරණය, භාණ්ඩාගාර කළමනාකරණය, මූල්‍ය හා කළමනාකරණ වාර්තාකරණය, ව්‍යවස්ථාමය සම්බන්ධතා, බදුකරණය, මුදල් කලමනාකරණය, ආයතනික හා ව්‍යාපෘති මුදල් ක්ෂේත්‍ර ඇතුළත්ව ලං.වි.ම. තුළ තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. එහි මූලික වගකීම වනුයේ ලං.වි.ම. පුරා විහිදි පිරිවැය කාර්යක්ෂමතාවයකට දායක වන මනා නිර්ණායක මත සියලු මුදල් තීරණ පදනම් වන බවට වගබලා ගැනීමයි.

### මෙහෙයුම් ව්‍යුහය

මුදල් අංශයේ ප්‍රධානියා මුදල් කළමනාකරු වන අතර, ඔහු විසින් සෘජුවම ලං.වි.ම. සාමාන්‍යාධිකාරිවරයා වෙත වාර්තා කරනු ලබයි. අතිරේක මුදල් කළමනාකරු (මූලස්ථාන), අතිරේක මුදල් කළමනාකරු (ආයතනික) හා අතිරේක මුදල් කළමනාකරු (භාණ්ඩාගාර කළමනාකරණ) විසින් මුදල් අංශය තුළ මුදල් කළමනාකරු වෙත සෘජුවම වාර්තා කරනු ලබන අතර, අංශයන්හි අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් වෙත සෘජුව වාර්තා කරන්නාවූ අතිරේක මුදල් කළමනාකරුවන් අට දෙනෙකුද වේ. ඔවුන් එක් එක් අංශයේ මුදල් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් මුදල් කළමනාකරු වෙත කාර්යමය වශයෙන් වගකිව යුතුවේ.

අතිරේක මුදල් කළමනාකරු (මූලස්ථාන) සතු ප්‍රධාන කර්තව්‍ය වනුයේ මුදල් කළමනාකරණය, ව්‍යාපෘති සම්බන්ධීකරණය හා රැස්කිරීම් කළමනාකරණය වන අතර, ලං.වි.ම. මූල්‍ය ප්‍රකාශන සහ අයවැයද ඇතුළත් කළමනාකරණ තොරතුරු සැකසීම හා ඉදිරිපත් කිරීම අතිරේක මුදල් කළමනාකරු (ආයතනික) සතු කර්තව්‍ය වේ. අතිරේක මුදල් කළමනාකරු (භාණ්ඩාගාර කළමනාකරණ) ලං.වි.ම. අර්ථසාධක හා විශ්‍රාම අරමුදල් කළමනාකරණය හා එදිනෙදා මෙහෙයුම් සහ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සකස් කිරීම යන කටයුතුවල නිරත වේ. එක් එක් කර්තව්‍යයට අදාළ මෙහෙයුම් කටයුතු නංවාලීම සඳහා ගනු ලැබූ ප්‍රධාන මූලාරම්භයන් හා පියවර සම්බන්ධ කෙටි විස්තරයක් පහත දක්වා ඇත.

### මුදල් කළමනාකරණය

ගෙවීම් ඒකකය විසින් මුදල් අංශයේ ප්‍රධාන කර්තව්‍යයක් ඉටු කරනු ලබයි. සියලු ගෙවීම් සම්බන්ධ කටයුතු මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි. කොවිඩ් - 19 ව්‍යාප්තිය හේතුකොට මෙම වසර ගෙවීම් අංශයට තීරණාත්මක වැදගත්කමකින් යුත් වසරක් විය. භව්‍ය ද්‍රවශීලතා ගැටලුද ඇතුළත්ව මුදල් හා කාරක ප්‍රාග්ධනය සම්බන්ධ සැලකිය යුතු සීමා සහිතතා අත් විඳින තත්ත්වයක වුව විදුලි බිල්පත සම්බන්ධයෙන් පාරිභෝගිකයන් වෙත සහන කිහිපයක් ලබාදීමට ලං.වි.ම. විසින් කටයුතු කරන ලදී. කෙසේ වුවද, භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාවේ සහායෙන් ගෙවීම් ඒකකය විසින් ගෙවීම් ප්‍රමුඛතාගත කරන ලදුව පවත්නා අරමුදල් කාර්යක්ෂම ලෙස වෙන් කරන ලදී.

තාක්ෂණික පැතිකඩයන්ගෙන් සලකා බලන කල, මෙහෙයුම් පද්ධතියෙහි මනා ක්‍රියාකාරිත්වයක් සහතික කරනු පිණිස ගෙවීම් ඒකකය විසින් මාර්ගගත ගෙවීම් වව්චර පියවීම් ක්‍රමයක් ආරම්භ කොට ඇත.

### එකතු කිරීම් කළමනාකරණය

මහජන බැංකු ශාඛාවන්හි මධ්‍යස්ථාන තුනක් හා ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේ එකක්ද ඇතුළත් අලෙවි ස්ථාන මධ්‍යස්ථාන හතක අලෙවි ස්ථාන කවුළු 14 ක්ද සමගින් ලං.වි.ම ප්‍රධාන කාර්යාලයේ මුදල් ශාඛාව ක්‍රියාත්මක වේ. විදුලි බිල්පත් රැස් කරන්නාවූ රැස්කිරීමේ නියෝජිතවරු 24 දෙනෙක් වෙති. ඒ අතරට ශ්‍රී ලංකාවේ සියලු ප්‍රධාන පෙළේ වාණිජ බැංකු පාහේ ඇතුළත් වන අතර, සුපිරි වෙළඳසැල්, ජංගම ජාල සම්පාදකයන් හා විද්‍යුත් උපකරණ සම්පාදකයන්ද ඇතුළත් වේ. තවද, ලං.වි.ම. විසින් එහි බිල්පත් ගෙවීමේ පහසුකම් වෙබ් අඩවිගත ගෙවීම්, කෙටි පණිවිඩ මගින් ගෙවීම් හා CEB Care යෙදවුම දක්වාද ව්‍යාප්ත කර ඇත.

මුදල් ශාඛාවේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ රටපුරා විහිදි රැස් කිරීමේ නියෝජිතයන් 24 දෙනා මගින් දෛනික විදුලි බිල්පත් රැස් කිරීමේ කටයුතු යාවත්කාලීන කිරීමයි. මෙම රැස් කිරීමේ ප්‍රමාණය ලං.වි.ම. මාසික රැස් කිරීමේ ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට සමාන වේ. රැස් කිරීමේ නියෝජිතයන් විසින් සිදුකරන දෛනික මුදල් එවීම් සැසඳුම, ආපසු ගෙවීම් ගැලපීම් හා වැරදි නිවැරදි කිරීම්ද මුදල් ඒකකය විසින් සිදු කරනු ලබයි.

### ව්‍යාපෘති සම්බන්ධීකරණය

අරමුදල් සම්පාදනායතනය, ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMUs), විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) හා මහා භාණ්ඩාගාරය සමගින්ද ණය ආශ්‍රිත කරුණු සම්බන්ධීකරණය සඳහා සහාය ලබා දෙමින් ආයතනයේ සියලු විදේශ අරමුදල්ගත ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ ඒකකයක් වශයෙන් ලං.වි.ම. ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය කටයුතු කරයි. ප්‍රධාන කටයුතු අතරට අරමුදල් සපයන නියෝජිතායතන විසින් ණය ගිවිසුම් ප්‍රකාර ඉල්ලා සිටින හා ඔවුන් වෙත අවශ්‍ය වන විගණනය කළ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන හා සෙසු තොරතුරු ඉදිරිපත් කිරීම ඇතුළත් වේ. තවද, ණය සම කොටස්වලට පරිවර්තනය කිරීමේදී මහා භාණ්ඩාගාරය සමගින් සම්බන්ධීකරණය හා තීරණ ගැනීම සඳහා අවශ්‍ය ණය ආශ්‍රිත තොරතුරු සම්පාදනය කරමින් ලං.වි.ම. කළමනාකාරිත්වයට සහාය ලබාදීම සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අනාගත මෙහෙයුම් කටයුතු සැලසුම්කරණයද මෙම ඒකකයේ විෂය පථය යටතට ගැනේ.

කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියත් සමගින්, කල් පිරෙන දිනය වනවිට ව්‍යාපෘතිවල විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ණය දෙන නියෝජිතායතනය වෙත ඉදිරිපත් කිරීම විෂයයෙහි 2021 වර්ෂය අභියෝගාත්මක වසරක් විය. කෙසේ වුවද, ව්‍යාපෘති සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව අදාළ ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා විගණනායතනයන් සමගින් අත්වැල් බැඳ ගනිමින් කටයුතු කර ඇති අතර, ණය දෙන නියෝජිතායතන වෙත නිසි කලට අවශ්‍ය සියලු කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

### භාණ්ඩාගාර කළමනාකරණය

මුදල්, ආයෝජන හා සෙසු මූල්‍ය වත්කම් කළමනාකරණය කරමින් භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව විසින් තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. රට වසා තැබීමේ තත්ත්වයෙන් නිදහස් වීමත් සමගින් විදුලිය සඳහා වූ සාමාන්‍ය ඉල්ලුම් රටාව නැවත තහවුරු වූ අතර, අඩු විදුලි පරිභෝජනය හේතුකොට භාණ්ඩාගාරය මත පැටවුණු වැය බර ඉවත් කෙරිණි. ඉහළ ගාස්තුවලට අඩු රැස් කිරීම් මට්ටමක් සහිතව තාප ජනනයනට අදාළ බලශක්ති මිලදී ගැනීම් සඳහා මුදල් සැපයීමේ අභියෝගය මෙම ඒකකය වෙත

පැවතිණි. තවද, ඉහළ ලෝක ගල් අඟුරු මිල ගණන් හේතුකොට භාණ්ඩාගාරයට දැඩි පීඩනයක් එල්ල විය. කෙසේ වුවද, 2021 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලං.රු. බිලියන 20 ක් ලෙස එදා මෙදාතුර නිකුත් කරන ලද ලැයිස්තුගත ඉහළම ණයකර නිකුතුව සම්පූර්ණ කරමින් මෙම අභියෝගය සාර්ථකව කළමනාකරණය කරන ලදී. ගැටලුවට මුහුණ පෑ පළමු දින ඒ සඳහා අධි දායකත්වයක් ලැබිණි. ලැයිස්තුගත ණය සුරැකුම් නිකුත් කිරීමේ කාර්යයට අත ගැසූ පළමු රජය සතු ව්‍යවස්ථාපිත මණ්ඩලය බවට ලං.වි.ම. පත්විය.

විදේශ විනිමය වෙළඳපල විදේශ ණය හා විදේශ මිලදී ගැනීම් පියවීම සඳහා විදේශ විනිමය සොයා ගැනීමේ අභියෝගයට භාණ්ඩාගාර කළමනාකරණ ඒකකයට මුහුණ දීමට සිදුවිය. කෙසේ වුවද, ප්‍රධාන බැංකුකරු මත පමණක් රඳා පැවතීම වෙනුවට සෙසු බැංකු වෙතින් විදේශ විනිමය මිලදී ගනිමින් එකී සෙසු බැංකු සමග පැවති බැංකුකරණ සම්බන්ධතාවය ප්‍රයෝජනයට ගනිමින් මෙම තත්ත්වය සැලකිය යුතු මට්ටමකට මැඩ පැවැත්වීමට භාණ්ඩාගාරයට හැකිවිය. තවද, විදේශ විනිමය නිරාවරණ කාර්යය අවම කිරීමක් වශයෙන්, විදේශ මිලදී ගැනීම් සීමා කිරීමේ කාර්යයකද භාණ්ඩාගාරය නිරත විය.

වසර තුළ භාණ්ඩාගාර ශාඛාව විසින් ද්‍රවශීලතා මට්ටම කළමනාකරණය කරමින් මුදල් රැස් කිරීම් හා මුදල් පිටතට ගලනයන් නිරීක්ෂණය කිරීම සඳහා මුදල් පිටතට ගලනයන් හා ඇතුළතට ගලනයන් ගැලපීම උදෙසා MITFFIN ගෙවුම් මොඩියුලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ආරම්භ කොට ඇත.

## අරමුදල් කළමනාකරණය

### ලං.වි.ම. අර්ථසාධක අරමුදල

ලංකා විදුලිබල මණ්ඩල අර්ථසාධක අරමුදල (CEBPF) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ විධිවිධාන යටතේ පුද්ගලික අර්ථසාධක අරමුදලක් ලෙස ක්‍රියාත්මක වේ.

අරමුදලේ කටයුතු සම්බන්ධ සමස්ත වගකීම අරමුදලේ භාරකරු වන ලං.වි.ම. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමීප නිරීක්ෂණය යටතේ කළමනාකරණ කමිටුව වෙත පවරා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අරමුදලේ ලේකම් හා ගණකාධිකාරී අරමුදලේ සියලු මෙහෙයුම් කටයුතු හා ක්‍රියාකාරකම් සම්බන්ධ වගකීම දරයි.




ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවලට දැඩි බලපෑම් ඇති කරමින් කොවිඩ් 19 වසංගතය විසින් ලොව පුරා සෞඛ්‍ය අර්බුදයක් හා ආර්ථික විනාශයක්ද ඇති කරවන ලදී. 2020 ඔක්තෝබර් මස ඇතිවූ දෙවන රැල්ල හේතුකොටගෙන ආර්ථික තත්ත්වයන් වඩාත් අයහපත් අතට හැරිණි. 2021 මෙහෙයුම් පරිසරය තුළ ඇතිවූ පෙර නුවූ විරූ අභියෝග අරමුදලේ කාර්ය සාධනය තුළ නිරූපණය විය.

පොළී අනුපාතයන්හි තිරසර පහත වැටීමක් පිළිබිඹු කරමින් පසුගිය වසර හා සාපේක්ෂව අරමුදලේ ශුද්ධ ලාභය 14% කින් පහත වැටිණි. පවත්නා බැංකු අනුපාතයන් හා සාපේක්ෂව අඩු පොළී අනුපාතියකයකට ලබාදෙන ලද ණය පහසුකම් හේතුකොට පොළී ආදායමටද බලපෑම් ඇතිවිය. ලබාදුන් ණය සම්බන්ධ පරීක්ෂාවන්හි වර්ධනයත් සමගින් මෙහෙයුම් වියදම්හි තියුණු වර්ධනයක් ඉස්මතු විය.

2021 වසර සඳහා අරමුදලේ බදු වියදම් 20% කින් පහත වැටිණි. කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 15% ක අනුපාතයට මූල්‍ය සේවා මත පවත්නා එකතු කළ වටිනාකම් මත බදු සඳහා යොමුවිය යුතුවන අරමුදල් සම්බන්ධයෙන් 2002 අංක 14 දරන එකතු කළ වටිනාකම් මත බදු පනතේ 25අ(1) වගන්තිය යටතේ නියෝගයක් නිකුත් කරන ලදී. මේ දක්වාද පොළී ආදායම මත අරමුදල විසින් කිසිදු එකතු කළ අගය මත බදු මුදලක් ගෙවා නොතිබූ නමුදු, පොළී ආදායම මත 15% ක එකතු කළ වටිනාකම් මත බදු මුදලක් පැනවීම මගින් අරමුදලේ තිරසර බව වඩා අයහපත් අතට හැරෙනු ඇත.

2021 වසර තුළ ශ්‍රී ලං.රු. බිලියන 73.895 දක්වා අරමුදලේ වත්කම් පදනම 9% කින් වර්ධනය විය. අවදානම් ප්‍රතිලාභ ගතිකයන් ප්‍රශස්තකරණයේදී, අරමුදල විසින් තෝරාගත් ආයෝජන අවස්ථාවන් පමණක් අනුගමනය කරන ලදී. පැවති මෙහෙයුම් තත්ත්වය හමුවේ අරමුදලේ ආයෝජනය (පෙර වසරේ 74.06% අගය හා සාපේක්ෂව) පැවති සමස්ත වත්කම් ප්‍රමාණයෙන් 74.86% ක අගයක විය.

සමස්ත බැරකම් ප්‍රමාණය 17.22% කින් පහත වැටුණු අතර සාමාජික ශේෂය ශ්‍රී ලං.රු. බිලියන 66.632 දක්වා 2.93% කින් වර්ධනය විය. 2021 දෙසැම්බර් මස 31 වන දිනය වනවිට, අරමුදල සතුව සාමාජික ගිණුම් 25,118 ක් පමණ පවත්නා අතර, ඒ අතරින් 24,602 ක් පමණ මේවන විටද දායකත්වය ලබාදෙන සාමාජිකයෝ වෙති. 2021 වසර සඳහා වූ සමස්ත දායකත්වය ශ්‍රී ලං.රු. බිලියන 6.3 ක් ලෙස වාර්තා වූ අතර, එම කාල සීමාව තුළම අරමුදල විසින් සාමාජිකයන් වෙත ශ්‍රී ලං.රු. බිලියන 4.49 ක් ආපසු ලබාදී තිබේ.

2020 වසර සඳහා ලාභාංශ වශයෙන් සිය සාමාජිකයන් හට 8% ක අනුපාතයක් ප්‍රකාශයට පත් කිරීමට අරමුදලට හැකිවිය. කෙසේ වුවද, 15% ක් ලෙස මූල්‍ය සේවා මත අලුතින් පනවන ලද එකතු කළ අගය මත බදු හේතුකොට 2021 වසර සඳහා මෙසේ ප්‍රකාශයට පත් කරන ලද අනුපාතයට බලපෑම් එල්ලවනු ඇත.

ආර්ථික තත්ත්වයන්හි අපේක්ෂිත පුනර්ජීවනයත් සමගින් ආයෝජන අවස්ථාවන් මතට අරමුදල විසින් ප්‍රවේශම්කාරී ප්‍රවේශයක් නොකඩවා අනුගමනය කරන ලදී.

ඩිජිටල් හැකියාවන් හා උසස් මට්ටමේ දත්ත විග්‍රහයන් මගින් ජනන පිරිවැය ඌණතා හා ආයෝජන කළඹ ගුණාත්මකභාවය ආරක්ෂා කරගැනීම මත අඛන්ඩ අවධානයක් යොමු කෙරෙනු ඇත.

- සාමාජිකයන්ගේ ගිණුම් වෙත පහසු ප්‍රවේශයක් ලබාදෙනු පිණිස සාමාජික කේන්ද්‍රීය දත්ත පදනමක් ගොඩනඟන ලදී.

- කඩදාසි රහිත පරිසරයක් සමගින් පූර්ණ වශයෙන් ස්වයංක්‍රියගත පද්ධතියකට මං පාදන ලෙස සේවක අර්ථසාධක අරමුදල් මෙහෙයුම් ඩිජිටල්කරණය කරනු පිණිස සංවර්ධනායතනයේ සහායද සහිතව අරමුදල සඳහා නව කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

(රූපය F1 සිට රූපය F5 දක්වා) පහත දක්වා ඇති ප්‍රස්ථාර මගින් රජයේ හා සාමාජිකයන්ගේ දෘෂ්ටි කෝණයෙන් අරමුදලේ මෙහෙයුම් හා මූල්‍ය උද්දීපනයන් දක්වනු ලබයි.




රූපය F 1: ගෙවන ලද ආදායම් බදු (ශ්‍රී ලං.රු. මිලියන)




රූපය F 2: ලබාදුන් ණය (ශ්‍රී ලං.රු.මිලියන)




රූපය F 3: පොළිය හා ලාභාංශ (ශ්‍රී ලං.රු. බිලියන)




රූපය F 4 : ආදායම (ශ්‍රී ලං.රු.බිලියන)




රූපය F 5: ආයෝජන කළඹ (%)

## ලං.වි.ම. විශ්‍රාම අරමුදල

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12(ජේ) වගන්තියේ විධිවිධාන යටතේ 1994 ජනවාරි මස පළමුවැනි දින විශ්‍රාම අරමුදල පිහිටුවන ලද අතර, එහි භාරකරු වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් පත් කරන ලද කළමනාකරණ කමිටුවක් මගින් එය කළමනාකරණය කෙරේ. අරමුදල කළමනාකරණ කමිටුවේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ලේකම් හා ගණකාධිකාරී විශ්‍රාම අරමුදලේ භාණ්ඩාගාරික හා පරිපාලකවරයාද වේ.

2021 වසර අවසානය වනවිට 8,057 ක් වූ සමස්ත විශ්‍රාමිකයන් සංඛ්‍යාවෙන් සමස්ත සක්‍රිය විශ්‍රාමිකයන් සංඛ්‍යාව 7,714 ක් විය. පසුගිය වසර පහ ඇතුළත විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාත්මක වර්ධනය පහත නිරූපණය කොට ඇත.

| වර්ෂය | විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව | විශ්‍රාමිකයන්ගේ වැඩිවීම | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| 2015 | 5,721 | - | - |
| 2016 | 6,194 | 473 | 8.30% |
| 2017 | 6,622 | 428 | 6.90% |
| 2018 | 7,061 | 439 | 6.60% |
| 2019 | 7,533 | 472 | 6.70% |
| 2020 | 7,839 | 306 | 4.06% |
| 2021 | 8,057 | 218 | 2.78% |




රූපය F6: 2015-2021 විශ්‍රාමිකයන් සංඛ්‍යාව




රූපය F7: වාර්ෂික විශ්‍රාම බැඳීම් සංයුතිය - 2015-20211

විශ්‍රාම අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයන් වනුයේ සක්‍රීය සේවා නියුක්තිකයන් වෙනුවෙන් ලං.වි.ම. විසින් සිදුකරන දායකත්වයන් හා ආයෝජන ප්‍රතිලාභද වේ. 2015 වසරේ සිට ක්‍රියාත්මකවන පරිදි ලං.වි.ම. වැටුප් වැඩිකිරීම හා විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ වර්ධනයද හේතුකොට පසුගිය වසර පහක කාලය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ඇති අරමුදල්වල හිඟය වාර්ෂිකව වර්ධනය වී ඇත. පසුගිය වසර හයක කාල පරිච්ඡේදය තුළ විශ්‍රාමිකයන් සම්බන්ධ සාමාන්‍ය වර්ධනය 5.90% ක් විය.

හිඟය පුළුල් වීමට මං පාදන ලද අඩු පොළී තත්ත්වය මගින් අරමුදලට බරපතල බාධාවන් එල්ල විය.




රූපය F9: ශුද්ධ වත්කම්

# මූල්‍ය සමාලෝචනය

ජාතික ප්‍රතිපත්ති හා අනුගාමීව විශ්වසනීය බලශක්තිය සහතික කිරීම මෙන්ම තිරසර ප්‍රගතියක් ලබාගැනීම යන ආකාරයන්ගෙන් ජාතිය ඉදිරියට ගමන් කරවීමේ තීරණාත්මක කාර්ය භාරයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් නොකඩවා ඉටුකොට තිබේ. වඩාත් විනාශකාරී වසංගතයකින් හිස එසවීමට රට විසින් අරගලයක නිරතව සිටින තත්ත්වයක තිරසර ආකාරයකින් ජීවිත හා ආර්ථිකයන් නැවත ගොඩ නැගීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී. මෙම අසාමාන්‍ය හා දුෂ්කර කාල සීමාවන්හි, මෙහෙයුම් කාර්යක්ෂමතාවයන්හි ඉහළම මට්ටමින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ආරක්ෂාව හා යහ සාධනයද සහතික කරන අතර සිය පාරිභෝගිකයන් වෙත ආරක්ෂිත හා විශ්වසනීය විදුලිය සැපයුමක් සහතික කිරීම ලං.වි.ම. විෂයයෙහි අත්‍යවශ්‍ය සාධකයක් විය.

## මූල්‍ය කාර්යසාධනය

### ආදායම

වසංගත තත්ත්වය හේතුකොට සිදුවූ අවිනිශ්චිතතාවයන් හා අස්ථාවරත්වයන් මැඩ පැවැත්වීම උදෙසා දරන ලද කැපී පෙනෙන ප්‍රයත්නයන් පිළිබිඹු කරමින් 2020 වසර හා සාපේක්ෂව 4% ක වර්ධනයක් සහිතව ලං.වි.ම. විසින් 2021 වසර තුළ ශ්‍රී ලං.රු. බිලියන 249 ක ආදායමක් වාර්තා කරන ලදී. රටේ සමස්ත විදුලිය ඉල්ලුමෙහි 6% ක වර්ධනයක් පිළිබිඹු කරමින් වසංගත සමය තුළ 2020 වසරේදී පහත වැටුණු තොග අයක්‍රම කාණ්ඩයන්ගේ ඉල්ලුම ඉහළ යාම හා ගෘහස්ථ පරිභෝජනයේ වර්ධනයද යන ප්‍රධාන සාධකද ආදායම් වර්ධනයට දායක විය. රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව 2014 වසරේ සිට අයක්‍රම ව්‍යුහය නොවෙනස්ව පවත්නා අතර, විදුලි ජනනයට අදාළ සියලු පිරිවැය සාධක සීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී.




රූපය F1: අලෙවි ආදායම හා අලෙවි කල ඒකක විචලනය




රූපය F2: ජනන හා අලෙවි ඒකක (ගි.වො.පැ.)

### ශුද්ධ ලාභය / (අලාභය)

පසුගිය වසර හා සාපේක්ෂව 68% ක සැලකිය යුතු පහත වැටීමක් නිරූපණය කරමින් වසර සඳහා වන ශුද්ධ අලාභය ශ්‍රී ලං.රු. බිලියන 21.9 ක් විය. විදුලි ජනනයෙන් සුවිශාල සහායක්ද ලබමින්, සැකසුණු සුහදායී ජනන මුහුවක් තුළින්, පිරිවැය පිළිබිඹු නොකරන අයක්‍රමය නොසලකා යෙදවුම් මිල ගණන්හි සැලකිය යුතු විචලනයන් දරා සිටීමට ලං.වි.ම.ට හැකිවිය. අවම පිරිවැය, පදනම් විදුලි බලාගාර ස්ථාපනය නොකිරීම තවදුරටත් අලාභ නොකඩවා පවත්වාගෙන යාමට දායකත්වයක් ලබාදෙන ලදී. රටේ පැවති අභියෝගාත්මක සමාජාර්ථික තත්ත්වයන් නොසලකා, අඩු වූ සෘජු ජනන පිරිවැය හා බලශක්ති ඉල්ලුමෙන් ලද වර්ධිත දායකත්වයෙහි මූලික පහසුකම්කරණය හරහා 2020 වසරට සාපේක්ෂව ලං.වි.ම.ට එහි ශුද්ධ අලාභය අවම කිරීමට හැකිවිය.




රූපය F3: 2020 ට සාපේක්ෂව 2021 වසරේ මූල්‍ය කාර්ය සාධනය

**සටහන :** ප්‍රතිලාභ බැඳීම් මත වූ ආයුගණක ලාභය/(අලාභය) අනෙකුත් ආදායම සමඟ ශුද්ධ අගයට ගෙන එන ලදී.

| | 2021 රු. මිලියන | 2020 නැවත ප්‍රකාශිත රු.මිලයන | විචලනය % |
|---|---|---|---|
| විදුලිය අලෙවිය | 249,089 | 238,911 | 4% |
| සෙසු ආදායම් | 12,824 | 10,155 | 26% |
| අලෙවි පිරිවැය | (283,364) | (309,552) | -8% |
| අර්ථ නිරූපිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක අලාභය | (505) | (8,678) | -94% |

25% (2020) සිට 34% දක්වා ලං.වි.ම. ජල විදුලි වර්ධිත දායකත්වය තුළින් ලත් මඟ පෙන්වීම අනුව ජනන මුහුවේ සිදුවූ සුහදායී වෙනස 2020 හා සාපේක්ෂව ශ්‍රී ලං.රු. බිලියන 26කින් (14%) ජනන සෘජු ජනන පිරිවැය අඩු වීමට බොහෝ සෙයින් දායක විය. ශ්‍රී ලංකාවේ විදුලිබල ජනනයේ ඓතිහාසික කඩඉමක් සනිටුහන් කරමින්,

ශ්‍රී ලංකාවේ විශාලතම සුළං විදුලි බලාගාරය වන "තම්බපවනි" බලාගාරය වාර්ෂික ශුද්ධ ජනනයෙන් 2%ක දායකත්වයක් ලබාදෙන ලදී. ලං.වි.ම. ජල විදුලි, ලංවි.ම. සුළං හා පෞද්ගලික ස.නො.පු.බ. අංශයන් වෙතින් ජනන මුහුව වෙත යොමු කරන ලද වර්ධිත යෙදවුම් ප්‍රමාණය (සමස්ත ශුද්ධ ජනනයෙන් 35% සිට 49% දක්වා) පෙර වසර හා සාපේක්ෂව මූල්‍ය කාර්ය සාධනයට ධනාත්මක බලපෑමක් සිදු කරන ලදී. ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් වෙතින් විදුලිය මිලදී ගැනීම වැනි අධි පිරිවැය තාප විදුලි මූලාශ්‍රයන්ගෙන් ලද අවම දායකත්වයක් සහිතව ලං.වි.ම.ට වසරේ බලශක්ති ඉල්ලුම සපුරාලීමට හැකිවිය.

ගල් අඟුරු, ඉන්ධන හා සෙසු ද්‍රව්‍යවල මිල ඉහළ නැගීමට බලපෑ ලෝක සැපයුම් දාමයන්ට වසංගතයේ බලපෑමෙන් සිදුවූ බාධාවන් වසරේ අවසන් සමය විශේෂ කොටගෙන මෙහෙයුම් පිරිවැයට හානිකර බලපෑමක් එල්ල කරන ලදී. වහළය මත සවි කරන සූර්ය පැනල මගින් බලශක්තිය ජනනය කිරීම සඳහා වූ සම්බන්ධිතා ඉල්ලුම නොකඩවා වර්ධනය විය.




රූපය F4: ශුද්ධ ජනන මුහුව

## පිරිවැය ව්‍යුහය




රූපය F5: පිරිවැය ව්‍යුහය 2021




රූපය F6: පිරිවැය ව්‍යුහය 2020

පසුගිය වසරට සාපේක්ෂව සෘජු ජනන පිරිවැයෙහි 14% ක පහත වැටීම (2021: බිලියන 157, 2020: බිලියන 183) මූලික වශයෙන්ම රටේ මධ්‍යම කඳුකරයේ සාමාන්‍ය තත්ත්වය ඉක්මවා ඇද හැලුණු වර්ෂාපතනය මගින් ඇති කරන ලද සුභදායී ජනන මුහුවේ ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන හා ස්.වි.නි. - තාප පිරිවැය අඩුවීම හේතුකොට සිදුවිය. ගල් අඟුරු වියදම් තුළ පිළිබිඹු වූ පිරිවැය ඉහළ යාම ඒ ආශ්‍රිත බලශක්ති ජනනයේ සිදුවූ 4% ක පහත වැටීම මධ්‍යයේ වුව, පසුගිය වසරට සාපේක්ෂව 2021 වසර තුළ 11% ක් විය. සේවා නියුක්තිකයන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව හා බැඳි පිරිවැය තුළින් ඉස්මතුවන අතිරේක වියදම් මධ්‍යයේ වුව, ලං.වි.ම.ට මෙහෙයුම් හා නඩත්තු පිරිවැය වර්ධනය 4% ක අගයේ පාලනයකට නතුකොට තබාගැනීමට හැකිවිය.

සෘජු ජනනයේ පිරිවැය ඉතිරි වීම මගින් 2021 වසරේ ජනන ලක්ෂ්‍යයේදී ඒකකයක පිරිවැය අඩුවීමට ධනාත්මක බලපෑමක් සිදු කරන ලද අතර, එය 2020 වසරේ පැවති කි.වො. ඒකකට ශ්‍රී ලං.රු. 13.96 අගයේ සිට කි.වො. ඒකකට ශ්‍රී ලං.රු. 11.74 ක අගයක් වාර්තා කරන ලදී.

අවසන් පාරිභෝගිකයා වෙත අලෙවි කරන අවස්ථාව වනවිට, ලං.වි.ම. ඒකකයක පිරිවැය 2020 (නැවත ප්‍රකාශිත) කි.වො. ඒකකට ශ්‍රී ලං.රු. 21.67 අගයේ සිට 2021 දී කි.වො. ඒකකට ශ්‍රී ලං.රු. 18.63 අගයක පැවතිණි. ඒ අනුව, සෘජු ජනන පිරිවැයද ඇතුළත් මෙහෙයුම් පිරිවැය පසුගිය මූල්‍ය වර්ෂය හා සන්සන්දනාත්මකව 8% කින් පහත වැටී ඇත.

## ණය ගැනීම් හා මූල්‍ය පිරිවැය

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතුව පැවති ගාස්තුවල ප්‍රමාද පොළිය 145% කින් ශ්‍රී ලං.රු. බිලියන 6.4 දක්වා ඉහල යාම හේතුකොට වසර තුළ ලං.වි.ම. මූල්‍ය වියදම් ශ්‍රී ලං.රු. බිලියන 20.4 දක්වා 5% කින් වර්ධනය විය. වසංගත තත්ත්වය හේතුකොට මුදල් රැස්කිරීමේ ක්‍රියාවලියට ඇතිවූ බාධාවන් තුළින් ඒවන විටද සීමාකරණයනට ලක්ව තිබූ මූල්‍ය ධාරාවන් වෙත දැඩි බලපෑම් එල්ල කෙරුණු අතර, ප්‍රමාද පොළී මුදල් ඉහළ දැමීමට හේතුවන ලෙස ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවද ඇතුළත් ප්‍රධාන සැපයුම්කරුවන් වෙත කළ යුතුව පැවති ගාස්තු පියවීම්වලට බාධා ඇති කරන ලදී.

2021 වසරේ ශ්‍රී ලං.රු. බිලියන 64.8 ක් වූ නව ණය ගැනීම් මධ්‍යයේ වුව, පොළී අනුපාතිකයන් ප්‍රතිශෝධනය කරමින් මුදල් ආපසු ගෙවිය යුතුවන කාල සීමාවන් දීර්ඝ කරමින් පවත්නා ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ ප්‍රායෝගික ප්‍රයත්නයන් පිළිබිඹු කරමින් පොළී පිරිවැය ශ්‍රී ලං.රු. බිලියන 12.2 දක්වා 16% කින් පහත වැටිණි.




රූපය F7: ණය ගැනීම්වලට සාපේක්ෂව මූල්‍ය පිරිවැය (ශ්‍රී ලං.රු. මිලියන)

රජය සතු උපයෝගිතා ආයතනයක් වශයෙන් මෙවන් ක්‍රියාමාර්ගයකට යොමුවූ පළමු අවස්ථාව සනිටුහන් කරමින් ලං.වි.ම. විසින් 2021 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලං.රු. 100 ක නිකුතු මිලක් සහිතව, 9.35% ක ස්ථාවර කූපන් අනුපාතිකයක් හා වසර 5 ක කල් පිරීමේ කාල සීමාවක්ද සහිතව ශ්‍රී ලං. රු. බිලියන 20 ක් වටිනා ජ්‍යෙෂ්ඨ, සුරකූ නොලත්, ලැයිස්තුගත, පියවිය හැකි, අනුපාතගත ණයකර ප්‍රමාණයක් නිකුත් කරන ලදී. වසර සඳහා ශ්‍රී ලං.රු. බිලියන 1.35 ක පොළී පිරිවැයක් වාර්තා කරමින්, ලං.වි.ම. ප්‍රධාන ණය හිමියන් වෙත කළ යුතුව පැවති ගෙවීම් පාර්ශ්වීය වශයෙන් පියවීම සඳහා එම ණයකරවලින් උත්පාදිත මුදල් යොදවා ගන්නා ලදී.

## මූල්‍ය තත්වය

පසුගිය මූල්‍ය වර්ෂය හා සන්සන්දනාත්මකව 5% කින්, එනම් ශ්‍රී ලං.රු. බිලියන 48 කින්, සිය වත්කම් පදනම වර්ධනය කරගනිමින් සමස්ත වත්කම් ප්‍රමාණය ට්‍රිලියනයේ සීමාවට එළැඹෙමින් සුවිශේෂී කඩඉමක් කරා ලං.වි.ම. සේන්දු විය. දේපළ, පිරියත හා උපකරණ හා භාණ්ඩ තොග අංශයන්හි ප්‍රධාන දායකත්වයෙන් වසර තුළ ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් පිළිවෙලින් 4% කින් හා 15% කින් වර්ධනය විය.




රූපය F8: වත්කම් චලනය

බොහෝ කොටම ජනන විදුලි බලාගාර, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ මාර්ග හා ගොඩනැගිලි අංශයන්හි ආයෝජන හේතුකොට ලං.වි.ම. සමස්ත වත්කම් පදනමින් 85% ක අගයක් නිරූපණය කරමින් 2020 ට සාපේක්ෂව දේපළ, පිරියත හා උපකරණ 4% කින් වර්ධනය විය. ප්‍රධාන කොටම ගල් අඟුරු තොග, අමතර කොටස් හා පාරිභෝගික ද්‍රව්‍ය මගින් ලද තල්ලුවද සමගින් භාණ්ඩ තොග සම්බන්ධ ආයෝජන ශ්‍රී ලං.රු. බිලියන 64 දක්වා 40% කින් වර්ධනය වන පසුබිමක, පසුගිය වසරේ 12% අගය හා සාපේක්ෂව ලං.වි.ම. සමස්ත වත්කම් පදනමින් ජංගම වත්කම්හි කොටස 13% ක අගයක් පෙන්වන ලදී. වසර තුළ වෙළඳ හා සෙසු ලැබිය යුතු දේ 7% කින් පහත වැටුණද, විදුලිය විසන්ධි කිරීමේ කාර්යයන් කල් තැබීම සඳහා වූ රජයේ තීරණය හා වසංගත සමය තුළ රැස්කිරීමේ ක්‍රියාවලියට සිදුවූ බාධාවන්ද සමගින් පාරිභෝගිකයන්ගේ වැයකළ හැකි ආදායමේ ඇතිවූ පහත වැටීම්ද හේතුවෙන් ආශ්‍රිත නොවන විදුලි ණයකරුවන් සංඛ්‍යාව 8% කින් වර්ධනය විය.

2021 වසරේ සමස්ත සම කොටස් හා බැරකම්හි 5% ක වර්ධනයක් පිළිබිඹු කරමින් පසුගිය වසරයන්හි සාපේක්ෂව නොවෙනස්ව පැවති ලං.වි.ම. සමස්ත වත්කම් ප්‍රමාණයෙන් 40% ක අරමුදල් ණය ගැනීම් විය. වසර තුළ අබාධක විදුලිය සැපයුමක් පවත්වාගනු පිණිස ලං.වි.ම. වර්ධිත ප්‍රාග්ධන හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයනට මුදල් සපයනු වස් ශ්‍රී ලං.රු. බිලියන 45 ක් වටිනා ණය ප්‍රමාණයක් මූල්‍යායතන වෙතින් ලබාගන්නා ලදී.

තවද, ශ්‍රී ලංකා ඉතිහාසයේ ලැයිස්තුගත සුවිශාලතම ණයකර නිකුතුව වශයෙන් ඉහළම වාර්තාවක් තබමින් ශ්‍රී ලං.රු. බිලියන 20 ක ණයකර නිකුතුවක් සමගින් වෙළඳපල ලැයිස්තුගත කෙරෙමින් අරමුදල් රැස්කර ගැනීමේ අභියෝගාත්මක මාර්ගයක් ලං.වි.ම. විසින් තෝරා ගන්නා ලදී. ණයකර සඳහා සාර්ථක අධි දායකත්වයක් හෙවත් සැපයුම ඉක්මවූ ඉල්ලුමක් ලද අතර, එසේ රැස්කරන ලද මුදල් පිළිවෙලින් ශ්‍රී ලං.රු. බිලියන 6 ක් හා ශ්‍රී ලං.රු. බිලියන 14 ක් ලෙස ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා ලං.වි.ම. ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් වෙත වූ බැරකම් කොටසක් පියවනු පිණිස යොදාග න්නා ලදී.

මෙයට අමතරව, පුත්තලම ගල් අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘතිය මත වූ විදේශ ණය සඳහා සිදුකරන ලද පියවීම් මගින් මහා භාණ්ඩාගාරය වෙතින් ලද ශ්‍රී ලං.රු. බිලියන 21.3 ක් වටිනා මූලධන දායකත්ව යොමුව හේතුකොට සම කොටස් තත්ත්වය වර්ධනය විය. කෙසේ වුවද, 2021 වසර අවසානය වනවිට ලං.වි.ම. ණය /සම කොටස් අනුපාතය තවදුරටත් අයහපත් අතට හරවමින්, පොළිය සහිත ණය හා ණය ගැනීම් සමස්තය සම කොටස් ප්‍රමාණයට වඩා සැලකිය යුතු ඉහළ අගයක් ගන්නා තත්ත්වයක, සමස්ත බැරකම් ප්‍රමාණය පසුගිය වසර හා සාපේක්ෂව 7% කින් වර්ධනය විය.

## මූල්‍ය තත්ත්වය (උද්දීපනයන්)

### සමස්ත වත්කම්






## සමස්ත බැරකම් හා සම කොටස්







## ජංගම නොවන වත්කම් සංයුතිය







## ජංගම වත්කම් සංයුතිය







## මූල්‍ය අනුපාත

| අනුපාතය | 2021 | ප්‍රතිප්‍රකාශිත 2020 |
|---|---|---|
| වත්කම් මත ප්‍රතිලාභ | -2% | -7% |
| සම කොටස් මත ප්‍රතිලාභ | -8% | -26% |
| සම කොටස්වලට ණය | 150% | 143% |
| වත්කම්වලට ණය | 40% | 40% |
| ජංගම අනුපාතය | 0.53:1 | 0.56:1 |
| ක්ෂණික අනුපාතය | 0.27:1 | 0.34:1 |
| ණය සේවා ආවරණ අනුපාතිකය (DSCR) | 0.79 | -0.24 |
| පොලී ආවරණය | -0.08 | -2.80 |

## අවසන් පාරිභෝගික අයකුමය හා රජයේ ප්‍රතිපත්තිය

රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් ගෘහස්ථ කාණ්ඩයේ අඩු පරිභෝජනයක් සහිත පාරිභෝගිකයන් වෙත හා පොදු කාර්ය කාණ්ඩය හැර අන් කාණ්ඩයන් අතරින් බොහොමයක් වෙතද අලෙවි ලක්ෂ්‍යයේදී සැබෑ පිරිවැයට අඩු මිලක විදුලි ගාස්තුවක් ලං.වි.ම. විසින් ලබාදෙනු ලබයි. එබැවින්, ගෘහස්ථ කාණ්ඩයේ ඉහළ කෙළවර පාරිභෝගිකයන් හා පොදුකාර්ය කාණ්ඩය විසින් මෙකී වැඩිපුර යෙදෙන පිරිවැයෙන් කොටසක් දරනු ලබයි. 2021 දෙසැම්බර් මස 31වන දින වනවිට, රජයේ මෙකී ප්‍රතිපත්තිය හේතුකොට වාර්තාගත සමස්ත අලාභය ශ්‍රී ලං.රු. බිලියන 59.7 ක් වූ අතර, ඉහළ කෙළවර පාරිභෝගිකයන් වෙතින් අය කරන ලද අතිරික්තය ශ්‍රීලං. රු. බිලියන 25.4 ක් විය. එබැවින්, ලං.වි.ම. විසින් දරන ලද අලාභය සෙසු ආදායම් හැර ශ්‍රී ලං.රු. බිලියන 34.3 ක් ලෙස ප්‍රකාශිතය.

ඒ අනුව, රජයේ සහන ප්‍රතිපත්තිය හේතුකොට ලං.වි.ම. මූල්‍ය ප්‍රකාශන වෙත ඇතිවූ ශුද්ධ බලපෑම පහත පරිදි වේ:

| | 2021 ශ්‍රී ලං.රු.මි. | 2020 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී ලං.රු.මි. |
|---|---|---|
| රජයේ ප්‍රතිපත්තිය හේතුකොට ඇතිවූ අලාභය/ හිඟය (අවශ්‍ය සහන මුදල) | (59,665) | (83,856) |
| අයකළ අතිරික්තය | 25,390 | 13,215 |
| රජය විසින් ලබාදිය යුතුවන ශුද්ධ සහනය | -34,275 | -70,641 |
| සෙසු ආදායම් (අර්ථ නිරූපිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක අලාභය ගලපන ලදුව) | 12,320 | 1,477 |
| මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර ශුද්ධ අලාභය | -21,955 | -69,164 |

# දස වසරක සාරාංශය

පසුගිය වසර 10 තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල සහ වත්කම් තත්ත්වය පහත පරිදි දක්වා ඇත.

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2021 ශ්‍රී. ලං. රු. මිලියන | 2020 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2019 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2018 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2017 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2016 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2015 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2014 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2013 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන | 2012 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | | | | | | | |
| අදායම | 249,089 | 238,911 | 242,950 | 229,571 | 218,450 | 206,811 | 188,684 | 202,645 | 194,147 | 163,512 |
| ගෘහස්ථ පාරිභෝගිකයන්ට ලබාදුන් සහන | (196) | (5,908) | - | - | - | - | - | - | - | - |
| විකුණුම් පිරිවැය | (254,452) | (276,938) | (322,521) | (251,964) | (260,273) | (222,097) | (168,781) | (213,646) | (165,509) | (222,419) |
| දළ ලාභය/ (අලාභය) | (5,559) | (43,935) | (79,571) | (22,393) | (41,823) | (15,286) | 19,903 | (11,001) | 28,638 | (58,907) |
| අනෙකුත් ආදායම් හා ලැබීම් | 11,693 | 8,817 | 10,307 | 9,450 | 8,143 | 10,323 | 8,292 | 5,871 | 5,107 | 4,225 |
| පරිපාලන වියදම් | (8,285) | (7,131) | (7,280) | (5,832) | (5,110) | (4,965) | (4,086) | (3,146) | (2,556) | (2,997) |
| මූල්‍ය ආදායම | 1,131 | 1,338 | 1,751 | 1,466 | 1,194 | 1,049 | 434 | 304 | 1,677 | 2,429 |
| මූල්‍ය පිරිවැය | (20,430) | (19,522) | (22,526) | (13,036) | (8,415) | (4,312) | (5,134) | (7,030) | (10,601) | (6,198) |
| බදු පෙර ලාභය/ අලාභය | (21,450) | (60,433) | (97,319) | (30,345) | (46,011) | (13,191) | 19,409 | (15,002) | 22,265 | (61,448) |
| අදායම් බදු වියදම | - | (53) | (39) | (50) | (232) | (263) | (61) | (95) | | |
| විලම්භිත බදු (අයකිරීම්)/ හැරවීම් | - | - | - | - | - | - | - | 995 | (1,326) | (16,198) |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභ/ අලාභ | (505) | (8,678) | (64) | (1,541) | (1,338) | (1,003) | 952 | (3,183) | (39) | (124) |
| විස්තීරණ ආදායම් | (21,955) | (69,164) | (97,422) | (31,936) | (47,581) | (14,457) | 20,300 | (17,285) | 20,900 | (77,770) |
| **දෙසැම්බර් 31 දිනට** | **2021 ශ්‍රී. ලං. රු. මිලියන** | **2020 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2019 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2018 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2017 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2016 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2015 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2014 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2013 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** | **2012 ප්‍රතිප්‍රකාශිත ශ්‍රී. ලං. රු. මිලියන** |
| **වත්කම්** | | | | | | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 853,011 | 819,248 | 781,517 | 747,012 | 724,068 | 704,695 | 694,415 | 681,471 | 648,130 | 621,088 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 912 | 912 | 912 | 912 | 912 | 912 | 912 | 785 | 785 | 762 |
| හවුල් ව්‍යාපාරවල ආයෝජන | 329 | 329 | 329 | 329 | 329 | 329 | 329 | 150 | 150 | 150 |
| රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජන | 10,658 | 9,981 | 8,997 | 8,070 | 7,246 | 6,496 | 6,036 | 5,653 | 5,250 | 4,433 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 7,700 | 8,859 | 9,951 | 10,204 | 8,912 | 8,983 | 3,848 | 2,291 | - | - |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | 851 | 1,074 | 1,489 | 1,242 | 961 | 949 | 896 | - | - | - |
| විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් | 0.076 | 0.076 | 0.076 | 0.076 | 0.655 | 1,022 | 1,025 | 1,023 | 1,021 | - |
| ජංගම වත්කම් | 131,921 | 116,617 | 110,576 | 102,338 | 89,065 | 80,968 | 69,391 | 72,662 | 91,423 | 101,295 |
| **මුළු වගකීම්** | **1,005,382** | **957,020** | **913,771** | **870,107** | **831,494** | **804,354** | **776,852** | **764,035** | **746,759** | **727,728** |
| **වගකීම්** | | | | | | | | | | |
| පොළී දරණ ණය සහ ණය ගැනීම් | 353,928 | 352,094 | 318,149 | 281,262 | 236,129 | 220,476 | 214,299 | 221,735 | 355,043 | 345,700 |
| පාරිභෝගික තැන්පතු | 16,300 | 15,641 | 15,014 | 14,311 | 13,557 | 12,753 | 11,484 | 10,458 | 9,722 | 8,899 |
| ප්‍රතිපාදන සහ අනෙකුත් විලම්භිත වගකීම් | 21,615 | 20,121 | 10,482 | 10,038 | 8,622 | 7,262 | 6,116 | 6,572 | 3,236 | 3,593 |
| රාජ්‍ය ප්‍රධාන | 188 | 200 | 213 | 228 | 243 | 211 | - | - | - | - |
| විලම්භිත ආදායම් | - | - | - | - | - | - | 71,696 | 66,292 | 60,343 | 55,208 |
| කොන්ත්‍රාත් වගකීම් | 99,518 | 95,771 | 89,746 | 86,335 | 82,564 | 77,628 | - | - | - | - |
| විලම්භිත බදු | - | - | - | - | - | - | - | - | 22,182 | 20,857 |
| ජංගම වගකීම් | 249,031 | 208,447 | 223,803 | 145,712 | 123,682 | 72,661 | 43,630 | 64,147 | 69,134 | 96,171 |
| **මුළු වගකීම්** | **740,580** | **692,274** | **657,407** | **537,886** | **464,797** | **390,991** | **347,225** | **369,204** | **519,660** | **530,428** |
| **ස්කන්ධය** | | | | | | | | | | |
| දායක ප්‍රග්ධනය | 413,054 | 391,731 | 323,194 | 302,695 | 302,695 | 302,695 | 302,228 | 289,038 | 121,708 | 110,862 |
| සංචිත | 41,222 | 39,254 | 37,110 | 34,881 | 32,783 | 30,283 | 28,463 | 27,434 | 25,999 | 24,460 |
| රඳවා ගත් ඉපයීම් | (189,474) | (166,239) | (103,940) | (5,355) | 31,219 | 80,385 | 98,936 | 78,359 | 79,392 | 61,978 |
| **මුළු ස්කන්ධය** | **264,802** | **264,746** | **256,364** | **332,221** | **366,697** | **413,363** | **429,627** | **394,831** | **227,099** | **197,300** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **1,005,382** | **957,020** | **913,771** | **870,107** | **831,494** | **804,354** | **776,852** | **764,035** | **746,759** | **727,728** |

# අගය එකතු කිරීමේ ප්‍රකාශය

| විස්තරය | 2021<br>ශ්‍රී. ලං. රු. මිලියන | 2020<br>ශ්‍රී. ලං.රු. මිලියන<br>ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|
| **එකතු කල අගය** | | |
| අදායම | 249,089 | 238,911 |
| අනෙකුත් ආදායම් | 11,693 | 8,817 |
| මූල්‍ය ආදායම | 1,131 | 1,338 |
| තෙවන පාර්ශවයන් විසින් සපයනු ලබන සම්පත් වල පිරිවැය | (144,426) | (148,856) |
| **ආයතනය විසින් එකතු කරන ලද මුළු එකතු කල අගය** | **117,488** | **100,210** |
| **අගය බෙදාහැරීම** | | |
| **සේවකයින්ට වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වශයෙන්** | **47,869** | **38,224** |
| **රජයේ ආදායමට** | | |
| අදායම් බදු | | 53 |
| අනෙකුත් බදු | 3,504 | 3,173 |
| **ප්‍රාග්ධනය ණය දෙන්නන්ට** | | |
| ණය මත පොළී | 20,431 | 19,522 |
| **ප්‍රජාවට** | | |
| ආයතනික සමාජ වගකීම | 24 | 69 |
| කොවිඩ්-19 හේතුවෙන් සහන සැපයීම | 196 | 5,908 |
| සහන ගාස්තු යටතේ විදුලිය ලබා දීම | 34,275 | 70,641 |
| **වර්ධනය හා ව්‍යාප්තිය සඳහා රඳවා ගත් අගය** | | |
| රදවා ගත් අගය | (21,955) | (69,164) |
| ක්ෂය | 33,144 | 31,784 |
| **ආයතනය විසින් බෙදා හරින ලද මුළු එකතු කල අගය** | **117,488** | **100,210** |

හම්බන්තොට සූර්ය උද්‍යානය



# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ

| ඉංජිනේරු එච්.එම්. විජිත හේරත් | |
|---|---|
| ධුරය | සභාපති |
| ධුර කාලය | 2021 ජුලි 19 දින දක්වා |
| කුසලතා හා පළපුරුද්ද | ඔහු විද්‍යාවේදී ඉංජිනේරු උපාධිධරයෙකි. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ඇමරිකානු පෑස්සුම් සංගමයේ සාමාජිකයෙකි. ව්‍යපෘති කළමනාකරණය හා ව්‍යාපාර පරිපාලනය සම්බන්ධයෙන් වසර 20ක පළපුරුද්දක් හිමි අයෙකි. |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | සභාපති, සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගම<br>සභාපති, සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම<br>සීමාසහිත ලංකා විදුලි (පුද්) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙක්<br>සභාපති, සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම |

| එම්.එම්.සී. ප්‍රදීනාන්දු | |
|---|---|
| ධුරය | සභාපති |
| ධුර කාලය | 2021 ජුලි 20 දින සිට |
| කුසලතා හා පළපුරුද්ද | ඔහු නීතිවේදී උපාධිධරයෙකි, නීතිඥයෙකි, රාජ්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් (පරිපාලන විද්‍යාලය, නෙදර්ලන්තය) ඩිප්ලෝමාධාරියෙකි.<br>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් වන අතර රාජ්‍ය සේවයේ වසර 45කට වැඩි සේවා කාලයක් හිමි අයෙකි. විවිධ අමාත්‍යංශ ගණනාවක ලේකම් ධුරයන් හොබවා ඇති අතර රජය සතු සමාගම් බොහොමයක සභාපති, වෙනත් ජ්‍යෙෂ්ඨ නිලයන් හා අධ්‍යක්ෂ මණ්ඩල නිලයන් හොබවා ඇති අතර ජාත්‍යන්තර සංසද බොහොමයක ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | සභාපති, සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම<br>සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙක් සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමෙහි අධ්‍යක්ෂවරයෙක් |

| එන්.එස්. ඉලංගකෝන් | |
|---|---|
| ධුරය | උප සභාපති |
| ධුර කාලය | 2020 දෙසැම්බර් 11 දින සිට |
| කුසලතා හා පළපුරුද්ද | ඔහු ජලයේ ගොඩබැස්සවිය හැකි ගුවන්යානා සඳහා ශ්‍රී ලංකාවේ හා ඇමරිකා එක්සත් ජනපදයේ පුහුණුව ලද සුදුසුකම්ලත් වාණිජ ගුවන් නියමුවෙකි. රජයේ හා පෞද්ගලික අංශයේ ආයතනයන්හි සභාපති හා ජ්‍යෙෂ්ඨ කළමනාකාර ධුරයන් හොබවා ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධයෙන් වසර 16ක පළපුරුද්දක් ඔහු සතුය. |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | සභාපති, සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගම<br>සභාපති, සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, සීමාසහිත ලංකා විදුලි (පුද්) සමාගම |

| එල්.පී. ප්‍රේමසිරි | |
|---|---|
| ධුරය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ධුර කාලය | 2021 ජනවාරි 29 දක්වා |
| කුසලතා හා පළපුරුද්ද | කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලනය පිලිබඳ පශ්චාත් උපාධිය ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකි. ඔහු අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු ගණනාවක ගණකාධිකාරීවරයෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු හා අධ්‍යක්ෂවරයෙකු ලෙස විවිධ තනතුරු වල වසර 34ක පළපුරුද්දක් ලබා ඇත. |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | ප්‍රධාන මූල්‍ය නිලධාරී - කර්මාන්ත අමාත්‍යංශය |

| වී.පී.කේ. අනුෂ පැල්පිට | |
|---|---|
| ධුරය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ධුර කාලය | 2021 ජනවාරි 30 සිට 2021 ජුලි 07 දක්වා |
| කුසලතා හා පළපුරුද්ද | රාජ්‍ය සේවයේ වසර 27ක පළපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරියෙකි. නෙලුම් කුළුණ හා සූරියවැව තොරතුරු තාක්ෂණ උද්‍යානය වැනි වැදගත් රාජ්‍ය ව්‍යාපෘති කළමනාකරණය කිරීම තුලින් ලබා ගත් ශක්තිමත් කළමනාකරණ හා සැලසුම් හැකියාවන් ඔහු සතුය. අධ්‍යක්ෂ ජනරාල්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, සභාපති-ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ රූපවාහිනී සංස්ථාව වැනි විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ධුරයන් ඔහු විසින් සාර්ථකව හොබවා ඇත. |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | ලේකම් - කර්මාන්ත අමාත්‍යංශය<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - නාගරික සංවර්ධන අධිකාරිය |

# අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව (ඉතිරිය...)

## අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ (ඉතිරිය...)

| ජෙනරල් දයා රත්නායක (විශ්‍රාමික) | |
|---|---|
| ධුරය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ධුර කාලය | 2021 ජුලි 08 දින සිට 2021 දෙසැම්බර් 23 දින දක්වා |
| කුසලතා හා පළපුරුද්ද | ජෙනරල් (විශ්‍රාමික) දයා රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු පීඑස්සී<br><br>ජෙනරල් (විශ්‍රාමික) දයා රත්නායක, 2021 වර්ෂයේදී කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් ලෙස පත් කරන ලද අතර ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හිටපු සභාපති මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 20 වැනි යුද්ධ හමුදාධිපති ( 2013-2015) ලෙස කීර්තිමත් සේවාවක් සිදු කල අයෙකි.<br><br>1980 පෙබරවාරි 06 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බල සේවයට කෙඩෙට් නිලධාරියෙකු ලෙස එක්ව අධිකාරියට පත්වීමෙන් පසු ඔහු ඉන්දියාවේ කනිෂ්ඨ අණ හා ජ්‍යෙෂ්ඨ අණ පාඨමාලා, බ්‍රිතාන්‍යයේ ක්‍රාන්ෆීල්ඩ් විශ්ව විද්‍යාලයේ පාලනය හා කළමනාකරණය පිලිබඳ ආරක්ෂක පාඨමාලාව, ඇමරිකා එක්සත් ජනපදයේ හවායි හි පිහිටි ආරක්ෂක අධ්‍යයන පිලිබඳ ආසියා පැසිෆික් මධ්‍යස්ථානයේ උසස් ආරක්ෂක අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව සහ උසස් සන්නිවේදන කුසලතා පාඨමාලාව ආදී යුධ හා යුධ නොවන පුහුණු හා අධ්‍යාපනික පාඨමාලා රැසක් හදාරා ඇත. එමෙන්ම ඔහු බංගලාදේශයේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාසලෙන් සහ චීනයේ ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ ඇරිසෝනා ප්‍රාන්තයේ යුධ බුද්ධි පුහුණු පාසලෙන් ද උපාධි ලබා ඇත. වර්තමානයේ දී ඔහු ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටී.<br><br>ජෙනරල් (විශ්‍රාමික) දයා රත්නායක තම නිලයට ගැලපෙන පරිදි අණදෙන නිලධාරී තනතුරු රැසක් හොබවා ඇති අතර එල් ටී ටී ඊ ත්‍රස්තවාදීන් 14,500ක් පුනරුත්ථාපනය කිරීමෙහිලා කොමසාරිස් ජනරාල්-පුනරුත්ථාපන ලෙස ඔහු විසින් සිදු කරන ලද මෙහෙවර බොහෝ දෙනාගේ පිළිගැනීමට ලක්විය.<br><br>බොහෝ භයානක යුධ මෙහෙයුම් වලදී ඔහු විසින් සිදු කල සුවිශේෂී කාර්යභාරයන් හේතුවෙන් ඔහු සටන් බිමෙහි ප්‍රවීණයෙකු ලෙස හැඳින්වෙන අතර එසේ සිදු කල සේවාව වෙනුවෙන් ඔහු වීර පදක්කම් හා සේවා පදක්කම් 26කින් පිදුම් ලබා ඇත. |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | ලේකම් - කර්මාන්ත අමාත්‍යංශය |

| පී.පී.එන්.එම්. අබේසේකර | |
|---|---|
| ධුරය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ධුර කාලය | 2021 දෙසැම්බර් 24 දින සිට |
| කුසලතා හා පළපුරුද්ද | ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) නිලධාරියෙකු ලෙස රාජ්‍ය සේවයේ වසර 22 කට වැඩි පළපුරුද්දක් හිමි අයෙකු වන අතර මේ වන විට කර්මාන්ත අමාත්‍යංශයේ අතිරේක ලේකම් ලෙස සේවය කරයි. ඔහු මීට ප්‍රථම අධිකරණ අමාත්‍යංශයේ සහ නාගරික සංවර්ධන අමාත්‍යංශයේ අතිරේක ලේකම් ධුරයන් ද හොබවා ඇත. ඊට අමතරව ඔහු අමාත්‍යංශ හා රජයේ දෙපාර්තමේන්තු ගණනාවක ද ජ්‍යෙෂ්ඨ සහකාර හා අධ්‍යක්ෂ තනතුරු හොබවා ඇත |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | අතිරේක ලේකම් ප්‍රතිපත්ති සංවර්ධන - කර්මාන්ත අමාත්‍යංශය |

| එස්.ඩී. ප්‍රබී නිලුක්ශාන් | |
|---|---|
| ධුරය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ධුර කාලය | 2020 ජනවාරි 13 දින සිට 2021 දෙසැම්බර් 23 දින දක්වා |
| කුසලතා හා පළපුරුද්ද | ඔහු දකුණු කොරියාවේ ක්යුන්ග් හී විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළෙඳාම හා ආර්ථික සහයෝගිතාව පිලිබඳ පශ්චාත් උපාධිය ලබා ගෙන ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිලිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා ගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු ලෙස රාජ්‍ය අංශයේ වසර 20ක වෘත්තීමය පළපුරුද්ද සහිත වුවෙකි. තවද, ඔහු 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස සේවය කර ඇති අතර ප්‍රධාන රජය සතු සමාගම් හා ව්‍යවස්ථා මණ්ඩල කිහිපයක මණ්ඩලවල භාණ්ඩාගාරය නියෝජනය කර ඇත |
| වෙනත් ආයතන වල හොබවන ධුරයන් | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව |

# අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව (ඉතිරිය...)

| එම්.එම්. නයිමුඩින් | |
|---|---|
| **ධුරය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2020 ජනවාරි 17 දින සිට |
| **කුසලතා හා පළපුරුද්ද** | ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු මෙන්ම වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ. එමෙන්ම ඔහු රාජ්‍ය කළමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධියක් සහ ආර්ථික විද්‍යාව පිලිබඳ උපාධියක් හිමි අයෙකි. ඔහු ඉහල මට්ටමේ නායකත්වයක් සහිත තනතුරු හොබවා වසර 16ක පළපුරුද්දක් සහිතව රාජ්‍ය අංශයේ කළමනාකරුවකු ලෙස වසර 26ක පමණ වෘත්තිමය පලපුරුද්දක් ද සහිත නිලධාරියෙකි. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය, ආයතනික ශක්තිමත් බව ඇති කිරීම, ව්‍යාපෘති කළමනාකරණය, ප්‍රසම්පාදනය හා මානව සම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනය මෙහෙයවීමෙහිලා ඔහු ඇගයීමට ලක් කර ඇත. |
| **වෙනත් ආයතන වල හොබවන ධුරයන්** | අතිරේක ලේකම්, (ව්‍යාපෘති අධීක්ෂණ) රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය |

| බී.කේ ජගත් පෙරේරා | |
|---|---|
| **ධුරය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2021 ජනවාරි 07 දක්වා |
| **කුසලතා හා පළපුරුද්ද** | ඔහු පෞද්ගලික අංශයේ වසර 20කට වැඩි සහ රජයේ සේවයේ වසර 10ක පළපුරුද්දක් සහිත අයෙකි. ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්වීම් ලැබීමට ප්‍රථම ඔහු කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි සභාපති, ලංකා ධීවර සංස්ථාවෙහි සභාපති, සීනෝර් පදනමේ සභාපති සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති ලෙස ද සේවය කර ඇත. |
| **වෙනත් ආයතන වල හොබවන ධුරයන්** | සභාපති - සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්) සමාගම |

| ආචාර්ය. බී විජයරත්න | |
|---|---|
| **ධුරය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2021 ජනවාරි 07 දින සිට |
| **කුසලතා හා පළපුරුද්ද** | ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු ලෙස රාජ්‍ය සේවයේ වසර 35කට වැඩි පළපුරුද්දක් හිමි අයෙකි. ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්වීම් ලැබීමට ප්‍රථම ඔහු කෘෂිකර්ම අමාත්‍යංශයේ ලේකම් ලෙස සේවය කර ඇත. ඔහු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ අතිරේක ලේකම්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් යන තනතුරු ද දරා ඇත. |
| **වෙනත් ආයතන වල හොබවන ධුරයන්** | සභාපති, ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අධ්‍යක්ෂ, ජාතික අධ්‍යාපන ආයතනය |

| රූබන් වික්‍රමාරච්චි | |
|---|---|
| **ධුරය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2020 අප්රේල් 24 දින සිට |
| **කුසලතා හා පළපුරුද්ද** | ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිලිබඳ උපාධිධරයෙකු මෙන්ම පිරිස් කළමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු ද වේ. ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය සහ විශේෂ විමර්ශන ඒකක වල වසර 36ක වෘත්තිමය පළපුරුද්දක් ඔහු සතුව ඇත. තවද, ඔහු 1994 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන හා කළමනාකරණ කමිටු සාමාජික, ලංකා විදුලිබල මණ්ඩලයේ විනය මණ්ඩලයේ සාමාජික ලෙසද තම කාර්යයන් ඉටු කර ඇත. එමෙන්ම ඔහු ලං.වි.ම විශේෂ විමර්ශන ඒකකයේ ආරම්භක ප්‍රධානියා ද වේ. |
| **වෙනත් ආයතන වල හොබවන ධුරයන්** | අධ්‍යක්ෂ සහ සාමාජික, විගණන කමිටුව ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් ආයතනය අධ්‍යක්ෂ සහ සාමාජික, විගණන කමිටුව පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය |

## අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන තම විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සතුටින් ඉදිරිපත් කරයි.

## මූලික කාර්යයන්

මණ්ඩලයේ මූලික කාර්යයන් වන්නේ විදුලිබල උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, එලදායී බෙදා හැරීම හා විකිණීමයි. මණ්ඩලය විසින් රටේ පවතින නීති හා රෙගුලාසි වලට පටහැනි කිසිදු කටයුත්තක නිරත වී නොමැත.

## පරිපාලිතයන් හා බද්ධ ව්‍යාපාර

පරිපාලිතයන් හා බද්ධ ව්‍යාපාර වල මූලික කාර්යයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ පිටු අංක 86 හි දැක්වේ. සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ හා සමූහයේ ප්‍රධාන කාර්යයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවී නොමැත.

## සමූහයේ ව්‍යුහයේ වෙනස්කම්

වර්ෂය තුල සමූහයේ ව්‍යුහයේ වෙනස්වීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 117 සිට 119 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 12 හා 13 යටතේ දක්වා ඇත.

## වර්ෂයේ කාර්ය සාධනය පිලිබඳ සමාලෝචනය

පිටු අංක 12 සිට 13 දක්වා සභාපතිවරයාගේ පණිවුඩයෙහි මණ්ඩලයේ/සමූහයේ වර්ෂයේ කාර්ය සාධනය ඇතුලත් වේ. පිටු අංක 14 සිට 15 දක්වා ඇති සාමාන්‍යාධිකාරීවරයාගේ සමාලෝචනයෙහි සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් පිලිබඳ විස්තරාත්මක සටහනක් සපයා ඇත. පිටු අංක 65 සිට 68 දක්වා ''මූල්‍ය සමාලෝචනය'' මාතෘකාව යටතේ මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය හා මූල්‍ය තත්වය පිලිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සපයයි. වාර්ෂික වාර්තාවේ අවශ්‍ය අංගයක් වන මෙම වාර්තා මණ්ඩලයේ කටයුතු පිලිබඳ සාධාරණ සමාලෝචනයක් සපයයි.

# අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව (ඉතිරිය...)

### දායක ප්‍රාග්ධනය

දායක ප්‍රාග්ධනය නියෝජනය කරනු ලබන්නේ 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත අනුව 1969 දී ලංකා විදුලිබල මණ්ඩලය ස්ථාපිත කිරීමේදී රජයේ විදුලි කටයුතු දෙපාර්තමේන්තුව වෙතින් පවරා ගන්නා ලද ශුද්ධ වත්කම්වල වටිනාකම හා විශේෂිත ප්‍රාග්ධන සංවර්ධන ව්‍යපෘති සඳහා ශ්‍රී ලංකා රජය මඟින් ප්‍රදානය කල අරමුදල්ය. දායක ප්‍රාග්ධනය පිලිබඳ විස්තර පිටු අංක ...... හි මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 22 යටතේ දක්වා ඇත.

### ණයකර නිකුත් කිරීම හා උපයෝජනය

2021 වර්ෂයේ අප්‍රේල් මාසය තුල, ලංවිම රුපියල් බිලියන 20ක් වටිනා ජ්‍යෙෂ්ඨ ඇප රහිත, ලැයිස්තුගත, නිදහස් කල හැකි ණයකර, ලං.රු. 100ක නිකුත් කල අගයකින්, 9.35% ක ස්ථාවර කූපන අනුපාතිකයක් සහිතව වසර 05කින් කල්පිරෙන ලෙස නිකුත් කර ඇත

ණයකර නිකුත් කිරීමෙන් ලැබූ මුදල (ලං රුබි 20), ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබා ගත් ණය (මුදලෙන් 30% ක්) සහ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගෙන් ලබා ගත් ණය (මුදලෙන් 70%ක්) ලෙස ණය මුදල් පියවීමට භාවිත කර ඇත.

ආයතනයේ ඉහත හිඟ ණය පියවීම සඳහා ලැබූ මුදල් භාවිතා කරන ලද අතර මුදල් දෙපාර්තමේන්තුවේ නිසි සමාලෝචනයකට යටත්ව ගෙවීම් සිදු කරන ලදී. තවද, ආයතනය විසින් අදාළ පාර්ශව සඳහා වන දඩ පොළී මුදල අඩු කිරීමට අපේක්ෂා කරන බැවින්, ණයකර නිකුත් කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුනොවීමට බලපෑ හැකි සැලකිය යුතු ආකාරයේ අවදානම් සාධක නොමැත.

### ආයතනික සමාජ වගකීම (CSR)

සමාලෝචනයට භාජනය වූ කාලය තුල සිදු කල ආයතනික සමාජ වගකීම් සම්බන්ධ ක්‍රියාකාරකම් පිටු අංක 58 සිට 59 හි ආයතන සමාජ වගකීම් වාර්තාව ලෙස සඳහන් කොටසෙහි දක්වා ඇත.

### තිරසාරභාවය

ලං.වි.ම. සමාජ, ආර්ථික සහ පාරිසරික තිරසාරභාවයන්ගේ නිවැරදි සමතුලනයක් පවත්වාගෙන යමින් තම මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. සමාජ, ආර්ථික සහ පාරිසරික තිරසාරභාවය ලඟා කර ගැනීම සඳහා ලං.වි.ම. විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිටු අංක .... හි දක්වා ඇත.

### මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම

පවත්නා තත්වය පිලිබඳ සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් ප්‍රතිබිම්බනය කරන්නා වූ මූල්‍ය ප්‍රකාශන සැකසීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවන්ට හා 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂකවරුන්ගේ මතයයි. පර්පාලිත සමාගම් සම්බන්ධයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට ද අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබේ.

### විගණකවරුන්ගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධිවිධාන හා 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 51 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති ලංකා විදුලිබල මණ්ඩලයේ විගණකවරයා වේ. 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය හා එහි පර්පාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපති වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 151 සිට 164 දක්වා ඇත'

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංමුවාප්‍ර) අනුකූලව සමූහය හා මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු 86 සිට 105 දක්වා ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබෙන වෙනස්කම්වලට අමතරව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී නොමැත.

### මණ්ඩලය සමඟ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 39.4 හි අනාවරණය කර ඇති ඒවා හැරුනු කොට 2021 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා මණ්ඩලය සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් හෝ යෝජිත බැඳීමක් නොමැත.

### පාරිශ්‍රමික කමිටුව

ලංකා විදුලිබල මණ්ඩලය පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපිත කරන ලද රාජ්‍ය ආයතනයකි. ඒ අනුව චක්‍රලේඛ, පනත් ආදිය මඟින් පරිපාලන භාවිතයන් හා පාලන ක්‍රියා පටිපාටි පාලනය කරනු ලබයි. මුදල් අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක. PED 3/2015 මත පදනම්ව ලංවිම අධ්‍යක්ෂවරුන්ගේ වේතන නිර්ණය කරන බැවින් ලංවිමට පාරිශ්‍රමික කමිටුවක් පැවැත්වීම අවශ්‍ය නොවේ. ඉහත සඳහන් චක්‍රලේඛය පහත වෙබ් ලිපිනය හරහා පරිශීලනය කල හැක.
https://www.treasury.gov.lk/web/public-enterprises-department-circular/section/2015.

### මණ්ඩලය විසින් පහත උප කමිටු පත් කර ඇත.

01. සේවක දුක්ගැනවිලි කමිටුව
02. විනය අභියාචනා මණ්ඩලය
03. විගණන හා කළමනාකරණ කමිටුව
04. නීති කමිටුව

### 01. සේවක දුක්ගැනවිලි කමිටුව

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්/හිටපු සේවකයින් පිලිබඳ දුක්ගැනවිලි සලකා බැලීමට මණ්ඩලය විසින් පත් කරන ලද උප කමිටුව සේවක දුක්ගැනවිලි කමිටුවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සහ ලං.වි.ම. ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් මෙම දුක්ගැනවිලි කමිටුව සමන්විත වේ.

2021 වර්ෂය සඳහා සේවක දුක්ගැනවිලි කමිටුවේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ සංයුතිය පහත පරිදි වේ.

i. එන්.එස්. ඉලංගකෝන් මහතා, උප සභාපති, ලං.වි.ම සභාපති ලෙස
ii. රූබන් වික්‍රමාරච්චි මහතා, සාමාජික, සාමාජික ලෙස

# අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව (ඉතිරිය...)

**අනෙකුත් සාමාජිකයින් පහත පරිදිය**

i. ඉංජිනේරු එච්.එම්.කේ.ජේ. වීරසූරිය (නි.සාමාන්‍යාධිකාරී- වාණිජ හා ආයතනික/බෙදාහැරීමේ අංශය-02)

ii. ඉංජිනේරු ආර්.කේ.පී.එස් ගුණතිලක (නියෝජ්‍ය සාමාන්‍යධිකාරී-ආයතනික කටයුතු/ජනන)

iii. ඉංජිනේරු පී.වී.ජේ.පී.කේ පෙරේරා (නියෝජ්‍ය සාමාන්‍යධිකාරී - පිරිස්)

iv. ඩබ්.පී.ජී.සී.එස් ජයලත් මෙය (අතිරේක මූල්‍ය කලමනාකර-ආයතනික-වැඩබලන

v. ඉංජිනේරු එම්.අයි.එම්. ඉර්ෂාඩ් (ප්‍රධාන ඉංජිනේරු-ප්‍රතිපත්ති)

vi. පී.ආර්.හඳපාන්ගොඩ මෙය (මානව සම්පත් කළමනාකරණය/නියෝජ්‍ය සාමාන්‍යධිකාරී-පිරිස්)

2021 වර්ෂය තුළදී මෙම කමිටුව දෙවරක් රැස් වී තිබූ අතර ලංවිම සේවකයින්/හිටපු සේවකයින්ගේ දුක් ගැනවිලි 26 ක් සමාලෝචනය කර සලකා බලා ඇත.

කමිටු රැස්වීම් වල සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කර පසුව එකී තීරණ ඒ අනුව ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍යාධිකාරී - ලංවිම පියවර ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම උප කමිටුවේ කැඳවුම්කරු වේ.

## 02. විනය අභියාචනා මණ්ඩලය

විනය අභියාචනා මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවකි. ලංවිම සේවකයන්ගේ විනය කරුණු මෙහෙයවීම සඳහා මෙම කමිටුව ස්ථාපනය කරන ලදී. 2021 වර්ෂයේදී කමිටුව විධිමත්ව අවස්ථා 10 කදී රැස් වූ අතර කාරණා 24ක් මෙහෙයවා තිබුණි.

කමිටු රැස්වීම් වල සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කර පසුව එකී තීරණ ඒ අනුව ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍යාධිකාරී - ලංවිම පියවර ගෙන ඇත.
2021 වර්ෂය සඳහා විනය අභියාචනා මණ්ඩල කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i. එන්.එස්. ඉලංගකෝන් මහතා, උප සභාපති, ලං.වි.ම සභාපති ලෙස

ii. රූබන් වික්‍රමාරච්චි මහතා, සාමාජික ලෙස

iii. එල්.ජී. ප්‍රේමසිරි මහතා, සාමාජික ලෙස (2021 ජනවාරි 11 දින දක්වා)

iv. වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා, සාමාජික ලෙස (2021 ජුනි මස දක්වා)

v. ආචාර්ය බී. විජයරත්න මහතා, සාමාජික ලෙස (2021 සැප්තැම්බර් 28 දින දක්වා)

vi. ජේ.ජී.එල්.එස්. ජයවර්ධන මහතා, සාමාජිකයෙකු ලෙස මණ්ඩලයේ නිරීක්ෂක (2021 සැප්තැම්බර් 28 දින දක්වා)

vii. එල්.කේ.එස්.යු. ධර්මකීර්ති මහතා, සාමාජිකයෙකු ලෙස මණ්ඩලයේ නිරීක්ෂක (2021 සැප්තැම්බර් 28 දින සිට)

viii. පී.එස්. පතිරණ මහතා, අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්, සාමාජික ලෙස

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම උප කමිටුවේ කැඳවුම්කරු වේ.

## 03. නීති කමිටුව

නීති කමිටුව යනු මණ්ඩලයේ උප කමිටුවකි. ලංවිමයේ නීතිමය කරුණු/අවස්ථා පිළිබඳව සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවලදී ඒවා සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් ලබා දීමට මෙම කමිටුව වගකියනු ලැබේ.

2021 මූල්‍ය වර්ෂය තුළදී කමිටුව නිල වශයෙන් දෙවරක් රැස් වී ඇත.

i. එන්.එස්. ඉලංගකෝන් මහතා, උප සභාපති, ලං.වි.ම සභාපති ලෙස

ii. රූබන් වික්‍රමාරච්චි මහතා, සාමාජික ලෙස

iii. එම්.එම්. නයීමුදීන් මහතා, සාමාජික ලෙස

නීති නිලධාරී මෙම උප කමිටුවේ කැඳවුම්කරු වේ.

## 04. විගණන කමිටුව

ආයතනයේ පාලනය හා අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ අභ්‍යන්තර විගණනයේ හා බාහිර විගණනයේ කාර්යයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් ලෙස විගණන කමිටුවට සමස්ථ වගකීමක් ඇත.

තවද, විගණන කමිටුවේ සභාපති හා කමිටු සාමාජිකයන් කිසිවෙකුත් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමේ නීති රීති අංක 7.10.6. (අ) ට අනුකූල වන පරිදි නියමිත ගිණුම්කරණ සුදුසුකම් ලබා නොමැත. ලංවිමයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් සිදු කරනු ලබන්නේ බලශක්ති අමාත්‍යවරයා බැවින් විගණන කමිටුවෙන් සමන්විත මණ්ඩලයේ සාමාජිකයින් සම්බන්ධයෙන් තීරණ ගැනීමට ලංවිමට නම්‍යශීලිභාවයක් නොමැත. ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමේ නීති රීති වලට අනුකූල වන පරිදි අපේක්ෂිත සුදුසුකම් සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක් මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකාවක් (ටී.එච්.පී. බන්දුතිලක මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක) විගණන කමිටුවට පවරන ලද කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමට ලංවිමයෙන් කැඳවුම්කරුවෙකු ලෙස පත්කර ඇත.

විගණන කමිටුව මූල්‍ය, විගණන හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි මනා කුසලතා සහ පුළුල් අත්දැකීම් ඇති ස්වාධීන අධ්‍යක්ෂවරුන් සිව් දෙනෙකුගෙන් සමන්විත වන අතර අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු

# අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව (ඉතිරිය...)

කරයි. ප්‍රධාන විධායක නිලධාරී ලෙස සාමාන්‍යාධිකාරී, මුල්‍ය කළමනාකරු හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශයේ නියෝජිතයෙකු රැස්වීමට ආරාධිතව සහභාගී වෙයි.

2021 වර්ෂය සඳහා විගණන කමිටුවේ සංයුතිය පහත පරිදිය.

එස්.ඩී. ප්‍රදීප් නිලූක්ශාන් මහතා - සභාපති
එම්.එම්. නයීමුදීන් මහතා - සාමාජික
බී. විජේරත්න මහතා - සාමාජික
ආර්. වික්‍රමාරච්චි මහතා - සාමාජික

මෙහෙයුම් හා මුල්‍ය සමාලෝචන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණකාධිපති හා අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා, විගණන කමිටුව විසින් සමාලෝචනය කර සාකච්ඡා කරයි. විගණන කමිටුව මෙම වාර්තා ඔවුන්ගේ පුළුල් අත්දැකීම් සහ විශේෂඥතාව භාවිතා කරමින් සමාලෝචනය කරන අතර පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලනයන් හා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරයි. එමඟින් වංචා හා දෝෂ සිදුවීම් අවම කෙරෙන අතර ආයතනය මුහුණ දෙන මෙහෙයුම් හා මුල්‍ය අවදානම් අවම කෙරේ. රට තුල පැවති වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂය තුල කමිටුව දෙවරක් පමණක් හිල වශයෙන් රැස් වී තිබුණි.

### ලංවිම හි ඉඩම් හා ගොඩනැගිලි

2021.12.31 දිනට ලංවිමයේ ඉඩම් හා ගොඩනැගිලි පිලිබඳ තොරතුරු අංශ අනුව පහත වගුවෙහි දක්වා ඇත.

**2021.12.31 දිනට ඉඩම් තොරතුරු**

| අංශය | ඉඩම් සංඛ්‍යාව | ඉඩමේ ප්‍රමාණය | | | මුළු වටිනාකම (ලංරු) | සටහන් |
|---|---|---|---|---|---|---|
| | | අක්කර | රූඩ් | පර්චස් | | |
| බෙදාහැරීම් අංශය 1 | 206 | 157 | 0 | 31.65 | 7,281,768,325.00 | ඉඩම් 186 ක ප්‍රමාණයක් සහ ඉන් ඉඩම් 160ක් තක්සේරු කිරීම |
| බෙදාහැරීම් අංශය 2 | 398 | 138 | 1 | 35.51 | 4,775,930,709.25 | ඉඩම් 365ක ප්‍රමාණයක් සහ ඉන් ඉඩම් 297ක් තක්සේරු කිරීම |
| බෙදාහැරීම් අංශය 3 | 128 | 66 | 2 | 0.94 | 2,177,543,200.00 | ඉඩම් 127 ක ප්‍රමාණයක් සහ ඉන් ඉඩම් 114ක් තක්සේරු කිරීම |
| බෙදාහැරීම් අංශය 4 | 161 | 66 | 3 | 1.14 | 3,461,751,021.00 | ඉඩම් 153 ක ප්‍රමාණයක් සහ ඉන් ඉඩම් 140ක් තක්සේරු කිරීම |
| ව්‍යාපෘති කළමනාකරණ | 5 | 45 | 2 | 14.55 | 5,366,450,000.00 | ඉඩම් 5 ක ප්‍රමාණයක් සහ ඉඩම් 5 තක්සේරු කිරීම |
| සම්ප්‍රේෂණ | 123 | 409 | 2 | 6.28 | 5,772,362,300.00 | ඉඩම් 117ක ප්‍රමාණයක් සහ ඉන් ඉඩම් 84ක් තක්සේරු කිරීම |
| ජනන | 3086 | 6194 | 0 | 6.19 | 688,700,000.00 | ඉඩම් 2327 ක ප්‍රමාණයක් සහ ඉන් ඉඩම් 8ක් තක්සේරු කිරීම |
| **එකතුව** | **4107** | **7075** | **10** | **96.26** | **29,524,505,555.25** | |

**2021.12.31 දිනට ගොඩනැගිලි තොරතුරු**

| අංශය | ගොඩනැගිලි සංඛ්‍යාව | වර්ග අඩි |
|---|---|---|
| බෙදාහැරීම් අංශය 1 | 271 | 250,955.79 |
| බෙදාහැරීම් අංශය 2 | 415 | 306,086.65 |
| බෙදාහැරීම් අංශය 3 | 216 | 195,907.62 |
| බෙදාහැරීම් අංශය 4 | 168 | 320,393.55 |
| ව්‍යාපෘති කළමනාකරණ | 68 | 21,808.24 |
| සම්ප්‍රේෂණ | 98 | 39,231.39 |
| ජනන | 1044 | 275,618.18 |
| ව්‍යාපෘති | 31 | 9,687.31 |
| ආයතනික ක්‍රමෝපාය | 8 | 7,597.32 |
| **එකතුව** | **2319** | **1,427,286.05** |

### සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 මඟින් අපේක්ෂිත පරිදි සම්බන්ධිත පාර්ශව හෙළිකිරීම්, ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 39 හි විස්තර කර දක්වා ඇත.

### නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

සමූහය නීති හා රෙගුලාසි වලට පටහැනිව කිසිදු කාර්යයක නිරත වී නොමැති බව අධ්‍යක්ෂවරු ඔවුන්ගේ උපරිම දැනුමෙන් හා විශ්වාසයෙන් සනාථ කරයි.

### පවතින නඩු කටයුතු

තවමත් අවසන් නොවූ නඩු කටයුතු හේතුවෙන් පැන නැගී ඇති අසම්භව්‍ය වගකීම, ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 37.1 හි සඳහන් කර ඇත.

# අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව (ඉතිරිය...)

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජය හා සේවකයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවන්හිදීම සිදු කර ඇති බව මණ්ඩලය තහවුරු කරයි.

**ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**

මූල්‍ය වර්ෂය අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාල පරතරය තුල ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් පැන නැගී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

**අඛණ්ඩ පැවැත්ම**

මණ්ඩලයේ සම්පත් එහි මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය වේ. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම අදාළ කරගෙන ඇත.

**වාර්ෂික වාර්තාවේ අන්තර්ගතයට අදාලව කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමේ අවශ්‍යතාවලට අනුකූල වීම**

| ලැයිස්තුගත වීමේ නීති රීති අංක | හෙළිදරව් කිරීමේ අවශ්‍යතා | යොමුව/අදහස් | පිටු අංක |
|---|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කල අයගේ නම් | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 72-74 |
| 7.6 (ii) | ආයතනයේ හා එහි අනුබද්ධිත ආයතන වල ප්‍රධාන කාර්යයන් හා එහි යම් වෙනස්කම් | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 12.1 | 74,118 |
| 7.6 (iii) | වැඩිම ඡන්දබල කොටස් හා නිෂ්ඡන්ද කොටස් හිමි 20 දෙනාගේ නම් හා කොටස් සංඛ්‍යාව සහ එම කොටස් ප්‍රතිශතය | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (iv) | රජය සතු ප්‍රතිශතය | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (v) | එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී කොටස් හිමි ඒ ඒ ආයතන වල අධ්‍යක්ෂ ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශය | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (vi) | ආයතනයෙහි ප්‍රමාණාත්මකව පුරෝකථනය කල හැකි අවදානම් සාධක වලට අදාළ තොරතුරු | අවදානම්කළමනාකරණ වාර්තාව | 51-54 |
| 7.6 (vii) | ආයතනයේ සේවකයින්ට හා කාර්මික සම්බන්ධතා වලට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිලිබඳ තොරතුරු | වර්ෂය තුල ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් සිදු නොවීය | - |
| 7.6 (viii) | ආයතනය සතු ඉඩම් හිමිකම් හා ආයෝජන දේපල වල විශාලත්වය, පිහිටි ස්ථාන, තක්සේරු කිරීම් හා ගොඩනැගිලි සංඛාව | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 77 |
| 7.6 (ix) | ආයතනයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය පෙන්නුම් කරන කොටස් සංඛ්‍යාව | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (x) | එක් එක් ප්‍රාග්ධන සුරැකුම්පත් වර්ග සතු ආයතන සංඛ්‍යාවේ බෙදාහැරීමේ ලේඛනය සහ ඔවුන් සතු මුළු වත්කම් ප්‍රතිශතය | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (xi) | අනුපාත හා වෙළෙඳපොල මිල පිලිබඳ තොරතුරු | | |
| | රාජ්‍ය සුරැකුම්පත්, ණය/ස්කන්ධ අනුපාත, පොළී ආවරණ, ක්ෂණික වත්කම් අනුපාත වල තුලනිය පොළී අනුපාතිකය | මූල්‍ය සමාලෝචනය | 68 |
| | වර්ෂය තුල වෙළෙඳපොල මිල හා ප්‍රතිලාභ (වැඩිම මිල/අඩුම මිල/අවසන් වරට විකුණුම් මිල) | විකිණීම් කර නොමැත | - |
| | ණය ඇගයුමෙහි යම් වෙනස්කම් | ණය ඇගයුමෙහි වෙනස්කම් සිදු වී නොමැත | - |
| 7.6 (xii) | වටිනාකම සැලකිය යුතු ලෙස ගිණුම් පොත් වල සඳහන් අගයට වඩා වෙනස් වන්නේ නම් ආයතනයේ හෝ එහි අනුබද්ධිත ආයතන වල ස්ථාවර වත්කම් සහ ඉඩම් වල වෙළෙඳපොළ මිලෙහි වන සුවිශේෂී වෙනස්කම් | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (xiii) | වර්ෂය තුල මහජන නිකුතු, හිමිකම් නිකුතු සහ පෞද්ගලික නිකුතු හරහා අරමුදල් රැස් කරගෙන ඇත | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 74-75 |
| 7.6 (xiv) | එක් එක් සේවක කොටස් නිකුතු හෝ සේවක කොටස් සැලසුම් වලට අදාළ තොරතුරු . | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.6 (xv) | ලැයිස්තුගත වීමේ නීති හි අංක 7 කොටසෙහි 7.10.3, 7.10.5 (ඇ) සහ 7.10.6 (ඇ) යන නීති ප්‍රකාරව ආයතනික පාලන පිළිවෙත් වලට අදාළ හෙළිදරව් කිරීම් | අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ සහ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 72-77 |
| 7.6 (xvi) | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ප්‍රකාරව ස්කන්ධ ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවූ හෝ ආයතනයේ මුළු වත්කම් වලින් 5% ඉක්මවූ සම්බන්ධිත පාර්ශව සමඟ කෙරෙන ගනුදෙනු වලින් වඩා අඩු අගයක් සහිත ගනුදෙනු | විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 39 | 146-147 |

# ලාභ හෝ අලාභ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | සටහන | 2021 | 2020 ප්‍රතිප්‍රකාශිත | 2021 | 2020 ප්‍රතිප්‍රකාශිත |
| ආදායම | 4 | 291,198,388 | 264,265,952 | 249,089,188 | 238,910,553 |
| ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා සහන | 5 | (195,709) | (5,907,770) | (195,709) | (5,907,770) |
| විකුණුම් පිරිවැය | | (279,421,532) | (286,530,043) | (254,452,760) | (276,938,425) |
| **දළ ලාභය / (අලාභය)** | | **11,581,147** | **(28,171,861)** | **(5,559,281)** | **(43,935,642)** |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | 6 | 18,297,764 | 9,844,016 | 11,692,938 | 8,817,159 |
| බෙදාහැරීමේ පිරිවැය | | (205,209) | (166,221) | - | - |
| වෙනත් වියදම් | | (3,260,481) | (3,164,799) | - | - |
| පරිපාලන වියදම් | | (13,166,794) | (11,565,050) | (8,284,761) | (7,130,803) |
| **මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | **13,246,427** | **(33,223,915)** | **(2,151,104)** | **(42,249,286)** |
| මූල්‍ය ආදායම | 7.1 | 3,286,673 | 2,942,470 | 1,131,378 | 1,337,772 |
| මූල්‍ය පිරිවැය | 7.2 | (22,544,140) | (21,242,401) | (20,430,643) | (19,521,978) |
| මූල්‍ය පිරිවැය-ශුද්ධ | | (19,257,467) | (18,299,931) | (19,299,265) | (18,184,206) |
| බද්ධ ව්‍යාපාරයේ අලාභ කොටස | 13 | (5,080) | (6,143) | - | - |
| **බදු පෙර ලාභය /(අලාභය)** | | **(6,016,120)** | **(51,529,989)** | **(21,450,369)** | **(60,433,492)** |
| ආදායම් බදු වියදම් | 9.1 | (3,190,093) | (2,615,239) | - | (52,970) |
| විලම්භිත බදු (ගාස්තු)/ ප්‍රතිවර්ථන | 9.2 | (46,656) | 211,068 | - | - |
| **අඛණ්ඩ මෙහෙයුම් මගින් වර්ෂය තුල උපයන ලද ලාභය/(අලාභය)** | | **(9,252,869)** | **(53,934,160)** | **(21,450,369)** | **(60,486,462)** |
| **විසර්ජනය** | | | | | |
| **පරිපාලන හිමි අයිතිය** | | **(16,572,106)** | **(58,040,771)** | | |
| **පාලනයට යටත් නොවන හිමිකම්** | | **7,319,237** | **4,106,611** | | |
| | | **(9,252,869)** | **(53,934,160)** | | |

පිටු අංක 86 සිට 150 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 ප්‍රතිප්‍රකාශිත | 2021 | 2020 ප්‍රතිප්‍රකාශිත |
| **අඛණ්ඩ මෙහෙයුම්වලින් වර්ෂය සඳහා ලාභ (අලාභය)** | **(9,252,869)** | **(53,934,160)** | **(21,450,369)** | **(60,486,462)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක අලාභය | (377,986) | (8,877,951) | (504,579) | (8,677,627) |
| අයුගණක ලාභය/(අලාභය) මත විලම්භිත බදු වල බලපෑම | (33,122) | 55,961 | - | - |
| විදේශ පරිපාලිත මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්වීම් | 935,845 | 336,799 | - | - |
| විකුණුම සඳහා ඇති මූල්‍ය වත්කම් මත සාධාරණ අගයෙහි ලාභය | 1,082,877 | 126,398 | - | - |
| විදේශ මුදල් ණය විනිමය පරිවර්තන මත ශුද්ධ ලාභ හා පාඩු | (92,688) | - | - | - |
| **වර්ෂය සඳහා බදු පසු මුළු විස්තීර්ණ ආදායම** | **(7,737,943)** | **(62,292,953)** | **(21,954,948)** | **(69,164,089)** |
| **විසර්ජනය** | | | | |
| පරිපාලන හිමි අයිතිය | (16,174,363) | (66,579,481) | | |
| පාලනයට යටත් නොවන හිමිකම් | 8,436,420 | 4,286,528 | | |
| | **(7,737,943)** | **(62,292,953)** | | |

පිටු අංක 86 සිට 150 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය තත්වය ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සටහන | සමූහය | | | මණ්ඩලය | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2021 | 2020 ප්‍රතිප්‍රකාශිත | ජනවාරි 1 දිනට 2020 ප්‍රතිප්‍රකාශිත | 2021 | 2020 ප්‍රතිප්‍රකාශිත | ජනවාරි 1 දිනට 2020 ප්‍රතිප්‍රකාශිත |
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 10 | 873,253,897 | 838,065,364 | 801,729,433 | 852,877,484 | 819,086,380 | 784,022,232 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරික | | - | - | 235,577 | - | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 513,343 | 512,459 | 499,058 | 133,997 | 161,509 | 107,718 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 12 | - | - | - | 911,813 | 911,813 | 911,813 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 13 | 25,677 | 30,757 | 36,900 | 328,606 | 328,606 | 328,606 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 14 | 20,465,466 | 19,588,944 | 19,899,441 | - | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 15 | 28,054,665 | 24,418,095 | 25,353,078 | 7,700,399 | 8,859,225 | 9,951,461 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 16 | 1,830,583 | 2,160,224 | 2,591,430 | 851,383 | 1,073,891 | 1,489,354 |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 17 | 10,657,598 | 9,980,730 | 8,996,893 | 10,657,598 | 9,980,730 | 8,996,893 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **934,801,229** | **894,756,573** | **859,341,810** | **873,461,280** | **840,402,154** | **805,808,077** |
| විකුණුම් සඳහා ඇති ජංගම නොවන වත්කම් | 18 | 76 | 76 | 76 | 76 | 76 | 76 |
| **ජංගම  වත්කම්** | | | | | | | |
| භාණ්ඩ තොග | 19 | 74,986,599 | 53,412,273 | 56,128,504 | 63,926,113 | 45,522,065 | 48,529,122 |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 20 | 84,380,715 | 74,358,646 | 56,491,746 | 56,340,888 | 59,342,291 | 49,126,626 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ | 21 | - | - | - | 3,612,627 | 5,322,241 | 5,984,849 |
| ලැබිය යුතු උප මූල්‍ය කල්බදු | | - | - | 21,110 | | | |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 14 | 825,121 | 1,015,236 | 910,171 | - | - | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 15 | 29,922,547 | 33,652,650 | 27,080,350 | 2,601,739 | 2,826,654 | 3,485,735 |
| මුදල් හා බැංකු ශේෂ | 32 | 15,309,470 | 9,719,896 | 7,282,167 | 5,439,757 | 3,604,157 | 3,725,333 |
| **මුළු ජංගම වත්කම්** | | **205,424,452** | **172,158,701** | **147,914,048** | **131,921,124** | **116,617,408** | **110,851,665** |
| **මුළු වත්කම්** | | **1,140,225,757** | **1,066,915,350** | **1,007,255,934** | **1,005,382,480** | **957,019,638** | **916,659,818** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා ස්කන්ධය** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 22 | 413,054,569 | 391,730,584 | 323,194,038 | 413,054,569 | 391,730,584 | 323,194,038 |
| සංචිත | 23 | 59,080,519 | 52,807,115 | 50,082,923 | 41,222,600 | 39,253,987 | 37,109,568 |
| රඳවාගත් ඉපැයීම්/(අලාභ) | | (170,433,066) | (148,673,699) | (80,229,218) | (189,474,269) | (166,239,107) | (95,851,304) |
| **මව් සමාගමේ කොටස් හිමියන්ට අදාළ හිමිකම්** | | **301,702,022** | **295,864,000** | **293,047,743** | **264,802,900** | **264,745,464** | **264,452,302** |
| පාලනයට යටත් නොවන හිමිකම | | 39,331,148 | 34,651,585 | 31,655,307 | - | - | - |
| **මුළු ස්කන්ධය** | | **341,033,170** | **330,515,585** | **324,703,050** | **264,802,900** | **264,745,464** | **264,452,302** |
| **ජංගම නොවන වගකීම් හා විලම්භිත ආදායම්** | | | | | | | |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 24 | 372,001,007 | 353,176,565 | 324,004,981 | 353,927,442 | 352,094,501 | 318,149,176 |
| පාරිභෝගික තැන්පතු | 25 | 16,299,865 | 15,640,570 | 15,013,791 | 16,299,865 | 15,640,571 | 15,013,791 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 26 | 23,289,439 | 21,798,853 | 11,788,539 | 21,615,200 | 20,120,600 | 10,482,143 |
| රාජ්‍ය ප්‍රදාන | 27 | 261,134 | 278,934 | 297,697 | 188,347 | 200,334 | 213,303 |
| ගිවිසුම් ගත වගකීම් | 28 | 104,566,765 | 100,694,744 | 94,421,389 | 99,518,157 | 95,770,721 | 89,746,084 |
| විලම්භිත බදු | 29 | 715,268 | 541,753 | 753,562 | - | - | - |
| | | 517,133,478 | 492,131,419 | 446,279,959 | 491,549,011 | 483,826,727 | 433,604,497 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 30 | 220,801,095 | 187,337,415 | 195,261,270 | 197,241,656 | 176,476,320 | 185,930,922 |
| ගෙවිය යුතු ලාභාංශ | | 1,618,534 | 905,038 | 2,303,810 | - | - | - |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල | 31 | - | - | - | 6,214,208 | 4,213,940 | 2,989,787 |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 24 | 55,652,643 | 53,038,697 | 36,492,272 | 44,303,939 | 26,486,421 | 28,411,544 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 3,986,837 | 2,987,196 | 2,215,573 | 1,270,766 | 1,270,766 | 1,270,766 |
| | | 282,059,109 | 244,268,346 | 236,272,925 | 249,030,569 | 208,447,447 | 218,603,019 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | **1,140,225,757** | **1,066,915,350** | **1,007,255,934** | **1,005,382,480** | **957,019,638** | **916,659,818** |

පිටු අංක 86 සිට 150 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

''මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය වගකීම දරයි   මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ''

| | | | |
|---|---|---|---|
| ............................................ | ............................................ | ............................................ | ............................................ |
| සභාපති | උප සභාපති | සාමාන්‍යාධිකාරී | මූල්‍ය කළමණාකරු |

කොළඹ
2022.08.16

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| සමූහය | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ක්ෂය සංචිත |
|---|---|---|---|
| **2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **323,194,038** | **19,197,852** | **24,000** |
| කාල සීමාව තුල සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම් | - | - | - |
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | **323,194,038** | **19,197,852** | **24,000** |
| වර්ෂය සඳහා ලාභය /(අලාභය) | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - |
| හුවමාරු තුල්‍ය සංචිත | - | 103,426 | - |
| **මුළු විස්තීර්ණ ආදායම** | **-** | **103,426** | **-** |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,361,455 | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,175,091 | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - |
| ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලෙන් අතිරේක ස්කන්ධ ආයෝජනය(FPSF) | 48,000,000 | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 |
| පාරිභෝගිකයන්ගෙන් ලද පොළී | - | 36,601 | - |
| ආයෝජන සංචිත | - | - | - |
| සංවර්ධන සංචිත | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - |
| විදුලි පුද්ගලික සමාගම සුළු කොටස් හිමියන් සඳහා පොලි ගැලපීම | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **391,730,584** | **19,337,879** | **25,000** |
| වර්ෂය සඳහා ලාභ/(අලාභ) | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - |
| හුවමාරු තුල්‍ය සංචිත | - | 306,670 | - |
| **මුළු විස්තීර්ණ ආදයම** | **-** | **306,670** | **-** |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,915,014 | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,408,971 | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 |
| පාරිභෝගිකයන්ගෙන් ලද පොළී | - | 24,558 | - |
| ආයෝජන සංචිතය | - | - | - |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | - | - | - |
| සංවර්ධන සංචිත | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **413,054,569** | **19,669,107** | **26,000** |

පිටු අංක 86 සිට 150 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| වත්කම් ප්‍රතිස්ථාපන සංචිත | ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | සාධාරණ අගය සංචිත | සංවර්ධන සංචිත | රඳවාගත් ඉපයීම් | පාලනයට යටත් නොවන කොටස් හිමිකම | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **312,494** | **5,930,351** | **18,540,372** | **6,060,529** | **17,325** | **(88,317,951)** | **31,655,307** | **316,614,317** |
| **-** | **-** | **-** | **-** | **-** | **8,088,733** | **-** | **8,088,733** |
| **312,494** | **5,930,351** | **18,540,372** | **6,060,529** | **17,325** | **(80,229,218)** | **31,655,307** | **324,703,050** |
| - | - | - | - | - | (58,040,771) | 4,106,611 | (53,934,160) |
| - | - | - | - | - | (8,757,641) | (64,349) | (8,821,990) |
| - | - | - | 66,155 | - | - | 60,244 | 126,399 |
| - | - | - | - | - | - | 233,374 | 336,800 |
| **-** | **-** | **-** | **66,155** | **-** | **(66,798,412)** | **4,335,880** | **(62,292,951)** |
| - | - | - | - | - | - | - | 17,361,455 |
| - | - | - | - | - | - | - | 3,175,091 |
| - | - | 884,104 | - | - | - | - | 884,104 |
| - | - | - | - | - | - | - | 48,000,000 |
| - | - | 1,222,714 | - | - | (1,222,714) | - | - |
| - | - | - | - | - | (1,000) | - | - |
| - | - | - | - | - | - | - | 36,601 |
| - | 400,192 | - | - | - | (400,192) | - | - |
| - | - | - | - | 10,000 | (10,000) | - | - |
| - | - | - | - | - | - | 119,925 | 119,925 |
| - | - | - | - | - | (12,163) | (20,096) | (32,259) |
| - | - | - | - | - | - | (1,100,731) | (1,100,731) |
| - | - | - | - | - | - | (338,700) | (338,700) |
| **312,494** | **6,330,543** | **20,647,190** | **6,126,684** | **27,325** | **(148,673,699)** | **34,651,585** | **330,515,585** |
| - | - | - | - | - | (16,572,106) | 7,319,237 | (9,252,869) |
| - | - | - | - | - | (449,693) | 38,586 | (411,107) |
| - | - | - | 540,767 | - | - | 449,422 | 990,189 |
| - | - | - | - | - | - | 629,175 | 935,845 |
| **-** | **-** | **-** | **540,767** | **-** | **(17,021,799)** | **8,436,420** | **(7,737,942)** |
| - | - | - | - | - | - | - | 17,915,014 |
| - | - | - | - | - | - | - | 3,408,971 |
| - | - | 663,841 | - | - | - | - | 663,841 |
| - | - | 1,279,214 | - | - | (1,279,214) | - | - |
| - | - | - | - | - | (1,000) | - | - |
| - | - | - | - | - | - | - | 24,558 |
| - | 3,671,322 | - | - | - | (3,671,322) | - | - |
| (223,968) | - | - | - | - | 223,968 | - | - |
| - | - | - | - | 10,000 | (10,000) | - | - |
| - | - | - | - | - | - | 28,350 | 28,350 |
| - | - | - | - | - | - | (3,285,207) | (3,285,207) |
| - | - | - | - | - | - | (500,000) | (500,000) |
| **88,526** | **10,001,865** | **22,590,245** | **6,667,451** | **37,325** | **(170,433,066)** | **39,331,148** | **341,033,170** |

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| මණ්ඩලය | දායක ප්‍රාග්ධන | අනෙකුත් ප්‍රාග්ධන සංචිත | ආර්.එච්.සී.පී. සංචිත | ණය නිදහස් කිරීමේ සංචිතය | ක්ෂය සංචිතය | ස්වයං රක්ෂණ සංචිතය | රඳවාගත් ඉපයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | **323,194,038** | **165,446** | **948,639** | **17,447,062** | **24,000** | **18,524,421** | **(103,940,037)** | **256,363,569** |
| කාල සීමාව තුල සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම් | - | - | - | - | - | - | 8,088,733 | 8,088,733 |
| **2020 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | **323,194,038** | **165,446** | **948,639** | **17,447,062** | **24,000** | **18,524,421** | **(95,851,304)** | **264,452,302** |
| වර්ෂය සඳහා ලාභ /(අලාභ) | - | - | | - | - | - | (69,164,089) | (69,164,089) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | | - | - | 884,104 | - | 884,104 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,361,455 | | | | | | | 17,361,455 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,175,091 | | | | | | | 3,175,091 |
| ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදලෙන් අතිරේක ස්කන්ධ ආයෝජනය(FPSF) | 48,000,000 | | | | | | | 48,000,000 |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | | | | 1,000 | | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | | - | - | 1,222,714 | (1,222,714) | - |
| පාරිභෝගිකයින්ගෙන් ලද පොලී | - | | 36,601 | - | - | - | - | 36,601 |
| **2020 දෙසැම්බර් මස 31 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | **391,730,584** | **165,446** | **985,240** | **17,447,062** | **25,000** | **20,631,239** | **(166,239,107)** | **264,745,464** |
| වර්ෂය සඳහා ලාභ /(අලාභ) | - | - | | - | - | - | (21,954,948) | (21,954,948) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | | - | - | 663,841 | - | 663,841 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,915,014 | - | | - | - | - | - | 17,915,014 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,408,971 | - | | - | - | - | - | 3,408,971 |
| ක්ෂය සංචිතයට මාරු කිරීම් | - | - | | - | 1,000 | - | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරු කිරීම් | - | - | | - | - | 1,279,214 | (1,279,214) | - |
| පාරිභෝගිකයින්ගෙන් ලද පොලී | - | | 24,558 | - | - | - | - | 24,558 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **413,054,569** | **165,446** | **1,009,798** | **17,447,062** | **26,000** | **22,574,294** | **(189,474,269)** | **264,802,900** |

පිටු අංක 86 සිට 150 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශණය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| **මෙහෙයුම් කටයුතුවල වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභ/(අලාභ) | (6,016,120) | (51,529,989) | (21,450,369) | (60,433,492) |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය-වර්ෂය සඳහා අයවීම | 34,771,183 | 34,469,546 | 33,095,688 | 32,107,297 |
| පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම | (4,487,145) | (3,841,968) | (4,058,249) | (3,440,050) |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම් | (15,068) | (20,511) | (15,068) | (14,718) |
| ආයෝජන අදායම | (1,359,813) | - | - | - |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | 149,507 | (48,658) | 135,046 | (31,285) |
| මූල්‍ය පිරිවැය | 22,661,291 | 21,441,905 | 20,430,643 | 19,705,300 |
| කල්බදු පොලිය | 12,775 | - | 12,775 | 14,332 |
| යල්පැන ගිය භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන | 337,770 | 15,069 | 331,159 | 71,706 |
| මිල විචලනය සඳහා ප්‍රතිපාදන | (2,037,510) | 347,263 | (2,037,510) | 347,263 |
| ණයකරුවන් හානිකරණය වීම සඳහා ප්‍රතිපාදන | 1,649,777 | 1,842,072 | 1,747,552 | 1,343,916 |
| බොල් ණය කපාහැරීම | 345,653 | - | 345,653 | - |
| විද්‍යුත් වාහන ආරෝපණ ආදායම | (2,696) | (2,836) | (2,696) | (2,836) |
| බද්ධ ව්‍යාපාරවල කොටස් ලාභ/(අලාභ) | 5,080 | 6,143 | - | - |
| අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | 60,832 | 46,752 | 48,442 | - |
| මූල්‍ය ආදායම | (2,041,285) | (2,942,471) | (1,131,378) | (1,337,772) |
| ලාභාංශ ආදායම | (6,908,775) | (807,188) | (2,519,496) | (1,129,505) |
| විදේශ මුදල් ලාභ හෝ අලාභ | (1,353,047) | 51,963 | - | - |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු සඳහා අදායම් බැරකම් | 1,600,538 | 1,461,389 | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 1,301,341 | 1,148,638 | 1,067,140 | 1,117,957 |
| විශ්‍රාම වැටුප් අරමුදලේ පිරිවැය | 717,208 | 534,584 | 717,208 | 534,584 |
| කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | 556,360 | 770,928 | 556,360 | 770,928 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | **39,947,856** | **2,942,631** | **27,272,900** | **(10,376,375)** |
| භාණ්ඩ තොග (වැඩිවීම)/අඩුවීම | (20,679,002) | 2,716,231 | (17,579,672) | 3,941,964 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (4,766,748) | (25,898,417) | 9,673,323 | (9,623,794) |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 30,408,639 | (7,894,835) | 18,544,716 | (4,213,535) |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | **44,910,745** | **(28,134,390)** | **37,911,267** | **(20,271,740)** |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (22,661,291) | (21,427,573) | (20,430,643) | (19,705,300) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | (921,523) | (740,303) | (794,325) | (691,714) |
| ගෙවූ ආදායම් බදු | (2,190,520) | (1,886,702) | - | - |
| **මෙහෙයුම් කටයුතු වල (යෙදවූ)/කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **19,137,411** | **(52,188,968)** | **16,686,299** | **(40,668,754)** |
| **ආයෝජන කටයුතු වල (යෙදවූ) /කටයුතු වලින් ජනනය වූ ප්‍රවාහ** | | | | |
| දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (73,357,083) | (71,511,025) | (70,650,630) | (68,699,432) |
| උප සමාගම් ලැබිය යුතු මූල්‍ය කල්බදු අත්පත් කර ගැනීම | - | (68,224) | - | - |
| අස්පෘශ වත්කම් අත්පත් කරගැනීම | (21,088) | (89,732) | (20,930) | (89,732) |
| රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය | (676,868) | (983,837) | (676,868) | (983,837) |
| රක්ෂණ සංචිත අරමුලෙන් ලද පොලී | - | 884,104 | - | - |
| රක්ෂණ සංචිත අරමුදල මත ලද පොලී අදායම | 663,841 | - | 663,841 | 884,104 |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | (140,931) | 12,607,086 | - | - |
| පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම | 51,975 | 96,300 | - | - |
| ලද ලාභාංශ | 6,908,775 | 807,188 | 3,119,790 | 2,204,559 |
| ලද පොලී | 2,746,863 | 1,564,393 | 575,018 | 566,843 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | (131,759) | 36,009 | (135,046) | 31,322 |
| ගෙවූ ලාභාංශ | (2,660,372) | (3,209,977) | - | - |
| **අයෝජන කටයතු වල (යෙදවූ)/කටයතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **(66,616,647)** | **(59,867,715)** | **(67,124,825)** | **(66,086,173)** |
| **මුදල් යෙදවීමේ කටයතු වල (යෙදවූ) /කටයතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | | | |
| දායක ප්‍රාග්ධන ලැබීම් | 3,408,971 | 57,882,718 | 3,408,969 | 57,882,722 |
| පාරිභෝගික දායකත්වය | 10,669,518 | 5,964,166 | 10,669,518 | 5,445,429 |
| විදුලි වාහන සඳහා ඊ-කාර්ඩ් පෙර ගෙවීම් | 2,791 | 2,977 | 2,796 | 2,977 |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම් | 24,558 | 36,601 | 24,558 | 36,601 |
| ප්‍රදාන ලැබීම් | 3,082 | 1,749 | 3,082 | 1,749 |
| පාරිභෝගික තැන්පතු ආපසු ගෙවීම් | (146,050) | (101,908) | (146,050) | (101,908) |
| පාරිභෝගික තැන්පතු ලැබීම් | 805,345 | 728,688 | 805,345 | 728,688 |
| කල්බදු ණයකරු ශුද්ධ සංචරන/(කල්බදු ගෙවීම්) | (172,675) | (101,288) | (64,099) | (64,629) |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් වලින් ලද මුදල් | 75,824,340 | 83,540,078 | 64,829,950 | 63,196,153 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම් | (38,330,162) | (34,068,909) | (28,201,288) | (20,656,692) |
| වරණීය කොටස් නිදහස් කිරීම | (732,087) | (689,475) | - | - |
| **මුදල් යෙදවීමේ කටයතු වල (යෙදවූ)/ කටයතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **51,357,631** | **113,195,397** | **51,332,781** | **106,471,090** |
| **මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **3,878,395** | **1,138,714** | **894,255** | **(283,837)** |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | **(6,916,202)** | **(8,054,916)** | **(9,596,222)** | **(9,312,387)** |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | **(3,037,807)** | **(6,916,202)** | **(8,701,967)** | **(9,596,222)** |

පිටු අංක 86 සිට 150 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

1969 අංකඃ 17දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපිත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය (මණ්ඩලය) සහ එහි සියළුම අනුබද්ධ සමාගම් වලින් සමන්විත වේ.

### 1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

**මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, සළුලදායී බෙදාහැරීම සහ විකිණීමයි.

මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ

#### 1.3.1 පරිපාලිතයන්

**අ) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගැනීම හා එසේ මිලදී ගත් විදුලිය ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුවේ පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහාශ්‍රිත හා කාර්මික පාරිභෝගිකයන්ට සිල්ලරට විකිණීමයි. කණ්ඩායමේ උපපරිපාලිත සමාගම් විදුලි මීටර නිෂ්පාදනය හා වෙළෙඳාම ඇතුළුව විදුලිය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ නිරතව සිටිති.

**ආ) සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම**

වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ සමූහයට අයත් සමාගම්හි ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමට උපායමාර්ගික ආයෝජනයන් සිදු කිරීමයි. මෙම පරිපාලිතයන් විදුලි උත්පාදනය, බලශක්ති උත්පාදනයට අදාළ යටිතල පහසුකම් සැපයීම, තාරාපැවි සහ පෝෂක කුළුණු නිෂ්පාදනය කිරීම සහ ගැල්වනයිස් කිරීමේ කටයුතු වල නිරත වෙති.

**ඇ) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම**

නොරොච්චෝලේ පිහිටි ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා ගෙන්දගම් ප්‍රමාණය අඩු උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීමයි.

**ඈ) සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම**

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ කටයුතු වල නිරතවීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලිබල බලශක්ති උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම, මීටර් පෙට්ටි නිෂ්පාදනය කිරීම සහ මණ්ඩලයේ අවශ්‍යතා සඳහා මිනිස් බල සේවා සැපයීමයි.

සමාගමේ අනුබද්ධ සමාගම් මණ්ඩලයේ සේවාවන් සහ ජල විදුලි උත්පාදනය සඳහා අවශ්‍ය සේවක පිරිස් බඳවා ගැනීම හා සැපයීමෙහි යෙදී සිටී.

#### 1.3.2 බද්ධ ව්‍යාපාරය

**සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම**

ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික පද්ධතියට විදුලිබලය උත්පාදනය කර විකිණීමේ අරමුණ සහිතව සමාගම ස්ථාපිත කරන ලදී. සමාගම මේ වන විට ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා ඇතත් සාම්පූර්හි මෙගාවොට් 50 ක සූර්ය බලශක්ති බලාගාරය පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත.

### 1.4 පරිපාලකය සහ මණ්ඩලයෙහි අවසන් භාරකාරීත්වය

මණ්ඩලය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. අධ්‍යක්ෂකවරුන්ගේ මතය අනුව, ශ්‍රී ලංකා ආණ්ඩුව, ලංකා විදුලිබල මණ්ඩලයේ මවු අස්ථිත්වයත් අවසන් පාලන පාර්ශවයත් වනු ඇත.

### 1.5 නිකුතුව සඳහා බලය පැවරනු ලැබූ දිනය

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2022.08.16 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව අනුමැතිය ලබාදී ඇත.

## 2 පිළියෙල කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ අගය මත ගණනය කරනු ලබන මූල්‍ය වත්කම් වන, ආදායම් ප්‍රකාශණය තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හා විස්තීරණ අදායම තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හැරුණු විට, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණය ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණය ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන අතර වෙනත් අගයන් හැර අනෙක් සියලුම වටිනාකම් ලඟම ඇති දහස දක්වා (රු. 1000) දක්වා වටයා ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ මගින් පෙර කාලයට සාපේක්ෂව සංසන්දනාත්මක තොරතුරු සපයයි. මීට අමතරව, පෙර කාලච්ඡේදයට බලපෑම් ඇති වන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සිදුවන වෙනස් වීමකදී හෝ පෙර කාලච්ඡේදයට බලපෑම් ඇති වන පරිදි මූල්‍ය ප්‍රකාශණවල ගැලපුම් කිරීම අවශ්‍ය වන විට, සමූහය විසින් පූර්ව කාලසීමාව ආරම්භය වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ අතිරේක ප්‍රකාශයක් ඉදිරිපත් කරයි. සටහන 34 හි දක්වා ඇති හේතු නිසා 2022 ජනවාරි 01 දිනට අතිරේක මූල්‍ය ප්‍රකාශයක් මෙම මූල්‍ය ප්‍රකාශණවල ඉදිරිපත් කෙරේ.

## 2.2 අනුකූලතා ප්‍රකාශණය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණය සමන්විත වන ලාභ හෝ අලාභ ප්‍රකාශණය, විස්තීර්ණ අදායම් ප්‍රකාශණය මූල්‍ය තත්ව ප්‍රකාශණය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශණය, මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/ LKAS- වලට අනුකූලවය

## 2.3 අඛණ්ඩ පැවැත්ම

අඛන්ඩ පැවැත්මක් ලෙස සමූහය නොකඩවා පවත්වා ගෙන යෑමේ සමූහයේ හැකියාව ගැන අධ්‍යක්ෂකවරුන් විසින් තක්සේරුවක්කර තිබෙන අතර, පහත සඳහන් කරුණු හැර ඈවර කිරීමට හෝ ව්‍යාපාර කටයුතු නැවැත්වීමට ඔවුහු අදහස් නොකරයි.

### අඛණ්ඩ පැවැත්ම - සීමාසහිත හෙලදනව් සමාගම

සීමාසහිත හෙලදනව් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්සන් කරන ලද 2009 මැයි මස 09 දිනැති බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම 2014 දෙසැම්බර් මස 08 දින ඉකුත් වී තිබුණි. ආයතනයේ දෘෂ්ඨි කෝණය අනුව ගිවිසුම කල් ඉකුත්වීමත් සමග ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑම ගැන සැළකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවයක් තිබේ.

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමේ ආයතනයේ හැකියාව ගැන වාර්තා කරන දිනය වන විට තක්සේරුවක් අධ්‍යක්ෂකවරුන් විසින් කර තිබෙන අතර, ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමට අස්ථිත්වයට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් තිබෙන බව ඔවුහු තීරණය කර තිබේ. එම නිසා හෙලදනව් සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුව කටයුතු කිරීම උචිත නොවේ.

### අඛණ්ඩ පැවැත්ම - ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම

2015 නොවැම්බර් මස 01 දින සිට මෙහෙයුම් නවත්වා සීමාසහිත එල් ටී එල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම වෙත සිය මෙහෙයුම් පැවරීමට අධ්‍යක්ෂකවරුන් තීරණයකර තිබේ. එම නිසා සීමාසහිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට් ඉංජිනියරින් (පුද්ගලික) සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුගමනය කර නොමැත.

### අඛණ්ඩ පැවැත්ම ශ්‍රී ලංකා එනජිස් එච්. ආර් (පුද්ගලික) සමාගම

මෙම සමාගමේ බහුතරයක් වූ මින්ස්බල සේවකයන් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයින් ලෙස පත් කරන ලද අතර එම තීරණයත් සමග මෙම සමාගමේ ආදායම විශාල ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත් වාර්තාකරන දිනය වන විට සමාගම සමඟ කුමක් කිරීමට අදහස් කරන්නේද යන්න පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් කිසිදු තීරණයක් ගෙන නැති අතර ඈවර කිරීමට කිසිදු අදහසක් නොමැති හෙයින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම උදෙසා බලපෑමක් නොමැත්තේය යන පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

## 2.4 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ ඉදිරිපත් කිරීමකට හා වර්තමාන වර්ෂය සමග සැසඳීමට හැකිවන පරිදි පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර ඇත.

## 2.5 ඒකාබද්ධ කිරීමේ පදනම

සමූහයේ සහ එහි පරිපාලිතයන්හි 2021 දෙසැම්බර් මස 31 දිනට අදාළ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට හෝ ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ආයෝජකයා කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව තුළින් ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව යන සාධක මත පාලනය බලය ලබා ගත හැකිය. විශේෂයෙන් සමූහය සතුව පහත දැක්වෙන බලය ඇති විට පමණක් ආයෝජක පාලනය කෙරෙයි.

- ආයෝජක සම්බන්ධයෙන් අයිතියක් තිබේ නම් (එනම්, ආයෝජකගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙය වීමට ප්‍රවර්තන හැකියාව ලැබෙන පවත්නා අයිතීන්)
- ආයෝජක සමග එහි සහභාගිත්වය සඳහා අදාල විචල්‍ය ප්‍රතිලාභ වලට අනාවරනය හෝ අයිතීන් ආවේදනය කිරීම සම්බන්ධයෙන් වන අයිතීන්
- එහි ලාභයන්ට බලපෑම් කිරීම සඳහා ආයෝජක කෙරෙහි සමූහයට ඇති හැකියාව

සාමාන්‍යයෙන් ඡන්දය දීමේ බහුතර අයිතීන් තිබීම මගින් පාලනයක් පවත්වා ගෙන යා හැකි බවට පූර්ව නිගමනයක් පවතී. මෙම පූර්ව නිගමනය තහවුරු කිරීමට සහ ආයෝජකයෙකු සතු ඡන්දය දීමේ හෝ වෙනත් සමාන අයිතිවාසිකම් බහුතරයට වඩා අඩු ප්‍රමාණයක් සමූහයට ඇති විට පහත දක්වා ඇති සියළු සාධක සැලකිල්ලට ගනිමින් අයිතිය පිළිබඳ තක්සේරුවක් සිදුකළ යුතුය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

- වෙනත් ඡන්ද හිමියන් සමග වන ආයෝජකගේ ගිවිසුම් ගත විධිවිධාන
- වෙනත් ගිවිසුම්ගත විධිවිධාන තුලින් පැන නගින අයිතීන්
- සමූහයේ ඡන්ද අයිතීන් හා විභව්‍ය ඡන්ද අයිතීන්

පරිපාලිතයන්ගේ තොරතුරු පහත දැක්වේ.

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට | ආයතනය සතු ප්‍රතිශතය |
|---|---|---|
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | ශ්‍රී ලංකාව | 63% |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) | ශ්‍රී ලංකාව | 55.2% |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) | ශ්‍රී ලංකාව | 60% |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම (SLE) | ශ්‍රී ලංකාව | 100% |
| **බද්ධ ව්‍යාපාරයේ නම** | **සංස්ථාගත කරන ලද රට** | **ආයතනය සතු ප්‍රතිශතය** |
| සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම (TPCL) | ශ්‍රී ලංකාව | 50% |

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ පහත සඳහන් උප පරිපාත සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කර ඇත.

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට |
|---|---|
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගම | සිංගප්පූරුව |
| සීමාසහිත රාජ් ලංකා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත මැකරිගාඩි හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම | නේපාලය |
| සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච් ගියර් (පුද්ගලික) සමාගම | ඉන්දියාව |
| ෆෙනී ලංකා පුද්ගලික සමාගම | බංගලාදේශය |

ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මාස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම යන සමාගම් වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. කෙසේ වුවද එම සමාගම්වල දෙසැම්බර් 31 දිනට අදාල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේ පරමාර්ථය මත විගණක වරුන් විසින් සහතික කර පිලියෙල කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල මුළු ලාභ/අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශණ වල ඇතුළත් කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකරුවන්ට ආරෝපිත ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී, බාහිර කොටස්කරුවන්ට අදාළ ලාභ හෝ අලාභ අනුපාතිකයන් පාලනයට යටත් නොවන හිමිකමයන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වල සියලු වත්කම් හා වගකීම්, මූල්‍ය තත්ත්ව පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශණයට ඇතුළත් කර ඇත. පරිපාලිත සමාගම්වල බාහිර කොටස් හිමියන්ට අදාළ වත්කම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ පාලනයට යටත් නොවන හිමිකම්ශීර්ෂය යටතේ ගලපා ඇත. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනුවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ලාභාංශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ඉවත් කරණු ලැබේ.

පාලනය ගිලිහීයාමෙන් තොරව පරිපාලිතයේ අයිතියෙහි සිදු වන වෙනස් වීමක් ස්කන්ධ ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කරණු ලැබේ. පරිපාලිත සමාගමක පාලනය සමූහයෙන් ගිලිහී ගියහොත්, එය

- පරිපාලිත සමාගමෙහි (කීර්තිනාමය ද ඇතුළු) වත්කම් සහ වගකීම් තවදුරටත් ගිණුම්වල හඳුනා නොගනියි.
- පාලනයට යටත් නොවන හිමිකම් හි ධාරණ අගය ගිණුම්වල හඳුනා නොගනියි.
- ස්කන්ධය තුල වාර්ථා කර ඇත සමුච්චිත පරිවර්තන වෙනස්කම් තවදුටත් ගිණුම්වල හඳුනා නොගනියි.
- ලද ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගය ගිණුම්වල නොගනියි.
- රඳවාගත් ආයෝජනයන්හි සාධාරණ අගය හඳුනා ගනියි.
- ලාභ/අලාභයන්හි අතිරික්ත/ඌණතා හඳුනා ගනියි.
- වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හඳුනා ගෙන ඇති මව් සමාගමේ කොටස් සුදුසු පරිදි ලාභ/අලාභ යටතේ හෝ රඳවාගත් ඉපැයීම් යටතේ නැවත වර්ගීකරණය කිරීම.

පාලනයට අදාල අංග තුනෙන් එකක හෝ වැඩි ගණනක වෙනස්කම් තිබේ දැයි කරුණු හා හේතූන් මගින් පෙන්නුම් කරන්නේ නම්, ආයෝජක පාලනය කරනවා ද නැද්ද යන්න සමූහය විසින් නැවත තක්සේරු කරණු ලබයි. පාලිත සමාගම ඒකාබද්ධ කිරීම ඇරඹෙනුයේ පාලිතය කෙරෙහි සමූහය විසින් පාලනය ලබා ගන්නා විට වන අතර, පාලිත සමාගම කෙරෙහි පාලනය සමූහයට අහිමි වන විට එය නවතී. සමූහය විසින් පාලනය ලබා ගන්නා දිනයේ සිට සමූහය විසින් පාලිත සමාගම පාලනය කිරීම නවතිනතෙක්, වසර තුළදී ලබාගත් හෝ බැහැර කළ පාලිත සමාගමක වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වේ.

පාලනයේ නිරත නොවන පාර්ශවයට ඌන ශේෂයක් තිබුනද, ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සෑම අංගයක්ම ආරෝපණය කරනුයේ සමූහයේ මව් සමාගමේ සම කොටස් දරන්නන් හා පාලනය නොකරන පාර්ශවයන් මතය. ඒකාබද්ධ කිරීමේදී සමූහය සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ නම්, සමූහයේ සාමාජිකයින් අතර

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

ගනුදෙනු වලට අදාළ වත්කම් හා බැරකම්, සමකොටස්, ආදායම්, වියදම් හා මුදල් ප්‍රවාහ ගැන මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය විට ගලපනු ලැබේ. පාලනයේ අහිමිවීමකින් තොරව පරිපාලිත සමාගමේ අයිතිවාසිකම් ලැදියාවේ වෙනසක් ගිනුම් ගත කරනුයේ ස්කන්ධ ගනුදෙනුවක් වශයෙනි.

පාලිත සමාගමක් සම්බන්ධයෙන් පාලනය සමූහය වෙතින් ගිලිහී ගියහොත්, එය විසින් අදාළ වත්කම් (කීර්ති නාමය ඇතුලුව), වගකීම්, පාලනය නොවන ලැදියාවන් හා සමකොටස් වල වෙනත් අංගයන් පිළිගනු ලබන අතර, ලාභයක් හෝ පාඩුවක් වශයෙන් වූ ඕනෑම ප්‍රතිපලයක් ලාභයක් හෝ පාඩුවක් වශයෙන් පිළිගනු ලැබේ. රඳවා ගන්නා යම් ආයෝජනයක් සාධාරණ වටිනාකමක් මත පිළිගනු ලැබේ.

## 2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් සෑම වසරක් සඳහාම මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ වේ

### 2.6.1 ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය

මණ්ඩලය සිය මූල්‍ය තත්වය ප්‍රකාශණයෙහි වත්කම් හා බැරකම් ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව ඉදිරිපත් කරයි. පහත අවස්ථාවන්හීදී වත්කමක් ජංගම වත්කම් ලෙස හඳුනාගනී

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී උපලබ්ධි කිරීමට විකිණීමට, හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන වත්කම්
- වෙළදාම සඳහා තබා ඇති වත්කම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ද්ධි කර ගැනීමට අපේක්ෂා කෙරෙන වත්කම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහකටවත් පසු හුවමාරු කිරීමට හෝ වගකීමක් පියවීමට භාවිතා කිරීමට හෝ අපේක්ෂා නොකරන මුදල් හෝ මුදල් හා සමානදෑ

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත.

පහත අවස්ථාවන්හීදී වගකීමක් ජංගම වගකීමක් ලෙස හඳුනාගනී.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී ගෙවා නිදහස් කිරීමට අපේක්ෂා කරන වගකීම්
- වෙළෙඳාම සඳහා තබා ඇති වගකීම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත ගෙවා නිදහස් කල යුතු වගකීම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් වත් වගකීම් පියවීම කල් දැමීමට හැකියාවක් නොමැති වගකීම්

අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත

විලම්භිත බදු වත්කම් සහ වගකීම් ජංගම නොවන වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත

### 2.6.2 ව්‍යාපාර සංයෝජනය, පාලනය යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම හා කීර්තිනාමය

ව්‍යාපාර සංයෝජනය අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා විටක කලින් පැවති ඕනෑම හිමිකම් අයිතියක් එය ලබා ගත් දින පවතින සාධාරණ අගයෙන් නැවත මනිනු ලබන අතර එයින් ලැබෙන ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ වශයෙන් පිළිගනු ලැබේ

ව්‍යාපාර සංයෝජනයන්, අත්පත් කරගැනීමේ ක්‍රමය මත ගිණුම්ගත කරයි. අත්පත් කරගැනීමේ පිරිවැය, අත්පත් කරගන්න දිනට, සාධාරණ අගය මත ගණනය කරන ලද මාරු කල පිරිවැයත් අත්පත් කරගන්නගේ පාලනයට යටත් නොවන හිමිකමෙහිත් එකතුව වේ. සෑම ව්‍යාපාර සංයෝජනයක් සඳහාම, පාලනය කල නොහැකි හිමිකමේ වටිනාකම සාධාරණ අගයට හෝ අත්පත්කරගන්නා සතු හදුනාගත හැකි වත්කම් වලට සමානුපාතික අගයකට අනුව මැනීමට, සමූහයට තීරණය කල හැකිය. අත්පත් කර ගැනීම්දී දරනු ලබන පිරිවැය පරිපාලන වියදම් යටතට ඇතුළත් කෙරේ.

සමූහය ව්‍යාපාරයක් අත්පත් කර ගත් විට, එය සතු මූල්‍ය වත්කම් හා වගකීම් ගිවිසුමේ කොන්දේසි , ආර්ථික තත්වයන් සහ අත්පත් කර ගත් දිනයේදී අදාළ කොන්දේසි වලට අනුකූලව සකස් කරගන්නා ලද උපකල්පන මත සුදුසු පරිදි වර්ගීකරණය සහ තක්සේරුකිරීම් කරනු ලැබේ.

කීර්තිනාමය, ආරම්භයේදී පිරිවැයට මනිනු ලබන අතර, එය හඳුනා ගතහැකි වත්කම් හා දරන ලද වගකීම් වල ශුද්ධ අගයට වඩා පාලනයට යටත් හිමිකමෙහි හා මාරු කරනලද ප්‍රතිලාභයෙහි එකතුවට වඩා වැඩි වූ වටිනාකමයි. අත්පත් කරගත් ශුද්ධ වත්කම් වල සාධාරණ අගය ගෙවනලද අගයට වඩා වැඩිනම්, එම ලාභය ලාභ අලාභ ප්‍රකාශණයෙහි හඳුනා ගැනේ.

ව්‍යාපාරය අත්කර ගැනීමෙන් ලබාගත් ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකම ගෙවන ලද අගයට වඩා වැඩි නම්, සමූහය විසින් අත්පත් කරගත් සියළුම වත්කම් නිවැරදිව හඳුනාගෙන තිබේ දැයි නැවත තක්සේරු කරනු ලබන අතර වගකීම් භාරගෙන සියළු දේ මැන බැලීම සඳහා භාවිතා

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

කල ක්‍රියාපටිපාටිය නැවත සමාලෝචනය කරයි. නැවත තක්සේරු කිරීම මගින්ද ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකමට මාරු කරන ලද සමස්ථ වටිනාකමට වඩා වැඩිපුර ඇත්නම්, එය ලාභය ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශණය තුළ හඳුනා ගැනේ.

මූලික හඳුනාගැනීමෙන් පසු, කීර්තිනාමය මැනීම සඳහා පිරිවැයෙන් සමුච්චිත හාණිකරන පාඩු අඩුකරනු ලැබේ. හාණිකරන පරීක්ෂාව සිදුකිරීමේදී, අත්පත් කරගත් තැනැත්තාගේ වෙනත් වත්කම් හෝ වගකීම් එම එක් එක් ඒකකයන් සඳහා පවරා නැතත්, ව්‍යාපාර සංයෝජනයක් තුළින් ලබා ගත් කීර්තිනාමය, අත්පත් කර ගත් දිනයේ සිටම, සංයෝජනයේ ප්‍රතිලාභ ඇති සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක සඳහා වෙන් කරනු ලැබේ.

මුදල් උත්පාදන ඒකකයක් සඳහා කීර්තිනාමය වෙන්කර ඇති විටක, එම ඒකකය තුළ ඇති මෙහෙයුම් කොටසක් බැහැර කරනු ලැබුවහොත්, බැහැර කිරීමේ ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී මෙහෙයුම් ඒකකයට අදාළ කීර්තිනාම කොටසද ධාරණ අගයට ඇතුලත් කරනු ලබයි. මෙම තත්වය තුළ බැහැර කළ කීර්තිනාමයේ වටිනාකම මනිනු ලබන්නේ, බැහැර කරන ලද මෙහෙයුමේ අගය හා මුදල් උත්පාදන ඒකකයේ රඳවා ගත ප්‍රමාණයේ වටිනාකමට සාපේක්ෂවය.

### 2.6.3 බද්ධ ව්‍යාපාරවල ආයෝජන

බද්ධ ව්‍යාපාරයක් යනු ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් සම්බන්ධයෙන් බද්ධ පාලන අයිතිවාසිකම් ඇති බද්ධ සංවිධාන වර්ගයකි. බද්ධ පාලනයක් යනු අදාල ක්‍රියාකාරකම් ගැන චලබෙන්නාවූ තීරණ සම්බන්ධයෙන් පාලනය බෙදා හදා ගන්නා පාර්ශවයන් අතර ඒකමතික කැමැත්තක් අවශ්‍ය වන්නාවූ ගිවිසුම්ගත එකගතාවයක් පවතින සංවිධානයක් වේ. සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සාමාගම යනු ලංකා විදුලිබල මණ්ඩලය හා සීමාසහිත NTPC සමාගම අතර වූ බද්ධව පාලනය වන ආයතනයකි. බද්ධ පාලනය පිලිබඳ තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු පර්පාලිත සමාගම් පාලනය කෙරෙහි ගනු ලබන තීරණයට සමානය.

සිය බද්ධ ව්‍යාපාරයේ මණ්ඩලයේ ආයෝජන ගණනය කරනුයේ සමකොටස් ක්‍රමවේදය යොදා ගනිමිනි. සමකොටස් ක්‍රමවේදය යටතේ බද්ධ ව්‍යාපාර ආයෝජන මුලදී හඳුනාගන්නේ පිරිවැය මතය. අත්පත් කර ගැනීමේ දිනයේ සිට පවතින්නා වූ ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්වලින් මණ්ඩලයේ කොටස් වල වෙනස්කම් හඳුනා ගැනීම පිණිස ආයෝජනයේ ධාරණ වටිනාකම ව්‍යාපාරයට අදාළව (carrying amount) ගලපනු ලැබේ. බද්ධ ව්‍යාපාරයට අදාල කීර්ති නාමය ආයෝජනයේ ධාරණ වටිනාකමෙහි අඩංගු අතර අඩු කිරීම සඳහා තනි තනිව පරීක්ෂා නොකරේ. බද්ධ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලවල මණ්ඩලයේ කොටස ආදායම් ප්‍රකාශයේ පිලිඹිබු වේ. ආයෝජකයාගේ වෙනත් විස්තීරණ ආදායම් වෙනස්කම් මණ්ඩලයේ වෙනත් විස්තීරණ ආදායම් කොටස් වශයෙන් ඉදිරිපත් කරේ.

මෙයට අමතරව බද්ධ ව්‍යාපාරයේ සමකොටස් වල ඍජුව හඳුනාගන්න වෙනසක් සිදුව ඇත්නම් සමකොටස් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශයේ වෙනස්වීම්වලට සිය කොටස මණ්ඩලය විසින් අදාල පරිදි හඳුනා ගනී. බද්ධ ව්‍යාපාරය ගැන වූ උනන්දුවේ ප්‍රමාණය කොතෙක්දයත් මණ්ඩලය හා බද්ධ ව්‍යාපාරය අතර වූ ගනුදෙනු වලින් පැන නගින උපලබ්ධි නොවූ ලාභ හා පාඩු ඉවත්කරනු ලැබේ. මණ්ඩලයට අදාල බද්ධ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ කොටස ලාභ හෝ පාඩු ලාභ අලාභ හා සුළු කොටස් හිමියන්ගේ බද්ධ ව්‍යාපාරයට ඇති ලැදියාව නියෝජනය කරමින් ලාභ පාඩු ප්‍රකාශණයේ මුහුණත පෙන්නුම් කරයි.

### 2.6.4 විදේශ විනිමයන් පරිවර්තනය, විදේශ විනිමය ගනුදෙනු සහ ශේෂයන්

#### අ) ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල

සමූහයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබෙන්නේ ආයතනයේ ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මුදල් වශයෙන් සැලකෙන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

#### ආ) ගනුදෙනු හා ශේෂයන්

විදේශ විනිමය ගනුදෙනු ආරම්භක අවස්ථාවේදී ගනුදෙනු සිදුවන දිනයන්හි බල පවත්නා විනිමය අනුපාත යොදා ගනිමින් ව්‍යවහාරික මුදලින් වාර්තා කරයි. විදේශ මුදල් වල සඳහන් මුදල් වත්කම් හා බැරකම් වාර්තා කරන දිනයේදී පවතින ස්ථානීය අනුපාතයට අනුව නැවත ව්‍යවහාර මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් ලාභ හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය වෙත ගෙන යනු ලැබේ.

ඓතිහාසික පිරිවැය අනුව විදේශ මුදල් වලින් මනිනු ලබන මුදල් නොවන අයිතමයන් මුල් ගනුදෙනු සිදු වූ දිනයේ පැවති විනිමය අනුපාත උපයෝගී කරගනිමින් පරිවර්තනය කෙරේ. මුදල් නොවන අයිතමයන්හි පරිවර්තනයෙන් මතුවන ලාභය හෝ අලාභය පරිවර්තන වෙනස ඇති කිරීමට හේතු වූ අයිතමයේ ලාභය හෝ අලාභය සමඟ පිළිගැනේ. (වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභ ප්‍රකාශය තුළින් ලාභ හෝ පාඩු පිළිගත් අයිතමයන්හි පරිවර්තවන වෙනස්කම්) නැතහොත් පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභයෙන් හෝ අලාභය තුළින් ද පාඩු පිළිගැනේ).

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වගන්තියේ 06 වන උපවගන්තිය යටතේ විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රාග්ධනය හා ණය මත පොලිය සම්බන්ධයෙන් විනිමය උච්චාවචන වලින් ඇති වන ලාභ හෝ පාඩු ලංකා විදුලිබල මණ්ඩලය ගිණුම් ගත නොකෙරෙනුයේ ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

බැවිනි. ආපසු ගෙවිය යුතු නොපියවූ ණය තක්සේරු කරනුයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ පැවති එකඟ වූ විනිමය අනුපාතය මතය.

**ඇ) විදේශ මෙහෙයුම්**

විදේශ මෙහෙයුම් ලෙස සැලකෙන විදේශයන්හී ක්‍රියාත්මක පරිපාලිත සමාගම් සහ හවුල් ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය සහ ආදායම් ප්‍රකාශය වාර්තා කරන දිනට අදාළ විනිමය අනුපාතය සහ වාර්ෂික හුවමාරු අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

පරිවර්තනය තුලින් මතුවන හුවමාරු වෙනස්කම් සෘජුවම වෙනත් විස්තීර්ණ ආදායමට හදුනාගනු ලැබේ. විදේශීය ආයතනයක් බැහැර කිරීමේදී එම විදේශීය මෙහෙයුමට අදාළව අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හදුනාගෙන ඇති සමුච්චිත අගය ආදායම් ප්‍රකාශනයට හදුනාගනු ලැබේ.

**2.6.5 බදුකරණය**

අදාළ කාලසීමාව සඳහා බදු වියදම්, ප්‍රවර්තන බදු සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනා ගත් ආදායම් හෝ වියදම් අයිතමයකට අරෝපණය කළ හැකි වෙනසක් වෙනත් විස්තීර්ණ ආදායම් වල ද සෘජුව හඳුනා ගනු ලබන අතර අනෙකුත් බදු ලාභ අලාභ ප්‍රකාශණයට හදුනාගනී

**අ) ප්‍රවර්තන බදු**

පවත්නා හා පෙර කාලසීමාවන් සඳහා වූ ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා බැරකම් මිනිනුයේ දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් ගෙන් ලැබිමට හෝ ඔහු වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මතය. මුදල් ප්‍රමාණය ගණන් බැලීමට යොදා ගන්නා බදු අනුපාතය හා බදු නීතිය වනුයේ සමාගම ක්‍රියාත්මක හා බදු වලට යටත් ආදායම් ජනනය කරනු ලබන රටේ පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ ප්‍රමාණවත් ලෙස පන වන ලද ඒවාය. හිමිකම් වලදී සෘජුව හඳුනා ගත් අයිතම වලට අදාළ ප්‍රවර්තන ආදායම් බදුහිමිකම් හඳුනා ගන්නේ හිමිකම් වලදීමිස ආදායම් ප්‍රකාශය තුළ නොවේ.

අදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ 2018 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක 2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන එහි සංශෝධන අනුව බදුකරණය සඳහා ගැලපීම් කරනලද ගිණුම්කරණ ලාභය මතය.

**ආ) විලම්භිත බදුකරණය**

වත්කම් හා බැරකම් වල බදු පදනම් අතර පැනනගින තාවකාලික වෙනස් වීම් හා මූල්‍ය වාර්තා වල ඔවුන්ගේ ධාරණ වටිනාකම් මත බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත.

ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක හෝ බැරකමක මුල් හඳුනා ගැනීමකදී විලම්බීත ආදායම් බදු වගකීම් හට ගන්නා අවස්ථාවක ද ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදු වන අවස්ථාවකදී ද හැර ගිණුම්කරණ ලාභය හෝ බදු වලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් විලම්බිත ආදායම් බදු බැරකම් පැන නැගීමේදී හැර බදුවලට යටත් සියලුම තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලැබිම සහ ගනුදෙනු කරන ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කල හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

අඩු කළහැකි සියලුම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන යන භාවිතයට නොගත් බදු වත්කම් හා භාවිතයට නොගත් බදුපාඩු සඳහා බදුවලට යටත් ලාභ තිබීමේ හැකියාවක් පවතින තාක් විලම්බීත ආදායම් බදු වත්කම් පිළිගනු ලැබේ. මෙයින් අඩු කළහැකි තාවකාලික වෙනස්කම් හා භාවිතයට නොගත් බදු බැර හා භාවිතයට නොගත් බදු පාඩුවල ඉදිරියට ගෙනයෑම් උපයෝගී කර ගත හැකි වනුයේ එය ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවකදී ගනුදෙනු කාලය තුළදී හා එම ගනුදෙනු කාලය තුලදී ගිණුම්කරණ ලාභය හෝ බදුවලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් නොකළ යුතු ගනුදෙනුවකදී වත්කමක හෝ බැරකමක මූලික පිළිගැනීම තුළින් පැන නගින අඩු කළහැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්බිත ආදායම් බදු වත්කමිය.

විලම්බිත බදු වත්කම්වල ඉදිරියට ගෙන යන ප්‍රමාණයන් වාර්තා කරණ සෑම දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර විලම්බිත ආදායම් බදු වත්කම මුලුමනින්ම හෝ අඩක් වශයෙන් යොදා ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු වලට යටත් ලාභයක් තිබේ දැයි තවදුරටත් හැකි නොවනතාක් ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල, ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ආයෝජන තුළින් ඇති වන තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් සලකා බැලීමේදී ප්‍රත්‍යාවර්ති නියම කිරීම් හැර අනෙකුත් තාවකාලික වෙනස්කම් පාලනය කළ හැකි අතර එම තාවකාලික වෙනස්වීම් නුදුරු අනාගතයේදී ප්‍රත්‍යාවර්තනය නොවනු ඇත.

වාර්තා කරනු ලබන සෑම දිනයකදීම හඳුනානොගත් විලම්බිත ආදායම් බදු වත්කම් නැවත ඇගයන අතර අනාගත බදුවලින් විලම්බිත ආදායම් බදුවත්කම් ආපසු ලබා ගැනීමට යටත් ලාභ වලින් ඉඩ ලැබෙන බව හඳුනා ගැනෙයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාර වල ලැදියාවන්ට සම්බන්ධ අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගැනෙන්නේ නුදුරු අනාගතයේදී තාවකාලික වෙනස්වීම් ආපසු හැරීමේ හා තාවකාලික වෙනස්කම් යොදා ගත හැකි බදුයටතේ ලාභයක් ලැබීමේ හැකියාවක් තිබෙනතාක් පමණි

විලම්බිත ආදායම් බදු වත්කම් හා බැරකම් මහිනුයේ වත්කම උපලබ්ධි වන හෝ බැරකම නිරවුල් කරණු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතයන් (හා බදුනීති) පදනම් වූ බදු අනුපාත මතය. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ස්කන්ධ ප්‍රාග්ධනයට සෘජුව පිළිගන්නා ලද අයිතම වලට පාදක ගනුදෙනුවට සහ සම්බන්ධව අදාළ විලම්බිත බදු පිළිගනු ලැබේ. ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදුබැරකම් වලට හිලව් කිරීමට නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් හා විලම්බිත බදු අදාළ වන්නේ බදුවලට යටත් එම ආයතනයට හා එම බදුකරණ බලධාරියාටම නම් විලම්බිත බදුවත්කම් හා විලම්බිත බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් වල ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කෙරෙන අතර, විලම්භිත බදු වත්කම් වලින් කොටසක් හෝ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට නොහැකි වන තරමට අඩු කෙරේ.

හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් වාර්තාකරන සෑම දිනකම නැවත තක්සේරු කෙරෙන අතර අනාගත බදු අය කළ හැකි ලාභ මඟින් විලම්භිත බදු වත්කම් ආපසු ලබා ගැනීමට ඉඩ සැලසෙන තරමට පිළිගැනේ.

වත්කම් උපලබ්ද්ධි වීම තහවුරු වූ විට හෝ වගකීම පියවන අවස්ථාව පැමිණි විට වාර්තාකරණ දිනය වන විට බලාත්මක කර ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත (සහ බදු නීති) මත පදනම්ව විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලැබේ.

ලාභ හෝ අලාභ ප්‍රශයෙන් පිටත හදුනාගත් අයිතමයන්ට අදාළ විලම්භිත බදු ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළින් පිළිගනු නොලැබේ. එවැනි අයිතමයන්ට අදාල විලම්භිත බදු විස්තීරණ ආදායම් ප්‍රකාශණයට හෝ සෘජුවම ස්කන්ධයට හදුනාගනු ලැබේ.

ප්‍රවර්ථන බදු වගකීම් වලට එරෙහිව ප්‍රවර්ථන බදු වත්කම් අහෝසි කිරීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් සහ විලම්භිත බදු එකම බදු ගෙවිය යුතු ආයතනයට සහ එකම බදු අධිකාරියට අදාළව පවතී නම් විලම්භිත වත්කම් වලට එදිරිව විලම්භිත වගකීම් පියවනු ඇත.

### ලාභාංශ ආදායම මත බදු

ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී පරිපාලිත සමාගම් වලින් ලාභාංශ ආදායම සඳහා වන බද්ද වියදමක් ලෙස හදුනාගනු ලැබේ.

### විකුණුම් බද්ද

පහත දෑ හරුණු විට ආදායම්, වියදම් සහ වත්කම් විකිණුම් බදු වලින් පසු හදුනා ගෙන ඇත

- වත්කමක් හෝ සේවාවක් මිලට ගැනීමේදී ගෙවිය යුතු විකුණුම් බද්ද බදු අධිකාරියෙන් අය කර ගත නොහැකි නම්, වත්කම් හෝ වියදම් අයිතමය අත්පත් කර ගැනීමේ පිරිවැයෙහි කොටසක් ලෙස විකුණුම් බද්ද පිළිගනු ලැබේ. හා
- ඇතුළත් කළ විකුණුම් බද්ද සමඟ ලැබිය යුතු හා ගෙවිය යුතු දේ සඳහන් කළ විට. බදු අධිකාරියෙන් අය කර ගත හැකි හෝ ගෙවිය යුතු විකුණුම් බද්දේ ශුද්ධ මුදල මුල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ලැබිය යුතු හෝ ගෙවිය යුතු කොටසක් ලෙස ඇතුළත් කර ඇත.

### 2.6.6 භාණ්ඩ තොග

යල්පැන ඇති හා මන්දගාමී චලනය වන අයිතම සඳහා වෙන් කිරීමෙන් පසු තොග තක්සේරු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මතය. ශුද්ධ උපලබ්ධි වටිනාකම අවසන් කිරීමේ හා විකිණීම කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තු කළ පිරිවැය අඩු කළ පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකිණිය හැකි මිල ගණන්ය. භාණ්ඩ දැනට ඇති ස්ථානයට ගෙන ඒමට හා වත්මන් තත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය පහත දැක්වෙන පරිදි ගනණය කෙරේ.

### ලංකා විදුලිබල මණ්ඩලය

වැඩි වශයෙන් පාවිච්චියට ගන්නා හා වාර්ෂික මිල ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ තක්සේරු කරනුයේ බෙදාහැරීම් අංශවල සම්මත මිල අනුව වන අතර පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් ඒවා (ජනන හා සම්ප්‍රේෂණ අංශවල) ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කෙරෙන ක්‍රමය මතය. කෙසේ වුවද සම්මත මිල අනුව තක්සේරුකර තිබෙන භාණ්ඩ වල උපලබ්ධි ලාභය මගින් දක්වා ඇති පිරිවැය පහත හෙළීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය විසින් සලසා ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | |
|---|---|
| **සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික ) සමාගම** | |
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | - බර තබන ලද සාමාන්‍යය පදනමින් සත්‍ය පිරිවැය මත |
| මාර්ගස්ථ තොග හා වෙනත් තොග | - සත්‍ය පිරිවැය මත |
| අමු ද්‍රව්‍ය | - බර තැබූ මිළ ක්‍රමය මත සත්‍ය පිරිවැය |
| නිමි භාන්ඩ සහ කෙරීගෙන යන වැඩ | - සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය ද, භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ සමාන්‍ය ක්‍රියාකාරී ධාරිතාව මත පදනම්ව සමානුපාතිකව අවශෝෂණය කරනලද ස්ථාවර හා විචල්‍ය පොදුකාර්ය පිරිවැය ද මත |
| **සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම** | |
| අමුද්‍රව්‍ය තක්සේරු කරනු ලබන්නේ | - ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට |
| නිමිභාණ්ඩ හා නිමකෙරෙමින් ඇති භාණ්ඩ | - සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය දල සුදුසු අනුපාතයකට අවශෝෂණය කරනලද ස්ථාවර පොදුකාර්ය පිරිවැය ද මත |
| පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස | - ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට |
| මාර්ගස්ථ තොග | - සත්‍ය පිරිවැය මත |

## 2.6.7 දේපල, පිරියත හා උපකරණ

### අ) හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත සහ උපකරණ ගිණුම් සඳහා හඳුනාගනු ලබන්නේ වත්කමට ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් හා වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණි.

### ආ) මිනුම් කිරීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් වූයේ නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැය වටිනාකමටය. දේපල, පිරියත හා උපකරණ වල උපාංග කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය හා පිළිගැනීමේ නිර්නායක සපුරා තිබේ නම් දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළ ණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් ය. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන විට ප්‍රතිස්ථාපිත වූ කොටසේ ශුද්ධ පොත් වටිනාකම සමූහය විසින් හඳුනා නොගන්නා අතර එයට අදාළ ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය වීම් සහිත වන කොටස පමණක් හඳුනා ගැනේ. එලෙසම ප්‍රධාන පරීක්ෂණයක් ඉටු කළ විට පිළිගැනීමේ නිර්නායක සපුරාලන්නේ නම් එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් සියළුම නඩත්තු සහ අළුත්වැඩියා වියදම් ලාභ/අලාභ ප්‍රකාශණය තුල හදුනාගැනේ.

දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය නැවත අයකර ගත නොහැකි බව පෙන්නුම් කරන සිද්ධීන් හෝ තත්වයන් ඇතිවන විට ඒ සඳහා හාණිකරන පරීක්ෂාවන් සිදුකරනු ලැබේ.

### ඇ) දැනට සිදුකෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

වාර්තා කරන දිනට අවසන් කර නොමැති ස්ථාවර වත්කම් හා සම්බන්ධව සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් ලෙස පෙන්නුම් කෙරෙන අතර එය පිරිවැය අනුව දක්වා ඇත. මෙම කාර්යයන් අවසන් වූ පසු අදාළ වත්කම් දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කෙරේ.

### ඈ) හඳුනා ගත් වත්කම් පොත් වලින් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු විය නොහැකි අවස්ථාවක දී හෝ බැහැර කිරීමකදී පොත් වලින් ලියා හැරීම සිදු කෙරේ. වත්කම් පොත් වලින් ලියා හැරීමේදී මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (වත්කම ඉවත්කිරීමේ ශුද්ධ අගය සහ වත්කමේ ධාරන අගය අතර වෙනස මෙම ලාභය හෝ අලාභය ලෙස ගණනය කෙරේ) අදාල වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් වේ.

### ඉ) ක්ෂය

සින්නක්කර ඉඩම් හැර සෙසු දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත සරල රේඛීය ක්‍රමයක් උපයෝගී කරගනිමින් ගණනය කර එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තුල ඒවායේ වටිනාකම් ලියා හැරීම ක්ෂය වීම් වේ. 2.6.7 යටතේ විස්තර කර ඇති පරිදි වත්කම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විට හෝ වත්කම පොත් වලින් ඉවත් කිරීමට තීරණය කර ඇතිවිට යන සිදුවීම් දෙකෙන් පෙරඅතිවන සිදුවීම් දින සිට වත්කම් සඳහා ක්ෂය කිරීම නතර වේ.

වත්කම් වල සඵල ආයුකාල ඇස්තමේන්තු කරනුයේ පහත දැක්වෙන අයුරිනි:

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

**ලංකා විදුලිබල මණ්ඩලය**

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි හා බදුඉඩම් හා ගොඩනැගිලි | වසර 40 |

**සිවිල්වැඩ:**

| | |
|---|---|
| වාන් දොරටු හා වේලි | වසර 100 |
| වානේ ජලනල හා කොටු දොර | වසර 40 |
| උප පොල හා ස්විච්චි අංගනය | වසර 35 |

**උත්පාදන යන්ත්‍ර:**

| | |
|---|---|
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ජලවිදුලි) | වසර 35 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (තාප) | වසර 25 |
| පිරියත ඇතුලු විදුල බලාගාර (ඩීසල්) | වසර 15 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ගෑස් ටර්බයින්) | වසර 12 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ගල් අඟුරු) | වසර 30 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (සුළං) | වසර 15 |
| සම්ප්‍රේෂණ මාර්ග කිවො 220, කිවො 132, කිවො 66 | වසර 35 |

**බෙදා හැරීමේ මාර්ග**

| | |
|---|---|
| අධි සැර යටිබහන් - කි.වො. 33 | වසර 50 |
| අධි සැර යටිබහන් - කි.වො. 132 | වසර 50 |
| අධි සැර යටිබහන් - කි.වො. 11 | වසර 40 |
| අධි සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර භූගත | වසර 40 |
| අඩු සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර පෝෂණ කණුව | වසර 35 |

| | |
|---|---|
| පාරිභෝගික උප පොල | වසර 35 |
| අධිසැර ස්විච්චිපන්න | වසර 35 |
| ප්‍රාථමික හා ජාලක උප පොල | වසර 35 |
| සේවා නඩත්තු - පොදු කාර්යන් | වසර 35 |
| සේවා නඩත්තු භූගත | වසර 40 |
| SCADA(මධ්‍යම පහසුකම්) හා සන්නිවේදන උපකරණ | වසර 15 |
| මෝටර් වාහන - මගී ප්‍රවාහනය - වීල් දෙක හෝ තුන - | වසර 15 |
| මෝටර් වාහන - මගී ප්‍රවාහනය - වෙනත් - | වසර 14 |
| බර වාහන - | වසර 20 |
| මෝටර් බෝට්ටු | වසර 07 |
| යන්ත්‍ර හා මෙවලම් | වසර 05 |
| කාර්යාලීය උපකරණ | වසර 05-15 |
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| සූර්යපැනල | වසර 10-25 |

- සටහන: මෝටර් රථවල ආයු කාලය 2021 දී සංශෝධනය කර ඇත. 2021 වසරට පෙර සියලුම මෝටර් රථවල ආයු කාලය වසර 07ක් ලෙස සැලකේ.

**සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්)සමාගම**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 25-50 අධික |
| පිරියත හා යන්ත්‍ර | වසර 8-20 අධික |
| බලාගාරය | වසර 10-20 අධික |
| කම්හල් උපකරණ | වසර 10 අධික |
| විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ | වසර 10 අධික |
| ගිනිනිවීමේ උපකරණ | වසර 10 අධික |
| කාර්යාලීය උපකරණ | වසර 03-10 අධික |
| ලීබඩු හා සවිකිරීම් | වසර 03-10 අධික |
| මෝටර් වාහන | වසර 4 අධික |
| මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් | තත්‍ය භාවිතය |
| සූර්ය බල පීවී බලාගාර | වසර 15 අධික |

**සීමා සහිත ලංකාවිදුලි (පුද්) සමාගම**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| යටිතල පහසුකම් සැපයීම | |
| පලාත් පාලන ආයතන හා ලංවිම වෙතින් භාරගත් උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 10 |
| ලෙකෝ සමාගමෙන් ඉදි කළ උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 20 - 25 |
| මොටර් වාහන | වසර 5 - 7 |
| පරිඝණක | වසර 3 - 5 |
| කාර්යාල උපකරණ | වසර 3 - 7 |
| පිරියත හා යන්ත්‍ර | වසර 3-4 |

**සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්) සමාගම**

| | |
|---|---|
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| උපකරණ | වසර 04 |
| මොටර් වාහන | වසර 04 |
| පරිඝණක | වසර 04 |
| කල්බදු වැඩි දියුණු කිරීම | වසර 02 |
| ජාල පද්ධති | වසර 02 |

**ශ්‍රී ලංකා එනජීස් (පුද්) සමාගම**

| | |
|---|---|
| පිරියත හා යන්ත්‍ර | වසර 5 |
| ලී බඩු උපකරණ හා මෙවලම් | වසර 3 |
| මොටර් වාහන | වසර 5 |

**සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම**

| | |
|---|---|
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| උපකරණ | වසර 05 |
| ලැප්ටොප් හා පරිඝණක | වසර 03 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

අවසන් වරට වාර්තා කිරීමේ දිනයේ සිට වත්කම් වල වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාලය හා ක්ෂය වීමේ ක්‍රමවල සැලකිය යුතු වෙනසක් සිදු වන බවට ඉඟියක් තිබේ නම් ඒවා නැවත සමාලෝචනය කර, සුදුසු නම්, ගැලපෙන පරිදි සකස් කරනු ලැබේ

ඊ) ණය ගැනීම් පිරිවැය

අරමුදල් ණයට ගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන පොලිය හා වෙනත් පිරිවැය වලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ. ඒවා යේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීමට සූදානම් වීම පිණිස අවශ්‍යවම සැලකිය යුතු කාල සීමාවක් ගත වෙන යෝග්‍ය වන වත්කම් අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණය කළ හැකි පොදු හා නිශ්චිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් සාරානුකූලව ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීම පිණිස සාරානුකූලව සූදානම් කෙරෙන තුරු එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ. අනෙකුත් ණය ගැනීමේ සියලුම පිරිවැය, වියදම් දරන ලද කාලසීමාව තුළ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

සුදුසුකම් ලත් වත්කම් සඳහා ලබාගත් ණය එම වත්කම් සඳහා වැයවන තෙක් තාවකාලිකව ආයෝජනය කිරීමෙන් උපයනු ලබන ආදායම ප්‍රාග්ධනිත කිරීමට සුදුසුකම් ඇති පිරිවැයෙන් අඩුකර දක්වයි.

### 2.6.8 විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම්

වාර්තා ගත වටිනාකම, අඛණ්ඩව භාවිතා කිරීමට වඩා මූලික වශයෙන්ම, විකිණීම මගින් අයකර ගනී නම්, සමූහය විසින් ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරයි. අපහරණය සඳහා වර්ගීකරණය කර ඇති එකී ජංගම නොවන වත්කම්, ඒවායේ පොත්වල අගය හා සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩු කල පසු අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරේ. මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු වියදම් හැර වත්කමක් ඉවත් කිරීම සඳහා සෘජුවම දැරිය යුතු වර්ධක පිරිවැය විකිණීමේ පිරිවැය වේ.

කළමනාකරණය (අධ්‍යක්ෂක මණ්ඩලය) විසින් ප්‍රධානය කරනු ලබන අනුමැතිය මත ඉහල විකුණුම් සම්භාවිතයක් ඇති යන නිර්ණායක මත සහ වත්කම එහි වර්තමාන තත්වය තුළ වහාම විකිණීමට හැකිය යන නිර්දේශය මත විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීම සම්පූර්ණ කිරීමට ගන්නා ක්‍රියාමාර්ග වලින්, විකිණීමේදී සැලකිය යුතු වෙනස්කම් සිදුකිරීමක් හෝ විකිණීමේ තීරණය ඉවත් කර ගැනීමක් නොහැකි වීම දැක්වේ. වත්කම් විකිණීමේ සැලැස්මට කළමනාකාරීත්වය කැපවිය යුතු අතර වර්ගීකරණය කළ දින සිට මාස හයක් ඇතුළත විකිණීම අවසන් කිරීමට අපේක්ෂා කළ යුතුය.

විකිණීම සඳහා වර්ගීකරණය කිරීමෙන් පසු දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන අත්හිටුවයි.

විකිණීම සඳහා වර්ගීකරණය කල වත්කම් සහ වගකීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශණයේ ජංගම අයිතිමයන් වශයෙන් වෙනමම දක්වනු ලැබේ.

#### බැහැර කිරීම

මණ්ඩල තීන්දුවෙන්, "විකිණීමට තිබෙන වත්කම්" ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මාස හයක් ඇතුළත විකිණීමට අපොහොසත් වුවහොත්, නැවත එම වත්කම් දේපල පිරියත සහ උපකරණ (PPE) යටතේ වර්ගීකරණය කලයුතු අතර නවතා ඇති ක්ෂය ගැලපීම් කාලානුරූපව නැවත අයකල යුතුය.

### 2.6.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් වටිනාකම අඩු වන බවට වාර්තාකරණ සෑම දිනයකදීම එසේ වන බවට යම් සංඥාවක් තිබේදැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් සංඥාවක් තිබේ නම්, එම වත්කම හෝ මුදල් ජනන ඒකකය සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදුකරනු ලබයි. වත්කමේ ධාරණ අගයට වඩා නැවත අයකර ගත හැකි අගය අඩුවන ප්‍රමාණයෙන් හානිකරන අලාභ හඳුනාගනු ලබයි. නැවත අයකර ගත හැකි අගය යනු වත්කම විකිණීමට යන පිරිවැය හා පාවිච්චියේදී එහි අගය අඩු කර වත්කමක් හෝ මුදල් ජනනය කරණ ඒකකයක් යන දෙකෙන් වැඩි වටිනාකමක් ඇති සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩු කළ විට ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකෙන් වඩා වැඩි අගයටය. ප්‍රයෝජන අගය තක්සේරු කිරීම පිණිස, මුදල් වල කාලීන අගයේ වර්තමාන වෙළෙඳපල තක්සේරුව හා වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු අයකර ගැනීමට පෙර වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්, ඒවායේ වර්තමාන අගය දක්වා වට්ටම් කරණු ලැබේ.

හාණිකර අලාභ තක්සේරු කිරීමේ අරමුණින් සමස්ථ මණ්ඩලය වෙනම මුදල් උත්පාදන ඒකකයක් ලෙස සැලකේ.

අඛණ්ඩ මෙහෙයුම් වල හාණිකර අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී හඳුනා ගැනේ.

පෙර හඳුනාගත් හාණිකරන අලාභය ආපසු හැරවිය හැක්කේ අවසන් වරට හඳුනාගත් හාණිකරන අලාභය හඳුනා ගත් දා සිට ආපසු අයකර ගත හැකි වත්කම් නිශ්චය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වල වෙනසක් සිදුවී ඇත්නම් පමණි. එය එසේ නම් වත්කම් වල ධාරණ අගය ආපසු අයකර ගත හැකි ප්‍රමාණය දක්වා වැඩි කෙරේ. එම වැඩි කළ මුදල කලින් වසර වල වත්කම් සඳහා වූ අඩුපාඩු හඳුනා නොගත්තේ නම්

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

අවප්‍රමාණය වීමේ ශුද්ධ අගය තීරණය කරන ලද ධාරණ අගයට වඩා වැඩි විය නොහැක. ලාභ හෝ පාඩු ප්‍රකාශ තුළ එවැනි ආපසු හැරවීමක් පිළිගැනේ.

### 2.6.10 කල්බදු

කොන්ත්‍රාත්තුවක් අරම්භයේදී, මණ්ඩලය විසින්, එම කොන්ත්‍රාත්තුව හෝ එම කොන්ත්‍රාත්තුව තුල, කල්බදු ගිවිසුමක් තිබේ ද යන්න තක්සේරු කරයි. මූල්‍ය වටිනාකමකට හුවමාරුවක් වශයෙන් යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය යම් කොන්ත්‍රාත්තුවක් මඟින් ලබා දෙන්නේ නම්, එම කොන්ත්‍රාත්තුව කල් බද්දක් ලෙස හඳුනා ගැනේ. මෙසේ හඳුනාගත් වත්කමක්, භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් හෝ එම කොන්ත්‍රාත්තුවෙහි අඩංගු කරුණු මඟින් ලබා දී ඇත්දැයි තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි අර්ථ දැක්වීම භාවිතා කරයි.

### 2.6.10.1 බදුකරු ලෙස සමූහය

කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකමින් යුත් කල්බදු වත්කම් හැර සෙසු කල්බදු සඳහා සමූහය තනි පිළිගැනීමක් සහ මිනුම් ප්‍රවේශයක් භාවිතා කරයි. භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරන කල්බදු ගෙවීම් සහ භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මත සමූහය විසින් බදු වගකීම් හඳුනා ගනී.

#### භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්

සමූහය විසින් භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් එවා ප්‍රයෝජනයට ගත හැකි විට හඳුනා ගනී.

භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් හාණිකරණ අලාභ හා නැවත තක්සේරු කරන ලද බදු වගකීම් ගැලපීමෙන් පසුව වේ. ආරම්භයේදීම භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්, බදුකරුවන් විසින් ලබා දුන් යම් දිරිගැන්වීම් අඩු කිරීමෙන් පසු ආරම්භක කල් බදු වගකීම, ආරම්භක ඍජු පිරිවැය සහ වත්කම් නවීකරණය කිරීම සඳහා බැඳීම් වලින් සමන්විත වේ. භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් කෙටි කාල සීමාවට හෝ පාදක වූ වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මෙම වත්කම් හාණිකරන පරීක්ෂාවට යටත්වේ.

සමූහය සතු භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් දේපල පිරියත හා උපකරණ යටතේ ඇතුලත් වේ.

#### කල්බදු වගකීම්

කල්බදු ආරම්භ කරන දිනයේදී, කල්බදු කාලය තුළදී ගෙවිය යුතු සම්පූර්ණ ගෙවීම් වල වර්තමාන වටිනාකම අනුව සමූහය විසින් කල්බදු වගකීම් හඳුනාගනු ඇත. කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී, කල්බදු ගිවිසුමේ ඇති පොලී අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, කල්බදු ආරම්භක දිනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතය මණ්ඩලය භාවිතා කරයි. ආරම්භක දිනයට පසුව, පොලිය එකතු වීම පිළිබිඹු කිරීම සඳහා කල්බදු වගකීම් ප්‍රමාණය වැඩි කරන අතර බදු ගෙවීම් සඳහා ගෙවීම් අඩු කෙරේ. ඊට අමතරව, ස්ථාවර කල්බදු ගෙවීමේ දුවයේ වෙනසක් හෝ වත්කම් මිලදී ගැනීම සඳහා වූ තක්සේරුවේ වෙනසක් ඇත්නම් කල්බදු වගකීම් දරන ප්‍රමාණය නැවත මනිනු ලැබේ. සමූහයේ කල්බදු වගකීම් පොලී දරණ ණය සහ ණය ගැනීම් යටතේ ඇතුළත් වේ.

### 2.6.10.2 සමූහය බදු කරු ලෙස - එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම

#### මෙහෙයුම් කල්බදු

වත්කම් වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් ප්‍රමාණවත් ලෙසින් නොපවරන ජලවිදුලි, වායු බල හා තාප බල බලාගාර වර්ග කරනුයේ මෙහෙයුම් කල්බදු වශයෙනි. සියලුම බලාගාර වලින් ලැබෙන ආදායම් බලශක්ති නිපැයුම මත ආදායම් ප්‍රකාශයේ පිළිගැනෙන්නේ බදු දුන් වත්කම් වලින් ඉපදෙන භාවිතයේ ප්‍රතිලාභ අඩු වන කාල රටාව වැඩියෙන් නියෝජනයවන කාල සීමාවේ බලශක්ති නිපැයුම මතය. බදු ආදායම ඉපයීමේදී දරන ලද ක්ෂයවීම් ඇතුලු පිරිවැය වියදමක් වශයෙන් පිළිගැනේ. ක්ෂයවීමට යටත් බදු වත්කම් වල ක්ෂය වීමේ ප්‍රතිපත්තිය සමාන වත්කම් සඳහා සමූහයේ ක්ෂය වීමේ ප්‍රතිපත්තියට ගැලපේ.

#### මූල්‍ය කල්බදු

පහත සඳහන් නිර්නායකයන්ගෙන් සෑහීමකට පත්වීම හේතුවෙන් සීමාසහිත රාජ් ලංකා විදුලිබල සමාගම හා බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය සහ සීමාසහිත ලක්දනව් බංගලා පවර් සහ බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය අතර ඇති විධිවිධාන IFRIC 4 - එකඟ වීමට කල්බදු ඇතුළත් ද යන්න තීරණය කිරීම සහ "ශ්‍රී.ගි.ප්‍ර-16 කල්බදු" යටතේ කල්බදු ලෙස ගිණුම් ගත කළ යුතුය යන විෂය පථයට අයත්බව සමූහයේ අදහසයි.

- විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුම යටතේ ඇති විධිවිධානය සපුරාලීම රඳා පවතින්නේ බංගලාදේශයේහි පිහිටි සමූහයේ නිශ්චිත බලාගාරයේ සුවිශේෂී භාවිතය මතය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

- බලාගාරය ක්‍රියාත්මක කිරීමට හෝ බලාගාරයේ සමස්ත නිෂ්පාදනය පාලනය කරන අතරම එය තීරණය කරන ආකාරයට බලාගාරය ක්‍රියාත්මක කිරීම අන් අයට යොමු කිරීමට බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලයට අයිතියක් ඇත.

- සමාගමේ විදුලි බලාගාරය මඟින් උත්පාදනය කරන ලද විදුලිබල නිමැවුම, බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය හැර වෙනත් පාර්ශවයකට ලබාගත නොහැකි අතර බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය විසින් ගෙවනු ලබන ඒකකයකට ධාරිතා ගාස්තුව නැමැවුම මත පදනම් නොවේ.

සමූහයේ විදුලි බලාගාරයේ නෛතික හිමිකාරිත්වයට ආනුපාතික සියලු අවදානම් සහ ප්‍රසතිලාභ බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලයට වෙත මාරු කර ඇති හෙයින් සී/ස රාජ් ලංකා සමාගම හා සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම බදුකරු ලෙසත්, බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය බදුගන්නා ලෙසත් ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු යටතේ මූල්‍යය කල්බදු ලෙස ගිණුම්ගත කෙරේ.

## 2.6.11 අස්පාශ්‍ය වත්කම්

### හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම්, සහ වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලැබේ.

### මිණුම් කිරීමේ පදනම

වෙන් වෙන් වශයෙන් අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේ පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයක අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ අත්කර ගන්නා දිනයේදී ඒවායේ පවත්නා සාධාරණ වටිනාකමය. මූලික හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ සමුච්චිත හානිකරණයක් වේතොත් අදාළ පරිදි පාඩු අඩු කර අස්පෘශ්‍ය වත්කම් පිරිවැය ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රාග්ධනිත කළ සංවර්ධණ පිරිවැය හැර අභ්‍යන්තරිකව ජනනය කළ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරන අතර වියදම දරන ලද වසරේ ආදායම් ප්‍රකාශයේ අදාළ වියදම පිළිඹිබු වේ.

### ක්‍රමක්ෂය/හාණිකරණය

අස්පෘශ්‍ය වත්කම් වල සඵල ආයුකාලය තක්සේරු කරනුයේ පරිමිත හෝ අපිරිමිත වශයෙනි.

පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් ඒවායේ සඵල ආර්ථික ආයුකාලය ඔස්සේ ක්‍රමක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට ලක් විය හැකි බවට සංඥාවක් ලැබෙන සෑම අවස්ථාවකදීම හානිවූ ලෙස තක්සේරු කෙරේ. පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය ක්‍රමවේදය හා ක්‍රමක්ෂය කාලසීමාව අවම වශයෙන් වාර්තා කරන සෑම කාලසීමාවකදීම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත සඵල ජීව කාලයේ වෙනස් වීම් හෝ වත්කමෙහි ඇතුළත්ව තිබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව ගිණුම් ගත කරනුයේ අදාළ පරිදි ක්‍රමක්ෂය ක්‍රමවේදය හෝ ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කිරීමෙන් වන අතර ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්වීම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ආයු කාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කම් වල කාර්ය භාරයට අනුකූල වියදම් ප්‍රභේදයන් යටතේය.

### මණ්ඩලය

වසර 5 ක ප්‍රයෝජනවත් ජීව කාලයක් සඳහා මෘදුකාංග ක්‍රමක්ෂය කර ඇති අතර බලපත්‍රය සඳහා ගිවිසුම් තුළ නියම කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

### එල්ටීඑල් හෝල්ඩිංන්ස් (පුද්) සමාගම

පරිගණක මෘදුකාංග අත්පත් කර ගත් හා සංවර්ධනය කළ දින සිට වසර 4 ක් වැනි කාලයක් තුළදී ක්මක්ෂය කර ඇත.

### ලංකා විදුලි (පුද්) සමාගම

පරිගණක මෘදුකාංග බලපත්‍ර වසර 5 ක ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

තාක්ෂණික දැනුම ගිවිසුම් කාලය වන වසර 15 දක්වා ක්‍රමක්ෂය කර ඇත. අසීමිත සඵල ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකෙරෙන අතර තනි තනිව හෝ මුදල් ජනනය කරන ඒකකයේ මට්ටමින් හානි කරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය තක්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙනුයේ අසීමිත ජීව කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතීදැයි යන්න තීරණය කිරීමටයි. එසේ නොමැතිනම් ජීවකාලය අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා අනාගතය සඳහා බලපවත්න පරිදි වෙනස් කෙරේ.

### හඳුනාගනු ලැබූ අස්පාශ්‍ය වත්කම් පොත් වලින් ලියා හැරීම

අස්පෘශ්‍ය වත්කමක් පිළිගැනීම තුළින් පැන නගින ලාභ හෝ පාඩු මනින්නේ බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් හා වත්කම් වල ඉදිරියට ගෙනයන ප්‍රමාණය අතර වෙනස වශයෙන් වන අතර වත්කම පිළිගැනීමෙන් බැහැර කළ විට එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

### 2.6.12 මූල්‍ය වත්කම් හා වගකීම්

### 2.6.12.1 මූල්‍ය වත්කම්

#### මූල්‍ය වත්කම් මූලික හනාදුගැනීම හා මිනුම්කරණය

මූලික වශයෙන් හඳුනාගැනීමේදී, මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI), හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ආදී වටිනාකම් මත වර්ගීකරණය කෙරේ.

මූල්‍ය වත්කමක් (එය සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව වෙළෙඳ ලැබිය යුතු නම්) හෝ මූල්‍ය වගකීම් මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින්, එය අත්පත් කර ගැනීම හෝ නිකුතුව සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් එක්වූ පසු ගනුදෙනු පිරිවැය වේ

සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ණයක් මුලින් මනිනු ලබන්නේ ගනුදෙනු මිලෙනි.

#### පසුකාලීන මිනුම්කරණය

පසුකාලීන මිණුම්කරනය සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත;

- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)
- සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිචක්‍රීකරණය කිරීමත් සමඟ විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍යය වත්කම් (ණය උපකරණ)
- බැහැර කිරීමේදී සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිචක්‍රීකරණය කිරීමකින් තොරව විස්තීරණ ආදායම තුලින් සාධාරණ වටිනාකම හදුනාගන්නා මූල්‍යය වත්කම්
- සාධාරන විටිනාකම ලාභ අලාභ ගිණුම හරහා ගලපන මූල්‍ය වත්කම්

#### ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට හදුනාගනු ලබයි:

- කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණ ඇතිව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

  සහ

- මූල්‍ය වත්කම්වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොලිය සහ වාරිකය වීම

ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාත (ඊඅයිආර්) ක්‍රමය උපයෝගී කරගනිමින් පසුව මනිනු ලබන අතර එය හානිකර පරීක්ෂාවන්ට යටත්වේ. වත්කම් හඳුනා නොගත් විට, වෙනස් කළ විට හෝ හාණිකරනයට ලක්වූ විට ලාභ හෝ අලාභය ලාභය හා පාඩු ප්‍රකාශයට හඳුනා ගැනේ.

සමූහයේ ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් සඳහා වෙළෙඳ ලැබීම්, සේවකයින්ට ණය, සම්බන්ධිත පාර්ශවයන්ට ණය සහ වෙනත් මූල්‍ය වත්කම් යටතේ ඇතුළත් අනෙකුත් ආයෝජන ඇතුළත් වේ.

#### විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබන මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම යන අරමුණු දෙක සහිතව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

  සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොලිය සහ වාරිකය වීම

  විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබන ණය උපකරණ සඳහා පොලී ආදායම, විදේශ විනිමය නැවත ඇගයීම සහ හාණිකරන පාඩු හෝ ආපසු හැරවීම් ලාභ හෝ අලාභය ප්‍රකාශණයට හඳුනාගනු ලබන අතර මිණුම්කරනය ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් සඳහා සිදුකරන ආකාරයට සිදුකරනු ලබයි. ඉතිරි සාධාරණ අගයන් වෙනස්වීම් විස්තීරන ආදායම් ප්‍රකාශණයේ හඳුනා ගැනේ. ආපසු හැරවීමේදී, විස්තීරන ආදායම් ප්‍රකාශණයේ හඳුනාගත් සමුච්චිත සාධාරණ අගය වෙනස් වීම ලාභ හෝ අලාභ ප්‍රකාශයට ගැලපුම් කෙරේ.

#### විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබන මූල්‍ය වත්කම් (කොටස් උපකරණ)

මූලික හදුනාගැනීමෙන් පසු SLFRS-3 යටතේ වෙළෙඳාම සඳහා හෝ අසම්භාව්‍ය සලකා බැලීම් ලෙස සිය ආයෝජන වර්ගීකරණය කිරීමට සමූහයට තෝරා ගත හැකිය. මෙහිදී ණය උපකරණයෙන් උපකරණය පදනම මත මෙම වර්ගීකරණය තීරණය වේ.

මෙම මූල්‍ය වත්කම් වල ලාභ හා පාඩු කිසි විටෙක ලාභ හෝ අලාභය ප්‍රකාශයට ප්‍රතිචක්‍රීකරණය නොකෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

මූල්‍ය වත්කම් වල පිරිවැයෙන් කොටසක් නැවත අය කර ගැනීමක් ලෙස සමූහයේ ප්‍රතිලාභ ලැබෙන විට හැර, ගෙවීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ අලාභ ප්‍රකාශයේ ලාභාංශ වෙනත් ආදායමක් ලෙස හදුනාගනු ලබන අතර, පෙරකී ලැබීම් විස්තීරණ ආදායම් ප්‍රකාශණයේ හදුනාගනී. එසේම මෙම මූල්‍ය වත්කම් හාණිකරන පරීක්ෂාවන් සඳහාද යටත් නොවේ.

### මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහය සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කළ විට පමණක් සමූහය සිය මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලැබේ. සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම්, සාධාරණ අගය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් ගලපන හෝ සාධාරණ අගය ලාභයෙන් හෝ අලාභයෙන් ගලපණු ලැබූ මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන්නේ නම්, නැවත වර්ගීකරණය කරන ලද දිනයේ සිට ඉදිරියට ගැලපුම් කිරීම සිදු කරයි. සමූහය කලින් හඳුනාගත් කිසිදු ලාභයක්, අලාභයක් (හාණිකරන ලාභයක් හෝ අලාභයක් ඇතුළුව) හෝ පොලිය නැවත ලබා නිවැරදි නොකරයි.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සාධාරණ අගය ලාභ අලාභ ගිණුම තුලින් ගලපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍යමය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හදුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හදුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයට හදුනාගනු ලැබේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. කෙසේ වෙතත්, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් ඉවත්කර නැවත වර්ගීකරණය කරන දිනයේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ගැලපුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කළ දිනයේදී මනිනු ලබන්නේ එය සෑම විටම ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කල ආකාරයෙනි. මෙම ගැලපීම අනෙකුත් විස්තීර්ණ ආදායමට බලපාන නමුත් ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති බැවින් එය නැවත වර්ගීකරණය කිරීමක් ලෙස නොසැලකේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ලාභ අලාභ තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මැනීම අඛණ්ඩව සිදු කෙරේ. අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදී කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය නැවත වර්ගීකරණය කරන දිනයේදී නැවත වර්ගීකරණය කිරීමේ ගැලපීමක් ලෙස ස්කන්ධයෙන් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

### ආ) බැහැර කිරීම

හඳුනා ගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත් පත් වලින් ඉවත් කරනුයේ පහත අවස්ථාවලදීය:

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය අවසන් වීම

ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් මාරුකර තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලත් මත තෙවන පාර්ශ්වයකට ලැබී ඇති මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවීමට වගකීමක් භාර ගෙන තිබෙන විට; සහ පහත කරුණු දෙකෙන් එකක්:

(අ ) වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් හරවත් ලෙස මාරු කර තිබෙන විට

හෝ

(ආ) සමූහය විසින් වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ තබා ගැනීමක් නොකර වත්කමේ පාලනය මාරු කර තිබෙන විට

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් පවරා තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලකට එළඹ තිබෙනවිට හා වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් නොකර වත්කමේ පාලනයද මාරු කර නොතිබෙන විට ඒ ගැන සමාගම පවත්වා ගෙනයන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

අඛණ්ඩ සම්බන්ධයේ ප්‍රමාණය දක්වා වත්කම හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව සමූහය විසින් රඳවා ගෙන තිබෙන අයිතිවාසිකම් හා වගකීම් පිළිබිඹු වන පදනමක් මත මනිනු ලැබේ.

ඇප ප්‍රතිඥාවක ස්වභාවයක් ගන්නා මාරු කරන ලද වත්කම කෙරෙහි වූ අඛණ්ඩ සහභාගිත්වය මනිනුයේ වත්කමේ මුල්ධාරණ අගයත් සමූහයට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

### 2.6.12.2 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් ලැබෙන බවට වාර්තා කරණ සෑම දිනයකදීම සමූහය විසින් එම වත්නම් අගැයීමට ලක් කෙරේ.

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයවී තිබෙන බවට සලකණු ලබන්නේ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සිද්ධියක හෝ සිද්ධි කීපයක ප්‍රතිපලයක් වශයෙන් (දරණ ලද පාඩු සිද්ධියක්) වන අතර එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් ඇති කළ විටය. පාඩු සිද්ධියෙන් ඇති කරණ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු හානිකරණය වන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබේ නම් පමණි. ණය කරුවන් හෝ ණය කරුවන් සමූහයක් සැලකිය යුතු අන්දමින් මුදල් දුෂ්කරතා, ණය නොගෙවීම් හෝ පොලිය හෝ ප්‍රාග්ධන ගෙවීම් වල දී අදාල පැහැර හැරීම් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන්ව ස්තුභංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ප්‍රවේශ වීමේ භව්‍යතාවයක් සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනිය හැකි අඩුවීමක් ඇතිවීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්වීම ද (එනම් හිඟවීම් වල වෙනස්වීම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්වීම් අතපසුවීම් සමග සම්බන්ධතාවක් ඇති බව) හානිකරණ සාක්ෂි වලට අයත් විය හැකිය.

සමූහය විසින්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන උපකරණ හැර අනෙකුත් සියලුම ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා දීමනාවක් හඳුනාගනී. ණය අලාභ සඳහා පදනම් වී ඇත්තේ කොන්ත්‍රාත්තුවට අනුකූලව ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් සහ සමූහය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන්හි වෙනස මූලික ඵලදායි පොලී අනුපාතයට වට්ටම් කිරීමෙනි. අපේක්ෂිත මුදල් ප්‍රවාහයට, කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූලව සිදුවන ණය වැඩිදියුණු කිරීම් හෝ ඇප තැන්පතු විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් ඇතුළත් වේ.

අපේක්ෂිත ණය අලාභ අවස්ථා දෙකකදී හදුනා ගැනේ.

මූලික හදුනාගැනීමෙන් පසුල ණය අවදානමේ සැලකිය යුතු වර්ධනයක් සිදු නොවූ ණය සඳහා, අපේක්ෂිත ණය අලාභය ලබා දෙනුයේ ඉදිරි මාස 12 තුළදී (මාස 12 ක ඊසීඑල්) සිදුවිය හැකි පැහැර හැරීම් හේතුවෙන් සිදුවන ණය අලාභ සඳහා ය.

මූලික හදුනාගැනීමෙන් පසුල ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇති ණය සඳහා, ගෙවීම් පැහැර හැරීමේ කාලය නොසලකා, ඉතිරි නිරාවරණ කාලය සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් අවශ්‍යවේ.

වෙළෙඳ ලැබීම් සහ කොන්ත්‍රාත් වත්කම් සඳහා සමූහය අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදීල සරල ක්‍රමය අනුගමනය කරයි. එම නිසා සමූහය ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරන අතර ඒ වෙනුවට එක් එක් වාර්තාකරණ දිනයේදී ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභ මත පදනම් වූ අලාභ දීමනාවක් හඳුනා ගනී. සමූහය විසින් ඓතිහාසික ණය අලාභ අත්දැකීම සඳහා ආර්ථික පරිසරය සම්බන්ධ ඉදිරි සාධක ගලපන ලද ප්‍රතිපාදන අකෘතියක් ස්ථාපිත කර ඇත.

### 2.6.12.3 මූල්‍ය බැරකම්

#### මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

SLFRS 9 හි විෂය පථය තුල මූල්‍ය වගකීම් වල වර්ග කිරීම සමූහය විසින් තීරණය කරණු ලබන්නේ මුල් හඳුනා ගැනීමේදීය.

සියලුම මූල්‍ය බැරකම් මුලදී හඳුනා ගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය හා අතමාරු සහ වෙනත් මූල්‍ය බැරකම් වලට අදාලව ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙහි අඩංගුය.

#### පසුකාලීන මිනුම්කරණය

පහත දැක්වෙන පරිදි මූල්‍ය බැරකම්වල මිනුම් රඳා පවතිනුයේ, වර්ග කිරීම මතය

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වගකීම් පසුව සාධාරණ අගයකින් මනිනු ලබන අතර, 'වෙනත් වගකීම්' ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂ්‍ය පිරිවැය යටතේ මනිනු ඇත.

#### බැහැර කිරීම

මූල්‍ය බැරකමක් පොත්පත් වලින් ඉවත් කරනුයේ, අදාළ වගකීම යටතේවූ බැඳීම ඉටු කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විටය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

### 2.6.12.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම්

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ වාර්තා කරනුයේ, හඳුනා ගත වටිනාකම් දැනට බලාත්මක නීතිමය අයිතියක් හා ශුද්ධ පදනමක් මත වත්කම් උපලබ්ධි කර බැරකම් පියවීම සමගාමීව සිදු කිරීමෙන් ශුද්ධ වටිනාකම පියවීමේ අභිප්‍රායක් තිබෙන විට පමණි.

### 2.6.12.5 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සමූහය විසින් සෑම වාර්තා කරන දිනයකදීම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන මූල්‍ය වත්කම් හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් මිණුම්කරනය සිදුකරනු ලබයි

සාධාරණ අගය වනුයේ, මිණුම්කරන දිනයේදී, වෙළෙඳ පොළ සහභාගිවන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීමෙන් ලැබෙන හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිලයි.

සාධාරණ අගය මැනීම පදනම් වන්නේ වත්කම් විකිණීමේ හෝ වගකීම පැවරීමේ ගනුදෙනුව

- වත්කම් හෝ වගකීම් සඳහා ප්‍රධාන වෙළඳ පොළකදී
- ප්‍රධාන වෙළෙඳ පොලක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී සිදුවන බවට ඇති උපකල්පනය මතය.

වත්කම් හෝ වගකීම් වල සාධාරණ අගය මනිනු ලබන්නේ වෙළෙඳපොළ සහභාගිවන්නන් තම ආර්ථික යහපත සඳහා ක්‍රියාකරන බව උපකල්පනය කරමින් වත්කම් හෝ වගකීම් මිල නියම කිරීමේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් භාවිතා කරන උපකල්පන උපයෝගී කරගනිමිනි.

අදාළ තත්ත්වයනට ගැලපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම ලෙස භාවිතා කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදීම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය භාවිතා කරයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිණුම්කරණය සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ අගය මත ගිණුම්කරණය කර ඉදිරිපත් කරන සියලුම වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි සාධාරණ වටිනාකම් ධූරාවලියකට අනුව වර්ගීකරණය කෙරේ.

| | | |
|---|---|---|
| 1 වන මට්ටම | - | සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය නියමවූ වෙළෙඳපොළේ මිල ගණන් (වෙනස්කම් සිදු නොකළ). |
| 2 වන මට්ටම | - | සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු කිරීමේ ක්‍රම. |
| 3 වන මට්ටම | - | සාධාරණ අගය මැනීමේදී සැලකිය යුතු අවම මට්ටමේ යෙදවුම් නිරීක්ෂණය කළ නොහැක තක්සේරු කිරීමේ ක්‍රම. |

සමූහය විසින් එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදී. පුනරාවර්තන පදනමින් මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගන්නා වත්කම් හා වගකීම්, ධූරාවලියේ මට්ටම් අතර ස්ථාන මාරුවීම් සිදුවී ඇත්ද යන්න වර්ගීකරණය නැවත තක්සේරු කිරීමෙන් තීරණය කරනු ලබයි. (සාධාරණ අගය මැනීමට සැලකිය යුතු අවම මට්ටමේ යෙදවුම් සමස්තයක් ලෙස පදනම් කර)

වෙනත් විසිතීරණ ආදායම තුළින් මනිනු ලබන මිල නියම නොකළ මූල්‍ය වත්කම් වැනි පුනරාවර්තන සාධාරණ අගයන්, මැනීම සඳහා වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිල සමූහයේ කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

සාධාරණ වටිනාකම් හෙළිදරව් කිරීම් සඳහා, සමූහයේ වත්කම් හා වගකීම් කාණ්ඩයන්, වත්කම් හෝ වගකීම් වල ස්වභාවය, ලක්ෂණ සහ අවදානම් සහ ඉහත විස්තර කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලියේ මට්ටම අනුව තීරණය කර ඇත.

### 2.6.13 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් සමූහයට ප්‍රවර්තන බැඳීම් (නීතිමය හෝ සමප්‍රයුක්තව) තිබෙන විට ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරණ සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතී නම් සහ බැඳීයාවට අදාළ මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වන්නේ නම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් වන්නේ නම් මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිත වූ ආදායම පිළිබිඹු වන අයුරින් බදු ගෙවීමට පෙර අනුපාතයන් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදන නියම කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිතා කිරීමේ දී කාලයත් සමග ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 2.6.14 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීයාවන්

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳියාව

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ වියට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිළිගෙන තිබෙන බැරකම වන්නේ, සැලසුම් කළ වත්කම් වල සාධාරණ අගය අඩු කර, පිළිනොගත් පැරණි සේවා පිරිවැය වෙනුවෙන් ගැලපීම් සහිතව, වාර්තා කරණු ලබන කාල සීමාව අවසානයේ තිබුන අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගයයි. ස්වාධීන අයුගණකයින් විසින් ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැරකම වාර්ෂිකව ගණනය කරති. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගය තීරණය වන්නේ ඉහල ප්‍රමිතිව්‍යාප්ත සංයුක්ත බැඳුම්කර වෙළෙඳපලක් ශ්‍රී ලංකාවේ නොමැති නිසා, ඇස්තමේන්තු කළ අනාගත මුදල් පිටත ප්‍රවාහ රජයේ බැඳුම්කර වල පොලී අනුපාතය යොදා ගනිමින් වට්ටම් කිරීමෙනි. රජයේ බැඳුම්කර නාමනය කෙරෙණුයේ අදාළ විශ්‍රාම වැටුප් බැරකමේ නියමයන්ට සමාන වන පරිදි කල්පිරිය යුතු ප්‍රතිලාභ ගෙවනු ලබන්නා වූ ව්‍යවහාර මුදල් වලිනි.

ආයුගණක ලාභ හා පාඩු, ඒවා පැන නගින අවස්ථාවේදී වෙනත් විස්තීර්ණ ආදායම් වල ක්ෂණිකව හඳුනාගැනේ

නිශ්චිත කාල සීමාවක් (පැවරුම් කාල සීමාව) තුළ සේවයේ යෙදී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මේ වෙනස්වීම් කොන්දේසි සහගත නොවන්නේ නම්, අතීත සේවා පිරිවැය ආදායම් ප්‍රකාශයට වහාම හඳුනා ගැනේ. මෙම අවස්ථාවේදී, අතීත සේවා පිරිවැය පැවරුම් කාලය ඔස්සේ සරල රේඛා පදනමක් මත ක්‍රමක්ෂය කරණු ලැබේ.

### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ වියට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් රඳා පවතින, සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන ප්‍රතිලාභ ගණන අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය මගින් අර්ථ නිරූපනය කෙරෙයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම සමන්විත වන්නේ 1983 අංක 12 දරණ පනතෙන් ප්‍රතිපාදිත පාරිතෝෂිකයෙනි. පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥා දී ඇති විශ්‍රාම ප්‍රතිලාභයන්හි ප්‍රවර්තන අගය සමූහය විසින් මනිනු ලබන අතර එම අගය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය:PUB - මත පාදක වූ ආයු ගණක තක්සේරු ක්‍රමවේදය භාවිතයට ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයු ගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාළව ආදායම් ප්‍රකාශණයේ සම්පූර්ණයෙන්ම හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික බැඳියාව සඳහා අරමුදල් බාහිරව ලබා නොගැනේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ අනෙකුත් අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ග කෙරේ.

### අර්ථ දැක්වූ දායකත්ව සැලැසුම් - සේවක අර්ථ සාධක අරමුදල හා සේවානියුක්ත භාර අරමුදල

අදාල නීති හා රෙගුලාසි ප්‍රකාර සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලැබීමට සේවකයෝ සුදුසුකම් ලබති. ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයින්ගේ දළ වැටුපෙන් 15% ක් ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හා 3% ක් සමූහය විසින් අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාරකාර අරමුදලට දායකවේ.

## 2.6.15 ස්වයං රක්ෂණ සංචිතය

සෑම වසරකදීම වසර අවසානයේ දළ වශයෙන් නැවත තක්සේරු කළ ස්ථාවර වත්කම් වලින් 0.1% ක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ස්වයං රක්ෂණ සංචිතයකට මාරු කරයි. ලංකා විදුලිබල මණ්ඩලය දේපල, පිරියත හා උපකරණ වල පාඩු හා හානි රක්ෂණ සංචිතයට හර කෙරේ. මෙම කාර්යය සඳහා අරමුදල් සපුරා ගන්නේ බැංකුවක වෙනම ගිණුමක ආයෝජනය කර තිබෙන මුදල් වලිනි.

## 2.6.16 රජයේ ප්‍රධාන

රජයේ ප්‍රධාන මූලික වශයෙන්ම සාධාරණ අගයට හඳුනා ගැනෙන අතර, එකී ප්‍රධාන ලැබෙනු ඇති බවට සාධාරණව තහවුරු කොට ඇති විටක, එකී ප්‍රධාන ආශ්‍රිත කොන්දේසි වලට සමාගම අනුගතවනු ඇත. සමූහය විසින් දරන ලද වියදම් සඳහා වන්දියක් වශයෙන් එකී ප්‍රධාන ලැබෙන අවස්ථාව ලාභ අලාභ ප්‍රකාශයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ ආදායම හඳුනා ගන්නා ලද එකී කාල පරිච්ඡේදය සඳහා ක්‍රමානුකූල පදනම මත අනෙකුත් ආදායම් වශයෙන් හඳුනා ගැනේ. වත්කම් පිරිවැය වශයෙන් සමූහයට ගෙවන ලද ප්‍රධාන එකී වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත ක්‍රමානුකූල පදනම මත ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

## 2.6.17 මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන වෙනත් දේ ලෙස විග්‍රහ කර ඇත්තේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා ඉක්මණින් හා පහසුවෙන් මාස තුනක් හෝ ඊට අඩු කාලයකදී නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි හා අගය වෙනස් වීම පිළිබඳව අල්ප අවදානමකට ලක් වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්ය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් වලට සමාන දේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ ප්‍රමාණයෙන් සමන්විත වේ.

## 2.6.18 පාරිභෝගිකයන් සමග වූ ගිවිසුම වලින් ලද ආදායම්

පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් වශයෙන් සමූහය අපේක්ෂා කරන වටිනාකමට පොරොන්දු වූ භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා වෙත ලබාදීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කිරීමේ දී සමූහය විසින් ආදායම හඳුනාගනු ලැබේ.

### අ) විදුලි විකිණුම්

විදුලිය/සේවා සහ භාණ්ඩ අලෙවිය සපයන ලද සේවා සම්බන්ධතාවයන් හරහා පාරිභෝගිකයන් විසින් විදුලිය පාරිභෝජනය කිරීමේදී විදුලිය අලෙවි කිරීමේ ආදායම සමූහය විසින් හඳුනාගනියි. අයකිරීම් කාණ්ඩය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගැසට් කරන ලද ගාස්තු මත පදනම්ව ආදායම හඳුනාගන්නා මිළ තීරණය කරනු ලැබේ.

නිමැවුම් ක්‍රමය භාවිතා කරමින් කාර්ය සාධන වගකීම් වල ප්‍රගතිය සමූහය මැන බලයි. ප්‍රතිදාන ක්‍රමය මඟින් පිළිගත් ආදායම පදනම් වන්නේ පාරිභෝගිකයා වෙත මාරු කරන ලද වටිනාකම් සෘජුවම මැනීම මතය. ඒ අනුව, බෙදා හරින ලද විදුලිබල ධාරිතාවය මත පදනම්ව, සමූහය මාසිකව පිරිවැටුම වාර්තා කරයි.

### ආ) පාරිභෝගික දායකත්වය

සමූහය විසින් සපයන ලද වත්කමේ ප්‍රතිලාභය පාරිභෝගිකයා විසින් සමස්ත කාලය පුරා විදුලිය පරිභෝජනය කිරීමේ දී සමාන්තරව ලබාගැනීම සහ පරිභෝජනය සිදුකරන බැවින්, විදුලිය සැපයීම උදෙසා වූ වත්කම් සකස් කිරීම සඳහා පාරිභෝගිකයා වෙතින් ආරම්භයේ දී ලැබෙන ප්‍රතිෂ්ඨාව සමස්ත කාලය පුරාම හඳුනාගනු ලැබේ. එබැවින් ලැබෙන ප්‍රතිෂ්ඨාව වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා ආදායම වශයෙන් හඳුනාගනු ලැබේ.

### ඇ) විද්‍යුත් වාහන ආරෝපන ආදායම

මණ්ඩලය විසින් පිහිටුවන ලද විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථානවලදී, පාරිභෝගිකයා විසින් තම වාහන ආරෝපණය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන විදුලිය සඳහා මණ්ඩලය විසින්ම සපයන ලද පෙර ගෙවුම් කාඩ්පත් මඟින් ගෙවීමේ දී, වාහන ආරෝපනයෙන් පසුව ආදායම හඳුනාගනු ලැබේ.

### ඈ) ගිවිසුම් වගකීම

සමූහය වෙත දැනටමත් ප්‍රතිෂ්ඨාවක් ගෙවා ඇති පාරිභෝගිකයකු වෙත සේවාව ලබාදීම සඳහා වූ බැඳීම ගිවිසුම් වගකීමක් වේ. එබැවින් විද්‍යුත් වාහන ආරෝපණය සඳහා වූ විද්‍යුත් කාඩ්පතෙහි ඉතිරිව පවතින පෙර ගෙවුම් ශේෂය සහ සේවා සම්බන්ධතාවයන් සඳහා වූ පාරිභෝගික ගෙවීම්වල ක්‍රමක්ෂය නොවූ අගය සමූහයේ ගිවිසුම්ගත වගකීම් ලෙස සැලකේ.

## 2.6.19 මූල්‍ය ආදායම හා වියදම

ඵලදායී පොලී අනුපාතය (ඊඅයිආර්) උපයෝගී කරගනිමින් පොලී ආදායම හෝ වියදම ගණණය කරන අතර එය ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්, සුදුසු පරිදි මූල්‍ය වත්කමේ වටිනාකමට වට්ටම්කර වත්කම් සඳහා වූ පොලී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ

## 2.6.20 ලාභාංශ

ලාභාංශ ආදායම් හඳුනා ගනු ලබන්නේ ගෙවීම ලබා ගැනීමට කොටස්කරුවන්ට ඇති අයිතිය තහවුරුවූ පසුය.

## 2.6.21 වෙනත් මෙහෙයුම් ආදායම් සහ වියදම්

### ලාභ හා පාඩු

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් පැනනගින ආදායම් ස්වභාවයකින් යුත් ශුද්ධ ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම් ගත කර තිබෙනුයේ, වත්කම්වල ධාරක ගණන හා ආශ්‍රිත විකිණුම් වියදම්, බැහැර කිරීම්වලට අදාල ලැබීම්වලින් අඩු කළ පසුවය.

### වෙනත් ආදායම් සහ වියදම්

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

## 2.6.22 වියදම් හඳුනා ගැනීම

විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම (පීපීඒ) මත පැන නඟින වියදම් ඇතුළුව වියදම්, ආදායම අතර වූ සෘජු නිශ්චිත සම්බන්ධතාවන් මත පදනම්ව වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. ව්‍යාපාරයේ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමටත් ව්‍යාපාරය කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාමටත් දරන වියදම් ලාභ හෝ අලාභය ප්‍රකාශයට හඳුනාගනී.

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂකවරුන්ගේ අදහස වන්නේ "වියදම් කියාත්මක කිරීමේ ක්‍රමය" සාධාරණ ලෙස මණ්ඩලයේ

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

ක්‍රියාකාරීත්වයේ අංගයක් වන අතර, එබැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බවයි

3. **සැලකිය යුතු ගිණුම්කරණ උපකල්පන, තීන්දු හා ඇස්තමේන්තු**

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වාර්තා කිරීමේ කාලය අවසානයේදී ආදායම, වියදම, වත්කම්, වගකීම් සහ අවදානම් වගකීම් හෙළිදරව් කිරීමේ ප්‍රමාණයට බලපෑම් කළ හැකි විනිශ්චය, තක්සේරු කිරීම් සහ උපකල්පනයන් කළමණාකරණයන් විසින් තීරණය කළ යුතුය.

ඇස්තමේන්තු සහ තීන්දු අඛණ්ඩව ඇගයීමට ලක් කෙරෙන අතර ඒ සඳහා ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් සාධක සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් පදනම් වේ.

මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිත භාවය හේතුවෙන් අනාගත කාල පරිච්ඡේදයන්හි වත්කම් හෝ බැරකම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇති විය හැක. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් විවිධ ගැනීම සිදුකල යුතුය. කළමනාකරණයේ මූල්‍ය ප්‍රකාශණ වල පිළිගත් ප්‍රමාණයන් කෙරෙහි ඉතාමත් වැදගත් බලපෑමක් ඇති කළ හැකි යැයි තක්සේරු කර ඇති ඒවා පහත සාකච්ඡා කර ඇත;

අළුත් කිරීමේ හා අවසන් කිරීමේ කොන්ත්‍රාත් වල කල්බදු කාලය තීරණය කිරීම - සමූහය බදුකරු වශයෙන් කල්බදු ගිවිසුමක අවලංගු කළ නොහැකි කාල සීමාව සමූහය විසින් තීරණය කරනු ලබන අතර, මෙහිදී යම් කාල සීමාවක් සහිතව බදු ගෙවීම සාධාරණයැයි නිශ්චිත නම් හෝ බදු නොගැනීම සඳහා ආවරණය කරන ලද කාල සීමාව සාධාරණ ලෙස ක්‍රියාත්මක නොවන බව සහතික නම් කල්බදු කාලය දීර්ඝ කිරීමේ විකල්පයක් මඟින් මෙය ආවරණය කෙරේ.

දිගු කිරීම සහ අවසන් කිරීමේ විකල්ප ඇතුළත් බදු ගිවිසුම් කිහිපයක් සමූහය සතුව ඇත. කල්බදු අළුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය ක්‍රියාත්මක කළ යුතුද නැද්ද යන්න සාධාරණද යන්න තක්සේරු කිරීමේදී සමූහය තම විනිශ්චය ක්‍රියාත්මක කරයි. එනම්, එය අලුත් කිරීම හෝ අවසන් කිරීම සිදු කිරීම සඳහා ආර්ථික දිරිගැන්වීමක් ඇති කරන අදාළ සියළුම සාධක සලකා බලයි. ආරම්භක දිනට පසු, සමූහය විසින් පාලනය කළ යුතු සැලකිය යුතු සිදුවීමක් හෝ තත්වයේ වෙනසක් සිදු වුවහොත් බදු දීමේ කාලය නැවත තක්සේරු කරන අතර අලුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය භාවිතා නොකිරීමට බලපායි.

තවද අවසන් කිරීමේ විකල්පයන්ගෙන් ආවරණය වන කාල වකවානු බදු කාල සීමාවේ කොටසක් ලෙස ඇතුළත් කරනුයේ ඒවා ක්‍රියාත්මක නොකිරීම සාධාරණ ලෙස තහවුරු වූ විට පමණි.

### මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ව ප්‍රකාශයේ සටහන්ව තිබෙන මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වල සාධාරණ අගය ක්‍රියාත්මක වෙළෙඳපල වලින් ලබාගත නොහැකි විට, ඒවායේ සාධාරණ අගය තීරණය කරනුයේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය ඇතුලු තක්සේරු ක්‍රම ශිල්ප යොදා ගනිමිනි. නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපල වලින් මෙම ක්‍රම වලට අදාළ යෙදවුම් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, මෙසේ කිරීම ඵලදායි නොවන විට සාධාරණ අගයන් ස්ථාපනය කිරීමෙහිලා විචාර බුද්ධි මට්ටමක් අවශ්‍යවේ.

ද්‍රවශීලතා අවදානම හා වෙළෙඳපලේ පවත්නා අවිනිශ්චිත භාවය වැනි සලකා බැලීමේ නිර්ණායකයන් (considerations) විනිශ්චයන්ට ඇතළත්ය. මෙම සාධක සම්බන්ධයෙන් වන උපකල්පනයන්හි වෙනස්වීම් මගින් මූල්‍ය උපකරණ වල වාර්තා කළ සාධාරණ අගයට බලපෑමක් ඇති කළ හැකිය.

### මූල්‍ය නොවන වත්කම් වල හානි වීමෙන් සිදුවන පාඩු සමාලෝචනය කිරීම

වත්කම් වලට හානි සිදුවී තිබේ දැයි සමූහය විසින් තීරණය කරණු ලබන්නේ හානි පිළිබඳ සමාලෝචනයක් කිරීමෙනි. මේ සඳහා මුදල් ජනනය කරණ ඒකකවල පාවිච්චියේදී අගය (value in use) ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. පාවිච්චියේදී අගය ඇස්තමේන්තු කිරීම සඳහා මුදල් ජනනය කරණ ඒකක වලින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වල ඇස්තමේන්තුවක් කළමනාකරණය විසින් සකස් කිරීමද, අදාළ මුදල් ප්‍රවාහ වල වත්මන් අගය ගණනය කිරීම පිණිස යෝග්‍ය වට්ටම් අනුපාතයක් තෝරා ගැනීමද අවශ්‍යය. මෙම තක්සේරුව අනුව අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ හා වට්ටම් අනුපාත පිළිබඳව සමූහය විසින් ඇස්තමේන්තු කිරීම අපේක්ෂිත බැවින් ඒවා අවිනිශ්චිත ස්වභාවයක් ගනී.

### වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු අයිතම හානිකරණයෙන් සිදු වන පාඩු

තනි තනිව අගැයීමට ලක් කර හානි වීමේ අවදානමක් නොමැති බව සොයා ගත් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු අයිතම සහ තනිව වැදගත් නොවන ලැබිය යුතු අයිතම ඉන්පසු සමාන අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩ අනුව, අදාළ ප්‍රතිඵල තවම ප්‍රත්‍යක්ෂ නොමැති විෂය මූලික සාක්ෂි තිබෙන සිදුව ඇති පාඩු සිද්ධි සඳහා වෙන් කිරීම් කළ යුතු දැයි තීරණය කිරීම පිණිස සාමූහිකව තක්සේරු කරණු ලැබේ. ලැබිය යුතු එකතුවෙන් ලැබෙන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(හිග මුදල් මට්ටම්, ණය උපයෝගී කර ගැනීම් යනාදී) දත්ත, අවදානම් සංකේන්ද්‍රණයේ ප්‍රතිඵල හා ආර්ථික දත්ත (විරැකියා මට්ටම්, නිශ්චල දේපල මිල දර්ශක, රටට අදාළ අවදානම හා විවිධ තනි කාණ්ඩායම් වල කාර්ය සාධනය ඇතුලු) සම්බන්ධයෙන් තීන්දු සාමූහික තක්සේරුව විසින් සැලකිල්ලට ගනු ලැබේ.

## අයබදු

ආදායම් බදු හා වැට් ඇතුලු වෙනත් බදුගෙවනු ලැබීමට සමූහය යටත්ය. මූල්‍ය ප්‍රකාශ වල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුගතවීම පිණිස පිළිපැදිය යුතු බදු උපදෙස් මාලව ලැබෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා අතිරේක බදු සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු විචාර බුද්ධියක් අවශ්‍යය. බදු මාර්ග ෂුචක නිකුත් කරණ තෙක් බදු පැනවීමේ කාර්යය සඳහා බදු වලට යටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරණ අවස්ථාවේදී බදු නීති අදාළවීම ගැන අර්ථ නිරූපන සම්බන්ධයෙන් අවිනිශ්චිතතා තිබුණි. ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා අතිරේක බදු ගෙවිය යුතු වන්නේද යන්න ගැන ඇස්තමේන්තු මත සමූහය විසින් වත්කම් හා බැරකම් හඳුනා ගඳුනා ගන්නා ලදී. මෙම කරුණු වල අවසාන බදු ප්‍රතිඵලය මුලදී සටහන් කරණ ලද ගණන් වලට වෙනස් නම්, එම වෙනස්කම් හේතු කොට ගෙන තීරණය ගනු ලබන කාලසීමාවේ ආදායම්, විලම්බිත හා බදු වලට බලපෑමක් ඇති කරයි.

## දේපල, පිරියත හා උපකරණ වල ඵලදායී ආයුකාලය

සමූහය විසින් වත්කම් වල අවශේෂ වටිනාකම්, සඵල ආයුකාල හා ක්ෂය කිරීමේ ක්‍රම සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරණු ලබයි. මෙම වටිනාකම්, අනුපාතය හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන් යොදා ගනු ලබයි.

## අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය තීරණය කරණු ලබන්නේ අයුගණක තක්සේරුව ශිල්ප ක්‍රමය භාවිතයෙනි. වට්ටම් අනුපාත, වත්කම්වලට අදාළ අපේක්ෂිත ප්‍රතිලාභ හා අනාගත වැටුප් වැඩි කිරීම් සම්බන්ධයෙන් උපකල්පනයන් සකස් කිරීමට අයුගණක තක්සේරු ශිල්පක්‍රම යොදා ගැනේ. මෙම සැලසුම්වලට දිගු කාලින ස්වභාවය නිසා ඇතැම් ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතවයන්ට යටත් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2021 | 2020 | 2021 | 2020 |
| 4 | **ආදායම** | | | | |
| | විකුණුම් | 291,198,388 | 264,265,952 | 249,089,188 | 238,910,553 |
| | | **291,198,388** | **264,265,952** | **249,089,188** | **238,910,553** |
| 4.1 | **ආදායම් කාණ්ඩ** | | | | |
| | විදුලිය විකිණීම | 258,006,739 | 243,902,714 | 249,089,188 | 238,910,553 |
| | භාණ්ඩ විකිණීම | 6,889,127 | 4,820,639 | - | - |
| | ගැල්වනයිස් කිරීමේ මෙහෙයුම | 1,661,318 | 927,129 | - | - |
| | විදුලි බලාගාර කුලියට දීමෙන් ලද ආදායම | 16,920,361 | 7,951,833 | - | - |
| | මූල්‍යමය කල්බදු හා බලශක්ති ජනනය | 4,098,395 | 1,845,615 | - | - |
| | විදුලි බලාගාර මෙහෙයුම් සහ නඩත්තු සේවා | 3,530,556 | 4,772,257 | - | - |
| | වෙනත් මෙහෙයුම් | 91,892 | 45,765 | - | - |
| | | **291,198,388** | **264,265,952** | **249,089,188** | **238,910,553** |

**5. ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා ලබා දුන් සහන**

රු. 195,708,670 (2021) හා රු 5,907,769,841 (2020) ක මුදලින් නියෝජනය වන්නේ කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2020 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ විදුලි බිල්පත් ගෙවීම සඳහා 2020 ජූලි 15 දිනැති අංක 20/1063/226/062 දරණ කැබිනට් තීරණය මත පදනම්ව ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා ලබා දුන් සහන මුදල වේ.

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2021 | 2020 | 2021 | 2020 |
| 6. | **වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ** | | | | |
| | ලාභාංශ ආදායම | 6,908,775 | 807,188 | 2,519,496 | 1,129,505 |
| | විදුලි පරිභෝජනය මත දඩ මුදල් | 4,704 | 6,232 | 4,704 | 6,232 |
| | පාරිභෝගික අයකිරීම් | 169,496 | 176,704 | - | - |
| | දේපළ පිරියත සහ උපකරණ විකිණීමේ ලාභ | 686,309 | 416,113 | 700,770 | 398,740 |
| | පාරිභෝගික දායකත්වය මත ක්‍රමක්ෂය | 4,481,332 | 3,841,968 | 4,058,249 | 3,440,050 |
| | රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | 20,882 | 20,511 | 15,068 | 14,718 |
| | විවිධ ආදායම් | 964,956 | 1,553,564 | 898,231 | 806,178 |
| | රාජ්‍ය ප්‍රදාන ආදායම් | 7,850 | 3,399 | 7,850 | 3,399 |
| | රජයේ දෙපාර්තමේන්තු ආදායම් | 204,145 | 198,208 | 204,145 | 198,208 |
| | ඇවර හානි | 199,570 | 202,861 | 199,570 | 202,861 |
| | අළු විකිණීම | 787,226 | 699,274 | 787,226 | 699,274 |
| | ටෙන්ඩර් ගාස්තු /ආපසු නොගෙවන තැන්පතු /ඇපකර අහිමි කිරීම් | 72,140 | 89,080 | 72,140 | 89,080 |
| | පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනීමේ කාර්යයන් මත ආදායම | 1,425,993 | 1,075,225 | 1,425,993 | 1,075,225 |
| | සේවා රැහැන් අයදුම්පත් ගාස්තු | 9,467 | 7,112 | 9,467 | 7,112 |
| | විදුලි බිල මත අයභාර | 790,027 | 746,548 | 790,027 | 746,548 |
| | විද්‍යුත් වාහන බලශක්ති කාඩ්පත් විකිණීම | 2 | 29 | 2 | 29 |
| | විනිමය හුවමාරු මත ලාභ/(අලාභ) | 1,564,890 | - | - | - |
| | | **18,297,764** | **9,844,016** | **11,692,938** | **8,817,159** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| **7.1** | **මූල්‍ය ආදායම** | **2021** | **2020** | **2021** | **2020** |
| | තැන්පතු මත පොලී ආදායම | 1,517,556 | 1,439,925 | - | - |
| | ණය පොළී ආදායම | 85,702 | 31,226 | - | - |
| | රාජ්‍ය සුරැකුම්පත් මත පොලී ආදායම | 312,332 | - | - | - |
| | ආයෝජනවලින් ලද පොලී ආදායම | 119,188 | 23,911 | 21,313 | 23,911 |
| | කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම | 1,113,238 | 1,262,025 | 971,408 | 1,126,374 |
| | සමෘද්ධි ණය මත පොලී ආදායම | 117,799 | 151,338 | 117,799 | 151,338 |
| | සම්බන්ධිත පාර්ශවයන්ට දුන් ණය මත පොලී ආදායම | 1,950 | - | 1,950 | 2,104 |
| | වෙනත් පාරිභෝගික ණය මත පොලී ආදායම | 18,908 | 34,045 | 18,908 | 34,045 |
| | | **3,286,673** | **2,942,470** | **1,131,378** | **1,337,772** |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| **7.2** | **මූල්‍ය පිරිවැය** | **2021** | **2020 ප්‍රතිප්‍රකාශිත** | **2021** | **2020** |
| | අයිරාවන් මත පොලී වියදම | 823,074 | 1,405,470 | 586,294 | 843,851 |
| | දිගුකාලීන/කෙටිකාලීන ණය ගැනීම සඳහා පොලී වියදම | 9,228,253 | 11,241,673 | 7,415,828 | 10,222,844 |
| | ව්‍යාපෘති ණය මත පොලී වියදම | 2,878,855 | 3,498,949 | 2,878,855 | 3,498,949 |
| | ණයකර පොළී ගිණුම් | 1,354,504 | - | 1,354,504 | - |
| | කල්බදු පොලී වියදම | 35,955 | 14,415 | 12,775 | 14,332 |
| | ස්වාධීන විදුලිබලශක්ති නිෂ්පාදකයින්ගෙන් විදුලි මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රමාද පොලී | 1,730,595 | 2,297,951 | 1,730,595 | 2,297,951 |
| | ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවූ ප්‍රමාද ගාස්තු | 6,448,291 | 2,632,905 | 6,448,291 | 2,632,905 |
| | පාරිභෝගික ණය සඳහා ලබාගත් ණය මත පොලී වියදම | 5,037 | 99,652 | 3,501 | 11,146 |
| | පාරිභෝගික තැන්පතු මත පොලී වියදම | 39,576 | 51,386 | - | - |
| | | **22,544,140** | **21,242,401** | **20,430,643** | **19,521,978** |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| **8.** | **බදු පෙර ලාභ/(අලාභ)** | **2021** | **2020 ප්‍රතිප්‍රකාශිත** | **2021** | **2020 ප්‍රතිප්‍රකාශිත** |
| | ගාස්තු අයකිරීම්/බැර කිරීම් වලට පසු ප්‍රකාශිත | | | | |
| | විගණන සේවා ගාස්තු (ප්‍රවර්තන වසර සඳහා) | 28,933 | 21,049 | 17,040 | 9,339 |
| | අධ්‍යක්ෂ පාරිශ්‍රමික | 129,906 | 149,497 | 4,061 | 3,471 |
| | ක්ෂය | 34,542,913 | 34,126,242 | 33,095,689 | 32,398,646 |
| | කාර්ය මණ්ඩල පිරිවැයට ඇතුළත් වන | | | | |
| | - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 1,301,341 | 1,148,638 | 1,067,140 | 1,117,957 |
| | - නිශ්චිත දායක සැලසුම් පිරිවැය - (EPF & ETF) | 4,795,792 | 3,676,302 | 4,371,493 | 3,316,570 |
| | - වෙනත් කාර්ය මණ්ඩල පිරිවැය | 46,059,399 | 37,153,458 | 42,379,538 | 33,754,346 |
| | දේපළ පිරියත සහ උපකරණ විකිණීම (ලාභය)/අලාභය | 120,585 | (48,658) | 135,046 | (31,285) |
| | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 60,831 | 44,868 | 48,442 | 35,993 |
| | මහජන සබඳතා හා දැන්වීම් ප්‍රචාරණය | 12,810 | 293,328 | - | 281,037 |
| | ආධාර | - | 1,169 | - | - |
| | රජයේ ප්‍රදාන | 15,068 | (20,511) | 15,068 | (14,718) |
| | අභාවිත හා සෙමින් චලනය වන භාණ්ඩ හානිකරණ සඳහා වෙන් කිරීම් | 337,770 | 15,069 | 331,159 | 71,706 |
| | ණය ගැතියන් හානිකරණය සඳහා වෙන්කිරීම් | 1,649,740 | 1,842,072 | 1,747,552 | 1,343,916 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| 9. | අදායම් බදු වියදම් | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2021 | 2020 | 2021 | 2020 |
| 9.1 | වර්තමාන අදායම් බදු | | | | |
| | වසරේ සාමාන්‍ය කටයුතු සඳහා අදායම් බදු | 2,491,911 | 2,681,859 | - | 52,970 |
| | පෙර වර්ෂ සඳහා අදායම් බදු වල උණ/(අධි) බදු ප්‍රතිපාදන | (16,292) | (66,620) | - | - |
| | පෙර වර්ෂ සඳහා ගැලපුම් මත වර්තමාන බදු සඳහා වූ ඌන අධි ප්‍රතිපාදන මත අධි භාර අයකිරීම - 25% | 714,474 | - | - | - |
| | | **3,190,093** | **2,615,239** | **-** | **52,970** |
| 9.2 | අදායම් බදු වියදම් | | | | |
| | විලම්භිත බදු අයකිරීම්/(ප්‍රතිවර්ථනය)-(සටහන 29) | 46,656 | (211,068) | - | - |
| | ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ ආදායම් බදු වියදම් | **3,236,749** | **2,404,171** | **-** | **52,970** |

| 9.3 | ප්‍රවර්තන බදු වියදම් හා ගිණුම්කරණ ලාභය අතර සැසඳුම | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2021 | 2020 | 2021 | 2020 |
| | බදු ගෙවීමට පෙර ලාභය | (6,016,120) | (51,529,989) | (21,450,369) | (60,433,492) |
| | බදු ගෙවීම පිණිස අනුමත කළ නොහැකි වියදම්/(ආදායම්) | 35,634,075 | 35,205,235 | 33,799,786 | 32,878,910 |
| | විශ්‍රාම වැටුපේ ශුද්ධ බලපෑම | 717,208 | 534,584 | 717,208 | 534,584 |
| | බදු ගෙවීම පිණිස අනුමත කළ හැකි වියදම්/(ආදායම්) | (45,765,389) | (41,098,960) | (43,389,025) | (39,577,777) |
| | ව්‍යාපාරික නොවන ආදායම/නිදහස් කළ ආදායම | (8,259,374) | (6,187,838) | (2,675,965) | (1,329,756) |
| | ඒකාබද්ධ කිරීමේ ගැලපීම | (18,403) | - | - | - |
| | වසර සඳහා ව්‍යාපාරික පාඩුව | **(32,998,365)** | **(61,324,924)** | **(32,998,365)** | **(67,927,531)** |
| | බදු සඳහා බදු ගෙවිය යුතු ව්‍යාපාරික ලාභය | **11,730,095** | **5,979,416** | **-** | **-** |
| | අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම් | 3,459,735 | 4,662,405 | 1,245,099 | 1,184,762 |
| | මුළු ව්‍යවස්ථාපිත ආදායම | 15,189,830 | 10,641,821 | 1,245,099 | 1,184,762 |
| | වසර තුළ උපයෝජනය කළ බදු අලාභය | (1,245,099) | (1,184,762) | (1,245,099) | (1,184,762) |
| | බදු ගෙවිය යතු ආදායම | **13,944,731** | **9,457,059** | **-** | **-** |
| | අදායම් බදු වියදම පහත අනුපාත යටතේ | | | | |
| | 28% බඟින් වූ සංයුක්ත බද්ද | 2,088,932 | 1,472,218 | - | - |
| | සහනදායි බදු අනුපාත | 44,065 | 487,710 | - | - |
| | 14% බැගින් වූ ලාභාංශ බද්ද | 233,626 | 721,930 | - | 52,970 |
| | ප්‍රවර්තන බදු වියදම | **2,366,623** | **2,681,859** | **-** | **52,970** |

සමූහයේ බදු වියදම් ගණනය කර ඇත්තේ සමූහය තුළ තනි සමාගම් වශයෙන් උපයන ලද බදු ගෙවිය යුතු ආදායම පදනම් කර ගෙනය.

### 9.3.2 බලාත්මක අදායම් බදු අනුපාත

පූර්ණ හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීම හා සහන භුක්ති විඳින පාලිත සමාගම් වල පහත දැක්වෙන ව්‍යාපාර හැර නේවාසික සමාගම් වල බදු වගකීම් ගණනය කරණු ලබන්නේ 28% සම්මත අනුපාතය මතය.

| පරිපාලිත/උප පරිපාලිත සමාගම | ව්‍යාපාර මෙහෙයුම් | බදු අනුපාතය |
|---|---|---|
| සීමාසහිත නිව්දු (පුද්) සමාගම | විදුලිබල උත්පාදනය | 14 % |
| සීමාසහිත නිව්දු අසුපිනිඇල්ල (පුද්) සමාගම | විදුලිබල උත්පාදනය | 14 % |
| ඉන්ෆ්‍රා ඇන්ඩ් ඉංජිනියරින් (පුද්) සමාගම | විදේශ ඉදිකිරීම් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති | 14 % |
| **විදේශීය උප පරිපාලිත සමාගම** | | |
| සීමාසහිත රාජ් ලංකා පවර් (පුද්) සමාගම | විදුලිබල උත්පාදන- බංගලාදේශය | බදු නිදහස් |
| සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම | විදුලිබල උත්පාදන- බංගලාදේශය | බදු නිදහස් |
| ෆෙනී ලංකා බලශක්ති පුද්ගලික සමාගම | විදුලිබල උත්පාදන- බංගලාදේශය | බදු නිදහස් |
| සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විජ් ගියර් (පුද්) සමාගම | ස්විච් ගියර් විකිණීම-ඉන්දියාව | 33 % |
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්) සමාගම | බලාගාර මෙහෙයුම් හා විදුලිබල උත්පාදන සහයක සේවා සැපයුම-සිංගප්පූරුව | 17.5% |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 10. දේපල පිරියත හා උපකරණ

### 10.1 සමූහය

### 10.1.1 සින්නක්කර වත්කම්

| දළ ධාරණ අගය පිරිවැය මත | 021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම්/ මාරු කිරීම්/ පවරා ගැනීම් | එකතු කිරීම් /ගැලපීම් | බැහැර කිරීම් / මාරු කිරීම් | බැහැර කිරීම් /ගැලපීම් | විකුණුම් සඳහා මාරු කිරීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 11,181,547 | 30,771 | 61,808 | - | - | - | 11,274,126 |
| ගොඩනැගිලි | 20,835,185 | 3,937,419 | 10,427 | - | (756) | - | 24,782,275 |
| සිවිල් වැඩ යන්ත්‍ර | 234,333,313 | - | - | - | - | - | 234,333,313 |
| පිරියත හා යන්ත්‍ර | 1,656,356 | 72,436 | 14,079 | (14,554) | - | - | 1,728,317 |
| ජනන විදුලි බලාගාර | 292,438,276 | 25,410,999 | (175,102) | (23,845) | - | - | 317,650,328 |
| සූර්ය බල PV පිරියත | 130,593 | 2,664 | 80,584 | - | - | - | 213,841 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ රැහැන් | 646,304,584 | 24,995,506 | 71,336 | (675,806) | (33,563) | - | 670,662,057 |
| මෝටර් වාහන | 13,616,147 | 2,845,273 | 17,009 | (184,466) | (2,114,472) | (50) | 14,179,441 |
| අනෙකුත් සැපයුම් යටිතල ව්‍යුහයන් | 24,159,113 | 907,248 | - | (114,152) | - | - | 24,952,209 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 7,535,227 | 545,377 | 3,427 | (27,018) | (77,290) | - | 7,979,723 |
| ලීබඩු හා සවිකිරීම් | 557,855 | 111,588 | 3,478 | (1,170) | 445 | - | 672,196 |
| යන්ත්‍ර හා මෙවලම් | 6,357,407 | 545,601 | 1,467 | (16,318) | (7,986) | - | 6,880,171 |
| බහාලුම් අංග | 6,744 | - | - | - | - | - | 6,744 |
| | **1,259,112,347** | **59,404,882** | **88,513** | **(1,057,329)** | **(2,233,622)** | **(50)** | **1,315,314,741** |

### 10.1.2 ව්‍යාපාති වත්කම්

| දළ ධාරණ අගය පිරිවැය හෝ තක්සේරු අගය මත | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම්/ මාරු කිරීම් / පවරා ගැනීම් | එකතු කිරීම්/ගැලපීම් | බැහැර කිරීම් / මාරු කිරීම් | බැහැර කිරීම් /ගැලපීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 199,543 | 38,744 | - | - | - | 238,287 |
| ගොඩනැගිලි | 6,370 | 193,237 | - | - | (5,577) | 194,030 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් රැහැන් | - | 2,915,974 | - | (2,915,974) | - | - |
| මෝටර් වාහන | 1,766,103 | 664,936 | 204,676 | (417,675) | - | 2,218,040 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 106,347 | 30,211 | 5,621 | (19,110) | (7,468) | 115,601 |
| ලීබඩු හා සවිකිරීම් | 28,635 | 4,308 | - | (3,443) | (20,157) | 9,343 |
| යන්ත්‍ර හා මෙවලම් | 60,823 | 817 | - | (640) | (991) | 60,009 |
| | **2,167,821** | **3,848,227** | **210,297** | **(3,356,842)** | **(34,193)** | **2,835,310** |

### 10.1.3 ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම්

| | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය තුල වැඩිවීම් | වත්කම් සඳහා මාරු කිරීම් | ප්‍රතිවර්ගීකරණය මාරුකිරීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම් - (සටහන් 10.3) | 157,869,513 | 68,855,732 | (29,168,454) | (26,921,867) | 170,634,924 |
| **මුළු දළ දරණ අගය** | **157,869,513** | **68,855,732** | **(29,168,454)** | **(26,921,867)** | **170,634,924** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 10. දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස...)

### 10.1.4 ක්ෂයවීම්

| සින්නක් කර වත්කම් | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය සඳහා අයකිරීම් | එකතු කිරීම්/ගැලපීම් | බැහැරකිරීම්/ මාරුකිරීම් | විකුණුම් සඳහා ගැලපීම් | විකුණුම් මාරු කිරීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | - | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | 7,702,914 | 600,493 | 1,060 | - | (134) | - | 8,304,333 |
| සිවිල් වැඩ | 83,092,411 | 3,568,792 | - | - | - | - | 86,661,203 |
| පිරියත හා යන්ත්‍ර | 1,222,630 | 118,942 | 6,790 | (1,980) | - | - | 1,346,382 |
| ජනන විදුලි බලාගාර | 181,367,707 | 10,996,161 | - | (118,128) | - | - | 192,245,740 |
| සූර්ය බල PV පිරියත | 24,585 | 8,830 | - | - | 16,246 | - | 49,661 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම රැහැන් | 274,025,597 | 16,588,699 | 2,878 | (210,449) | (5,269) | - | 290,401,456 |
| මෝටර් වාහන | 7,380,594 | 1,115,776 | 10,745 | (115,660) | - | (50) | 8,391,405 |
| අනෙකුත් සැපයුම් යටිතල ව්‍යුහයන් | 15,890,094 | 677,038 | - | (80,485) | - | - | 16,486,647 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 4,929,587 | 612,729 | 1,882 | (9,377) | (16,844) | - | 5,517,977 |
| ලීබඩු හා සවිකිරීම් | 418,383 | 65,223 | 1,279 | (937) | - | - | 483,948 |
| යන්ත්‍ර හා මෙවලම් | 4,710,432 | 529,753 | 1,303 | (1,050) | (706) | - | 5,239,732 |
| බහාලුම් අංග | | - | - | - | - | - | 6,744 |
| | **580,771,678** | **34,882,436** | **25,937** | **(538,066)** | **(6,707)** | **(50)** | **615,135,228** |

### 10.1.5 ක්ෂයවීම්

| ව්‍යාපෘති වත්කම් | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | කෙරීගෙන යන වැඩ ගිණුමට අයකිරීම්/මාරු කිරීම් | එකතු කිරීම්/ගැලපීම් | බැරකිරීම්/ ගැලපීම් | විකුණුම් සඳහා ගැලපීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | 830 | 159 | - | - | (892) | 97 |
| සිවිල් වැඩ | - | - | - | - | - | - |
| පිරියත හා යන්ත්‍ර | | | | | | |
| ජනන විදුලි බලාගාර | - | - | - | - | - | - |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම රැහැන් | - | - | - | - | - | - |
| මෝටර් වාහන | 848,348 | 194,960 | 204,676 | (223,013) | - | 1,024,971 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 88,540 | 11,024 | 937 | (9,765) | (7,467) | 83,269 |
| ලීබඩු හා සවිකිරීම් | 25,005 | 1,065 | - | (502) | (18,623) | 6,945 |
| යන්ත්‍ර හා මෙවලම් | 43,068 | 8,931 | - | (364) | (506) | 51,129 |
| | **1,005,791** | **216,139** | **205,613** | **(233,644)** | **(27,488)** | **1,166,411** |

### 10.1.6 ශුද්ධ පොත් අගය

| පිරිවැය හෝ තක්සේරු අගය මත | 2021 |
|---|---|
| සින්නක්කර ඉඩම් | 11,512,413 |
| ගොඩනැගිලි | 16,671,875 |
| සිවිල් වැඩ | 147,672,110 |
| පිරියත හා උපකරණ | 381,935 |
| ජනන විදුලි බලාගාර | 125,404,587 |
| සූර්ය බල පිරියත | 164,180 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ රැහැන් | 380,260,601 |
| මෝටර් වාහන | 6,981,106 |
| අනෙකුත් සැපයුම් යටිතල පහසුකම් | 8,465,562 |
| කාර්යාල හා වෙනත් උපකරණ | 2,494,078 |
| ලී බඩු හා සවිකිරීම් | 190,646 |
| යන්ත්‍ර හා මෙවලම් | 1,649,319 |
| | **701,848,412** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

**10. දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස...)**

**10.1 සමූහය (ඉතිරි කොටස...)**

**10.1.7 භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්**

| පිරිවැය | 2021.01.01 දිනට ශේෂය | එකතු කිරීම්/ගැලපීම් | අවසන් කිරීම්/ගැලපීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 742,732 | 228,971 | (14,391) | 957,312 |
| මෝටර් වාහන | 209,349 | 55,829 | (9,040) | 256,138 |
| | **952,081** | **284,800** | **(23,431)** | **1,213,450** |

| ක්ෂයවීම | 2021.01.01 දිනට ශේෂය | එකතු කිරීම්/ගැලපීම් | අවසන් කිරීම්/ගැලපීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 241,603 | 169,477 | (2,103) | 408,977 |
| මෝටර් වාහන | 17,326 | 18,200 | (1,614) | 33,912 |
| | **258,929** | **187,677** | **(3,717)** | **442,889** |

| ශුද්ධ පොත් අගය | 2021 | 2020 |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 548,335 | 501,129 |
| මෝටර් වාහන | 222,226 | 192,023 |
| | **770,561** | **693,152** |

| 10.1.8 දේපල පිරියත හා උපකරණ (භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්ද ඇතුලුව) | 2021 | 2020 |
|---|---|---|
| **ශුද්ධ පොත් අගය** | | |
| දේපල පිරියත හා උපකරණ (සටහන 10.1.6) | 701,848,412 | 679,502,699 |
| ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම් (සටහන් 10.1.3) | 170,634,924 | 157,869,513 |
| භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්ද අතුළුව (සටහන 10.1.7) | 770,561 | 693,152 |
| **මුළු දේපල පිරියත හා උපකරණ වල වටිනාකම** | **873,253,897** | **838,065,364** |

**10.1.9** 31.12.2021 දිනට සමූහය සතු සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණ වල ධාරණ අගය රු.මි 207,710 කි (2020.12.31 දිනට එය රු.මි 197,123 කි)

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 10. දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස...)

### 10.2 මණ්ඩලය

#### 10.2.1 දළ ධාරණ වටිනාකම

| සින්නක්කර වත්කම් පිරිවැය හෝ තක්සේරු අගය මත | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් මාරු කිරීම් පවරා ගැනීම් | එකතු කිරීම්/ ගැලපීම් | බැහැර කිරීම්/ මාරු කිරීම් | බැහැර කිරීම් ගැලපීම් | විකිණීම සඳහා රඳවා ඇති වත්කම් වලට මාරු කිරීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 9,568,081 | 7,214 | - | - | - | - | 9,575,295 |
| ගොඩනැගිලි | 19,722,834 | 3,772,793 | - | - | (756) | - | 23,494,871 |
| සිවිල් වැඩ යන්ත්‍ර | 234,333,313 | - | - | - | - | - | 234,333,313 |
| පිරියත හා යන්ත්‍ර | 766,745 | 30,449 | - | (11,508) | - | - | 785,686 |
| ජනන විදුලි බලාගාර | 288,956,815 | 25,081,281 | (175,102) | (23,845) | - | - | 313,839,149 |
| සූර්ය බල පිරියත | 13,737 | 2,664 | 80,584 | - | - | - | 96,985 |
| සම්ප්‍රේෂණ හා බෙදා හරීම රැහැන් | 646,304,584 | 24,995,506 | 71,336 | (675,806) | (33,563) | - | 670,662,057 |
| මෝටර් වාහන | 11,807,735 | 2,811,306 | 240 | (176,701) | (2,114,472) | (50) | 12,328,058 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 3,403,130 | 332,531 | 876 | (19,015) | (77,290) | - | 3,640,232 |
| ලිඛඩු හා සවිකිරීම් | 480,783 | 95,545 | 192 | (879) | 445 | - | 576,086 |
| යන්ත්‍ර හා මෙවලම් | 6,238,268 | 542,824 | 1,467 | (16,318) | (7,986) | - | 6,758,255 |
| | **1,221,596,025** | **57,672,113** | **(20,407)** | **(924,072)** | **(2,233,622)** | **(50)** | **1,276,089,987** |

#### 10.2.2 ව්‍යාපාති වත්කම්

දළ ධාරණ වටිනාකම

| සින්නක්කර වත්කම් පිරිවැය හෝ තක්සේරු අගය මත | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් මාරු කිරීම් පවරා ගැනීම් | එකතු කිරීම්/ ගැලපීම් | බැහැර කිරීම්/ මාරු කිරීම් | ගැලපීම් | විකිණීම සඳහා රඳවා ඇති වත්කම් වලට මාරු කිරීම් | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 199,543 | 38,744 | - | - | - | - | 238,287 |
| ගොඩනැගිලි | 6,370 | 193,237 | - | - | (5,577) | - | 194,030 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් රැහැන් | - | 2,915,974 | - | (2,915,974) | - | - | - |
| මෝටර් වාහන | 1,766,103 | 664,936 | 204,676 | (417,675) | - | - | 2,218,040 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 106,347 | 30,211 | 5,621 | (19,110) | (7,468) | - | 115,601 |
| ලිඛඩු හා සවිකිරීම් | 28,635 | 4,308 | - | (3,443) | (20,157) | - | 9,343 |
| යන්ත්‍ර හා මෙවලම් | 60,823 | 817 | - | (640) | (991) | - | 60,009 |
| | **2,167,821** | **3,848,227** | **210,297** | **(3,356,842)** | **(34,193)** | - | **2,835,310** |
| **ක්ෂය කළ හැකි වත්කම් වල මුළු වටිනාකම** | **1,223,763,846** | **61,520,340** | **189,890** | **(4,280,914)** | **(2,267,815)** | **(50)** | **1,278,925,297** |

#### 10.2.3 ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම්

| | 2021.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය තුළ අයකරන ලද | දේපළ පිරියත උපකරණ වෙත මාරු කිරීම | නැවත වර්ගීකරණය කිරීම/ මාරු කිරීම | 2021.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 154,671,838 | 66,897,017 | (28,185,858) | (26,924,139) | 166,458,858 |
| දළ ධාරණ අගය | **154,671,838** | **66,897,017** | **(28,185,858)** | **(26,924,139)** | **166,458,858** |

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීමේ හා සඵල අධීක්ෂණයේ සමස්ථ වගකීම රඳා පවතිනුයේ, අධ්‍යක්ෂක මණ්ඩලය මතය. සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටි ස්ථාපිත කරනුයේ සමූහය විසින් මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වයන් හඳුනා ගෙන විශ්ලේෂණය කිරීමට, උචිත අවදානම් සීමාවන් හා පාලක නියම කිරීම, අවදානම් හා සීමාවන්ට අනුකූලවීම හා පසු විපරම් සඳහාය.

සමූහයේ අවදානම් සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටිවලට අනුකූලව කළමනාකරණය විසින් පසුවිපරම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කනු ලබන අතර සමූහය විසින් මුහුණ පාණු ලබන අවදානම් වලට අදාළව අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත් බව සමාලෝචනය කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණ භූමිකාවට සහාය ලබා දෙයි.

### 40.3 ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය වගකීමට සම්බන්ධව බැඳීමක් ඉටු කිරීමට අපොහොසත්වීම තුළින් මූල්‍ය කළමනාකරණයක එක් පාර්ශවයක් අනෙක් පාර්ශවයට මූල්‍ය පාඩුවක් ඇති කිරීමේ අවදානමයි.

**ලංකා විදුලිබල මණ්ඩලයේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ණය ප්‍රතිපත්තිය පහත දැක්වේ.**

බිල්පත් පියවීම සඳහා තොග පාරිභෝගිකයන්ට දින 15 ක ණය කාලසීමාවක් ලබා දෙන අතර ඉන්පසුව සැපයුම විසන්ධි කිරීමේ නිවේදනයක් නිකුත් කර නිවේදනයේ දින සිට වැඩිමනත් දින 10 ක් ලබා දේ.එයට අවනත නොවන්නේ නම් සැපයුම විසන්ධි කරනු ඇත.

බිල්පත් පියවීම සඳහා සාමාන්‍ය පාරිභෝගිකයන්ට දින 30 ණය කාල සීමාවක් ලබා දෙනු ඇත. මෙයින් අනතුරුව රතු නිවේදනයක් නිකුත් කර වැඩි මනත් දින 10 ක් ලබා දෙයි. දින 40 කින් පසුව එයට අවනත නෙවන්නේ නම් සැපයුම විසන්ධි කිරීම පිණිස විසන්ධි කිරීමේ නියෝගයක් නිකුක් කරනු ඇත.

එක් එක් පාරිභෝගිකයාගේ ණය සුදුසුකම් සැලකිල්ලට ගනිමින් පහසුකම් ලබා දීමට පෙර ණය ලබා දීමේ යෝග්‍යතාවය විශ්ලේෂණය කරනු ලැබේ. සඵල පාලනය හා කාලීනව ණය ආපසු ලබා ගැනීම පිණිස ණයකරුවන්ගේ ණය වටිනාකම අනුව සිදු කෙරෙන විශ්ලේෂණයකින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිඵලදායි ණය පාලන ක්‍රියාවලියක් සමූහය විසින් ක්‍රියාවට නංවා ඇත.

### 40.4 ද්‍රවශීලතා අවදානම

පැන නගින අවස්ථාවන්හිදීම සිය බැඳීම් සපුරාලීම පිණිස ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් නොතිබීම නිසා සමූහයේ ද්‍රවශීලතා අවදානම් අවස්ථාවන් ඇතිවේ. ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුගේ විශ්වාසය පළුදු වීම තුළින් සමූහයේ තරලකාරී තත්වය දුර්වල කරමින් ප්‍රමාණවත් ද්‍රවශීලතා සම්පත් නොතිබීම සමූහයේ මෙහෙයුම්වලට අහිතකර බලපෑමක් ඇති කළ හැකිය.

සියලුම ක්ෂේත්‍ර ආවරණය වන උපාය මාර්ගික ක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන අතර එමගින් ලැබිය යුතු දෑ ඉතා සමීපව අධීක්ෂණය කර කාල පරාසය අවම කර ගැනීමට කටයුතු කෙරේ. විකුණුම්කරුවන් ප්‍රවේශමෙන් අගැයීම හා ප්‍රසම්පාදන උපාය මාර්ග තුලින් ලබා ගැනීම තහවුරු කරනු ලබන අතර උපරිම ණය කාල සීමාවක් ලබාගැනීමෙන් කාරක ප්‍රාග්ධන චක්‍රය ප්‍රශස්ථ මට්ටමට පවත්වා ගැනේ.

මෙහෙයුම් හා වෙනත් මූල්‍යන අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෙටි හා මධ්‍ය කාලීන මූල්‍ය උපකරනයන්හි ආයෝජනය කිරීම මගින් සමූහය විසින් සිය ද්‍රවශීලත්වය පවත්වා ගෙන යයි. සහනදායී පොළී අනුපාත මත අයිරා සීමාවන් වැඩි කර ගැනීම පිණිස බැංකුව සමග වන කතිකාවන් තුළින් කෙටි කාලීන ද්‍රවශීලතා ගැටළු ලිහිල් කරගනු ලැබේ. ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලතා වත්කම් නොතිබීම තුලින් සමූහයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර බලපෑමක් ඇති කල හැකි අතර එමගින් ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුවන්ගේ විශ්වාසය පළුදු වී තරලකාරිත්වය දුර්වල විය හැකිය.

### 40.5 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු වෙළඳපල මිල ගණන්වල වෙනස්වීම් නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්හි සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල අවධානම මුදල් අවධානම හා පොළී අනුපාත අවධානමෙන් සමන්විත වේ. වෙළඳපොල අවධානමෙන් බලපෑමට ලක්වන මූල්‍ය උපකරණවලට පොළී සහිත ණය ගැනීම්, තැන්පතු හා විකිණීමට තිබෙන ආයෝජන ඇතුළත් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

**40.5.1 විදේශීය ව්‍යවහාර මුදල් අවදානම**

ව්‍යාපාර සමූහයට අයත් ආයතනයන් හී භාවිතයේ පවත්නා අදාල ව්‍යවහාර මුදල් වලට ඇතුලත් නොවන යම් ව්‍යාවහාර මුදලකින් සිදු කෙරෙන විකුණුම් / මිලදී ගැනීම් වලදී සමූහය ව්‍යවහාර මුදල් අවදානමට අනාවෘතවේ. මෙම ගනුදෙනු ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් හෝ යුරෝ ව්‍යවහාර මුදල් මගින් නියම කෙරේ. යම් කාලපරාසයක් තුල සිදුවන විනිමය අනුපාත ගනුදෙනුවලට එරෙහිව අභ්‍යන්තර වශයෙන් ආරක්ෂක පියවර ගනිමින් එම ව්‍යාපාර සමූහය විසින් ව්‍යවහාර මුදල් කෙරේ ඇති අවධානම අවම කෙරේ. ගෙවීම් කිරීමට අවශ්‍ය වන එසේ ගෙවීමට සිදුවන විට එම ගෙවීම සිදු කිරීම සඳහා උපයෝගී කර ගැනීම පිණිස අනාගත ගෙවීම් වලට සමාන වන මුදල් ප්‍රමාණයක් කෙටිකාලීන ආදායම් උත්පාදන මෙවලම් වලට යොදනු ලබයි.

**40.5.2 පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපල පොලී අනුපාතයන්හි වෙනස්වීම නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් අදාළ වන්නේ පාවෙන පොලී අනුපාත සහිත සමූහයේ දීර්ඝ කාලීන ණය බැඳීම්වලටය. සමූහය විසින් ලබා ගන්නා ණය මුදල්වල පොලී අවදානම සමූහය මගින් කළමනාකරණය කරනුයේ, ස්ථාවර හා පාවෙන පොළී අනුපාත වලින් සම්මිශ්‍රණයවූ ණය ලබාගැනීමේ මෙන්ම තැන්පතු ද පවත්වා ගෙන යාමෙන් වන අතර එමගින් වෙළඳපොල පොළී අනුපාත උච්චාවචනයෙන් ආවරණය කෙරේ. පොලී අනුපාතයන් අවම කිරීම පිණිස රජයේ ආයතනයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාසිදායක පොලී අනුපාත සඳහා බැංකුව සමග කතිකාවත් පවත්වයි.

**41 සධාරණ අගය**

වර්ථමාන ගණුදෙනුවකදී මිනුම්කරණ දිනයට පෙළඹවීමකින් හෝ බලහත්කාරයෙන් තොරව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර මූල්‍ය වත්කම් පැවරීමට හෝ වගකීම් බේරුම් කිරීමට ගෙවන වටිනාකම මගින් මූල්‍ය වත්කම් හා වගකීම් වල සධාරණ අගය සමන්විත වේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රම සහ උපකල්පන භාවිතා කරන ලදී:

අ) මුදල් හා මුදල් සමාන දෑ, වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු, බැංකු අයිරා සහ අනෙකුත් ජංගම වගකීම් වල පවතින කෙටිකාලීනව කලිපිරීම් ස්භාවය හේතුවෙන් ඒවා ධාරණ අගයට මිනුම් කිරීමට කළමණාකරණය කටයුතු කරන ලදි.

අ) පොලී අනුපාත, නිශ්චිත අවධානම් සාධක, එක් එක් ගනුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘතියේ අවදානම වැනි සාධක මත පදනම්ව සමූහය විසින් දිගු කාලීන ස්ථාවර අනුපාත යටතේ සහ විචල්‍ය අනුපාත යටතේ ලැබිය යුතු දේ අගයකරනු ලැබීය. එසේ කරනු ලැබූ ඇගයීම මත පදනම්ව ලැබිය යුතු දේවල අපේක්ෂිත අලාභ සඳහා දීමනා සැලකිල්ලට ගනී. ඒ අනුව 2019 දෙසැම්බර් 31 වන විට, එවැනි ලැබිය යුතු දේ, සහ ශුද්ධ දීමනාවල ධාරණ අගය ඒවායේ ගණනය කරන ලද සාධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවීය.

**41.1 සධාරණ අගයට මිණුම්කරණය කරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර**

සධාරණ අගයට මිණුම්කරණය කරන ලද පහත දැක්වෙන මූල්‍ය කාර්යසාධන පත්‍ර සමූහය සතුවේ

වෙනත් විස්තීරණ ආදායම් යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම් (සටහන් 15)

ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම් (සටහන් 15)

**41.2 සධාරණ අගයට මිණුම්කරණය නොකරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර**

මූල්‍ය ප්‍රකාශනයන්හී සාධාරණ අගයට මිණුම්කරණය කර දක්වා නොමැති මූල්‍ය කාර්යසාධපත්‍ර වල ධාරණ අගය හා සධාරණ අගය අතර සැසඳීමක් පහතින් දක්වා ඇති අතර එහි ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගයට සමාන වන කාර්ය සාධන පත්‍රවල වල තොරතුරු ඇතුලත් නොවේ. තවද මූල්‍ය නොවන වත්කම් හා වගකිම් වල සාධාරණ අගයද මේ සඳහා සැලකිලල්ට ගෙන නොමැත.

| | ධාරණ අගය | | සාධාරණ අගය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | 82,646 | 68,676 | 82,646 | 68,676 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | 23,500,045 | 28,485,598 | 23,500,045 | 28,485,598 |
| ප්‍රතිමිළදී ගැනීමේ ගිවිසුම් වල ආයෝජන | 3,350,369 | 199,700 | 3,350,369 | 199,700 |
| වෙනත් තැන්පතුවල ආයෝජනය | 125,945 | 1,759,276 | 125,945 | 1,759,276 |
| සමාගම් නිලධාරීන්ට ණය | 10,519,701 | 10,454,647 | 10,519,701 | 10,454,647 |
| පාරිභෝගිකයන්ට ණය | 1,237,538 | 2,771,005 | 1,237,538 | 2,771,005 |
| ණයකර සඳහා ආයෝජනය කිරීම | 62,406 | 202,117 | 54,828 | 193,168 |
| | **38,878,650** | **43,941,019** | **38,871,072** | **43,932,070** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය...)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 41.3 සාධාරණ අගය ධූරාවලිය

ලයිස්තුගත මිළ ගනන් හෝ නිරීක්ෂණය කළ හැකි මිළකරන ක්‍රමයන් භාවිතා කරමින් සාධාරණ අගයන් තීරණය කරනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණය කිරීම් හෝ වලංගු කිරීම් ලබා ගනී. ක්‍රියාකාරී වෙළඳපොලක වෙළඳ මිලක් සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි විය හැකිය. මෙම තත්වයන් තුළ, සමූහය මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා වඩාත් අදාළ හා විශ්වාසදායක යැයි සැලකෙන තොරතුරු වලට වැඩි බරක් ලබා දෙමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

පහත දැක්වෙන අනුපිළිවලට සධාරණ අගය නිර්ණය කරනු ලබයි

**පියවර 1 :** සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලවල ලයිස්තුගත මිල ගණන් (සකස් නොකළ)

**පියවර 2 :** වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල හැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

**පියවර 3 :** වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල නොහැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

2021 දෙසැම්බර් 31 දින වන විට සමූහය විසින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුල සාධාරණ අගයට හඳුනාගෙන ඇති මූල්‍ය උපකරණ පහත පරිදිවේ.

| සාධාරණ අගයට මිණුම් කරන ලද වත්කම් | තක්සේරු දිනය | 2021 | පියවර 1 | පියවර 2 | පියවර 3 |
|---|---|---|---|---|---|
| **වෙනත් විස්තීරණ ආදායම් යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්** | | | | | |
| ලයිත්තුගත නොකරන ලද ස්කන්ධ ප්‍රග්ධනය | 31-දෙසැ-21 | 14,931,752 | - | - | 14,931,752 |
| **ලාභ/අලාභ ප්‍රකාශය යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්** | | | | | |
| ප්‍රාග්ධන සුරකුම්පත් වල ආයෝජන | 31-දෙසැ-21 | 338,548 | 338,548 | - | - |
| **සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම්** | | | | | |
| ණයකර වල ආයෝජන | 31-දෙසැ-21 | 54,828 | 54,828 | - | - |

### සාධාරණ අගය විස්තීර්ණ ආදායම තුලින් ගලපනු ලබන මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් පිළිබඳ විස්තර

#### ලංකා විදුලි(පුද්ගලික) සමාගම

ලයිස්තුගත නොකල කොටස් වල ආයෝජනවල සාධාරණ වටිනාකම වෙළඳපල බහුවිධ ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කර ඇත. මෙම ක්‍රමය යටතේ ව්‍යාපාරයේ අපේක්ෂිත අනාගත ඉපයීම් සුදුසු ගුණිතයක් භාවිතයෙන් ගුණකර එය ව්‍යාපාරයේ වටිනාකම ලෙස ප්‍රග්ධණිතකරයි. සමාගම පොළී හා බදු පෙර ලාභය ඉපැයීමේ පදනම ලෙස භාවිතා කරයි. වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ සාධාරණ වටිනාකම සමාලෝචනය කිරීමේදී එක හා සමාන ව්‍යාපාර ස්භාවයක් ඇති ආයතන අධ්‍යනය කිරීමට අවධානය යොමු කරන ලදි. එහිදි ආසියානු කලාපයේ පොසිල ඉන්ධන භාවිතා කරමින් විදුලිය සැපයීමට සම්බන්ධ ලැයිස්තුගත සමාගම් විශ්ලේෂණය කරන ලද අතර මෙහෙයුම් වල ස්වභාවය සහ ආයතනවල විශාලත්වය මත පදනම්ව මෙම තක්සේරු කරීම් සිදුකරන ලදී.

වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සුළු කොටස් අයිතියක් පැවතීම හේතුවෙන් කළමනාකරණයට ව්‍යාපාරයේ අභ්‍යන්තර තොරතුරු සදහා සෘජුවම ප්‍රවේශ විය නොහැක. කෙසේ වෙතත්, කර්මාන්තයේ ස්වභාවය සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ පොදු ලක්ෂණ සලකා බැලීමේදී, වත්කම් හා වගකීම්වල වෙළඳපල වටිනාකම් 2019 දෙසැම්බර් 31 දිනට වාර්තා කර ඇති ධාරණ වටිනාකමට සමාන යැයි උපකල්පනය කෙරේ. සමාගම වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමේ සම කොටස් අයිතියෙන් 18.8% ක් හිමිකරගෙන ඇත.

#### එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සාමාගම

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් ලයිස්තුගත නොකරන ලද සමාන්‍ය කොටස්වල සාධාරණ අගයන් තක්සේරු කර ඇත. තක්සේරු කිරීම සඳහා පුරෝකථනය කල මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාතය ආදිය පිළිබද උපකල්පන කළමණාකරනය විසින් සිදුකරනු ලැබේ. පරාසයක් තුළ ඇති විවිධ ඇස්තමේන්තු වල සම්භාවිතාව සාධාරණ ලෙස තක්සේරු කරමින් කළමනාකරණය ඇස්තමේන්තුගත සාධාරණ ආයෝජනය වටිනාකම් නිර්ණය කරනු ලැබේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PWR/A/CEB/FA/1/21//18 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date 27 October 2022

සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ (''මණ්ඩලය'') සහ එහි පරිපාලිත සමාගම්වල (''සමූහය'') 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශණය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. පරිපාලිත සමාගම් වන එල්.ටී.එල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් සහ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1.2.1.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදි.**

**(අ) සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම**

(i) ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (එල්.කේ.ඒ.එස් 12) හි 88 වන ඡේදයට අනුව, එකතු කළ අගය මත බදු තක්සේරු කිරීම් සම්බන්ධයෙන් 2017/2018 සහ 2018/2019 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු අතිරේක බදුවලට අදාළව රු. 287,139,348 ක් සහ ඒ මත ගෙවිය යුතු දඩ මුදල්වලට අදාළව රු. 220,628,092 ක් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.

(ii) නැව්ගත තොග 154 ක අවිනිශ්චිත ගිණුම්වලට අදාළව රු. 33,317,325 ක් සහ මණ්ඩලයේ ප්‍රසම්පාදන ගල් අඟුරු අවසන් ශේෂයෙන් ලැබිය යුතු අත්තිකාරම්වලට අදාළව රු. 1,760,500 ක් සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් පියවා නොතිබුණි.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(iii) ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනකමට එකතු කරන ලදි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. 5,324,423,778 ක් වූ සියයට 10 ක අංකිත මිල ආදායමට එකතු කර තිබූ අතර පසුව සමාගම විසින් ණයගැතියන්ට එය වට්ටමක් ලෙස ලබා දී විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(iv) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 197,452,711 ක වැට් බදු සහ වෙනත් ලැබිය යුතු දෑ මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. තවද, මණ්ඩලය සිය මූල්‍ය ප්‍රකාශනවල මෙම වගකීම හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, එම මුදල්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(v) සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. 22,502,205 ක් වූ කළමනාකරණ ගාස්තු වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතී. කෙසේවෙතත්, මේ සම්බන්ධව කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

(vi) පවතින තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. 205,000,000 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට සමාගම විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2019 දී ගෙවන ලද දඩ මුදල අදාළ වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රඳවා ගත් ඉපැයීම් රු. 205,000,000 කින් වැඩියෙන් දැක්වුණු අතර ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුම පිළිවෙලින් රු. 158,186,165 කින්, රු. 39,970,418 කින් සහ රු. 6,843,417 කින් අඩුවෙන් දැක්වුණි.

(vii) සී/ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ලිමිටඩ් මඟින් (ටී.අයි.එස්.සී.එල්) රු. 539,192,079 ක දිගු කාලීනව හිඟ ලැබිය යුතු ශේෂය අය කර ගැනීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. තවද, ටී.අයි.එස්.සී.එල්/සී.එස්.සී.එල් විසින් මෙම ශේෂය තහවුරු කර නොතිබුණි. එම නිසා, ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.

(viii) රු. 18,075,801 ක් වූ විවිධ ණයගැති ශේෂය, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් හි රු. 1,115,987 ක ලැබිය යුතු ශේෂය, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් හි රු. 85,887,776 ක වෙළෙඳ ණය හිමියන් සහ ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන රු. 8,048,531 ක් තහවුරු කිරීමට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.

(ix) සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. 136,236,370 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව, තථ්‍ය වැට් බදු මුදල රු. 106,969,404 ක් විය. ඒ අනුව, සමාගම වැඩිපුර රු. 29,266,965 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(x) සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය සහ එදිනට ලංකා නැව් සංස්ථාව විසින් තහවුරු කරන ලද ශේෂය අතර රු. 4,003,372 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි. කෙසේ වෙතත්, එම වෙනස සැසඳීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xi) සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. 2,362,129 ක ගෙවිය යුතු ශේෂයට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ආ) සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම

(i) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයෙන් විවිධ සේවා සඳහා අයවිය යුතු ශේෂය රු. 1,343,821,164 ක් වූ අතර එහි ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017, 2019 සහ 2020 වර්ෂ සඳහා මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද බලශක්තිවල පිරිවැය වූ රු.1,336,859,095 ක් ඇතුළත්ව තිබුණි. කෙසේ වෙතත්, එම මුදල සඳහා ශේෂ තහවුරු කිරීම් විගණනයට ලැබී නොතිබුණි. තවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වගකීම හඳුනාගෙන නොතිබුණි.

(ii) 2021 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස් සඳහා කරන ලද රු. 5,000,000 ක ආයෝජනයට අදාළ කොටස් සහතික හෝ වෙනත් ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.

(iii) පාරිභෝගිකයින්ගෙන් එකතුකර ගත් හඳුනා නොගත් රු. 14,731,287 ක් ප්‍රතික්ෂේප කරන ලද ගිණුමෙන් මාරු කර ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණය හිමියන්ගේ ශේෂය යටතේ පෙන්වා තිබුණි.

(iv) මණ්ඩලයේ ප්‍රාථමික උපපොලවල් ඉදිකිරීමට භාවිතා කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීමට සමාගම විසින් රු. 206,924,712 ක් වියදම් කර තිබුණු අතර එම මුදල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ඉඩම්වල ප්‍රාථමික උපපොළවල් පිහිටුවීම සහ ඉහත සඳහන් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි.

(v) 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වන වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත ක්‍රියාවලියක් සිදු කිරීමෙන් පසුව පාඩු කපා හැරිය හැකි අතර කපා හැරීම් පිළිබඳ විගණන කමිටුවේ නිර්දේශ ඇතුළුව නියමිත ක්‍රියාවලියක් අනුගමනය කරන බවට සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාගම මේ සම්බන්ධයෙන් එම ක්‍රියාවලිය අනුගමනය කර නොතිබූ අතර වීදි ලාම්පු සඳහා මහ නගර සභා සහ පළාත් සභාවලින් අයවිය යුතු රු. 387,806,335 ක් වූ ණයගැති ශේෂය 2021 නොවැම්බර් 30 දින ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව සමාලෝචිත වර්ෂය තුළ කපා හැර තිබුණි.

(vi) වසරේ අවසාන මාසය තුළ තොග නොවන පාරිභෝගිකයින්ගෙන් උපයාගත් ආදායම ඊළඟ වසරේ තොග නොවන පාරිභෝගිකයන්ගෙන් ලැබෙන ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් මාසයේදී තොග නොවන පාරිභෝගිකයින්ගෙන් ලැබුණු ආදායම 2021 ජනවාරි මාසයේ ආදායම ලෙස හඳුනාගෙන තිබූ අතර, අනෙකුත් වසර සඳහා එම පරිචය අඛණ්ඩව යෙදාගෙන තිබුණි. එම නිසා, තොග නොවන පාරිභෝගිකයින්ගෙන් ලැබෙන ආදායමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය නිසි ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 1.2.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්.එල්.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම.

(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව

(i) සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම් ලෙස රු. මිලියන 53.63 ක් මණ්ඩලය සිය ආදායම් ප්‍රකාශණයේ හඳුනාගෙන තිබුණි.

(ii) සංකල්ප රාමුවේ 4.3 ඡේදයට පටහැනිව, අයිතිය මණ්ඩලය සතු රු. මිලියන 8 ක් වටිනා වත්කම් සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ආ) **එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතුව රු. බිලියන 4.04 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිළ විචලනයක් පැවතුණි. තවද, රු. බිලියන 1.78 ක් වූ අහිතකර ශ්‍රමබඩා මිළ විචලනයක් පැවතුණි. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) **එල්.කේ.ඒ.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි**

මණ්ඩලය විසින් අඛණ්ඩව ප්‍රයෝජනයට ගනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.6 (ඉ) සහ 3 (ඇ) සඳහන් පරිදි සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ඒ අනුව, සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. බිලියන 197.21 ක දේපළ, පිරියත හා උපකරණ එහි ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව තක්සේරු නොකර මණ්ඩලය භාවිතා කර තිබුණි. තවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී එහි වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කර තිබූ අතර, ඒ අනුව රු. බිලියන 3.17 ක් මූල්‍ය ප්‍රකාශනවල අතීතයට බලපාන පරිදි ගලපා තිබුණි.

(ඈ) **එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල වටිනාකම රු. බිලියන 202.9 ක් වූ අතර ඒ අතුරින් රු. බිලියන 201.01 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

### 1.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණ අංක 10/2434/423/034 ට අනුව, ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගත් රු. බිලියන 159.18 ක් වූ මුළු ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්.සී.සී) භාණ්ඩාගාරය විසින් පැවරිය යුතුය. ඒ අනුව ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදලට සමාන මුදලක් මණ්ඩලය විසින් එල්.සී.සී වෙත ගෙවිය යුතුය. තවද, භාණ්ඩාගාර ලේකම්ගේ 2014 සැප්තැම්බර් 30 දිනැති අංක PE/EN/CEB/Equity/2014 දරන ලිපිය අනුව, මෙම ණය මණ්ඩලයේ ඍජු ණය ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණය ලෙස මණ්ඩලය මෙම ණය වාර්තා කර තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන සහ ජංගම වගකීම් යටතේ ණය ශේෂයේ දිගු කාලීන සහ කෙටි කාලීන කොටස් වෙන වෙනම හඳුනා ගැනීමට ගිණුම්කරණ වැඩපිළිවෙළක් ඇති බවට මණ්ඩලය සහතික විය යුතුය. වර්ෂය සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු පොලිය නිසි පරිදි හඳුනාගෙන තිබිය යුතු වුවද, මණ්ඩලය විසින් කිසිදු වැඩපිළිවෙළක් සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ණය ආපසු ගෙවීම ලෙස 2018 දෙසැම්බර් 31 දිනට පෙර මහා භාණ්ඩාගාරය විසින් කරන ලද රු. බිලියන 61 ක මුදලක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධය ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ii) 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 42 (6) වගන්තිය අනුව, මණ්ඩලයට ලබා දුන් ණයකට අදාළව ශ්‍රී ලංකා රුපියල නැවත ඇගයීම සම්බන්ධව යම් අලාභයක් හෝ ලාභයක් ඒකාබද්ධ අරමුදලට අය කළ යුතු අතර එම අලාභය හෝ ලාභය රජය විසින් දරනු ලබයි. කෙසේවෙතත්, 2020 සහ 2021 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. මිලියන 6,700 ක සහ රු. මිලියන 676.37 ක විනිමය අලාභයක් මණ්ඩලයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට අතුළත් කර තිබුණි. එම නිසා, 2020 සහ 2021 වසරවල අලාභය පිළිවෙලින් රු.මිලියන 6,700 කින් සහ රු. මිලියන 676.37 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) තොග හිඟයට අදාළ රු. මිලියන 123.86 ක හර ශේෂයක් සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 32.65 ක බැර ශේෂයක් නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඇ) ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 න් පසුව විදේශ ණයවලින් ලද රු. බිලියන 25.23 ක් මහා භාණ්ඩාගාරයෙන් ලද උප ණය ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණි. කෙසේවෙතත්, මෙම ණය ජනරජ ගිණුමේ උප ණය ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, 2015 මාර්තු 18 දිනැති කැබිනට් තීරණ අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ආපසු ගෙවීමේ වගකීම මණ්ඩලය වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය සඳහා වාරික ගෙවීම සහ පොලී ගෙවීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු අතර වෙන්කිරීමක් හෝ කර නොතිබුණි. එම නිසා, මෙම ණයවල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) රු. බිලියන 66.83 ක් වූ විදේශ ණය හයක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ණය වශයෙන් හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, මහා භාණ්ඩාගාරය සමඟ එළඹී උප ණය ගිවිසුම් නොතිබුණි. ඒ අනුව, එම ණය ආපසු ගෙවීමේ වගකීම මණ්ඩලය විසින් නිසි පරිදි හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, එම ණය පියවීමට හෝ එම ණයවල ප්‍රාග්ධන කොටස සහ පොලිය ආපසු ගෙවීමට කිසිදු වෙන්කිරීමක් කිරීමට මණ්ඩලය කිසිදු වැඩපිළිවෙළක් සකස් කර නොතිබුණි. එබැවින් එම ණයවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) 2013 වසරට පෙර රාජ්‍ය ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරනු ලබූ කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීම වෙනුවට, පිරිවැය අනුව තක්සේරු කර තිබූ අතර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ශේෂය සහ රඳවාගත් ඉපැයීම් රු. මිලියන 36.8 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම හිඟ ශේෂයන් පියවීමේ විස්තර සහ ඒ සඳහා නිර්මාණය කරන ලද ඉන්වොයිසි විගණනයට ලැබී නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේ බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත රු. මිලියන 5,000 ක් ගෙවා තිබූ අතර ඒ අතුරින් රු. මිලියන 2,000 ක් රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණු අතර රු. මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ ගාස්තු ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශණයට ක්‍රමක්ෂය කර තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 2,500 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් ලෙස දැක්වේ. ඒ අනුව, මණ්ඩලය එම ගනුදෙනුවේ ස්වභාවය පැහැදිලිව වටහාගෙන ඒවා සැලකිල්ලට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(උ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 6.34 ක් වටිනා කාර්යයන් 8,094 ක් බෙදාහැරීම් අංශවල වත්කම් ගිණුම්වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. තවද, එම වත්කම්වලට අදාළ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

(ඌ) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම වීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. තවද, ව්‍යාපෘතිය නිම කර දින සිට එම වාහනවලට අදාළ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

(එ) බෙදාහැරීමේ අංශය, 4 ට අදාළ වීදි ආලෝකකරණ නඩත්තු වියදම්වලින් අය කර ගත නොහැකි වූ රු. මිලියන 32.32 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඒ) අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් වීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රු. මිලියන 41.48 කින් අඩුවෙන් දැක්වුණි.

(ඔ) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ රු. බිලියන 2.7 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) විස්තීරණ ආදායම් ප්‍රකාශණයට වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඕ) නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොගෙන රු. මිලියන 871.2 ක මාර්ගස්ථ තොග අවුරුදු එකක් සහ පහක් අතර කාල පරාසයක් තිස්සේ මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. තවද, රු. මිලියන 5.1 ක් වූ අසාමාන්‍ය බැර ශේෂයක් මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. මාර්ගස්ථ තොග ශේෂ සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි විගණනයට ලබා දී නොතිබුණි.

(ක) දෙහිවල-ගල්කිස්ස විදුලිය බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතියේ වියදම වූ රු. මිලියන 39 ක්, ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව 2010 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ග) අපහරණය කරන ලද රු. මිලියන 14 ක් වූ ස්ථාවර වත්කම් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ච) වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගැනීම, නිවැරදි කිරීම සහ වලක්වා ගැනීමට හැකිවනු පිණිස අවශ්‍ය වන සුදුසු අභ්‍යන්තර පාලනය පද්ධතියක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමට මණ්ඩලය අසමත් වීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව යළි පිළියෙල කර තිබුණි.

(ජ) නිරවුල් කිරීම වෙනුවට අන්තර් අංශවල ජංගම ගිණුමේ ශේෂයන් ණයගැති පාලන ගිණුමට මාරු කිරීම හේතුවෙන් රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි.

(ට) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාර ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක් වියදම් කිරීමෙන් අනතුරුව, 2021 ඔක්තෝම්බර් 26 දින ගන්නා ලද රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව එය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. එසේ වුවද, එම මුදල කපා හැරීමට කිසිදු ප්‍රතිපාදනයක් 2021 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

(ඩ) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ වාහන 28 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණි. මේ නිසා, එම වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ණ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටා තිබූ රජයට අයත් ඉඩම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මණ්ඩලයේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, මණ්ඩලයේ වත්කම් රු. මිලියන 105.62 කින් වැඩියෙන් දැක්වුණි.

### 1.2.2.3 නොසැසඳූ වෙනස්කම්

(අ) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. මිලියන 1,235 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉහත ශේෂය තුළ 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 753.61 ක විවාදිත ශේෂයක් පැවතී අතර මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 469.11ක නොසැසඳූ ශේෂයක් පැවතුණි.

(ආ) බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට අයනොවී පවතී. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 181.42 ක් පැහැදිලි කිරීමක් නොමැතිව බෙදාහැරීමේ අංශය 3 වෙත මාරු කර තිබුණි.

(ඇ) බෙදාහැරීමේ අංශය 1 හි සාමාන්‍ය ණය ගැතියන් සම්බන්ධව පද්ධතිය ජනනය කරන ලද ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් අතර වෙනසක් පවතී. ඒ අනුව, පද්ධතිය විසින් ජනනය කරන ලද ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් කාලීනව සංසන්ධනය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ණය ගැතියන්ගේ රු. මිලියන 6.77 ක වෙනසක් සමාලෝචිත වර්ෂය තුළදී නිරීක්ෂණය විය.

(ඈ) 2021 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 297.33 ක හර ශේෂයක් සහ රු. මිලියන 1,409.57 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේවෙතත්, නොසැසඳූ ශේෂ සංසන්ධනය කිරීම් විගණනයට ලැබී නොතිබුණි. එම නිසා, එකතු කිරීමේ පාලන ගිණුමේ ඇති ශේෂයන්හි නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය. හඳුනා නොගත් ආරම්භක ශේෂය වූ රු. මිලියන 166.45 ක් එකතු කිරීමේ පාලන ගිණුමට ඇතුළත් කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඉ) 1998 සිට 2021 දක්වා කාලය තුළ එකතු කරන ලද රු. මිලියන 68.99 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ඊ) මණ්ඩලය විසින් පාරිභෝගිකයින් සඳහා වැරදි ගාස්තු ක්‍රමවේදයක් යෙදීම හේතුවෙන් 2019 වසරේ සිට ලැබිය යුතු රු. මිලියන 38.76 ක මුදලක් අය නොවී පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය සහ සමූහය විසින් මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

- මණ්ඩලයේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා අප වගකිව යුතුය. මාගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 විගණන නිරීක්ෂණ ඡේද අංක 1.2.1.1 (අ),(ස), (ii), (iii), (iv), (vi), (vii), (viii), (x), 1.2.2.1 (අ), (ස), (සස), (ආ), (ඇ), (ඈ), 1.2.2.2 (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ) හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සමඟ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

**ජාතික විගණන කාර්යාලය**
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

**2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට, මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;**

| නීතියට / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය. | නියාමකයගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රයක් ලබා නොගත් විශ්‍රාමලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 6.02 ක් වූ ගිගාවොට් 261.32 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. |
| (ආ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 46 වැනි වගන්තිය, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 11 (අ) හා (ආ) වගන්තිය | 1989 සිට සෑම වර්ෂයක් අවසානයේ දී දළ ස්ථාවර වත්කම්වල මුළු වටිනාකමෙන් සියයට 0.1 ක දායකත්වයක් රක්ෂණ එස්ක්‍රෝ අරමුදලට මාරු කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. මිලියන 10,657 ක් පමණක් ආයෝජනය කර තිබුණි. විගණනයේදී කරන ලද ගණනය කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී තවත් රු. මිලියන 852.87 ක් ආයෝජනය කළ යුතු බව අනාවරණය විය. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය | ප්‍රතිපාදනයට පටහැනිව, රේඛීය අමාත්‍යාංශයට සහ මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට මුදා හරින ලද සේවකයින් 65 දෙනෙකුට වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු. මිලියන 105.22 ක් ගෙවා තිබුණි. |
| (ඈ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 1994 ජූනි 14 දිනැති පී.ඊ.ඩී 95 චක්‍රලේඛය සහ අමාත්‍යාංශයේ විගණන කමිටුවේදී 2020 සැප්තැම්බර් 25 දින ගත් තීරණය. | විධිවිධානවලට හා තීරණවලට පටහැනිව, 2020 වර්ෂයේදී ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් ලෙස රු.බිලියන 1.2 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය | විධිවිධානවලට පටහැනිව, ඉපැයීම් ගණනය කිරීමේදී රඳවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දීමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. එම ඉපැයීම් අනුව සේවක අර්ථසාධක ගෙවීම් කර තිබුණි. |
| (ඊ) 2007 ජනවාරි 10 දින සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමඟ එළඹී විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය. | කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ සපයන විදුලිබලයට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, විදුලිබල පිරිවැය යටතේ අය කර යුතු වේ. කෙසේවෙතත්, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. |
| (උ) 2018 ඔක්තෝබර් 3 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | රජයේ ආයතන සතු පොරොත්තු ජනක යන්ත්‍ර උපයෝගී කර ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීරණය මණ්ඩලය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඌ) 2015 ජූනි 17 දිනැති චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/03/2015 සහ 2020 ජනවාරි 27 දිනැති චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/01/2020 | අතිරේක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිවීමේ දීමනාව සහ ප්‍රවාහන දීමනාව ගෙවීමට මණ්ඩලය විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (එ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 18 දිනැති චක්‍රලේඛ අංක 03/2018 සහ ආයතන සංග්‍රහය II කොටසේ 9.1 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන විශ්‍රාමික සේවකයින් දෙදෙනෙකු මණ්ඩලයේ උපදේශකයින් ලෙස පත් කර තිබුණි. |
| (ඒ) 2021 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.1 වගන්තිය | මණ්ඩලය දිගින් දිගටම පාඩු ලැබුවද කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 2.7 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. |

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

**2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව**

(අ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය සහ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි. විගණන නියැදි පරීක්ෂණවලදී, එවැනි දීමනා එකතුව රු. මිලියන 2,134.9 ක් සහ රු. මිලියන 1,544.4 ක් පිළිවෙලින් 2021 සහ 2020 වර්ෂයන්හිදී ගෙවා තිබූ බව හෙළිදරව් විය. තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයේ සහ අංක BM/2021/22/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ විධිවිධානවලට පටහැනිව, සේවකයින් 323 දෙනෙකු සඳහා ගෙවා ඇති දීමනා ඔවුන්ගේ වැටුපෙන් සියයට 65 ඉක්මවා තිබුණි.

(ආ) වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින එළඹී සාමූහික ගිවිසුම අනුව, උපයන විට ගෙවන (PAYE) බදු/අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) වගකීම මණ්ඩලයේ සේවකයින් වෙත මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 2016/3 දරන චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE/ APIT බදු ගෙවා තිබුණි.

(ඇ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දිය යුතුය. කෙසේවෙතත්, මණ්ඩලයේ දැඩි ද්‍රවශීලතා ගැටලු සලකා බැලීමකින් තොරව මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ වාහන ණය එහි සේවකයන් වෙත ලබා දී තිබුණි.

(ඈ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. කෙසේවෙතත්, දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම අනුව විදුලි බලාගාර ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලයක් ලෙස තාප විදුලිය කෙටි කාලීන පදනමින් අධික පිරිවැයක් යටතේ මිලදී ගැනීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

(ඉ) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණි. 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මඟින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,357.60 ක් වූ අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. මිලියන 8,089.50 ක් විය.

(ඊ) අදාළ පාර්ශවයන් එනම් සේවායෝජක සහ සේවක සංගම් විසින් අත්සන් කර නොතිබූ බැවින් නිත්‍යානුකූල ලියවිල්ලක් බවට පත් නොවූ කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව 2021 වර්ෂයේදී මණ්ඩලය විසින් සේවක වැටුප් සියයට 25 කින් වැඩි කර ඇති තිබුණි. ඒ අනුව, එම බලයනොලත් ගෙවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ අහිතකර බලපෑම ආසන්න වශයෙන් රු. බිලියන 9.6 කි.

(උ) 2017 මැයි 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී China Machinery Engineering Corporation (CMEC) ඉංජිනේරුවන්ගේ තාක්ෂණික දැනුම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරීමේ ශක්‍ය වැඩපිළිවෙළක් තිබිය යුතු බව අවධාරණය කරන ලදි. කෙසේ වෙතත්, එම තීරණය සැලකිල්ලට නොගෙන 2017 නොවැම්බර් 23 සහ 2020 පෙබරවාරි 25 යන දිනවලදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ලක්විජය බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා වන පිළිවෙලින් දෙවන සහ තෙවන තාක්ෂණික සහයෝගීතා ගිවිසුම්වලට මණ්ඩලය විසින් අත්සන් කර තිබුණි. එකී ගිවිසුම් දෙක සඳහා මුළු ඉන්වොයිසි වටිනාකම (2017 ඔක්තෝබර් 01 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා) ඇ.එ.ඩො 13,766,367 විය. තවද, 2022 ජනවාරි 01 සිට වසරක කාලයක් සඳහා බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා වන තාක්ෂණික උපදේශන සේවාව ලබා ගැනීම සඳහා සි/ස CMEC ලංකා (පුද්.) සමාගම සමඟ 2021 දෙසැම්බර් 27 වැනි දින රු. මිලියන 435.64 (වැට් බද්ද ඇතුළුව) ක පිරිවැයක් සහිතව තවත් ගිවිසුමකට එළඹී තිබුණි. බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා එම ගිවිසුම්වලට එළඹීමෙන් පසුවද, 2021 වර්ෂය තුළදී පමණක් දින 105 ක පාඩුවක් සහ මෙ.වො. පැය 758,587 ක බලශක්ති අහිමිවීමක් සමඟ බිඳවැටීම් 16 ක් සිදුවී තිබුණි. එම බිඳවැටීම් රටේ විදුලිබල සැපයුමට සැලකිය යුතු අහිතකර බලපෑම් ඇති කර තිබුණි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

**2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) 2018-2037 දීර්ඝ කාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (පී.එම්.යු) 2016 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කළ අතර ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් කිරීම සහ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සකස් කිරීම වැනි කටයුතු සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින් 2020 වර්ෂය අවසානයේදී රු. මිලියන 301.19 ක මුළු වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, 2021 පෙබරවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, මෙම ව්‍යාපෘතිය සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්) සමාගම හරහා සංවර්ධනය කිරීමට සහ මෙම කොන්ත්‍රාත්තුව ''තනි ප්‍රභව ප්‍රසම්පාදනයක්'' ලෙස එම සමාගමට ප්‍රධානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් කාර්යයන් සඳහා දරන ලද මෙම වියදම වෙනත් ආයෝජකයෙකුට භාවිතා කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය මගින් දරන ලද රු. මිලියන 301.19 ක් මණ්ඩලයේ වියදමක් ලෙස හඳුනාගැනීමට සිදුවීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ඒ කෙසේ වෙතත්, කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයක් සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2020 දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලද අතර කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. 36.20 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේවෙතත්, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එයින් රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි.

(ii) NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණි. තවද, ඉහත සඳහන් විදුලිබලාගාර අතුරින් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 49 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කරන ලදි.

(ඇ) අමතර ඉඩ අවශ්‍යතාවය, විෂය පථයේ වෙනස්වීම් සහ මිල උද්ධමනය නිසා 2011 සිට 2021 දක්වා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1000 සිට රු. මිලියන 6,161.87 ක් (උපදේශනය සහ පෙර කොන්ත්‍රාත්කරු සඳහා කරන ලද ගෙවීම් ඇතුළුව) දක්වා වැඩි වී තිබුණි. තවද, 2023 වර්ෂයේදී නව ගොඩනැගිල්ල නිම කිරීමට සැලසුම් කර තිබියදීත් හිමිකාරිත්වය තහවුරු කර නොතිබූ දැනට පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 සිට 2020 දක්වා කාලය තුළ මණ්ඩලය විසින් රු. මිලියන 284.41 ක් වැය කර තිබුණි.

(ඈ) 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක, මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 6.54 ක් වටිනා ගිගාවොට් පැය 267.17 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඉ) ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.37 ක් වන විට විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලාගාර තුනකින් සහ මෙගාවොට් 24 ක අතිරේක බලාගාරයකින් සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගත් බලශක්ති ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 21.75 ක්, රු. 25.26 ක්, රු. 24.97 ක් සහ රු. 88.85 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තත්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි.

(ඊ) CMEC විසින් ඉදිරිපත් කරන ලද පුහුණුකිරීමේ ලේඛනයට අනුව, උපකරණවල ක්‍රියාකාරිත්වය නඩත්තු කිරීම, ප්‍රකෘතිමත් කිරීම හෝ වැඩිදියුණු කිරීමට ඒකකය සඳහා පුළුල් විසුරුවීම් පරීක්ෂා කිරීම (comprehensive disassembling inspection) සහ අලුත්වැඩියා කිරීම සඳහා වන A මට්ටමේ නඩත්තු කාල පරාසය වසර 4 සිට 6 දක්වා විය යුතුය. කෙසේ වෙතත්, ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සඳහා A මට්ටමේ නඩත්තුව එම ඒකක ක්‍රියාත්මක කර වසර 7ක් ගතවී ඇතත් එය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. මෙගා වොට් පැය 663,510 ක බලශක්ති අහිමිවීමක් සමඟ සමාලෝචිත වර්ෂය තුළදී ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සම්බන්ධ බිඳවැටීම් 14 ක් සිදුවී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(උ) ලයිටින් ශ්‍රී ලංකා හම්බන්තොට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 15 ක් ගතවී ඇතත් නොවිසඳුණු විරෝධතා හේතුවෙන් තංගල්ල සිට නොනගම දක්වා ගැන්ට්‍රි මාර්ගයේ (කුළුණ 13 සිට 36 දක්වා) ඉතිරි වැඩ අවසන් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

### 2.3 වෙනත් කරුණු

(අ) 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 44,079 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 6,839 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,928 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන්ගෙන් සහ අනෙකුත් ණයගැතියන්ගෙන් එකතුව පිළිවෙලින් රු. බිලියන 1.67 ක් සහ රු. මිලියන 897 ක් වූ ණය ශේෂයන් වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව පැවතුණි.

(ඇ) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනවලින් ලැබිය යුතු දෑ යටතේ පෙන්වා ඇති රු. මිලියන 83.68 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව පැවතුණි.

(ඈ) ගල් අඟුරු හිඟය සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අයවිය යුතු රු. මිලියන 714.96 ක මුදලක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට නිසි පියවර නොගෙන හිඟව පැවතුණි.

(ඉ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. බිලියන 4.01 ක් වූ ණය ශේෂයන් දීර්ඝ කාලයක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුණි.

| ණයහිමියාගේ නම | වටිනාකම රු. |
|---|---|
| CMEC | 2,820,562,372 |
| ගෙවිය යුතු උද්දේශිත ලාභාංශ (deemed dividend) බද්ද | 1270,766,413 |

(ඊ) නොර්දන් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු රු. බිලියන 2.9 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල සම්ප්‍රේෂණ අංශයේ වෙළෙඳ ණය හිමියන් යටතේ දක්වා තිබුණු අතර එම මුදල වසර තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුණි.

(උ) තොග සත්‍යාපනයේදී හෙළිදරව් වූ රු. මිලියන 571.34 ක (මෙ.ටො 27,049.71 ක) ගල් අඟුරු තොග හිඟය 2021 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශයේ අලාභයක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, පහත හේතූන් මත එම මුදලෙහි නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(i) විශාල ගල් අඟුරු තොගයක් සත්‍යාපනය කිරීම සඳහා ඝන මීටරයකට ගල් අඟුරුවල ක්ෂේත්‍ර ඝනත්වය මැනීම සඳහා වළවල්වලින් කැණීම් කරන ලද ගල් අඟුරු කිලෝග්රෑම් 35 ක් පමණක් යොදා ගෙන තිබුණි.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ii) කැණීම් කරන ලද වළවල්වල පැවති ඝන මීටරයකට ගල් අඟුරුවල ක්ෂේත්‍ර ඝනත්වයේ වෙනස්කම් පැවතුණි.

(iii) ගල් අඟුරු තොග පැවති බැවින් බේ (Bay) 'බී' සඳහා සාමාන්‍ය ගල් අඟුරු මතුපිට මිනුම් කර නොතිබුණි.

(iv) පටවන ලද තොග සහ ගොඩබාන ලද තොග කෙටුම්පත් සමීක්ෂණයක් (Draft survey) මඟින් මිනුම් කර තිබුණි.

(v) ගොඩබාන ලද අඟුරු මැනීමට භාවිතා කරන ශූන්‍ය පටි තරාදියෙන් (Zero belt scale) නිශ්චිත මිනුම්කරණයක් ලබා දී නොතිබුණි.

(vi) බලාගාරයේ ඒකක තුන මඟින් පරිභෝජනය කරන ගල් අඟුරු මැනීමට භාවිතා කරන පටි තරාදියෙන් ( Belt scale) නිශ්චිත මිනුම්කරණයක් ලබා දී නොතිබුණි.

(vii) ගල් අඟුරු ගොඩබාන සහ පරිභෝජනය කරන අවස්ථාවේ ගල් අඟුරුවල ඝනත්වය වෙනස් විය හැකි අතර, ගල් අඟුරු තොගය මත ගල් අඟුරුවල ඝනත්වයේ වෙනස්වීම් ගැලපීම් කර නොතිබුණි.

(ඌ) මණ්ඩලය විසින් වසර ගණනාවක් තිස්සේ LECO වෙත විදුලිය විකිණීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදු කර ඇතත්, මෙම ආයතන දෙක අතර සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ එළඹී විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම් නොතිබුණි.

(එ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට ලබා දී ඇති විදේශ ණයවලින් බැඳීම් ගාස්තු ලෙස 2020 දී රු. මිලියන 61.39 ක මුදලක් ණය දෙන ආයතනය විසින් අඩු කර තිබුණි. මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද බොහෝ ව්‍යාපෘති නියමිත දිනට නිම කර නොතිබූ අතර, එය අතිරේක බැඳීම් ගාස්තුවලට හේතු වී තිබුණි. තවද, බැඳීම් ගාස්තු ගණනය කිරීම පිළිබඳ විස්තර විගණනයට ලැබී නොතිබුණ අතර, ඒ අනුව, බැඳීම් ගාස්තුවල ඇතිවීම සහ නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඒ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. මිලියන 3.67 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන දින දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම මණ්ඩලයේ වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, පෙර වංචාව සැලකිල්ලට ගැනීමෙන් තොරව වංචාවේ වටිනාකම ලෙස රු. 99,155 ක් පමණක් අය කර ගැනීමෙන් පසුව ඔහුගේ රාජකාරිය අවසන් කර තිබුණි.

(ඔ) පරීක්ෂණය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කර පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව රු. මිලියන 3.79 ක තොග හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, එම මුදල අයකර ගැනීමෙන් තොරව ගිණුම් පොත්වල පැවතුණි. මෙම මුදල කපා හැරීමට මණ්ඩලය කටයුතු කරමින් සිටි අතර ඔහුට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් නොගෙන ඔහුව විශ්‍රාම ගන්වා තිබුණි.

(ඕ) 2018 දෙසැම්බර් 31 දින සිට ජනන අංශයේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ රු. මිලියන 22.88 ක් වූ කිසිදු චලනයකින් තොර අයිතම පැවතුණි.

(ක) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. බිලියන 62.95 ක් වූ වේලිවල (dams) අයිතිය මණ්ඩලය විසින් පවරාගෙන නොතිබුණි.

(ග) 2021 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 28.79 ක් වූ පරිභෝජනයට ගත හැකි මුළු තොගයෙන් සියයට 8.5 ක් නියෝජනය වන රු. බිලියන 2.46 ක තොග සෙමින් චලනය වන, චලනය නොවන සහ පළුදු වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. ඒ අනුව, එවැනි වර්ගයේ පරිභෝජනයට ගත හැකි තොග පවත්වාගෙන යාමෙන් තොග හානිවලට, රඳවා ගැනීමේ පිරිවැය වැඩි වීමට සහ වංචාවන් සඳහා ඉඩකඩ නිර්මාණය වීමට හේතු විය හැකිය.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඉතිරිය...)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ච) කුඩා ජලවිදුලි බලාගාර සඳහා මිල නියම කිරීම තත්‍ය පිරිවැය මත කළ යුතුව තිබුණද වළකාලන ලද පිරිවැය ක්‍රමය (avoided cost method) මත ඇතැම් කුඩා ජල විදුලි බලාගාර සඳහා මිල තීරණය කර තිබුණු අතර මෙම ක්‍රමය කුඩා ජල විදුලි බලාගාරයක තත්‍ය පිරිවැයට කිසිදු සම්බන්ධයක් නොමැත. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. අංක DGM/SYC/TCH/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව ජල විදුලි බලාගාරයක සාමාන්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2021 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 19.11 ක් සහ වියළි කාලය සඳහා රු. 20.59 ක් විය. තවද, සංඛ්‍යාලේඛන වාර්තා අනුව, 2020 දී මණ්ඩලයේ ජල විදුලි බලාගාරයක ඒකකයක පිරිවැය රු.2.49 ක් විය.

(ට) 2020 ජූනි 01 දින සිට ආරම්භ කරන ලද මණ්ඩලයට අයත් ඉඩම් හඳුනාගැනීම, මැනීම සහ තක්සේරු කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි, එනම් මැනීම සියයට 34 ක් සහ තක්සේරු කිරීම සියයට 0.4 ක් පමණ විය.

(ඩ) ලක්විජය විදුලි බලාගාරයේ ඇතැම් තොග, ගිණුම් පොත්වල සටහන් කර නොතිබූ අතර, එම තොගය සෑම වසරකම අවසානයේ සත්‍යාපනය කර නොතිබුණි.

(ත) ලක්විජය බලාගාරයේ ඉන්ධන ලැබීම් සහ පරිභෝජනය පිළිබඳ වාර්තා 2021 දෙසැම්බර් 04 සිට 2022 ජනවාරි 11 දක්වා තොග පොත්වල යාවත්කාලීන කර නොතිබුණි. 2021 දෙසැම්බර් 04 සිට 2022 ජනවාරි 11 දක්වා කාලය තුළ මාසික සාමාන්‍ය ඉන්ධන ලැබීම් සහ පරිභෝජනය පිළිවෙලින් ලීටර 442,200 ක් සහ ලීටර 725,521 ක් විය.

(ද) වාලච්චේන කඩදාසි සංස්ථාවට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු. 361,992,685 ක අධිභාර සහ පොලී කපා හැරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට පිළිතුරු**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

තොරතුරු සහිතයි.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්**

**1.2.1.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදි.**

(අ) **සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම**

(i) **ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (එල්.කේ.ඒ.එස් 12) හි 88 වන ඡේදයට අනුව, එකතු කළ අගය මත බදු තක්සේරු කිරීම් සම්බන්ධයෙන් 2017/2018 සහ 2018/2019 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු අතිරේක බදුවලට අදාළව රු. 287,139,348 ක් සහ ඒ මත ගෙවිය යුතු දඩ මුදල්වලට අදාළව රු. 220,628,092 ක් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.**

ලද එකතු කළ අගය මත බදු තක්සේරුව සඳහා අභියාචනයක්ද සමඟ සංශෝධිත වැට් බදු වාර්තා 04 ක් ලංකා ගල්අඟුරු සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා සාකච්ඡා සිදු වෙමින් පවතී. බදු උපදේශකවරයාගේ සහාය ඇතිව 2022/06/06 දින පළමු රැස්වීම සාර්ථකව සිදු කර ඇත. අවශ්‍ය නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඉදිරි මූල්‍ය වර්ෂයේදී අනාවරණය කරනු ලැබේ.

(ii) **නැව්ගත තොග 154 ක අවිනිශ්චිත ගිණුම්වලට අදාළව රු. 33,317,325 ක් සහ මණ්ඩලයේ ප්‍රසම්පාදන ගල් අඟුරු අවසන් ශේෂයෙන් ලැබිය යුතු අත්තිකාරම්වලට අදාළව රු. 1,760,500 ක් සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් පියවා නොතිබුණි.**

**අවිනිශ්චිත ගිණුම්වල අන්තර්ගතය පහත පරිදි වේ.**

| | |
|---|---|
| වසර ආරම්භයේ ආරම්භක ශේෂය | : රු. 4,323,787.00 |
| 2021 වර්ෂයේදී මාරු කළ මුදල | : රු. 30,757,506.00 |
| 2021 වසර අවසානයේ ශේෂය | : රු. 35,081,293.00 |

**අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂයේ අන්තර්ගතය :**

මණ්ඩලයෙන් ලැබිය යුතු රු.4,323,787.00: 2017 දී මණ්ඩලය සමඟ ගිණුම පියවීමෙන් පසු මෙම මුදල ඉතිරිව ඇත. මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීමට මෙම ශේෂය තවදුරටත් විමර්ශනය කෙරෙන අතර මෙම ශේෂය අවිනිශ්චිත ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

**2021 වර්ෂය තුළ මාරු කළ මුදලේ අන්තර්ගතය :**

විගණන සහ කළමනාකරණ කමිටුවේ මඟපෙන්වීම ඇතිව 2022 මූල්‍ය වර්ෂයේදී අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීම සඳහා මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීමට මෙම ශේෂය තවදුරටත් විමර්ශනය කරමින් පවතී.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(iii) **ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනකමට එකතු කරන ලදී. කෙසේ වෙතත්, සමාගම විසින් රු. 5,324,423,778 ක් වූ සියයට 10 ක අංකිත මිල ආදායමට එකතු කර තිබූ අතර පසුව සමාගම විසින් ණයගැතියන්ට එය වට්ටමක් ලෙස ලබා දී විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.**

මණ්ඩලය වෙත වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේදී රේගු ආන්තිකය පිරිවැයට එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් ලංකා ගල්අඟුරු සමාගම (LCC) වෙත නියෝගයක් ලබා දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය සම්මත කර ඇත. IRD නිලධාරියා මණ්ඩලයට ලැබෙන ඉන්වොයිසි මත LCC හි වැට් බද්ද සඳහා වන මූලික අගය රේගු අරමුණු සඳහා වන අගයට වඩා අඩු විය නොහැකි බව පවසා ඇත. එබැවින් සියයට 10 එකතු කරනු ලබන්නේ IRD නිලධාරියාගේ නියෝගය මත පමණි. එතැන් සිට මණ්ඩලය මෙම නියෝගය අභියෝගයට ලක් කර ඔවුන්ගේ 2018-09-07 දිනැති ලිපිය මගින් IR වෙත ලියා ඇති අතර එයට ප්‍රතිචාරය තවමත් ලැබී නොමැත. එතෙක් අපි ඉන්වොයිසියට සියයට 10 රේගු ආන්තිකය එකතු කළ නමුත් IRD විසින් අතුරු නියෝගයක් නිකුත් කරන තුරු අතිරික්ත නිමැවුම් වැට් බදු IRD වෙත ප්‍රේෂණය කර නොමැත. ආදායමේ අන්තර්ගතය වන සියයට 10 ක සංකල්පීය ආන්තිකය ඉවත් කර නිමැවුම් වැට් බද්ද ගණනය කිරීමේ හැකියාව පිළිබඳව LCC දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ද විමසා ඇති අතර, ප්‍රතිචාරය තවමත් ලැබී නැත.

LCC හි මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සංකල්පීය බදු ආන්තිකය සටහන් කිරීමට අදාළ ගිණුම්කරණ ගැටලුව නිවැරදි කරන ලෙස ලංකා ගල්අඟුරු සමාගමට දැනුම් දීමට කටයුතු කරනු ඇත.

(iv) **මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 197,452,711 ක වැට් බදු සහ වෙනත් ලැබිය යුතු දෑ මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. තවද, මණ්ඩලය සිය මූල්‍ය ප්‍රකාශනවල මෙම වගකීම හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, එම මුදල්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.**

ගෙවිය යුතු මුදල් අවසන් කිරීමෙන් පසු ශේෂය තහවුරු කිරීම ලංකා ගල්අඟුරු සමාගමට නියමිත වේලාවට යවන ලෙස අදාළ නිලධාරීන්ට දැනුම් දීමට කටයුතු කර ඇත.

(v) **සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. 22,502,205 ක් වූ කළමනාකරණ ගාස්තු වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතී. කෙසේවෙතත්, මේ සම්බන්ධව කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.**

අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන) වෙතින් තහවුරු කිරීම ලබා ගැනීමෙන් පසු ගෙවිය යුතු එවැනි කළමනාකරණ ගාස්තුවක් තිබේ නම් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් ඇතුළත් කරන ලෙස ලංකා ගල්අඟුරු සමාගමට දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

(vi) **පවතින තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. 205,000,000 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට සමාගම විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2019 දී ගෙවන ලද දඩ මුදල අදාළ වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රඳවා ගත් ඉපැයීම් රු. 205,000,000 කින් වැඩියෙන් දැක්වුණු අතර ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුම පිළිවෙලින් රු. 158,186,165 කින්, රු. 39,970,418 කින් සහ රු. 6,843,417 කින් අඩුවෙන් දැක්වුණි.**

ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු අගයන් ප්‍රකාශණය කර නොමැත. එම කාලය තුළ, ලංකා නැව් සංස්ථාව (CSC) විසින් එක් නැව්ගත කිරීමකට රු. 1,000,000 ක ගාස්තුවක් යටතේ රේගු ප්‍රකාශණය සම්පූර්ණයෙන්ම හසුරුවා ඇති අතර ඉහත වැරදි ප්‍රකාශණය මත ශ්‍රී ලංකා රේගුව LCC වෙත රු. 205,000,000 ක දඩයක් පනවා තිබුණි. මෙම ගෙවීමෙන් පසු අවසන් වැට් බදු ගෙවීමක් නොමැති බව ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් LCC නිලධාරීන්ට දන්වා තිබුණි. තවද, ඉහත වැරදි ප්‍රකාශණය හේතුවෙන් තථ්‍ය දඩය රු. 6,843,417.00 ක් ලෙස LCC විසින් හඳුනාගෙන ඇති අතර CSC වගකීමට එරෙහිව හර කර ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේ උපදේශනය ඇතිව මේ සම්බන්ධයෙන් නිවැරදි ගිණුම් සටහන් සිදු කිරීමට LCC වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.

(vii) **සී/ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ලිමිටඩ් මගින් (ටී.අයි.එස්.සී.එල්) රු. 539,192,079 ක දිගු කාලීනව හිඟ ලැබිය යුතු ශේෂය අය කර ගැනීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. තවද, ටී.අයි.එස්.සී.එල්/සී.එස්.සී.එල් විසින් මෙම ශේෂය තහවුරු කර නොතිබුණි. එම නිසා, ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.**

ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් බේරුම්කරණය ඉහළ මට්ටමේ කමිටුවක් විසින් හසුරුවා ඇත. ණය බෝල් ණය බව කමිටුවේ මතය වී නොමැති අතර ගල් අඟුරු සැපයීම හරහා ගෙවිය යුතු මුදල් පියවීමට ගැණුම්කරු පවා කැමැත්ත පළ කර ඇත. අප සතුව ඇති තොරතුරුවලට අනුව, බේරුම්කරණ යෝජනාව අමාත්‍ය මණ්ඩලයට තීරණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. ලංකා නැව් සංස්ථාව (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් ලිමිටඩ්) වෙතින් ලැබිය යුතු හිඟ මුදල්වල වර්තමාන තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර අමාත්‍ය මණ්ඩලය විසින් ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සමඟ සාකච්ඡා කිරීමට භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය සහ ලංකා ගල්අඟුරු සමාගම නියෝජනය වන සිව් පුද්ගල කමිටුවක් පත් කර ඇත. තවද, ඉදිරිපත් කිරීමට නියමිත එම කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසද අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇත. රු. මිලියන 539 ක් වටිනා ගල් අඟුරු තොගය ලබා නොදීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීම සඳහා 2022 ජුනි 21 දිනැති කෝප් රැස්වීමේදී අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග කර ඇත. ඒ අනුව, 2022/09/15 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට අනුව අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විමර්ශන නිලධාරීන් පත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

(viii) **රු. 18,075,801 ක් වූ විවිධ ණයගැති ශේෂය, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් හි රු. 1,115,987 ක ලැබිය යුතු ශේෂය, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් හි රු. 85,887,776 ක වෙළෙඳ ණය හිමියන් සහ ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන රු. 8,048,531 ක් තහවුරු කිරීමට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.**

අ. **විවිධ ණයගැතියන් - රු. 18,075,802**

රු. 17,839,949 ක් වූ ආපසු අයකරගත නොහැකි NBT සහ PAL වලින් එම මුදල සමන්විත වන බව මූලික විමර්ශනවලින් හෙළි විය. ශේෂ තහවුරු ලබා ගැනීම සඳහා LCC වෙත දැනුම් දීමට කටයුතු කර ඇත.

ආ. **නෝබල් රිසෝසස් වෙතින් ලැබිය යුතු - රු.1,115,987**

නෝබල් රිසෝසස් වෙත රු. 85,887,776 ක ණය ශේෂයක් ඇති අතර මෙම ණයගැති ශේෂය ඊට එරෙහිව පියවීමට කටයුතු කරනු ඇත.

ඇ. **නෝබල් රිසෝසස් වෙළඳ ණයහිමියන් - රු.85, 887,776**

ණයවර ලිපි වලංගු කාලය අවසන් වීම හේතුවෙන් නෝබල් රිසෝසස් ඉන්ටනැෂනල් ලිමිටඩ් විසින් අඩුවෙන් ලබා ගන්නා ලද මුදලකින් මෙය ප්‍රධාන වශයෙන් සමන්විත වේ.

ඈ. **ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 - රු. 8,048,531**

2015/16 වාරයට අදාළ නැව් 17 ක් සඳහා ගොඩබෑමේ වරායේ Draft Survey ගාස්තු මේ තුළ ඇතුළත් වේ. අත්සන් කරන ලද ගිවිසුම මත පදනම්ව මෙම ගෙවීම සිදු කරන ලෙස ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙත දන්වමින් 2019 දී විද්‍යුත් තැපෑලක් යවා ඇත. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

(ix) **සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. 136,236,370 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව, තථ්‍ය වැට් බදු මුදල රු. 106,969,404 ක් විය. ඒ අනුව, සමාගම වැඩිපුර රු. 29,266,965 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.**

ලංකා නැව් සංස්ථාව විසින් කරන ලද වැරදි ප්‍රකාශණයක් හේතුවෙන් ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම ශ්‍රී ලංකා රේගුවට නැව් තොග අංක 123 සඳහා රු. 29,266,966 ක වැඩිපුර වැට් බදු ගෙවා ඇත. LCC විසින් දැනටමත් මුදල් ආපසු ගෙවීමේ හිමිකම් පෑමක් ගොනු කර ඇති අතර, ආපසු ගෙවීම සම්පූර්ණ කිරීමට හෝ LCC හි හිඟ රේගු ශේෂයන්ට එරෙහිව පියවීමට සුදුසු විධිවිධාන පිළිබඳව රේගු දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. ආපසු ගෙවීමේ හිමිකම් පෑම ලැබෙන තෙක් LCC විසින් එම මුදලට සමාන මුදලක් CSC හි හිඟ මුදල්වලින් රඳවා ගෙන ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(x) **සී/ස ලංකා ගල් අඟුරු (පුද්.) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය සහ එදිනට ලංකා නැව් සංස්ථාව විසින් තහවුරු කරන ලද ශේෂය අතර රු. 4,003,372 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි. කෙසේ වෙතත්, එම වෙනස සැසඳීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.**

2021 දෙසැම්බර් 31 වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂයේ වෙනස සඳහා අයිතම හඳුනා ගනිමින් LCC විසින් සැසඳුම් ප්‍රකාශයක් සකස් කර ඇත. බොහෝ අයිතම LCC විසින් සාධාරණ හේතු මත ගිණුම්ගත කර නොමැති අතර සටහන අංක 24, 'බැඳීම් සහ අසම්භාවයන්' යටතේ අනාවරණය කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට වසර අවසාන ශේෂයන් හි පවතින නොගැලපීම් සහ හඳුනා නොගත් වෙනස්කම් විසඳීමට වර්තමානයේදී LCC සහ CSC සාකච්ඡා කරමින් සිටී.

(xi) **සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. 2,362,129 ක ගෙවිය යුතු ශේෂයට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.**

ඉහත ගෙවිය යුතු ගිණුම් 2018 සහ ඊට පෙර වර්ෂවල සිදු කරන ලද වැරදි ගිණුම් සටහන් හේතුවෙන් සිදු විය. ඉහත දෝෂ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය සටහන් සිදු කරන ලෙස LCC වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.

(ආ) **සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම**

(i) **2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයෙන් විවිධ සේවා සඳහා අයවිය යුතු ශේෂය රු. 1,343,821,164 ක් වූ අතර එහි ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017, 2019 සහ 2020 වර්ෂ සඳහා මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද බලශක්තිවල පිරිවැය වූ රු.1,336,859,095 ක් ඇතුළත්ව තිබුණි. කෙසේ වෙතත්, එම මුදල සඳහා ශේෂ තහවුරු කිරීම් විගණනයට ලැබී නොතිබුණි. තවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වගකීම හඳුනාගෙන නොතිබුණි.**

2021 වර්ෂය සඳහා ලැබිය යුතු මුදල දැනටමත් 2021, 4 වන කාර්තුව සඳහා UNT ගාස්තු ගැලපීම සමඟ නිරවුල් කර ඇත. පෙර වසරවල ශේෂයන් පියවීම සම්බන්ධයෙන් සාකච්ඡා සිදු වෙමින් පවතී.

(ii) **2021 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස් සඳහා කරන ලද රු. 5,000,000 ක ආයෝජනයට අදාළ කොටස් සහතික හෝ වෙනත් ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.**

මේ කාරණය නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. ඔවුන් කලින් කලට යම් යම් තොරතුරු/පැහැදිලි කිරීම් ඉල්ලා ඇති අතර සමාගම එම තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දීමට කටයුතු කරමින් සිටී. නීතිපති දෙපාර්තමේන්තුවේ අවසන් උපදෙස් මත මෙම සමාගමට එරෙහිව නඩු පැවරීමට අපේක්ෂා කෙරේ.

(iii) **පාරිභෝගිකයින්ගෙන් එකතුකර ගත් හඳුනා නොගත් රු. 14,731,287 ක් ප්‍රතික්ෂේප කරන ලද ගිණුමෙන් මාරු කර ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණය හිමියන්ගේ ශේෂය යටතේ පෙන්වා තිබුණි.**

එකතු කිරීමේ නියෝජිතයින් සහ බැංකු සමඟ සම්බන්ධීකරණය කරමින් භාණ්ඩාගාර අංශය මගින් මෙම ශේෂයන් නිරවුල් කරමින් පවතී. මෙම ගැටලුව අවම කිරීම සඳහා ලෙකෝ විසින් අදාළ සියලු උත්සාහයන් ගෙන ඇත. මේ වන විට රු. 1,746,780.92 ක් හඳුනාගෙන නිරවුල් කර ඇත.

තවද, මෙය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, තැන්පත්කරුවන් විසින් සිදු කරන ලද වැරදි සහ එකතුකරන්නන්ගේ වැරදි/අතපසුවීම් හේතුවෙන් බැංකු ගිණුම් කිහිපයක හඳුනා නොගත් එකතු කිරීම් පවතී. බැංකු සැසඳුම් සකස් කරන විට, මෙම හඳුනා නොගත් එකතු කිරීම් නිරවුල් කිරීම සඳහා අදාළ එකතුකරන්නන් සමඟ නැවත පරීක්ෂා කරයි.

(iv) **මණ්ඩලයේ ප්‍රාථමික උපපොලවල් ඉදිකිරීමට භාවිතා කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීමට සමාගම විසින් රු. 206,924,712 ක් වියදම් කර තිබුණු අතර එම මුදල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ඉඩම්වල ප්‍රාථමික උපපොළවල් පිහිටුවීම සහ ඉහත සඳහන් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි.**

එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර, ඔවුන්ගේ උපදෙස් පරිදි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(v) **2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වන වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත ක්‍රියාවලියක් සිදු කිරීමෙන් පසුව පාඩු කපා හැරිය හැකි අතර කපා හැරීම් පිළිබඳ විගණන කමිටුවේ නිර්දේශ ඇතුළුව නියමිත ක්‍රියාවලියක් අනුගමනය කරන බවට සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාගම මේ සම්බන්ධයෙන් එම ක්‍රියාවලිය අනුගමනය කර නොතිබූ අතර වීදි ලාම්පු සඳහා මහ නගර සභා සහ පළාත් සභාවලින් අයවිය යුතු රු. 387,806,335 ක් වූ ණයගැති ශේෂය 2021 නොවැම්බර් 30 දින ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව සමාලෝචිත වර්ෂය තුළ කපා හැර තිබුණි.**

මෙම කපා හැරීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව සිදු කර ඇත. කපා හැරීම සඳහා ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කරන ලෙස LECO වෙත දැනුම් දීමට කටයුතු කරන අතර අනාගතයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යැවීමට පෙර කපා හැරීම සඳහා විගණන කමිටුවේ අනුමැතිය ගනු ලැබේ.

(vi) **වසරේ අවසාන මාසය තුළ තොග නොවන පාරිභෝගිකයින්ගෙන් උපයාගත් ආදායම ඊළඟ වසරේ තොග නොවන පාරිභෝගිකයන්ගෙන් ලැබෙන ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් මාසයේදී තොග නොවන පාරිභෝගිකයින්ගෙන් ලැබුණු ආදායම 2021 ජනවාරි මාසයේ ආදායම ලෙස හඳුනාගෙන තිබූ අතර, අනෙකුත් වසර සඳහා එම පරිචය අඛණ්ඩව යෙදාගෙන තිබුණි. එම නිසා, තොග නොවන පාරිභෝගිකයින්ගෙන් ලැබෙන ආදායමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය නිසි ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.**

සියලුම තොග බිල්පත් සෑම මසකම පළමු දින නිකුත් කෙරේ. එබැවින්, දෙසැම්බර් බිල්පත් චක්‍ර විකුණුම් එම වර්ෂය සඳහාම සලකා බලයි. කෙසේ වෙතත්, සිල්ලර (තොග නොවන) බිල්පත් සෑම මසකම 1 වන දින සිට 25 වන දින දක්වා බෙදා හරියි. දෙසැම්බර් සහ ජනවාරි පරිභෝජනය දෙසැම්බර් බිල්පත් චක්‍රය සමඟ මිශ්‍ර වූ අතර මාස දෙකක් සඳහා ඒවා වෙන්කිරීමට අපහසු විය. එබැවින්, බිල්පත් දිනයන්හි වෙනස හේතුවෙන් සිල්ලර තොග නොවන බිල්පත් ආදායම සෑම විටම ඊළඟ මාසයේ හඳුනා ගෙන ඇත.

### 1.2.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්.එල්.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම.

#### (අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව

(i) **සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම් ලෙස රු. මිලියන 53.63 ක් මණ්ඩලය සිය ආදායම් ප්‍රකාශණයේ හඳුනාගෙන තිබුණි.**

වාර්තා කිරීමේ ආයතනයක මූල්‍ය කාර්ය සාධනයට අදාළ ආදායම සහ වියදම් මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවේ 4.1 (ආ) ඡේදයේ සඳහන් වේ.

2003 දෙසැම්බර් 31 වන දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීතිවල අංක 5 වගන්තියට අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් මගින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කරනු ලබයි. එබැවින් අරමුදල කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එබැවින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කිරීමේ පිරිවැය මණ්ඩලය මගින් දරනු ලබයි.

තවද, එම රීතිවල අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 1 දින සිට) එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත.

මෙම කරුණ 2021 පෙබරවාරි 11 වැනි දින පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර, එමඟින් කමිටුව විසින් දැනට පවතින පරිචය දිගටම කරගෙන යාමට සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයක් ඇති කර ගැනීමට තීරණය කරන ලදි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. (2021-03-29 දිනැති යොමු අංකය: AFM(TM)/DFM (අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල)/Adm/2021/01) මෙම කරුණ විස්තරාත්මකව සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් දැරීමේ වත්මන් ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදි.

තවද, මෙම කරුණ 2022 පෙබරවාරි 24 සහ 2022 මැයි 26 යන දිනවල පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට නැවත ඉදිරිපත් කරන ලද අතර, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් අඛණ්ඩව දැරීමට කමිටුව තීරණය කර ඇත.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ii) **සංකල්ප රාමුවේ 4.3 ඡේදයට පටහැනිව, අයිතිය මණ්ඩලය සතු රු. මිලියන 8 ක් වටිනා වත්කම් සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි.**

වාර්තා කිරීමේ ආයතනයක මූල්‍ය කාර්ය සාධනයට අදාළ ආදායම සහ වියදම් මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවේ 4.1 (ආ) ඡේදයේ සඳහන් වේ.

2003 දෙසැම්බර් 31 වන දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීතිවල අංක 5 වගන්තියට අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් මගින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කරනු ලබයි. එබැවින් අරමුදල කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එබැවින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කිරීමේ පිරිවැය මණ්ඩලය මගින් දරනු ලබයි.

තවද, එම රීතිවල අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 1 දින සිට) එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත.

මෙම කරුණ 2021 පෙබරවාරි 11 වැනි දින පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර, එමඟින් කමිටුව විසින් දැනට පවතින පරිචය දිගටම කරගෙන යාමට සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයක් ඇති කර ගැනීමට තීරණය කරන ලදි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. (2021-03-29 දිනැති යොමු අංකය : FM(TM) / DFM (අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල) /Adm/ 2021/01) මෙම කරුණ විස්තරාත්මකව සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් දැරීමේ වත්මන් ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදි.

තවද, මෙම කරුණ 2022 පෙබරවාරි 24 සහ 2022 මැයි 26 යන දිනවල පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට නැවත ඉදිරිපත් කරන ලද අතර, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් අඛණ්ඩව දැරීමට කමිටුව තීරණය කර ඇත.

(ආ) **එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

**ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතුව රු. බිලියන 4.04 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිළ විචලනයක් පැවතුණි. තවද, රු. බිලියන 1.78 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.**

එල්.කේ.ඒ.එස් 2 - තොග, ඡේද අංක 25 අනුව, FIFO හෝ භරිත සාමාන්‍ය පිරිවැය සූත්‍රය භාවිතා කිරීමෙන් තොගවල පිරිවැය පැවරිය යුතුය. ආයතනයක් සමාන ස්වභාවයක් සහ ආයතනයට භාවිතයට ඇති සියලුම තොග සඳහා පිරිවැය සූත්‍රය භාවිතා කළ යුතුය. ඒ අනුව, මණ්ඩලය එහි තොග අගය කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරන අතර ජනන, සම්ප්‍රේෂණය, වත්කම් කළමනාකරණ සහ ව්‍යාපෘති අංශයේ ශ්‍රම පිරිවැය වාර්තා කිරීම සඳහා සත්‍ය පිරිවැය භාවිතා කරනු ලබන අතර එය 2021 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන වැඩවලින් සියයට 75 ක්, දේපල පිරියත සහ උපකරණවලින් සියයට 61 ක් සහ මණ්ඩලයේ තොගවලින් සියයට 55 කි. එබැවින්, දේපල පිරියත සහ උපකරණ, තොග සහ කෙරිගෙන යන වැඩවලින් වැඩි කොටසක් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිරිවැයට ඉදිරිපත් කෙරේ.

කෙසේ වෙතත්, සංකීර්ණත්වය සහ තොගවල විශාල ප්‍රමාණය හේතුවෙන්, මණ්ඩලයේ බෙදාහැරීමේ අංශ සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කරයි.

එල්.කේ.ඒ.එස් 02, තොගවල ඡේද අංක 25 මගින් ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, තොග තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කිරීමට අවසර දී ඇත ('ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, සම්මත පිරිවැය ක්‍රමය වැනි තොගවල පිරිවැය මැනීමේ තාක්ෂණික ක්‍රම භාවිතා කළ හැකිය'). ද්‍රව්‍යවල මිල වෙනස්වීම් නොසලකා ඕනෑම ප්‍රදේශයක සෑම පාරිභෝගිකයෙකුටම සම්මත පිරිවැය පදනමක් තිබීම, විදුලිබල මණ්ඩලය විසින් තොග තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කිරීමට තවත් හේතුවක් වේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

''ගාස්තු සඳහා ක්‍රමවේදය'' සඳහා වන PUCSL මාර්ගෝපදේශ මගින් ද ''එක් එක් බලපත්‍රලාභියා මෙහෙයුම් සිදුකරනු ලබන ප්‍රදේශවල විදුලි සැපයුම් සේවා සැපයීම සඳහා භාවිතා කරන සියලුම ද්‍රව්‍ය සඳහා සම්මත මිල ගණන් ගණනය කළ යුතුය'' යනුවෙන් අර්ථ දක්වා ඇත.

කෙසේ වෙතත්, ද්‍රව්‍ය සහ අනෙකුත් ගාස්තුවල මිල ඉහළ යාම හේතුවෙන් විචල්‍යයන් ඇති විය හැකි බව පිළිගැනේ. නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති අවස්ථාවක, සම්මත පිරිවැය සහ සත්‍ය පිරිවැය අතර වෙනස එම ප්‍රකාශයේ ඇති විචලන ගිණුම්වල පිළිබිඹු වන අතර ප්‍රතිඵල හිලව් වනු ඇත.

තවද, එල්.කේ.ඒ.එස් 02 (21 වන ඡේදය) අනුව තොග මැනීම සඳහා වන සම්මත පිරිවැය ක්‍රමය වර්තමාන තත්ත්වයන් මත පදනම්ව නිතිපතා සමාලෝචනය සහ සංශෝධනයට යටත්ව නිර්දේශ කරනු ලැබේ. ඒ අනුව, සත්‍ය මිල සහ සම්මත මිල අතර පරතරය අවම කර ගැනීම සඳහා ද්වි වාර්ෂිකව සම්මත මිල ගණන් සමාලෝචනය කරන ලෙස මිල කමිටුවට උපදෙස් දෙන ලදි.

ඉහත සඳහන් කරුණුවලට අමතරව, හරිත සාමාන්‍ය තොග තක්සේරු ක්‍රමය සමඟ ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ලංවිම යෙදී සිටී. ලංවිම ERP ක්‍රමය හඳුන්වා දීමත් සමඟ මෙම ගැටළු ඉවත් වනු ඇත.

තවද ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් සඳහා පොදු කාර්ය පිරිවැය අවශෝෂණය කර ගැනීමට වෙන්කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.

පොදු කාර්ය අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ ප්‍රාග්ධන හෝ නඩත්තු කාර්යයන්ට අදාළව සෘජු ලෙස ආරෝපණය කළ හැකි පොදු කාර්ය භාවිතා කර එම කාර්යයන්ට අවශෝෂණය කිරීමෙන් වේ.

### (ඈ) එල්.කේ.ඒ.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

මණ්ඩලය විසින් අඛණ්ඩව ප්‍රයෝජනයට ගනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.6 (ඉ) සහ 3 (ඇ) සඳහන් පරිදි සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ඒ අනුව, සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. බිලියන 197.21 ක දේපළ, පිරියත හා උපකරණ එහි ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව තක්සේරු නොකර මණ්ඩලය භාවිතා කර තිබුණි. තවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී එහි වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කර තිබූ අතර, ඒ අනුව රු. බිලියන 3.17 ක් මූල්‍ය ප්‍රකාශනවල අතීතයට බලපාන පරිදි ගලපා තිබුණි.

සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් බොහොමයක් ජනන බලාගාර සහ ඒ ආශ්‍රිත වත්කම් වලින් සමන්විත වේ. සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බලාගාරවල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට කමිටුවක් දැනටමත් පත් කර ඇත. කෙසේ වෙතත්, බලාගාරවල සංකීර්ණත්වය සහ සුවිශේෂත්වය නිසා, එය තක්සේරු කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත.

ඉතිරි වත්කම්වල තවත් ප්‍රධාන අංගයක් වන්නේ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ මාර්ග වේ. විගණන නිරීක්ෂණ විසඳීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත.

### (ඈ) එල්.කේ.ඒ. එස් 16 - දේපළ, පිරියත හා උපකරණ

සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල වටිනාකම රු. බිලියන 202.9 ක් වූ අතර ඒ අතුරින් රු. බිලියන 201.01 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

2021-12-31 දිනට සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල වටිනාකම රු. බිලියන 202.9 කි.

සියලුම වංචල ස්ථාවර වත්කම්වලට අදාළ භෞතික සත්‍යාපනය සාර්ථකව සිදු කර ඇති අතර විගණනයේ අවධානය සඳහා වාර්තා සපයා ඇත.

ප්‍රධාන වශයෙන් දැනට පවතින සම්ප්‍රේෂණ මාර්ග, විදුලි සම්ප්‍රේෂණ ජාලයේ අනිවාර්ය කොටස් වන පිරියත සහ යන්ත්‍රෝපකරණ හා සම්බන්ධ රු. බිලියන 201.01 ක් වූ නිශ්චල වත්කම්, වත්කම් කළමනාකරණ සහ තත්ත්ව අධීක්ෂණ ශාඛාවේ පවත්නා පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියේ (CMMS) වත්කම් දත්ත පදනමට හඳුනාගෙන ඇතුළත් කර ඇත.

2021 දෙසැම්බර් 31 වන දිනට, සම්ප්‍රේෂණ ජාලයේ නිශ්චල වත්කම් 01 සහ 02 වගුවේ දක්වා ඇති පරිදි කොටුමා උපපොළවල්, උඩින් පිහිටි සම්ප්‍රේෂණ මාර්ග සහ භූගත කේබල් වලින් සමන්විත වේ.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**වගුව 01 : කොටුමා උපපොළ**

| කොටුමා උපපොළ | කොටුමා උපපොළ සංඛ්‍යාව | මුළු ධාරිතාවය (MVA) |
|---|---|---|
| 132/33 kV | 60 | 4758 |
| 220/132/33 kV | 4 | 1600/380 |
| 220/33 kV | 5 | 498 |
| 132/11 kV | 8 | 792 |
| 220/132kV | 7 | 3010 |

**වගුව 02 : උඩින් පිහිටි (OH- සම්ප්‍රේෂණ මාර්ග/භූගත (UG - කේබල්)**

| උඩින් පිහිටි (OH- සම්ප්‍රේෂණ මාර්ග/භූගත (UG - කේබල) | දිග (කි.මී) |
|---|---|
| 220kV, OH | 807 |
| 220kV, UG | 22 |
| 132kV, OH | 2335 |
| 132kV, UG | 55 |

(1) ඉහත ප්‍රධාන වත්කම් වර්ග පහත පරිදි උපවර්ග කර ඇති සංරචක වලින් සමන්විත වේ. කොටුමා උපපොළ උපකරණ

අ. ප්‍රාථමික උපකරණ - 220kV, 132kV, 33/11kV කොටුමා වත්කම්

ආ. පාලන සහ ආරක්ෂණ උපකරණ

ඇ. සන්නිවේදන උපකරණ

ඈ. මිනුම් උපකරණ

ඉ. ද්විතියික උපකරණ

(2) මාර්ග උපකරණ

අ. උඩින් පිහිටි මාර්ග - 220kV සහ 132kV කුළුණු, සන්නායක ආදිය

ආ. භූගත කේබල් මාර්ග - 220kV සහ 132kV කේබල්, සන්ධි පෙට්ටි

දැනට වත්කම් කළමනාකරණ ශාඛාව විසින් පවත්වාගෙන යනු ලබන පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියේ (CMMS) වත්කම් දත්ත පදනමේ හඳුනාගෙන වාර්තා කර ඇති කොටුමා උපපොළ උපකරණවලට ප්‍රධාන වශයෙන් තනි වත්කම් ආශ්‍රිත අයිතම 24,000 කට වඩා තිබේ.

මීට අමතරව, 2 වගුවේ දක්වා ඇති තනි කුළුණු 9000 කට වැඩි ප්‍රමාණයක් සහ භූගත කේබල් ඇතුළු උඩින් පිහිටි සම්ප්‍රේෂණ මාර්ග, පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියේ (CMMS) වත්කම් දත්ත පදනමේ සම්ප්‍රේෂණ මාර්ග වත්කම් සහ භූගත කේබල් ලෙස හඳුනාගෙන ඇත.

එබැවින්, සම්ප්‍රේෂණ අංශයට අදාළ මෙම වත්කම් භෞතිකව තහවුරු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

## 1.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) **2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණ අංක 10/2434/423/034 ට අනුව, ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගත් රු. බිලියන 159.18 ක් වූ මුළු ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්.සී.සී) භාණ්ඩාගාරය විසින් පැවරිය යුතුය. ඒ අනුව ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදලට සමාන මුදලක් මණ්ඩලය විසින් එල්.සී.සී වෙත ගෙවිය යුතුය. තවද, භාණ්ඩාගාර ලේකම්ගේ 2014 සැප්තැම්බර් 30 දිනැති අංක PE/EN/CEB/Equity/2014 දරන ලිපිය අනුව, මෙම ණය මණ්ඩලයේ සෘජු ණය ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණය ලෙස මණ්ඩලය මෙම ණය වාර්තා කර තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන සහ ජංගම වගකීම් යටතේ ණය ශේෂයේ දිගු කාලීන සහ කෙටි කාලීන කොටස් වෙන වෙනම හඳුනා ගැනීමට ගිණුම්කරණ වැඩපිළිවෙළක් ඇති බවට මණ්ඩලය සහතික විය යුතුය. වර්ෂය සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු පොලිය නිසි පරිදි හඳුනාගෙන තිබිය යුතු වුවද, මණ්ඩලය විසින් කිසිදු වැඩපිළිවෙළක් සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) **ණය ආපසු ගෙවීම ලෙස 2018 දෙසැම්බර් 31 දිනට පෙර මහා භාණ්ඩාගාරය විසින් කරන ලද රු. බිලියන 61 ක මුදලක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධය ලෙස හඳුනාගෙන නොතිබුණි.**

2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ණය ස්කන්ධයට පරිවර්තනය කිරීම යන විෂය යටතේ භාණ්ඩාගාර ලේකම් විසින් අත්සන් කරන ලද 2014-09-30 දිනැති අංකඃ PE/EN/CEB/Equity/2014 ලිපියට අනුව, පුත්තලම ගල් අඟුරු බලාගාරය සම්බන්ධයෙන් ලබා ගත් සියලුම ණය මණ්ඩලය විසින් ලබා ගන්නා ලද සෘජු ණය ලෙස සැලකිය යුතු බව මණ්ඩලයට උපදෙස් දී ඇති අතර ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් මණ්ඩලයට ණය සේවා පිරිවැය පියවා ගැනීමට හැකිවන තෙක් මෙම ණය භාණ්ඩාගාරය විසින් පියවනු ඇත.

තවද, 2018-01-11 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පැවති රැස්වීමේ දී, මණ්ඩලයේ ශේෂ පත්‍රයේ වත්කම සහ වගකීම යන දෙකම පවතින බැවින් එකී ණය සේවාකරණය මණ්ඩලය වෙත පැවරිය යුතු බව අවධාරණය කරන ලදි. ඉන් අනතුරුව, 2019 වසරේ සිට ණය ගෙවීම් ලංවිම ස්කන්ධයට පරිවර්තනය කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දෙන ලදි.

ලංවිම රජය සතු ව්‍යවසායයක් වන බැවින් භාණ්ඩාගාරය විසින් ගනු ලබන තීරණ වලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටී. එබැවින්, භාණ්ඩාගාරයෙන් ලබා දෙන උපදෙස් අනුව ලංවිම පොත්පත් සකස් කළ හැක. මහා භාණ්ඩාගාරයෙන් එවැනි උපදෙස් ලැබීමෙන් පසු 2018 ට පෙර ණය ආපසු ගෙවීම් ලංවිම මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ඇත.

(ii) **1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 42 (6) වගන්තිය අනුව, මණ්ඩලයට ලබා දුන් ණයකට අදාළව ශ්‍රී ලංකා රුපියල නැවත ඇගයීම සම්බන්ධව යම් අලාභයක් හෝ ලාභයක් ඒකාබද්ධ අරමුදලට අය කළ යුතු අතර එම අලාභය හෝ ලාභය රජය විසින් දරනු ලබයි. කෙසේවෙතත්, 2020 සහ 2021 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. මිලියන 6,700 ක සහ රු. මිලියන 676.37 ක විනිමය අලාභයක් මණ්ඩලයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට අතුළත් කර තිබුණි. එම නිසා, 2020 සහ 2021 වසරවල අලාභය පිළිවෙලින් රු.මිලියන 6,700 කින් සහ රු. මිලියන 676.37 කින් වැඩියෙන් දැක්වුණි.**

1969 අංක 17 ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වැනි වගන්තියේ ඉහත 6 වැනි උප වගන්තියට අනුව, ආපසු ගෙවිය යුතු හිඟ ණය ලංවිම විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ එකඟ වූ විනිමය අනුපාතයට තක්සේරු කෙරේ.

කෙසේ වෙතත්, මෙම වියදම පියවා ගැනීමට ලංවිම සඳහා රජය මගින් ලබාගෙන ඇති එවැනි ණය පාඩු පියවා ගැනීමට පොලී අනුපාතයක් යටතේ රජය ලංවිම සමඟ උප ණය ගිවිසුමකට එළඹේ.

මෙම ණය ලංවිම විසින් ලබා ගන්නා ලද සෘජු ණය ලෙස සැලකීමට භාණ්ඩාගාරය තීරණය කර ඇති බැවින් රජය සමඟ එවැනි උප ණය ගිවිසුම්වලට එළඹී නොමැත. ලංවිම ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් ණය සේවාකරණය භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලබන බැවින් විනිමය අනුපාත පාඩු ඇතුළත්ව ණය දෙන ආයතනයට ගෙවන ලද තථ්‍ය ගෙවීම් ලංවිමට ණය ස්කන්ධයට පරිවර්තනයක් ලෙස පවරා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ස්කන්ධය වශයෙන් පරිවර්තනය කරන ලද ණය ප්‍රාග්ධන ආපසු ගෙවීමට අදාළ විනිමය අනුපාත පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(අ) **තොග හිඟයට අදාළ රු. මිලියන 123.86 ක හර ශේෂයක් සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 32.65 ක බැර ශේෂයක් නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි.**

| අංශ | තොග අතිරික්තය / හිඟය - ශුද්ධ-වසර 1 ට වැඩි | පිළිතුර |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය-02 | (1,670,231.44) | 2022 ජූනි සිට 2022 අගෝස්තු 31 දක්වා කාලය තුළ රු. 93,823.50 ක තොග හිඟය නිරවුල් කර ඇත. හිඟ ශේෂය නිරවුල් කිරීම සඳහා පසු විපරම් කටයුතු සිදු කරමින් ඇත. |
| බෙදාහැරීමේ අංශය-03 | (54,258,690.00) | සමහර තොග හිඟයන්, තොග අතිරික්තයන් සහ තොග ගැලපුම් ශේෂයන් 2022 අගෝස්තු වන විට නිරවුල් වේ. තවද, ඉතිරි ශේෂයන් සමාලෝචනය කිරීමට කමිටු පත් කර ඇති අතර කමිටු නිර්දේශ සහ අවශ්‍ය අනුමැතීන් මත පදනම්ව ශේෂයන් නිවුල් කරනු ඇත බස්නාහිර පළාත දකුණ II (WPSII) සම්බන්ධයෙන්, හිඟ ශේෂය නිරවුල් කිරීම සඳහා විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරනු ඇත. |
| ජනන අංශය | (35,280,314.00) | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලක්විජය සංකීර්ණයේ ශේෂය 2022 දී නිරවුල් කරනු ඇත. සමනල සංකීර්ණයේ නි.ස. (SC) විෂය පථය යටතේ ඇති සියලුම බලාගාරවල ගබඩා භාරකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීමට ගිණුම් අංශය විසින් දැනටමත් කටයුතු කර ඇති අතර තොග හිඟය සහ අතිරික්තයන් නිරවුල් කිරීම ආරම්භ කර ඇත. අනෙකුත් සංකීර්ණවලද තොග ගැලපුම් නිරවුල් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **එකතුව** | **(91,209,235.44)** | |

(ආ) **ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 න් පසුව විදේශ ණයවලින් ලද රු. බිලියන 25.23 ක් මහා භාණ්ඩාගාරයෙන් ලද උප ණය ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණි. කෙසේවෙතත්, මෙම ණය ජනරජ ගිණුමේ උප ණය ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, 2015 මාර්තු 18 දිනැති කැබිනට් තීරණ අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ආපසු ගෙවීමේ වගකීම මණ්ඩලය වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය සඳහා වාරික ගෙවීම සහ පොලී ගෙවීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු අතර වෙන්කිරීමක් හෝ කර නොතිබුණි. එම නිසා, මෙම ණයවල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.**

2015-03-18 දිනැති ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ලංවිම 2015 වර්ෂයේ සිට ණය සේවාකරණය සහ ණය ආපසු ගෙවීමට අපේක්ෂා කරයි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රජය සහ ණය දෙන නියෝජිතායතනය අතර දැනටමත් ණය ගිවිසුම් අත්සන් කර ඇති බැවින් මෙම ණය සඳහා ණය සේවාකරණය මහා භාණ්ඩාගාරය මගින් සිදු කෙරේ. එබැවින් ලංවිම සහ ණය දෙන ආයතන අතර ණය ගිවිසුම් අත්සන් කර නොමැති බැවින් ලංවිම ණය දෙන්නා වෙත සෘජු වගකීමක් නොපවත්වන බැවින් මෙම ණය ලබා දීම භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත.

ඉන් අනතුරුව, 2018-01-11 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද රැස්වීමේදී, 2014-12-31 න් පසුව මහා භාණ්ඩාගාරය හරහා ලංවිම වෙත ලබා දී ඇති ණය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව රජයේ ස්කන්ධය බවට පරිවර්තනය කිරීමට තීරණය කරන ලදී.

2021.07.14 දිනැති අංක (FM/AFM(HQ)/භාණ්ඩාගාර ණය) යන ලිපිය මගින් මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. එබැවින්, මෙම ශේෂය ස්කන්ධයට මාරුකිරීමට භාණ්ඩාග ාරයෙන් උපදෙස් ලැබෙන තුරු, ලංවිම එය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ඈ) **රු. බිලියන 66.83 ක් වූ විදේශ ණය හයක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ණය වශයෙන් හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, මහා භාණ්ඩාගාරය සමඟ එළඹී උප ණය ගිවිසුම් නොතිබුණි. ඒ අනුව, එම ණය ආපසු ගෙවීමේ වගකීම මණ්ඩලය විසින් නිසි පරිදි හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, එම ණය පියවීමට හෝ එම ණයවල ප්‍රාග්ධන කොටස සහ පොලිය ආපසු ගෙවීමට කිසිදු වෙන්කිරීමක් කිරීමට මණ්ඩලය කිසිදු වැඩපිළිවෙළක් සකස් කර නොතිබුණි. එබැවින් එම ණයවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.**

මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම් අවසන් කර නොමැති වුවත් මෙම ණය ලංවීම වෙනුවෙන් භාණ්ඩාගාරය හරහා ලබාගෙන ඇත.

කෙසේ වෙතත්, ණය ලංවීමට ලබා දෙන බැවින් ඒවා භාණ්ඩාගාරයට බැරකම් ලෙස සටහන් වේ. තවද, ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දෙන ආයතනය අතර ණය ගිවිසුම් දැනටමත් අත්සන් කර ඇත. එබැවින් මහා භාණ්ඩාගාරයෙන් ණය සේවාකරණයද සිදු කරයි. 2021.07.14 දිනැති අංක. FM/AFM (HQ)/භාණ්ඩාගාර ණය යන ලිපිය මගින් මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත.

(ඇ) **2013 වසරට පෙර රාජ්‍ය ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරනු ලබු කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීම වෙනුවට, පිරිවැය අනුව තක්සේරු කර තිබූ අතර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ශේෂය සහ රඳවාගත් ඉපයීම් රු. මිලියන 36.8 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම හිඟ ශේෂයන් පියවීමේ විස්තර සහ ඒ සඳහා නිර්මාණය කරන ලද ඉන්වොයිසි විගණනයට ලැබී නොතිබුණි.**

2020.12.31 දිනට රාජ්‍ය ආයතන සඳහා සිදු කරන ලද කාර්යයවල තථ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත වටිනාකම අතර වෙනස රු. 43,421,695.18 ක් සහ 2021.12.31 දිනට එම වෙනස රු. 36,811,013.41 ක් විය.

2021/01/01 සහ 2021/12/31 අතර පියවීම් විස්තරවල තොරතුරු විගණකවරුන් විසින් ඉල්ලා තිබූ අතර එය 2022 මැයි 18 දිනැති ලිපි යොමු අංක WAS/ACCT/EX/2022/AA1/15 දරන ලිපිය මගින් විගණකවරුන් වෙත යවන ලදි. හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා විවිධ උත්සාහයන් දැරීමෙන් පසුව පවා මෙම ශේෂයන් දීර්ඝකාලීනව හිඟව පැවතීම හේතුවෙන් මෙම හිඟ ශේෂවලින්, ආගමික උත්සව සහ ක්‍රීඩා අවස්ථා වැනි වෙනත් කටයුතු සඳහා ජංගම ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් ආගමික ආයතනවලින් ලැබිය යුතු මුළු මුදල වන රු. 33,784,518.05 ක් කපා හැරීමට 2021 අගෝස්තු මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

(ඉ) **2016 වර්ෂයේ බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත රු. මිලියන 5,000 ක් ගෙවා තිබූ අතර ඒ අතුරින් රු. මිලියන 2,000 ක් රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණු අතර රු. මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ ගාස්තු ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශණයට ක්‍රමක්ෂය කර තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 2,500 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් ලෙස දැක්වේ.** ඒ අනුව, මණ්ඩලය එම ගනුදෙනුවේ ස්වභාවය පැහැදිලිව වටහාගෙන ඒවා සැලකිල්ලට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

2019.10.16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක. PDE/I/CEB/2/11/(iii) ලිපිය මත පදනම්ව, 2019 වර්ෂයේදී, මෙම ගෙවීම භාණ්ඩාගාරයට ගෙවන ලද ''කළමනාකරණ ගාස්තු'' ලෙස සලකනු ලැබූ අතර, 2017 වසරේ සිට වසර 10 ක කාල සීමාවක් තුළ ක්‍රමක්ෂය කරයි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(ඊ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 6.34 ක් වටිනා කාර්යයන් 8,094 ක් බෙදාහැරීම් අංශවල වත්කම් ගිණුම්වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. තවද, එම වත්කම්වලට අදාළ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.**

| අංශය | අවුරුදු 4 ට වැඩි කෙරීගෙන යන වැඩ ශේෂයන්හි එකතුව | පිළිතුර |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය-01 | 1,124,556,867.00 | වසර 4 කට වැඩි කෙරීගෙන යන වැඩවල මුළු නිවැරදි වටිනාකම රු. 1,119,910,733 ක් වන අතර වසර 4 කට වැඩි කාර්යයන් 406 ක් අතුරින්, 2022 මැයි 31 දිනට අදාළ පළාත් විසින් රු. මිලියන 351.06 ක් වටිනා කාර්යයන් 218 ක් වත්කම්වලට මාරු කර ඇත. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ කරන ලද සියලුම කාර්යයන් නියමිත කාල සීමාවන් තුළ වත්කම්වලට මාරු කිරීමට අඛණ්ඩව කටයුතු කරමින් සිටී. වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතින කාර්යයන් සඳහා විශේෂ අවධානය යොමු කෙරෙන අතර 2022 සැප්තැම්බර් 30 වැනි දිනට පෙර මෙම කාර්යයන් වත්කම් වෙත පැවරීමට කටයුතු කරනු ඇත. |
| බෙදාහැරීමේ අංශය-02 | 1,099,759,554.00 | මෙම කාර්යයන් අතුරින් රු මිලියන. 331.93 ක පිරිවැයක් සහිත කාර්යයන් 194 ක් සම්පූර්ණ කර 2022 වර්ෂය තුළදී වත්කම් වෙත මාරු කර ඇත. තවද තෙවන පාර්ශවයන්ගේ විරෝධතා, මාර්ග නිෂ්කාශන නොලැබීම, පාරිභෝගිකයාගේ අවශ්‍යතා වෙනස් වීම වැනි විවිධ හේතූන් මත අවසන් නොකළ සහ කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වනු ලබන කාර්යයන් පවතී. |
| බෙදාහැරීමේ අංශය-03 | 2,385,892,793.00 | මෙම කාර්යයන් අතරින් රු. මිලියන 1,960.13 ක කෙරීගෙන යන වැඩ කාර්යයන් 8,878 ක් 2022 වර්ෂය තුළ නිරවුල් කර ස්ථාවර වත්කම් වෙත මාරු කර ඇත. සම්පූර්ණ කරන ලද කාර්යයන් මාසික පදනමින් වත්කම් ගිණුමට මාරු කිරීම ඇතුළුව ඉතිරිව ඇති දිගුකාලීන හිඟ කාර්යයන් සමාලෝචනය කිරීමට සහ සම්පූර්ණ කිරීමට කමිටු කටයුතු කරමින් සිටී. |
| බෙදාහැරීමේ අංශය-04 | 1,728,878,518.00 | සම්පූර්ණ කරන ලද සියලුම කාර්යයන් සම්පූර්ණ කිරීමේ වාර්තා ලැබුණු විට වත්කම්වලට මාරු කරනු ලැබේ. දිගුකාලීනව පවතින ප්‍රාග්ධන කාර්යයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ භාරදීම සඳහා පළාත් මට්ටමේ කමිටු පත් කර ඇත. එබැවින්, 2022 අගෝස්තු මාසය වන විට මෙම අංශයේ හිඟ කෙරීගෙන යන වැඩවල 2021 ට සාපේක්ෂව සියයට 35 ක සැලකිය යුතු අඩුවීමක්හි දැකිය හැකිය. |
| **එකතුව** | **6,339,087,732.00** | |

**(උ) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම වීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. තවද, ව්‍යාපෘතිය නිම කර දින සිට එම වාහනවලට අදාළ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.**

පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර-02) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 06 ක හිමිකාරිත්වය 2021 දෙසැම්බර් 31 වනදා දක්වාත් ලංවිම වෙත පවරා දී නොමැත. වාහනවල අයිතිය ලංවිමට පැවරීමෙන් පසු ප්‍රාග්ධනිත කිරීම සිදුවනු ඇත.

**(ඌ) බෙදාහැරීමේ අංශය, 4 ට අදාළ වීදි ආලෝකකරණ නඩත්තු වියදම්වලින් අය කර ගත නොහැකි වූ රු. මිලියන 32.32 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ප්‍රතිපාදන සලසා නොතිබුණි.**

වීදි ආලෝක නඩත්තු වියදම් සඳහා රු. මිලියන 32.32 ක් වූ අයකරගත නොහැකි ගිණුම් සඳහා දැනටමත් 2022 මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(එ) අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් වීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රු. මිලියන 41.48 කින් අඩුවෙන් දැක්වුණි.**

| අංශය | 2021.12.31 දිනට විවිධ ණයගැති බැර ශේෂ | පිළිතුර |
|---|---|---|
| **බෙදාහැරීමේ අංශය - 01** | | රු. මිලියන 41.48 න්, 2021 දී අසාමාන්‍ය බැර ශේෂයන් සමඟ හිලව් කර ඇති රු. මිලියන 37.65 ක විවිධ ණයගැති ශේෂයක් බෙදාහැරීමේ අංශය 01 හි ඇත. මෙම ශේෂයෙන් රු. මිලියන 32.21 ක බැර ශේෂය දැනටමත් නිවැරදි කර 2022 මූල්‍ය ප්‍රකාශනවල ගලපා ඇති අතර බැර ශේෂයන්ට එරෙහිව හිලව් නොකර විවිධ ණයගැති ශේෂයන් ඉදිරිපත් කර ඇත. ඉතිරි රු. මිලියන 5.44 ක ශේෂය 2022 සැප්තැම්බර් මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කර නිවැරදිව ඉදිරිපත් කරනු ඇත. |
| නි. සා. (කොළඹ නගරය) | (36,333,263) | |
| නි. සා. (උතුරු මැද පළාත) | (82,333) | |
| නි. සා. (උතුරු පළාත) | (969,129) | |
| නි. සා. (වයඹ පළාත-1) | (271,130) | |
| **බෙදාහැරීමේ අංශය - 03** | (3,731,851.00) | LRDD ලයිට්ං රත්නපුර ව්‍යාපෘතියේ බැර ශේෂ අගය හේතුවෙන් විවිධ ණයගැතියන්ගේ ශේෂය අඩුවෙන් දක්වා ඇත.<br><br>ලයිට්ං රත්නපුර ණයගැති ශේෂයේ බැර ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **එකතුව** | **(41,487,506.00)** | |

**(ඒ) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ රු. බිලියන 2.7 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) විස්තීරණ ආදායම් ප්‍රකාශණයට වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.**

ලැබිය යුතු ඊ.එස්.සී, 2019, 2020 සහ 2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට කපා හැරීමට අපේක්ෂිත වූ ඊ.එස්.සී නියෝජනය කරයි. කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අදාළ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව 2019 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම ඊ.එස්.සී ශේෂය කපා හැරීම වෙනුවට මෙම කරුණ විදුලිබල අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට යොමු කිරීම මඟින් මෙම ශේෂය අයකර ගැනීමට හෝ වෙනත් ගෙවිය යුතු මුදලකට එරෙහිව පියවීමට විකල්ප සොයා බැලීම, ලංවිම විගණන කමිටුවේ නිර්දේශය විය. කාල සීමාව වසර තුනකට සීමා කිරීම හේතුවෙන් ලංවිම මත ඊ.එස්.සී බර 2018 ජාතික අයවැය යෝජනාවල කොටසක් ලෙස මහා භාණ්ඩාගාරය වෙත දන්වා ඇති අතර බදු සහනවල කොටසක් ලෙස 2020 වර්ෂයේදී විදුලිබල අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත නැවත දැනුම් දී ඇත.

මෙම තත්ත්වය පැහැදිලි කරමින් රු. බිලියන 2.7 ක මුදල කපා හැරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල සටහනක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(ඕ) නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොගෙන රු. මිලියන 871.2 ක මාර්ගස්ථ තොග අවුරුදු එකක් සහ පහක් අතර කාල පරාසයක් තිස්සේ මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. තවද, රු. මිලියන 5.1 ක් වූ අසාමාන්‍ය බැර ශේෂයක් මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. මාර්ගස්ථ තොග ශේෂ සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි විගණනයට ලබා දී නොතිබුණි.**

<table>
<tr><th>අංශ</th><th>අවුරුදු එකකට වැඩි මාර්ගස්ථ තොග ශේෂය</th><th>පිළිතුර</th></tr>
<tr><td>බෙදාහැරීමේ අංශය-01</td><td>423,708,579.00</td><td>බෙදාහැරීමේ අංශය-01 හි 2021.12.31 දිනට රු. මිලියන 242.37 (රු. 242, 376,020) ක් වූ වසර 5 ට වැඩි ශේෂයක් නියෝජනය කරයි.<br><br>
<table>
<tr><th>පළාත/ශාඛාව</th><th>වටිනාකම (රු)</th></tr>
<tr><td>නි.සා. (කොළඹ නගරය)</td><td>11,620</td></tr>
<tr><td>නි.සා. (NWP 1)</td><td>20,090</td></tr>
<tr><td>නි.සා. (NP)</td><td>1,309,000</td></tr>
<tr><td>ආයතනික කාර්යාලය (DD1)</td><td>241,035,310</td></tr>
<tr><td>එකතුව</td><td>242,376,020</td></tr>
</table>
<br>රු.241,035,310 ක් වූ ආයතනික අංශයේ ගිණුම් ශේෂය, කලින් විවිධ ණය ගැතියන් යටතේ වර්ගීකරණය කරන ලද ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් ගිණුම නියෝජනය කරයි. 2021 වර්ෂය තුළදී, රු. 59,872,376.68 ක මුදලක් ගිණුම්වල ගලපා ඇත. ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් පිළිබඳ තොරතුරු අදාළ පළාත් කාර්යාල මගින් ලබා ගත් පසු පොත්වල ගැලපීම සහ එම මුදල සුදුසු ගිණුම් කේතයට නැවත වර්ගීකරණය කිරීමට තවදුරටත් කටයුතු කර ඇත. ඉහත කරුණුවලට අමතරව 2017-04-07 දිනැති සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ අංක 2017/GM/20/FM පිළිපදින ලෙසත් එවැනි ගනුදෙනුවල ශේෂයන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිරවුල් කරන ලෙසත් ගණකාධිකාරීවරුන්ට (වත්කම් සහ MI) උපදෙස් දී ඇත.</td></tr>
<tr><td>බෙදාහැරීමේ අංශය-02</td><td>106,046,035.00</td><td>i) විදේශීය මිලදී ගැනීම් වලදී, මිලදී ගැනීම අවසන් වන තෙක් දරන ලද වියදම් මාර්ගස්ථ තොග ගිණුමේ ඇතුළත් වේ. ණයවර ලිපිය සඳහා වියදම්, මිලදී ගැනීම් සඳහා සියයට 85 ගෙවීම සහ ප්‍රවාහන ගාස්තු, දේශීය නියෝජිත ගාස්තු, රේගු සහ අගය එකතු කළ බද්ද වැනි අනෙකුත් අදාළ වියදම් මෙයට ඇතුළත් වේ. අවසාන සියයට 15 ක ගෙවීම සහ අනෙකුත් අදාළ ගාස්තුවලින් පසුව, ද්‍රව්‍යවල පිරිවැය තොගය ලෙස මාරු කරනු ඇත. එතෙක් එම අගයන් මාර්ගස්ථ තොග ගිණුමේ තාවකාලිකව ගිණුම්ගත කරනු ඇත.<br><br>ii) දේශීයව මිල දී ගත් භාණ්ඩ ගැල්වනයිස් කිරීම සඳහා LTL ගැල්වනයිසර් වෙත භාර දුන් විට, එම තොග නැවත ලංවීමට ලැබෙන තුරු මාර්ගස්ථ තොග ගිණුමේ ගිණුම්ගත කෙරේ. ඒ අනුව, ඉහත සඳහන් පරිදි, මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂයන් පවතී.<br><br>එක් එක් ටෙන්ඩරය අනුව මාර්ගස්ථ තොග ගිණුමේ සවිස්තර ලැයිස්තුව 2021 දෙසැම්බර් වලින් අවසන් වූ වර්ෂය සඳහා වන අවසාන ගිණුම් සමඟ අමුණා ඇත.</td></tr>
<tr><td>බෙදාහැරීමේ අංශය-03</td><td>337,317,365.00</td><td>2022 මූල්‍ය කාලය තුළදී මාර්ගස්ථ තොග ගිණුමේ පැවති සැලකිය යුතු ශේෂය (සියයට 99) නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නිරවුල් කර ඇත. තවද, ඉතිරි හිඟ ශේෂය සමාලෝචනය කර ගිණුම්වලින් නිරවුල් කිරීමේ ක්‍රියාවලියේ පවතී.</td></tr>
<tr><td>බෙදාහැරීමේ අංශය-04</td><td>4,181,331.00</td><td>සඳහන් කළ ශේෂයෙන් (රු. 4,181,331), 2022 අගෝස්තු 31 දිනට බස්නාහිර පළාත දකුණ 1 හි රු. මිලියන 1.8 ක හර ශේෂය හැර අනෙකුත් සියලුම ශේෂයන් නිරවුල් කර ඇත.</td></tr>
<tr><td>එකතුව</td><td>871,253,310.00</td><td></td></tr>
</table>

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ඕ) **දෙහිවල-ගල්කිස්ස විදුලිය බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතියේ වියදම වූ රු. මිලියන 39 ක්, ප්‍රාග්ධනීත කිරීමෙන් තොරව 2010 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි.**

ව්‍යාපෘති අංශයේ NTDND@EIP යටතේ වන දෙහිවල-ගල්කිස්ස විදුලිබල බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතියේ රු. 39,075,308 ක් වූ කෙරීගෙන යන වැඩ ශේෂය ප්‍රාග්ධනීත කිරීමට අනුමැතිය ලැබී ඇති අතර කෙරීගෙන යන වැඩ ශේෂය 2022 වසර අවසන් වීමට පෙර ප්‍රාග්ධනීත කිරීම සඳහා බෙදාහැරීමේ අංශය 4 මගින් දැනටමත් ව්‍යාපෘති අංශය වෙත මාරු කර ඇත.

(ක) **අපහරණය කරන ලද රු. මිලියන 14 ක් වූ ස්ථාවර වත්කම් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.**

ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගැනීමටත්, 2022 වසර අවසානයේදී මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගිණුම් සටහන් යෙදීමටත් ක්‍රියාමාර්ග ගනු ඇත.

(ග) **වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගැනීම, නිවැරදි කිරීම සහ වලක්වා ගැනීමට හැකිවනු පිණිස අවශ්‍ය වන සුදුසු අභ්‍යන්තර පාලනය පද්ධතියක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමට මණ්ඩලය අසමත් වීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව යළි පිළියෙල කර තිබුණි.**

ඉදිරියේදී එවැනි යළි පිළියෙල කිරීම් අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. ලංවිම මෙහෙයුම් සහ ගණුදෙණුවල සංකීර්ණත්වය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් තොර බව සහතික කිරීම සඳහාත්, පෙර වසරවල යම් සාවද්‍ය ප්‍රකාශණ සිදුවී ඇත්නම් ඒවා නිවැරදි කර ගැනීම සඳහාත් මූල්‍ය ප්‍රකාශන යළි පිළියෙල කිරීමට අවශ්‍ය වන අවස්ථා පවතී.

(ච) **නිරවුල් කිරීම වෙනුවට අන්තර් අංශවල ජංගම ගිණුමේ ශේෂයන් ණයගැති පාලන ගිණුමට මාරු කිරීම හේතුවෙන් රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි.**

2004 දී බෙදාහැරීමේ අංශ විමධ්‍යගත කරන අවස්ථාවේ දී බෙදාහැරීමේ අංශ 1 සහ බෙදාහැරීමේ අංශ 2 ට අදාළව රු. මිලියන 556.81 ක සංක්‍රමණ බැර ශේෂයක් සහ රු. මිලියන 557.94 ක හර ශේෂයක් පැවතුණි''. මෙයට අමතරව හර සහ බැර ශේෂවල ස්වභාවය සහ විස්තර තහවුරු කිරීමට ලේඛනගත සාක්ෂි නොමැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා එය වෙළෙඳ ණයගැති ගිණුමට මාරු කර ඇත. මෙම ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.

(ජ) **2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාර ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක් වියදම් කිරීමෙන් අනතුරුව, 2021 ඔක්තෝම්බර් 26 දින ගන්නා ලද රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව එය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. එසේ වුවද, එම මුදල කපා හැරීමට කිසිදු ප්‍රතිපාදනයක් 2021 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.**

දරන ලද වියදම් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ගිණුම්වල ප්‍රතිපාදනයක් ඇතුළත් කළ හැකිය.

(ට) **ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ වාහන 28 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණි. මේ නිසා, එම වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.**

මෙම වාහන ලක්විජය විදුලි බලාගාරයේ අදියර I සහ II ව්‍යාපෘතිය යටතේ ලැබී ඇත. මෙම ගැටළුව නිරාකරණය කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.

(ඩ) **මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටා තිබූ රජයට අයත් ඉඩම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මණ්ඩලයේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, මණ්ඩලයේ වත්කම් රු. මිලියන 105.62 කින් වැඩියෙන් දැක්වුණි.**

ලංවිම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අදාල ලියකියවිලි නොමැති අතර එම නිසා ලංවිම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය තහවුරු කිරීමට කටයුතු සලසන ලෙස ලංවිම ඉඩම් කොමසාරිස්වරයාගෙන් ඉල්ලා ඇත. අදාළ හිමිකම් ලේඛනය නිකුත් නොකර දිගුකාලීන පදනමින් බදු දීමට කටයුතු කරන ලෙස ඉඩම් කොමසාරිස්වරයා කොළඹ ප්‍රාදේශීය ලේකම්වරයාට දන්වා ඇත. කෙසේ වෙතත්, ලංවිම දේපල අයිතිය සඳහා මිස බදු ගැනීමට කැමැත්තක් නොදක්වයි.

තවද, 2022-08-23 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් සහ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් සමඟ රැස්වීමක් පවත්වා ඇත. එම රැස්වීමේදී ගනු ලැබූ තීරණය වූයේ මෙය කඩිනමින් විසඳා ගැනීමයි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**1.2.2.3 නොසැසඳු වෙනස්කම්**

(අ) **2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. මිලියන 1,235 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉහත ශේෂය තුළ 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 753.61 ක විවාදිත ශේෂයක් පැවතී අතර මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 469.11ක නොසැසඳු ශේෂයක් පැවතුණි.**

ලංවිම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරයේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමේ දී රු. මිලියන 753.61 ක විවාදිත මුදල පිළිබඳව සාකච්ඡා කර ඇති අතර එය විසඳීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉන්වොයිසි පියවන විට ප්‍රමුඛතාවය මත ප්‍රමාද වූ පොලී පියවීම මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒකපාර්ශ්විකව සිදු කරන ලද පරිවයන් හි වෙනසක් හේතුවෙන් 2021 දෙසැම්බර් මාසයේ දී සහ මේ දක්වා රු. මිලියන 469.11 ක වෙනසක් පවතී.

(ආ) **බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට අයනොවී පවතී. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 181.42 ක් පැහැදිලි කිරීමක් නොමැතිව බෙදාහැරීමේ අංශය 3 වෙත මාරු කර තිබුණි.**

රු. මිලියන 423.76 ක ණය ගැති ශේෂය අතුරින්, රු. මිලියන 241.22 ක් පොත්වල පවතී. ශේෂය නිරවුල් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

පවතින තොරතුරුවලට අනුව, විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී එම මුදල මාරු කර නොතිබූ බැවින්, රු. මිලියන 423 ක ශේෂය 2015 වර්ෂයේ සිට අතිරේක මූල්‍ය කළමනාකාර (AFM) පිරිවැය මධ්‍යස්ථානයේ පොත් යටතේ පවතී. කිසියම් ශේෂයක් ඔවුන්ට අයත් දැයි පරීක්ෂා කරන ලෙස සියලුම ප්‍රාදේශීය අතිරේක මුදල් කළමණාකරුවන් වෙත දැනුම් දී ඇති අතර ප්‍රාදේශීය අතිරේක මුදල් කළමණාකරුවන් වෙතින් ලැබෙන ප්‍රතිචාරවලින් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

(ඇ) **බෙදාහැරීමේ අංශය 1 හි සාමාන්‍ය ණය ගැතියන් සම්බන්ධව පද්ධතිය ජනනය කරන ලද ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් අතර වෙනසක් පවතී. ඒ අනුව, පද්ධතිය විසින් ජනනය කරන ලද ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් කාලීනව සංසන්ධනය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ණය ගැතියන්ගේ රු. මිලියන 6.77 ක වෙනසක් සමාලෝචිත වර්ෂය තුළදී නිරීක්ෂණය විය.**

බිල්පත් පද්ධතියේ ශේෂයට ඇතුළත් කර ඇති නමුත් ලෙජරයේ ශේෂයට ඇතුළත් කර නොමැති අවිනිශ්චිත ගිණුම්, රු. 17,564,888 ක සාමාන්‍ය සැපයුම් වෙනසට හේතු වේ. බිල්පත් ක්‍රමය තුළ අවිනිශ්චිත මුදල සලකා බලනු ලබන නමුත් ලෙජරයේ ණයගැති ලෙජර ශේෂය තුළ අවිනිශ්චිත ශේෂය ඇතුළත් නොවන අතර එය වෙනමම අවිනිශ්චිත ගිණුමේ ගිණුම්ගත කෙරේ. බිල්පත් පද්ධතියේ ශේෂය සහ ලෙජරයේ ශේෂය අතර සැසඳීමක් සිදු කරන ලද අතර සැසඳුම් ප්‍රකාශය ලබා දී ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ඈ) **2021 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 297.33 ක හර ශේෂයක් සහ රු. මිලියන 1,409.57 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේවෙතත්, නොසැසඳූ ශේෂ සංසන්ධනය කිරීම් විගණනයට ලැබී නොතිබුණි. එම නිසා, එකතු කිරීමේ පාලන ගිණුමේ ඇති ශේෂයන්හි නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය. හඳුනා නොගත් ආරම්භක ශේෂය වූ රු. මිලියන 166.45 ක් එකතු කිරීමේ පාලන ගිණුමට ඇතුළත් කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.**

| අංශය | බැර ශේෂය | හර ශේෂය | පිළිතුර |
|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය - 01 | 105,823,157.78 | (398,179,897.06) | එකතු කිරීමේ පාලන ගිණුම නිතිපතා සැසඳීම අවශ්‍ය වන අතර තොරතුරු තාක්ෂණ ශාඛාවේ සහාය ඇතිව පාලන ගිණුම සැසඳීම සඳහා පළාත් ආදායම් ගණකාධිකාරීවරුන්ට අදාළ උපදෙස් ලබා දී ඇත.වෙනස්කම් හඳුනා ගනිමින් සැසඳීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. |
| බෙදාහැරීමේ අංශය - 02 | 191.508,556.91 | (600,379,371.64) | එකතු කිරීමේ පාලන සැසඳුම සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |
| බෙදාහැරීමේ අංශය - 03 | - | (98,757,289.00) | සියලූම පළාත්වල ආදායම් අංශ විදිනම එකතු කිරීම උකහා නොගැනීම හේතුවෙන් පසුගිය දින එකක හෝ දෙකක එකතුකිරීම් බිල්පත් සාරාංශවල ආවරණය නොවන නිසා ඒවා අදාළ ණයගැති පාලන ගිණුමට මාරු නොකර එකතු කිරීමේ පාලන ගිණුමේ බැර ශේෂයන් පැවතිය හැකිය. මෙය ඉදිරි මාසය වන විට නිරවුල් වන අතර එය අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, සැසඳීම් සකස් කර ඇති අතර, එක් එක් පළාත් අනුව ශේෂය හඳුනා ගැනීමට හැකි වේ. |
| බෙදාහැරීමේ අංශය - 04 | - | (375,576,200.86) | දකුණු පළාත 1-2021 දෙසැම්බර් 31 දිනට දකුණු පළාතේ එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 148 ක් වූ බැර ශේෂය සැසඳීම සිදුවෙමින් පවතී. ජූලි 31 දිනට ශේෂය රු. මිලියන 11ක් පමණක් වේ. දකුණු පළාත 2-එකතු කිරීමේ පාලන ගිණුම විශ්ලේෂණය කර ඇති අතර අදාළ සැසඳුම ඉදිරියේදී ඉදිරිපත් කෙරේ. |
| මූලස්ථානය | (38,049,717.00) | | නිවැරදි කිරීම සඳහා අනෙකුත් අංශ සමඟ සැසඳීමට ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **එකතුව** | **297,331,714.69** | **(1,510,942,475.56)** | |

(ඉ) **1998 සිට 2021 දක්වා කාලය තුළ එකතු කරන ලද රු. මිලියන 68.99 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි.**

පාරිභෝගික පැමිණිලි ලැබීමෙන් පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කළ හැක. පාරිභෝගිකයා නිවැරදි පාරිභෝගික ගිණුම් අංකය දැනුම් දුන් විට අදාළ මුදල පාරිභෝගික ගිණුමට මාරු කළ හැකිය. ඊට අමතරව, එකතු කිරීමේ නියෝජිතයින්ගෙන් විස්තර ලබා ගනිමින් අවිනිශ්චිත එකතු කිරීම් නිරවුල් කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි.

වාණිජ බැංකු සහ අනෙකුත් වෙළඳුන් විසින් මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) හඳුන්වා දීමත් සමඟම අවිනිශ්චිතතා ඇති වන අවස්ථා ඉහළ ගොස් තිබේ. බොහෝ අවස්ථාවලදී, CDM යන්ත්‍රය පාරිභෝගිකයා විසින්ම ක්‍රියාත්මක කරන බැවින් සහ නිවැරදි ගිණුම් අංකය පිහිටුවීමට වෙනත් ලේඛනගත සාක්ෂි නොමැති බැවින් අවිනිශ්චිතතා නිරවුල් කිරීමට අමතර තොරතුරු කිසිවක් අපට ලබා දීමට බැංකුවලට නොහැකි වේ.

දිගුකාලීන හිඟ අවිනිශ්චිත ශේෂය සම්බන්ධයෙන්, විවිධ ආදායම්වලට දිගුකාලීන හිඟ අවිනිශ්චිත ගෙවීම් අවශෝෂණය කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පියවර ගැනීමට (වසර දෙකකට පෙර ගෙවූ ගෙවීම්) සැලසුම් කර ඇත. ගෙවීම් පිළිබඳ විමසීම් ගෙවන දින සිට වසර 2 ක් දක්වා පමණක් ලබා දෙන බව ලංවිම බිලෙහි පැහැදිලිව දක්වා ඇති බැවින් මෙය කළ හැකිය.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(ඊ) මණ්ඩලය විසින් පාරිභෝගිකයින් සඳහා වැරදි ගාස්තු ක්‍රමවේදයක් යෙදීම හේතුවෙන් 2019 වසරේ සිට ලැබිය යුතු රු. මිලියන 38.76 ක මුදලක් අය නොවී පැවතුණි.**

විගණන කමිටු රැස්වීමේදී මෙය ආමන්ත්‍රණය කර ඇති අතර 2021 දෙසැම්බර් 28 දින පැවති විගණන කමිටු රැස්වීමේ තහවුරු කරන ලද රැස්වීම් වාර්තාව අනුව, ඒඊඑස් කැලණිතිස්ස පුද්ගලික සමාගමට අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම සහ තොග ගිවිසුම සම්බන්ධයෙන් සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සකස් කරන ලද කමිටුවේ කමිටු වාර්තාව අවසන් කරන ලෙස විගණන කමිටුව නියම කළේය. කමිටු වාර්තාව මෙතෙක් ඉදිරිපත් කර නොමැත.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

දැන ගැනීම සඳහා

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

දැන ගැනීම සඳහා

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.**

දැන ගැනීම සඳහා

**2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.**

දැන ගැනීම සඳහා

**2.2.2 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වාගෙන ගොස් තිබුණි.**

| නීතියට / විධානයට යොමුව | විස්තරය | පිළිතුරු |
|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය. | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රයක් ලබා නොගත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 6.02 ක් වූ ගිගාවොට් 261.32 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. | 2021 දී විශ්‍රාමලත් අයි.පී.පී බලාගාර 3 වන්නේ ඒස් පවර් ඇඹිලිපිටිය, ඒස් පවර් ජෙනරේෂන් මාතර සහ ඒසියා පවර්.<br><br>සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට විශ්‍රාමික අයි.පී.පී බලාගාරවලින් විදුලි බලය මිලදී ගැනීමට 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 7(1) හෝ 43(1) වගන්තිවලින් කිසිදු නීතිමය බාධාවක් නොමැත. මෙම විශ්‍රාමික අයි.පී.පී බලාගාර තුනේ කල් ඉකුත් වූ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම සඳහා ලංවිම මහජන උපයෝගිතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා තිබූ අතර අනුමැතිය සඳහා ඔවුන් වෙත දීර්ඝ කරන ලද බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් ඉදිරිපත් කර ඇත.<br><br>ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බවට සහතික වීමේ ලංවිම වගකීමට (සම්ප්‍රේෂණ බලපත්‍රයක් දරන්නෙකු වශයෙන්) අනුකූල වීමට ලංවිමට බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීමට සිදු විය. කිසියම් විදුලි කප්පාදුවක් පනවනු ලැබුවහොත්, කර්මාන්ත/හෝටල් සහ වාණිජ ගොඩනැගිලි සඳහා සපයනු නොලබන බලශක්තිය හේතුවෙන් රටේ ආර්ථිකයට සිදුවන බලපෑම පිළිබඳව ලංවිම තවදුරටත් සලකා බලා ඇත. ලංවිම කැබිනට් අනුමැතිය ඇතිව එය සිදු කර ඇත. |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| නීතියට / විධානයට යොමුව | විස්තරය | පිළිතුරු |
|---|---|---|
| (ආ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 46 වැනි වගන්තිය, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 11 (අ) හා (ආ) වගන්තිය | 1989 සිට සෑම වර්ෂයක් අවසානයේ දී දළ ස්ථාවර වත්කම්වල මුළු වටිනාකමෙන් සියයට 0.1 ක දායකත්වයක් රක්ෂණ ඊස්ක්රෝ අරමුදලට මාරු කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. මිලියන 10,657 ක් පමණක් ආයෝජනය කර තිබුණි. විගණනයේදී කරන ලද ගණනය කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ තවත් රු. මිලියන 852.87 ක් ආයෝජනය කළ යුතු බව අනාවරණය විය. | ලංවිම වසර ගණනාවක සිට අහිතකර මුදල් ප්‍රවාහ තත්ත්වයන් අත්විඳින බැවින් රක්ෂණ ආයෝජන එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය නොකිරීම මෙම වෙනස ඇති වීමට ප්‍රධාන වශයෙන්ම හේතුවී ඇත. ඉන්ධන සහ ගල් අඟුරු මිල ඉහළ යාම හේතුවෙන් ජනන පිරිවැය ඉහළ යද්දී පසුගිය වසර 8 තුළ ගාස්තු සංශෝධනයක් සිදු කර නොමැත. කෙසේවෙතත්, ලංවිම ද්‍රවශීලතා තත්ත්වය සහ මුදල් ප්‍රවාහය වැඩිදියුණු වූ පසු දළ ස්ථාවර වත්කම්වලින් සියයට 0.1 ට සමාන මුදලක් රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ ආයෝජනය කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය | ප්‍රතිපාදනයට පටහැනිව, රේඛීය අමාත්‍යාංශයට සහ මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට මුදා හරින ලද සේවකයින් 65 දෙනෙකුට වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු. මිලියන 105.22 ක් ගෙවා තිබුණි. | ලංවිමට රේඛීය අමාත්‍යාංශය විසින් සිය සේවකයන් අමාත්‍යාංශය වෙත මුදාහරින ලෙස කරන ලද ඉල්ලීම් අත්හිටුවීමට හැකියාවක් නොමැති අතර මේ සම්බන්ධයෙන් දරන වියදම් ලංවිම පාලනය කළ නොහැක. කෙසේ වෙතත්, ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් විදුලිබල අමාත්‍යාංශයට ලිපියක් යවා ඇති අතර, අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලංවිම විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලා ඇත. |
| (ඈ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 1994 ජූනි 14 දිනැති පී.ඊ.ඩී 95 චක්‍රලේඛය සහ අමාත්‍යාංශයේ විගණන කමිටුවේදී 2020 සැප්තැම්බර් 25 දින ගත් තීරණය. | විධිවිධානවලට හා තීරණවලට පටහැනිව, 2020 වර්ෂයේදී ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් ලෙස රු.බිලියන 1.2 ක් ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ තීරණයකට අනුව, වැටුප් සහ අනෙකුත් වරප්‍රසාද කළමනාකරණය සමඟ අත්සන් කරන ලද සාමූහික ගිවිසුමක් හරහා ලංවිම සේවකයින් වෙත ලබා දී ඇත. 2018 අප්‍රේල් 23 දිනැති අංකඃ 2068/5 දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් කරන ලද අවසන් වරට අත්සන් කරන ලද සාමූහික ගිවිසුමේ 13 වැනි වගන්තිය අනුව "ඒ ඒ දීමනා වලට අදාල වන කොන්දේසි වලට යටත්ව, මෙම ගිවිසුම බලාත්මක වන දිනයෙහි වලංගුව ක්‍රියාත්මක වෙමින් පවතින දීමනා අඛණ්ඩව මෙම ගිවිසුම් කාල සීමාව තුල ඉදිරියටත් සේවා නියුක්තිකයින්ට ලැබෙනු ඇත"<br><br>1984 සිට ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් ලංවිම සේවකයින් වෙත ලබා දෙන බැවින්, සාමූහික ගිවිසුමකින් නීත්‍යානුකූලව ආවරණය වන එවැනි ගෙවීමක් ප්‍රතික්ෂේප කිරීමට කළමනාකාරීත්වයට නොහැකි වූ අතර, මෙම ප්‍රතිලාභය සේවකයින්ට ලබා දෙන බව කළමනාකාරීත්වය සහතික විය.<br><br>කෙසේ වෙතත්, 2022.07.14 දිනැති පී.ඊ.ඩී 03/2022 (I) චක්‍රලේඛය අනුව 2022 වර්ෂය සඳහා ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් කිරීම අත්හිටුවීමට මණ්ඩලය තීරණය කර ඇත. |
| (ඉ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය. | විධිවිධානවලට පටහැනිව, ඉපැයීම් ගණනය කිරීමේදී රඳවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දීමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. එම ඉපැයීම් අනුව සේවක අර්ථසාධක ගෙවීම් කර තිබුණි. | 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනතේ 47 වැනි වගන්තියේ (f) උපවගන්තියේ සේවක අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු මුදල ගණනය කිරීම සඳහා ''නියම කළ හැකි වෙනත් ආකාරයේ වැටුප්'' භාවිතා කළ හැකි බව සඳහන් වේ. මෙම වගන්තියට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල සඳහා ඉපැයීම් ගණනය කිරීමේදී රඳවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනා ගෙවීම් හෝ වෘත්තීය දීමනාව / අර්ධ වෘත්තීය දීමනා අතුරින් ඉහළ දීමනාව සලකා බැලීමට මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව මෙය නීතියට පටහැනි නොවේ. |

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| නීතියට / විධානයට යොමුව | විස්තරය | පිළිතුරු |
|---|---|---|
| (ඊ) 2007 ජනවාරි 10 දින සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමඟ එළඹී විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය | කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ සපයන විදුලිබලයට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, විදුලිබල පිරිවැය යටතේ අය කර යුතු වේ. කෙසේවෙතත්, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. | සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමේ කෙරවලපිටිය බලාගාරය 220 kV වෝල්ටීයතා මට්ටමින් ලංවිම ජාලයට සම්බන්ධ කර ඇති අතර එම වෝල්ටීයතා මට්ටමින් විදුලි මිනුම් පද්ධතිය සවි කර ඇත. 2021-12-16 දිනැති අතිරේක සමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශ 2) ලිපිය මගින් සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සම්ප්‍රේෂණ පාරිභෝගිකයෙකු ලෙස සලකා බැලීමට පියවර ගන්නා ලෙස ඉල්ලා ඇත. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2022-01-24 දින නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (EM) ශාඛාවේ රැස්වීමක් පවත්වන ලද අතර එහිදී තීරණය කරන ලද්දේ,<br>අ) දැන් භාවිතාකරන හිලව් කිරීමේ ක්‍රමය අනුගමනය කිරීම සඳහා නිකුත් කර ඇති විධානය සෙවීම සහ:<br>ආ) අදාළ මුළු කාලය සඳහා හිලව් කිරීමේ ක්‍රමයෙන් ලංවිම විසින් වෙස්ට් කෝස්ට් පවර් සමාගමෙන් අයකරන ලද මුදල සහ I 3 ගාස්තුව සැසඳීම.<br>2014-11-12 දිනැති අතිරේක සමාන්‍යාධිකාරී (ආයතනික උපායමාර්ග) ලිපිය මගින් විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තියට අනුව ලංවිමෙන් පරිභෝජනය කරන විදුලිය හිලව් කිරීම සිදු කළ හැක්කේ සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට ගෙවිය යුතු බලශක්ති ගාස්තුවෙන් පමණක් බව නිරීක්ෂණය විය. එම විධානයට අනුව 2014 ඔක්තෝබර් මාසයේ සිට සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම ලබා ගන්නා බලශක්තියේ වටිනාකම ලංවිම විසින් හිලව් කර ගැනීම ආරම්භ කර ඇත.<br>සැසඳීමට අනුව, හිලව් කිරීමේ ක්‍රමයෙන් ලංවිම විසින් වෙස්ට් කෝස්ට් වෙත අය කරන මුදල අදාළ මුළු කාලය සඳහා I 3 ගාස්තු ක්‍රමයේ මුදලට වඩා වැඩිය. එබැවින්, දැනට සම්ප්‍රේෂණ අංශය විසින් සිදු කරනු ලබන හිලව් කිරීමේ ක්‍රමය දිගටම කරගෙන යාමටත්, සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සම්ප්‍රේෂණ පාරිභෝගිකයෙකු ලෙස සැලකීමටත්, අනුමත සම්ප්‍රේෂණ පාරිභෝගික ගාස්තුවක් තිබේ නම් සම්ප්‍රේෂණ අංශය වෙත මාරු කිරීමටත් තීරණය කර ඇත. |
| (උ) 2018 ඔක්තෝබර් 3 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | රජයේ ආයතන සතු පොරොත්තු ජනක යන්ත්‍ර උපයෝගී කර ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇත. | විවිධ හේතූන් මත මෙම තීරණය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත. |
| (ඌ) 2015 ජූනි 17 දිනැති චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/03/2015 සහ 2020 ජනවාරි 27 දිනැති චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/01/2020 | අතිරේක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිවීමේ දීමනාව සහ ප්‍රවාහන දීමනාව ගෙවීමට මණ්ඩලය විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සාමාන්‍යයෙන් මසකට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 02ක් පමණක් පවත්වනු ලැබේ. කෙසේ වෙතත්, හදිසි අවශ්‍යතාවය සහ වැදගත්කම සලකා විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වන්නේ නම්, පවත්වන ලද සෑම අතිරේක මණ්ඩල රැස්වීමක්ම සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට මෙන්ම රේඛීය අමාත්‍යාංශයේ නිරීක්ෂකයාටද සහභාගිවීමේ දීමනාව /ප්‍රවාහන දීමනාව ගෙවා තිබුණි. |
| (එ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 18 දිනැති චක්‍රලේඛ අංක 03/2018 සහ ආයතන සංග්‍රහය II කොටසේ 9.1 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන විශ්‍රාමික සේවකයින් දෙදෙනෙකු මණ්ඩලයේ උපදේශකයින් ලෙස පත් කර තිබුණි. | 1969 අංක 17 දරණ ලංවිම පනතේ 13 වැනි වගන්තිය යටතේ මණ්ඩලයට බලය පැවරී ඇති පරිදි: ''පුනර්ජනනීය බලශක්තිය සියයට 70 ක් අවශෝෂණ කිරීමේ දැනට පවතින වැඩසටහනට අනුකූලව සම්ප්‍රේෂණ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් සහාය වීම සඳහා උපදේශකයින් පත් කිරීම සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරන ලදි. |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| නීතියට / විධානයට යොමුව | විස්තරය | පිළිතුරු |
|---|---|---|
| (ඒ) 2021 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.1 වගන්තිය | මණ්ඩලය දිගින් දිගටම පාඩු ලැබුවද කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 2.7ක් ප්‍රසාද දීමනාවක් ලෙස ගෙවා තිබුණි. | වෘත්තීය සමිතිවලින් 2021 වසර සඳහා ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් ලංවිම කළමනාකාරිත්වයට ලැබුණු විවිධ ඉල්ලීම් මත පදනම්ව, කළමනාකාරිත්වය 2021 දෙසැම්බර් 06 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ඉල්ලන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රසාද දීමනා ගෙවීමට තීරණය කළ අතර 2021 දෙසැම්බර් 17 වැනි දින ලංවිම, සමාන්‍යාධිකාරී වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව, ලංවිම, සමාන්‍යාධිකාරී විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුගත වෙමින් ලංවිම සේවකයින් සඳහා 2021 වසර සඳහා ප්‍රසාද දීමනා ගෙවීම බලාත්මක කිරීමට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

**2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

**(අ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය සහ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි. විගණන නියැදි පරීක්ෂණවලදී, එවැනි දීමනා එකතුව රු. මිලියන 2,134.9 ක් සහ රු. මිලියන 1,544.4 ක් පිළිවෙලින් 2021 සහ 2020 වර්ෂයන්හිදී ගෙවා තිබු බව හෙළිදරව් විය. තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයේ සහ අංක BM/2021/22/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ විධිවිධානවලට පටහැනිව, සේවකයින් 323 දෙනෙකු සඳහා ගෙවා ඇති දීමනා ඔවුන්ගේ වැටුපෙන් සියයට 65 ඉක්මවා තිබුණි.**

2022 ජුලි 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවක දීමනාව වැටුපෙන් සියයට 65 කට සීමා කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

**(ආ) වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින එළඹී සාමූහික ගිවිසුම අනුව, උපයන විට ගෙවන (PAYE) බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) වගකීම මණ්ඩලයේ සේවකයින් වෙත මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 2016/3 දරන චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE/ APIT බදු ගෙවා තිබුණි.**

2020 නොවැම්බර් මාසයේ සිට, අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (APIT) ලංවිම සේවකයින් විසින් ගෙවනු ලැබේ.

**(ඇ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දිය යුතුය. කෙසේවෙතත්, මණ්ඩලයේ දැඩි ද්‍රවශීලතා ගැටලු සලකා බැලීමකින් තොරව මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ වාහන ණය එහි සේවකයන් වෙත ලබා දී තිබුණි.**

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල ලැයිස්තුගත කර ඇත.

12 (එම්) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සැකසීම

12 (එන්) වගන්තිය: අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව එහි ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට

ඒ අනුව, සඳහන් කරන ලද නිරීක්ෂණ ආයතනයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම සඳහා ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ හා සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම පනත මගින්ම සපයයි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(ඈ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. කෙසේවෙතත්, දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම අනුව විදුලි බලාගාර ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලයක් ලෙස තාප විදුලිය කෙටි කාලීන පදනමින් අධික පිරිවැයක් යටතේ මිලදී ගැනීමට මණ්ඩලයට සිදු වී තිබුණි.**

ලංවිම දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් (LTGEPs) තුළ වසර 20 ක් සඳහා අවශ්‍ය කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන බලශක්ති ධාරිතාවන් සමන්විත වේ. මේ අනුව, ආසන්න වසර කිහිපයක කෙටි කාලීන ධාරිතා අවශ්‍යතාවය පවා මූලික අවස්ථාව හෝ හදිසි විශ්ලේෂණය යටතේ LTGEPs හි දැක්වේ. දිගුකාලීන, අඩු වියදම් බලාගාර අපේක්ෂා කළ පරිදි නියමිත වේලාවට සංවර්ධනය නොකළ විට, (ලංවිම පාලනයෙන් බැහැර බොහෝ හේතු නිසා) හිඟය වළක්වා ගැනීමට සහ විදුලිබල පනතේ 24(1)(ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බව සහතික කිරීමේ ලංවිම (සම්ප්‍රේෂණ බලපත්‍රය දරන්නා ලෙස) වගකීමට අනුකූල වීම සඳහා කෙටි කාලීන අතිරේක ධාරිතාවක් ලබා ගැනීමට ලංවිමට බලකෙරේ.

මේ අනුව, එම ප්‍රසම්පාදනය 24(1)(ඇ) වගන්තියට අනුකූල වීමට සිදු කර ඇති අතර එම නිසා එය උල්ලංඝනය කිරීමක් නොවේ.

තවද, ලංවිම දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් සකස් කළද, LTGEPs හි හඳුනාගෙන ඇති එවැනි බලාගාර සංවර්ධනය කිරීම සඳහා ලංවිමට තනිව බලයක් නොමැත. ලංවිම අනෙකුත් ආයතන මත දැඩි ලෙස රඳා පවතින අතර PUCSL විසින් ප්‍රකාශයට පත් කරන ලද "2016 අංක 02 දරන විදුලි (ප්‍රසම්පාදන) රීති'' සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැනි අනෙකුත් ආයතනවල රීති සහ මාර්ගෝපදේශ මගින් පාලනය වේ. මෙම ක්‍රියාවලීන්ගෙන් සමහරක් අති ව්‍යාප්ති වේ.

**වසර 10ක කාලයක් සඳහා මෙගාවොට් 200 ක Furnace Oil Fired මධ්‍යම කාලීන ධාරිතාව අවලංගු කිරීම.**

අපගේ වාර්තාවලට අනුව, LTGEP 2018-2037 හි හඳුනාගෙන ඇති පරිදි මෙගාවොට් 320 ක මධ්‍ය කාලීන ධාරිතා අවශ්‍යතාවයෙන් කොටසක් සපුරාලීම සඳහා මෙගාවොට් 200 ක මධ්‍ය කාලීන විදුලිබල ධාරිතාවක් සඳහා වන ප්‍රසම්පාදනය ලංවිම කර ගෙන ගොස් තිබුණි. මෙම ප්‍රසම්පාදනය මෙගාවොට් 170 බලාගාරයක් (LTGEP 2015-2034 හි හඳුනාගෙන ඇති පරිදි) ලෙස මුලින්ම 2016 දී ආරම්භ කරන ලද අතර පසුව (LTGEP 2018-2037 ඉදිරිපත් කිරීමත් සමඟ) ගාල්ලේ මෙගාවොට් 100 ක land based බලාගාරයක් සහ කොටුමා උපපොළවල් හතරක මෙගාවොට් 24 x 4 ක තවත් බලාගාර ලෙස වෙනස් විය. මෙම, ගාල්ල කොටුමා උපපොළේ මෙගාවොට් 100 ක බලාගාරය සහ මෙගාවොට් 24 x 4 ක අවශ්‍යතාවය LTGEP 2020-2039 කෙටුම්පතේ විශේෂයෙන් හඳුනාගෙන ඇත.

තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත්කිරීම, ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතිය ලැබීම, PUCSL අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම යනාදිය ඇතුළුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ප්‍රසම්පාදනය සිදුවී ඇත. නමුත් අවසානයේ දී 2020-11-02 දින පැවති අමාත්‍ය මණ්ඩලය රැස්වීමේදී ප්‍රසම්පාදනය අවලංගු කර ඇත.

**(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - ප්‍රතිපත්තිමය කරුණු:**

15. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/1660/318/024 වූ, **"වර්තමාන විදුලි ජනන සැලසුම් සහ සිදුවිය හැකි අඩුපාඩු (Lapses) අවම කිරීම සඳහා යෝජනා"** යන මැයෙන් විදුලිබල ඇමතිතුමා ඉදිරිපත් කළ 2020-10-19 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය, මුදල් ඇමතිතුමාගේ සහ ජලසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සහ

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**Proposals/ Requests** : Approval of the Cabinet of Ministers is sought for the following proposal;

I. **Proposal 5.1**

To direct Ceylon Electricity Board (CEB) to initiate procurement to add medium term furnace oil fired power capacity up to 200 MW for a term of ten years with the approval of the Attorney General and the Public Utilities Commission of Sri Lanka (PUCSL).

II. **Proposal 5.2**

a) To direct CEB to first obtain the approval of the PUCSL to negotiate to extend the period of the power purchase agreements of three furnace oil fired IPP plants (ACE Power Embilipitiya, ACE Power Matara, and Asia Power) till 2023.

b) To instruct the Secretary to the Treasury to appoint a Project Committee and a Cabinet Appointed Negotiating Committee for the above purpose

ඒ අනුව, 2020 දෙසැම්බර් 30 වැනි දින පැවති CMT රැස්වීමේදී ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි.

**ගරු මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ.**

**Observations** : **I & II** **Proposal 5.1 and 5.2**

I observe that the current policy of the Government on power generation reiterate the need for enhancement of renewable energy while minimizing use of thermal energy. Therefore Ceylon Electricity Board need to expedite implementation of the power plants that are highlighted in the Cabinet Memorandum without further delay. It is noted that some of these plants are almost ready to be installed into the national grid. At the same time, apart from its inconsistency with the county's power generation policy in terms of environmental implications, procuring of emergency power from diesel based independent power producers will add significant burden to the economy As a more feasible solution CEB may explore the possibility of acquiring some of these diesel power plants at a reasonable cost. Therefore, I am not in agreement with the proposals.

**අමාත්‍ය මණ්ඩල තීරණය**

(ii) මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණවල පළමු ඡේදයෙහි දක්වා ඇති කරුණු හේතු කොට, සංදේශයේ 5 ඡේදයෙහි සඳහන් (5.1) සහ (5.2) යෝජනා සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන බව.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ඉ) **2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණි. 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,357.60 ක් වූ අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. මිලියන 8,089.50 ක් විය.**

2021-05-28 දිනැති ලංවිම ලිපිය අංකඃ DGM (CS)RA)/GEN/1 සඳහා විදුලිබල අමාත්‍යාංශයේ ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටී. 2022-06-09 දිනැති CEB/GM/CEB/03/Vol.1 ලිපිය මගින් විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත ඒ සඳහා සිහිකැඳවීම යවා ඇත. ඉහත කරුණුවලට අමතරව, විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු වූ පසු පාරිභෝගික ආරක්ෂක තැන්පතු සඳහා පොලී ගෙවීම ආරම්භ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලා කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඇත.

(ඊ) **අදාළ පාර්ශවයන් එනම් සේවායෝජක සහ සේවක සංගම් විසින් අත්සන් කර නොතිබූ බැවින් නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත් නොවූ කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව 2021 වර්ෂයේදී මණ්ඩලය විසින් සේවක වැටුප් සියයට 25 කින් වැඩි කර ඇති තිබුණි. ඒ අනුව, එම බලයනොලත් ගෙවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ අහිතකර බලපෑම ආසන්න වශයෙන් රු. බිලියන 9.6 කි.**

2021 ජුනි 15 වන දින පැවති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2021 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි 2021-2023 කාලසීමාව සඳහා ලංවිම සේවක වැටුප් සියයට 25 කින් වැඩි කිරීමට අනුමැතිය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. තවද, මේ සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය ලංවිම, සමාන්‍යාධිකාරී වෙත උපදෙස් දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත ලංවිම, සමාන්‍යාධිකාරී විසින් අදාළ චක්‍රලේඛය නිකුත් කර ඇත.

තවද, සාමූහික ගිවිසුම කඩිනමින් අත්සන් කරන ලෙස සියලූම වෘත්තීය සමිති දැනුවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

(උ) **2017 මැයි 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී China Machinery Engineering Corporation (CMEC) ඉංජිනේරුවන්ගේ තාක්ෂණික දැනුම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරීමේ ශක්‍ය වැඩපිළිවෙළක් තිබිය යුතු බව අවධාරණය කරන ලදි. කෙසේ වෙතත්, එම තීරණය සැලකිල්ලට නොගෙන 2017 නොවැම්බර් 23 සහ 2020 පෙබරවාරි 25 යන දිනවලදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ලක්විජය බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා වන පිළිවෙලින් දෙවන සහ තෙවන තාක්ෂණික සහයෝගීතා ගිවිසුම්වලට මණ්ඩලය විසින් අත්සන් කර තිබුණි. එකී ගිවිසුම් දෙක සඳහා මුළු ඉන්වොයිසි වටිනාකම (2017 ඔක්තෝබර් 01 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා) ඇ.එ.ඩො 13,766,367 විය. තවද, 2022 ජනවාරි 01 සිට වසරක කාලයක් සඳහා බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා වන තාක්ෂණික උපදේශන සේවාව ලබා ගැනීම සඳහා සි/ස CMEC ලංකා (පුද්.) සමාගම සමඟ 2021 දෙසැම්බර් 27 වැනි දින රු. මිලියන 435.64 (වැට් බද්ද ඇතුළුව) ක පිරිවැයක් සහිතව තවත් ගිවිසුමකට එළඹී තිබුණි. බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා එම ගිවිසුම්වලට එළඹීමෙන් පසුවද, 2021 වර්ෂය තුළදී පමණක් දින 105 ක පාඩුවක් සහ මෙ.වො. පැය 758,587 ක බලශක්ති අහිමිවීමක් සමඟ බිඳවැටීම් 16 ක් සිදුවී තිබුණි. එම බිඳවැටීම් රටේ විදුලිබල සැපයුමට සැලකිය යුතු අහිතකර බලපෑම් ඇති කර තිබුණි.**

මුලදී 2017 දී 170 ක් පමණ වූ CMEC කාර්ය මණ්ඩලය වැඩ කරමින් සිටියහ. කාලයත් සමඟ ඔවුන්ගේ දැනුම ලංවිම කාර්ය මණ්ඩලය වෙත පැවරීමෙන් එය 15 දක්වා පමණක් අඩු විය.

CMEC කාර්ය මණ්ඩලය අඩු කිරීම මගින් පැහැදිලිවම පෙන්නුම් කරන්නේ දැනුම ලංවිම කාර්ය මණ්ඩලය වෙත පැවරී ඇති බවයි.

වත්මන් තත්ත්වය පහත පරිදි වේ.

ගරු විදුලිබල අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය (82/2921/E) සැලකිල්ලට ගනිමින් මෙහෙයුම් සහ නඩත්තු උපදේශන සේවාව සැපයීම සඳහා CMEC වෙත ගෙවිය යුතු සියලූම හිඟ ගෙවීම් ගෙවීමට 2021 දෙසැම්බර් 29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. අදාළ තීරණයේ යොමු අංකය PE/TEN/SCAPC/SJ/2021/18 වේ.

බිඳවැටීම් සංඛ්‍යාව බලාගාර කාර්ය සාධනය පිළිබිඹු නොකරයි. අභ්‍යන්තර හා බාහිර ගැටළු හේතුවෙන් බලාගාර බිඳවැටීම් සිදු වේ. බාහිර ගැටළු ලක්විජය බලාගාරයට පාලනය කළ නොහැක. බලාගාරවල ක්‍රියාකාරීත්වය තක්සේරු කිරීම සඳහා බලාගාර උපයෝජ්‍යතා සාධකය (Plant availability factor) සහ බලාගාර සාධකය (plant factor) සුදුසු දර්ශක වේ. විමසුමේ යොමු අංක 2.2.4 (f) සඳහා පිළිතුරෙහි, ඒකක 2 සහ ඒකක 3 හි බලාගාර උපයෝජ්‍ය සාධකය සහ බලාගාර සාධකය ලබා දී ඇත.

විමසුමේ යොමු අංක 2.2.4 (ඊ) සඳහා පිළිතුරෙහි, ඒකක 2 සහ ඒකක 3 හි බලාගාර උපයෝජ්‍ය සාධකය සහ බලාගාර සාධකය පිළිබඳ තොරතුරු සපයා ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) **2018-2037 දීර්ඝ කාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (පී.එම්.යූ) 2016 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කළ අතර ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් කිරීම සහ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සකස් කිරීම වැනි කටයුතු සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය මගින් 2020 වර්ෂය අවසානයේදී රු. මිලියන 301.19 ක මුළු වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, 2021 පෙබරවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, මෙම ව්‍යාපෘතිය සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්) සමාගම හරහා සංවර්ධනය කිරීමට සහ මෙම කොන්ත්‍රාත්තුව "තනි ප්‍රභව ප්‍රසම්පාදනයක්" ලෙස එම සමාගමට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් කාර්යයන් සඳහා දරන ලද මෙම වියදම වෙනත් ආයෝජකයෙකුට භාවිතා කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය මගින් දරන ලද රු. මිලියන 301.19 ක් මණ්ඩලයේ වියදමක් ලෙස හඳුනාගැනීමට සිදුවීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය.**

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඔවුන්ගේ නිරීක්ෂණ සඳහා විගණන කමිටුව වෙත යොමු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ආ) **සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) **ඒ කෙසේ වෙතත්, කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයක් සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2020 දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලද අතර කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. 36.20 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේවෙතත්, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එයින් රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි**

NCRE ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ටෙන්ඩර් පටිපාටියේ ශක්‍යතාව පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි භාවයක් පවතී. එබැවින්, විදුලි බලශක්ති ප්‍රසම්පාදනය තරඟකාරී ලංසු තැබීම මත පදනම් විය යුතු බවට ගරු නීතිපතිවරයා සිය මතය ප්‍රකාශ කරන ලද 2017 ජූලි මස දක්වා ප්‍රමිතිගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත.

මීට අමතරව, කොළඹ අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ (මහ නගර) විදුලිබල ව්‍යාපෘතිය සහ තුම්බෝව්ල කරදියාන අපද්‍රව්‍ය (මහ නගර) විදුලිබල ව්‍යාපෘතිය සඳහා PPAs අත්සන් කිරීම සඳහා පිළිවෙලින් 2017-10-10 සහ 2019-02-12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණවලට ලංවීම විසින් අනුකූලව කටයුතු කර ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි, රු. 36.20 ක මුළු ගාස්තුවෙන් කි.වො.පැය එකකට රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය. වෙස්ටර්න් පවර් කම්පැනි (පුද්ගලික) සමාගම වෙත ගෙවා ඇති ගාස්තුවල ඉතිරි කොටස ප්‍රතිපූරණය සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉන්වොයිස් කර ඇත. 2020 දෙසැම්බර් සිට 2021 අගෝස්තු දක්වා එකතුව රු. 633,260,550.00 ක ඉන්වොයිසි ලංවීම විසින් ඉදිරිපත් කර ඇති නමුත් අද වන විට කිසිදු ප්‍රතිපූරණක් ලැබී නොමැත.

(ii) **NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණි. තවද, ඉහත සඳහන් විදුලිබලාගාර අතුරින් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 49 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කරන ලදි.**

2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ වගන්ති අංක 43(4) හි ප්‍රතිපාදන (අ) සහ (ආ) යෙදීම සම්බන්ධයෙන් 2013 නොවැම්බර් මස දිනැති ලිපිය මගින් ගරු නීතිපතිතුමා ලබාදුන් නීතිමය මතය අනුව, 2013-08-06 දිනට පසුව ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් ආරම්භ කිරීම අවශ්‍ය විය. ඒ අනුව, එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවක් සඳහා NCRE ව්‍යාපෘතිවලින් බලශක්තිය ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් හතක් ආරම්භ කර ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

පළමු ටෙන්ඩරය පිළිබඳ විස්තර නි.ස (බලශක්ති මිළදී ගැනීම) ශාඛාවේ ඇත. අනෙකුත් ටෙන්ඩර් 6 හි තත්ත්වය පහත පරිදි වේ.

- **වවුනතිව්වල මෙගාවෝට් 10 ක සූර්ය බලාගාරය:** ලංසු 2017 සැප්තැම්බර් මස විවෘත කර ඇති අතර 2018 මැයි මාසයේදී අභිප්‍රාය ලිපිය (LOI) නිකුත් කර ඇත. සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා සුනීත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් හඳුනාගෙන ඇති ඉඩම සුරක්ෂිත කිරීමට සහ අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය අවසර ලබා ගැනීමට සංවර්ධකයාට නොහැකි වීම හේතුවෙන්, විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම (PPA) අත්සන් කිරීම ප්‍රමාද වූ අතර 2021 මාර්තු මාසයේදී අත්සන් කර ඇත. ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 වන විට ඉදිවෙමින් පැවතුනු අතර මේ වන විට බලාගාරයේ ඉදිකිරීම් අවසන් අදියරේ පවතී. බලාගාරය 2022 සැප්තැම්බර් 28 වන දින ක්‍රියාත්මක කරන ලදි.

- **පොලොන්නරුවේ මෙගාවෝට් 10 ක සූර්ය බලාගාරයේ ටෙන්ඩරය:** ලංසු 2017 පෙබරවාරි මස විවෘත කර ඇති අතර 2018 සැප්තැම්බර් මාසයේදී LOI අත්සන් කර ඇත. සංවර්ධන කටයුතු සඳහා SLSEA විසින් හඳුනාගෙන ඇති ඉඩම සුරක්ෂිත කිරීමට සහ අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය අවසර ලබා ගැනීමට සංවර්ධකයාට නොහැකි වීම හේතුවෙන් විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම (PPA) අත්සන් කිරීම ප්‍රමාද වූ අතර 2021 මාර්තු මාසයේදී අත්සන් කර ඇත. ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 වන විට ඉදිවෙමින් පැවතුනු අතර මේ වන විට ග්‍රිඩ් අන්තර් සම්බන්ධතා මාර්ග ඉදිකිරීම සිදු වෙමින් පවතී. (ආසන්න වශයෙන් කි.මී. 9)

- **මෙගාවෝට් 190 සූර්ය බලාගාර ටෙන්ඩරය:** 2018 අප්‍රේල් මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම මත 2018 ඔක්තෝම්බර් සිට 2019 අගෝස්තු දක්වා කාලය තුළ සමාගම් 84 කට ලංසු ප්‍රදානය කර ඇත. ලංසු බැඳුම්කර කල් ඉකුත්වීම සහ ලංසුකරුවන් විසින් ඒවා දීර්ඝ නොකිරීම හේතුවෙන් ලංසු 6 ක් සඳහා ලංසු ප්‍රදානය කිරීමට නොහැකි විය. ලංසු බැඳුම්කර 14 ක් අහිමි වීම හේතුවෙන් ලංසු කරුවන් 70 කට (ලංසු ප්‍රදානය කිරීම් 84 න්) පමණක් LOI නිකුත් කර ඇත. කාර්ය සාධන බැඳුම්කර 2 ක් අහිමි වූ අතර කාර්ය සාධනය නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති අවලංගු කර ඇත. PPA 65 ක් අත්සන් කර ඇති අතර ඉතිරි සංවර්ධකයන් තුන්දෙනාට 2021 දෙසැම්බර් 31 වන විට අවශ්‍ය නිෂ්කාශන ඉදිරිපත් කිරීමට නොහැකි විය. බලාගාර 15 ක් (එකතුව මෙගාවොට් 15 ක) 2021 දෙසැම්බර් 31 වන විට ක්‍රියාත්මක කර ඇත. මේ වන විට බලාගාර 31 ක් (එකතුව මෙගාවොට් 31 ක) ක්‍රියාත්මක කර ඇත. එසේම PPAs 68 ක් අත්සන් කර ඇත. (මෙම ටෙන්ඩරයේ අවසාන PPA 2022 මාර්තු 10 දින අත්සන් කර ඇත.)

- **කෘෂිකර්මය/ගොවිතැන සමඟ මෙගාවොට් 10 ක සූර්ය බලාගාරය:** 2019 මැයි මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, ලංසු ප්‍රදානය 2020 ජුනි මාසයේදී සිදු කර ඇත. 2020 පෙබරවාරි මාසයේදී LOI අත්සන් කර අතර 2021 දෙසැම්බර් 31 වන දිනට PPA අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය නිෂ්කාශන ඉදිරිපත් කිරීම බලාපොරොත්තුවෙන් සිටී. වර්තමානයේදී, PPA අත්සන් කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීම දිගින් දිගටම ප්‍රමාද වීම හේතුවෙන්, ආයාචනා ලිපිය නිකුත් කිරීම ආරම්භ කර ඇත.

- **මෙගාවෝට් 1-10 පරාසයක යුත් මෙගාවොට් 60 සුළං බලාගාර:** කොටුමා උපපොළ පහ සඳහා 2020 මාර්තු මාසයේදී ලංසු විවෘත කර ඇත. බෝලවත්ත සහ කප්පල්තුරේ කොටුමා උපපොළ (GSS) සඳහා ලංසු ඉදිරිපත් නොකළ නිසා මෙගාවොට් 25ක් ඉදිරිපත් නොවීය.

    - ත්‍රිකුණාමලය කොටුමා උපපොළට මෙගාවෝට් 10 ක් ප්‍රදානය කිරීමට කැබිනට් අනුමැතිය ලද අතර 2021 ජනවාරි මාසයේදී ප්‍රදානය කර ඇත. 2021 අප්‍රේල් මාසයේදී LOI අත්සන් කර අතර 2021 දෙසැම්බර් 31 දිනට PPA අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය නිෂ්කාශන ඉදිරිපත් කිරීම බලාපොරොත්තුවෙන් සිටී. වර්තමානයේදී, සංවර්ධකයා PPA අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය නිෂ්කාශන ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

    - මන්නාරම කොටුමා උපපොළට මෙගාවෝට් 15 ක් ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද අතර 2021 ජූලි මාසයේදී ප්‍රදානය කර ඇත. 2021 සැප්තැම්බර් මාසයේදී LOI අත්සන් කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දිනට PPA අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය නිෂ්කාශන ඉදිරිපත් කිරීම බලාපොරොත්තුවෙන් සිටී. වර්තමානයේදී, සංවර්ධකයා අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් සියලු නිෂ්කාශන ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) බලශක්ති බලපත්‍රය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් (PUCSL) නිකුත් කරන විරෝධතාවයක් නොමැති බවට ලිපිය ලැබීමෙන් පසු PPA අත්සන් කරනු ඇත. දැනට සියලුම අනුමැතීන් ලැබී ඇති අතර දැන් PPAs 2 ක් අත්සන් කිරීමේ ක්‍රියාවලියේ පවතී. බලාගාරයේ ඉදිකිරීම් මේ වන විට සිදුවෙමින් පවතින අතර එය 2022 දෙසැම්බර් මස අවසන් වන විට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

- මාදම්පේ කොටුමා උපපොළට මෙගාවොට් 10 ක ධාරිතාවය සඳහා නැවත ටෙන්ඩර් කර ඇත. ප්‍රදානය කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කිරීමට නියමිතව ඇත. වර්තමානයේදී, 2022 ජනවාරි මාසයේ දී ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර ඇති අතර පසුව 2022 අප්‍රේල් මාසයේ දී LOI අත්සන් කර ඇත. සංවර්ධකයා PPA අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය නිෂ්කාශන ලබා ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.

- මෙගාවොට් 150 ක සූර්ය බලාගාර ටෙන්ඩරය (මෙගාවොට් 1 ත් 10 ත් අතර පරාසයකින්) මෙගාවොට් 147 ක් (බලාගාර 23) සඳහා 2021 පෙබරවාරි මාසයේදී ලංසු ප්‍රදානය කර ඇත. මෙගාවොට් 3 ක් සඳහා කොළොන්නාව (එළිමහන්) කොටුමා උපපොළ සඳහා ලංසු ලැබී නොමැත. බලාගාර 18 ක් සඳහා (මෙගාවොට් 104 ක) LOI අත්සන් කර ඇති අතර 2021 දෙසැම්බර් 31 වන විට LOI 5 ක් අත්සන් කිරීමට නියමිතව තිබුණි. වර්තමානයේදී, බලාගාර 21 ක් සඳහා (මෙගාවොට් 131 ක) LOI අත්සන් කර ඇති අතර බලාගාර 2 ක් සඳහා (මෙගාවොට් 16 ක) LOI අත්සන් කිරීමට නියමිතව ඇත. දැනට ප්‍රදානය කරන ලද බලාගාර 23 හි (මෙගාවොට් 147) LOIs අත්සන් කර ඇති අතර PPAs අත්සන් කිරීමට පමණක් ඉතිරිව පවතී.

2020 මාර්තු මාසයේ සිට Covid 19 වසංගතය රට තුළ ප්‍රථම වරට පැතිර ගිය අතර 2021 දක්වා වරින් වර සංචරන සීමා පැනවූ බව සඳහන් කළ යුතුය. මේ හේතුවෙන් බොහෝ කටයුතු අවහිර වී ඇති අතර සියලු කටයුතු පාහේ ප්‍රමාද වී ඇත. වර්තමානයේදී, විදේශ විනිමය, බැංකු පොළී අනුපාත, උද්ධමන අනුපාතය, ද්‍රව්‍ය හිඟය, ණයවර ලිපි විවෘත කිරීමේ සීමාවන් වැනි බොහෝ පරාමිතිවල අස්ථාවරත්වය හේතුවෙන් බොහෝ ව්‍යාපෘති මූල්‍යමය වශයෙන් ශක්‍ය නොවන අතර දැනට ක්‍රියාත්මක වෙමින් පවතින NCRE ව්‍යාපෘතිවල ප්‍රගතියට සෘජුවම බලපායි.

**(ඈ) අමතර ඉඩ අවශ්‍යතාවය, විෂය පථයේ වෙනස්වීම් සහ මිල උද්ධමනය නිසා 2011 සිට 2021 දක්වා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1000 සිට රු. මිලියන 6,161.87 ක් (උපදේශනය සහ පෙර කොන්ත්‍රාත්කරු සඳහා කරන ලද ගෙවීම් ඇතුළුව) දක්වා වැඩි වී තිබුණි. තවද, 2023 වර්ෂයේදී නව ගොඩනැගිල්ල නිම කිරීමට සැලසුම් කර තිබියදීත් හිමිකාරිත්වය තහවුරු කර නොතිබූ දැනට පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 සිට 2020 දක්වා කාලය තුළ මණ්ඩලය විසින් රු. මිලියන 284.41 ක් වැය කර තිබුණි.**

1. ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය - නාරාහේන්පිට මුලදී විදුලිබල මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් මෙහෙයවන ලද අතර, 2011 වර්ෂයේදී මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයේ ව්‍යාපෘති උපදේශන ඒකකය (PCU) විසින් සකස් කරන ලද ව්‍යාපෘතියේ මූලික පිරිවැය (ආසන්න වශයෙන්) රු. මිලියන 1,000 කි

2. රු. මිලියන 1936 ක මුළු ඇස්තමේන්තු පිරිවැය සඳහා 2011 මාර්තු 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රදානය කර ඇත. (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/063/516/013, 2011 මාර්තු 04 දිනැති සංදේශය) බිම් ප්‍රමාණය = වර්ග මීටර් 23,000 කි.

3. 2015 වර්ෂයේදී ඇස්තමේන්තුව රු. මිලියන 2,542 දක්වා සංශෝධනය කර ඇත. (2019 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් මුදල) බිම් ප්‍රමාණය = වර්ග මීටර් 27,750 (බිම් ප්‍රමාණය වර්ග මීටර් 4,750 කින් වැඩි විය.)

4. 2018 වර්ෂයේදී ඇස්තමේන්තුව රු. මිලියන 3,149 දක්වා සංශෝධනය කර ඇත. (2019 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් මුදල)

5. 2021 වර්ෂයේදී රු. මිලියන 5,672 ක මුළු මුදල සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත. (ප්‍රදානය කළ මුදල, රු. මිලියන 4,772 + සියයට 10 ක අවිනිශ්චිතතා + සියයට 08 ක වැට් බද්ද) (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක. 21/1278/318/034/TBR, 2021-07-08 දිනැති සංදේශය බලන්න) බිම් ප්‍රමාණය = වර්ග මීටර් 33,818 (බිම් ප්‍රමාණය වර්ග මීටර් 6068 කින් වැඩි විය.)

6. 2020 වර්ෂයේදී (පෙබරවාරි) ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සහ කඩිනම් කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී, බෙදාහැරීමේ අංශය 04 වෙත ව්‍යාපෘතිය භාර දී ඇත.

**යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත පිරිවැය ඉහළ යාමට හේතු පහත පරිදි හඳුනාගෙන ඇත.**

1. ගොඩනැගිල්ල තුළ ඇති ඇට්‍රියම් වෙල් වසා දැමීමෙන් කාර්යාල සඳහා උපරිම අවකාශයක් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය වැඩි කර ඇත. එබැවින් වාස්තු විද්‍යාත්මක බිම් ප්‍රමාණය වර්ග මීටර් 27,750 සිට වර්ග මීටර් 33,818 දක්වා වැඩි කරන ලද අතර එම නිසා මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 6,068 (වර්ග අඩි 65,290 ක්) කින් වැඩි කර ඇත. ඒ අනුව, ගොඩකිරීම්, ව්‍යුහාත්මක වැඩ, හිමාව සහ බෙදුම් (partition) හේතුවෙන් පිරිවැය වැඩි වේ. පසුව, අනෙකුත් අවශ්‍ය ගොඩනැගිලි සේවාවන්හි පිරිවැය වැඩි වේ. තවද, 4 වන මහලේ ඇති ටෙරස් ප්‍රදේශයේ කොටසක් භාවිතා කළ හැකි අවකාශයක් බවට පරිවර්තනය කර ඇත.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

2. 2018 දෙසැම්බර් සිට 2021 මාර්තු දක්වා කාල සීමාව සඳහා ද්‍රව්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස වැඩි වීම.

3. සියලුම කාර්යාල සඳහා අභ්‍යන්තර බෙදුම් (partition) හඳුන්වා දීම.

4. ගොඩනැගිලි පිරිසිදු කිරීමේ පද්ධතිය, ප්‍රවේශ පාලන පද්ධතිය, CCTV කැමරා පද්ධතිය, ගෑස්සැපයීම, කැලි කසළ පවිත්‍රාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම වැනි පෙර සැලසුමට ඇතුළත් නොවූ අත්‍යවශ්‍ය ගොඩනැගිලි සේවාවන් හඳුන්වා දීම

දැනට පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල දශක පහකට පමණ පෙර ඉදිකරන ලද අතර තවමත් ක්‍රියාත්මක වේ. CECB උපදේශකගේ නිර්දේශය පරිදි තවත් වසර විස්සක් ඔරොත්තු දීම සඳහා ගොඩනැගිල්ලේ වයසට යාමත් සමඟ අලුත්වැඩියා හා නඩත්තු කටයුතු කිහිපයක් සිදු කර ඇත. එබැවින්, දැනට පවතින ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ලංවිම වත්කම් කළමනාකරණ අංශය මගින් සිදු කර ඇත.

තවද, සිවිල් ගුවන් සේවා සීමා කිරීම් හේතුවෙන් නාරාහේන්පිට යෝජිත නව ලංවිම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ මහල් ගණන මහල් එකොළහකට සීමා වී ඇති අතර කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල කුලියට ගත් කාර්යාල සඳහා වත්මන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල භාවිතා කිරීමට ලංවිම අපේක්ෂා කරයි.

**(ඈ) 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක, මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 6.54 ක් වටිනා ගිගාවොට් පැය 267.17 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි.**

ලංවිම දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් (LTGEPs) තුළ වසර 20 ක් සඳහා අවශ්‍ය කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන බලශක්ති ධාරිතාවන් සමන්විත වේ. මේ අනුව, ආසන්න වසර කිහිපයක කෙටි කාලීන ධාරිතා අවශ්‍යතාවය පවා මූලික අවස්ථාව හෝ හදිසි විශ්ලේෂණය යටතේ LTGEPs හි දැක්වේ. දිගුකාලීන, අඩු වියදම් බලාගාර අපේක්ෂා කළ පරිදි නියමිත වේලාවට සංවර්ධනය නොකළ විට, (ලංවිම පාලනයෙන් බැහැර බොහෝ හේතු නිසා) හිඟය වළක්වා ගැනීමට සහ විදුලිබල පනතේ 24(1)(ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බව සහතික කිරීමේ ලංවිම (සම්ප්‍රේෂණ බලපත්‍රය දරන්නා ලෙස) වගකීමට අනුකූල වීම සඳහා කෙටි කාලීන අතිරේක ධාරිතාවක් ලබා ගැනීමට ලංවිමට බලකෙරේ.

මේ අනුව, එම ප්‍රසම්පාදනය 24(1)(ඇ) වගන්තියට අනුකූල වීමට සිදු කර ඇති අතර එම නිසා එය උල්ලංඝනය කිරීමක් නොවේ.

තවද, ලංවිම දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් සකස් කළද, LTGEPs හි හඳුනාගෙන ඇති එවැනි බලාගාර සංවර්ධනය කිරීම සඳහා ලංවිමට තනිව බලයක් නොමැත. ලංවිම අනෙකුත් ආයතන මත දැඩි ලෙස රඳා පවතින අතර PUCSL විසින් ප්‍රකාශයට පත් කරන ලද ''2016 අංක 02 දරන විදුලි (ප්‍රසම්පාදන) රීති'' සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැනි අනෙකුත් ආයතනවල රීති සහ මාර්ගෝපදේශ මගින් පාලනය වේ. මෙම ක්‍රියාවලීන්ගෙන් සමහරක් අති ව්‍යාප්ති වේ.

**වසර 10ක කාලයක් සඳහා මෙගාවොට් 200 ක Furnace Oil Fired මධ්‍යම කාලීන ධාරිතාව අවලංගු කිරීම.**

අපගේ වාර්තාවලට අනුව, LTGEP 2018-2037 හි හඳුනාගෙන ඇති පරිදි මෙගාවොට් 320 ක මධ්‍ය කාලීන ධාරිතා අවශ්‍යතාවයෙන් කොටසක් සපුරාලීම සඳහා මෙගාවොට් 200 ක මධ්‍ය කාලීන විදුලිබල ධාරිතාවක් සඳහා වන ප්‍රසම්පාදනය ලංවිම කර ගෙන ගොස් තිබුණි. මෙම ප්‍රසම්පාදනය මෙගාවොට් 170 බලාගාරයක් (LTGEP 2015-2034 හි හඳුනාගෙන ඇති පරිදි) ලෙස මුලින්ම 2016 දී ආරම්භ කරන ලද අතර පසුව (LTGEP 2018-2037 ඉදිරිපත් කිරීමත් සමඟ) ගාල්ලේ මෙගාවොට් 100 ක land based බලාගාරයක් සහ කොටුමා උපපොළවල් හතරක මෙගාවොට් 24 x 4 ක තවත් බලාගාර ලෙස වෙනස් විය. මෙම, ගාල්ල කොටුමා උපපොළේ මෙගාවොට් 100 ක බලාගාරය සහ මෙගාවොට් 24 x 4 ක අවශ්‍යතාවය LTGEP 2020-2039 කෙටුම්පතේ විශේෂයෙන් හඳුනාගෙන ඇත.

තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත්කිරීම, ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතිය ලැබීම, PUCSL අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම යනාදිය ඇතුළුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ප්‍රසම්පාදනය සිදුවී ඇත. නමුත් අවසානයේ දී 2020-11-02 දින පැවති අමාත්‍ය මණ්ඩලය රැස්වීමේදී ප්‍රසම්පාදනය අවලංගු කර ඇත.

## ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(I) **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - ප්‍රතිපත්තිමය කරුණු:**

15. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/1660/318/024 වූ, "**වර්තමාන විදුලි ජනන සැලසුම් සහ සිදුවිය හැකි අඩුපාඩු (Lapses) අවම කිරීම සඳහා යෝජනා**" යන මැයෙන් විදුලිබල ඇමතිතුමා ඉදිරිපත් කළ 2020-10-19 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය, මුදල් ඇමතිතුමාගේ සහ ජලසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සහ

**Proposals/ Requests** : Approval of the Cabinet of Ministers is sought for the following proposal;

I. **Proposal 5.1**

To direct Ceylon Electricity Board (CEB) to initiate procurement to add medium term furnace oil fired power capacity up to 200 MW for a term of ten years with the approval of the Attorney General and the Public Utilities Commission of Sri Lanka (PUCSL).

II. **Proposal 5.2**

a) To direct CEB to first obtain the approval of the PUCSL to negotiate to extend the period of the power purchase agreements of three furnace oil fired IPP plants (ACE Power Embilipitiya, ACE Power Matara, and Asia Power) till 2023.

b) To instruct the Secretary to the Treasury to appoint a Project Committee and a Cabinet Appointed Negotiating Committee for the above purpose

ඒ අනුව, 2020 දෙසැම්බර් 30 වැනි දින පැවති CMT රැස්වීමේදී ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි.

**ගරු මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ.**

**Observations** : **I & II** **Proposal 5.1 and 5.2**

I observe that the current policy of the Government on power generation reiterate the need for enhancement of renewable energy while minimizing use of thermal energy. Therefore Ceylon Electricity Board need to expedite implementation of the power plants that are highlighted in the Cabinet Memorandum without further delay. It is noted that some of these plants are almost ready to be installed into the national grid. At the same time, apart from its inconsistency with the county's power generation policy in terms of environmental implications, procuring of emergency power from diesel based independent power producers will add significant burden to the economy As a more feasible solution CEB may explore the possibility of acquiring some of these diesel power plants at a reasonable cost. Therefore, I am not in agreement with the proposals.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**අමාත්‍ය මණ්ඩල තීරණය**

(ii) මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණවල පළමු ඡේදයෙහි දක්වා ඇති කරුණු හේතු කොට, සංදේශයේ 5 ඡේදයෙහි සඳහන් (5.1) සහ (5.2) යෝජනා සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන බව.

(ඉ) **ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.37 ක් වන විට විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලාගාර තුනකින් සහ මෙගාවොට් 24 ක අතිරේක බලාගාරයකින් සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගත් බලශක්ති ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 21.75 ක්, රු. 25.26 ක්, රු. 24.97 ක් සහ රු. 88.85 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි.**

වසරේ මුල් මාස 04 තුළ වියළි කාලගුණ තත්ත්වයක් පැවතීම, පද්ධති ඉල්ලුම වැඩි වීම සහ එම කාලය තුළ ජල විදුලි ජනනය අවම බැවින් සියලුම තාප බලාගාර උපරිම බලාගාර සාධකයෙන් ක්‍රියාත්මක වේ. එබැවින් එම කාලය තුළ සියලුම තාප බලාගාරවල විදුලිය ජනනය කිරීමේ ඒකක පිරිවැය (ධාරිතාව සහ බලශක්ති ගාස්තු යන දෙකම සැලකිල්ලට ගනිමින්) සාපේක්ෂව අඩුය. එමෙන්ම, වැසි සමය ආරම්භ වීමත් සමඟ පද්ධති ඉල්ලුම අඩු වන අතර ජල විදුලි බලාගාර උපරිම බලාගාර සාධකය යටතේ ක්‍රියාත්මක වන අතර තාප බලාගාර භාවිතා කිරීමේ අවශ්‍යතාවය අඩු වේ. එහිදී බලශක්ති ගාස්තුවට වඩා ඉන්ධන පිරිවැය අඩු වන අතර ධාරිතා ගාස්තුව ගෙවීමට සිදුවේ. එමෙන්ම රාත්‍රී උපරිම ඉල්ලුම සපුරාලීම සඳහා වර්ෂා කාලයේදී පවා මෙම බලාගාර භාවිතා කිරීමට සිදුවේ. වර්ෂයේ විවිධ කාලවලදී විදුලිය මිලදී ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහත සඳහන් ඕනෑම ජනන යන්ත්‍රයක විදුලිය නිපදවීමේ ඒකක පිරිවැය ඉහළ හෝ පහළ යනු ඇත.

ගිවිසුම් කාලය කල් ඉකුත් වූ ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම, ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්.) සමාගම සහ ඒසියා පවර් (පුද්.) සමාගමේ බලාගාර වියළි කාලය තුළදී උපරිම බලාගාර සාධකය (සියයට 50 - සියයට 70) යටතේ අවම ඒකක පිරිවැයක් (කි.වො.පැය එකක් රු. 21.00 - රු. 25.00) පෙන්වා ඇත. කෙසේ වෙතත්, Covid 19 බලපෑම හේතුවෙන් විදුලි ඉල්ලුම අඩුවීම සහ මෙහෙයුම් කාලය තුළ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් වාලච්චේන බලාගාරය සමස්තයක් ලෙස ඉතා අඩු බලාගාර සාධකයක් (සියයට 5.4) යටතේ ක්‍රියාත්මක විය. එබැවින් ඉහළ ඒකක පිරිවැයක් පෙන්නුම් කරමින් මෙම තාප බලාගාරයේ විදුලිය නිපදවීමේ ඒකකයක පිරිවැය රු. 88.00 ක් විය.

මෙම අවස්ථාවෙහිදී, ඒකක පිරිවැය තීරණය කිරීම සඳහා ධාරිතා ගාස්තුව සලකා බලයි. කෙසේ වෙතත්, ධාරිතා ගාස්තුව ලංවීම වෙත බලශක්ති බෙදාහැරීම සමග කිසිදු සම්බන්ධයක් නොමැති එකඟ වූ කාලසීමාවක් සඳහා වන එකඟ වූ පිරිවැයකි.

(ඊ) **CMEC විසින් ඉදිරිපත් කරන ලද පුහුණුකිරීමේ ලේඛනයට අනුව, උපකරණවල ක්‍රියාකාරිත්වය නඩත්තු කිරීම, ප්‍රකෘතිමත් කිරීම හෝ වැඩිදියුණු කිරීමට ඒකකය සඳහා පුළුල් විසුරුවීම් පරීක්ෂා කිරීම (comprehensive disassembling inspection) සහ අලුත්වැඩියා කිරීම සඳහා වන A මට්ටමේ නඩත්තු කාල පරාසය වසර 4 සිට 6 දක්වා විය යුතුය. කෙසේ වෙතත්, ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සඳහා A මට්ටමේ නඩත්තුව එම ඒකක ක්‍රියාත්මක කර වසර 7ක් ගතවී ඇතත් එය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. මෙගා වොට් පැය 663,510 ක බලශක්ති අහිමිවීමක් සමඟ සමාලෝචිත වර්ෂය තුළදී ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සම්බන්ධ බිඳවැටීම් 14 ක් සිදුවී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.**

2 වන ඒකකයේ A මට්ටමේ නඩත්තුව මුලදී 2020 දී සැලසුම් කර තිබුණි. මෙම සේවාව ප්‍රසම්පාදනය සඳහා 2020 පෙබරවාරි මාසයේදී ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක් (SCAPC) පත් කරන ලෙස ලංවීම ඉල්ලා තිබුණි. 2020 දී SCAPC සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් (TEC) පත් කිරීම මගින් විශේෂඥ සේවය ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. CMEC වෙතින් ලංසුවක් කැඳවන ලද අතර, අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021 ජූලි 1 වැනි දින ලැබී තිබුණි. 2021 ජූලි 16 වැනි දින CMEC වෙත මිනිස් සේවා කොන්ත්‍රාතුව ප්‍රදානය කර ඇත.

- 2020 වසරේ ලෝක ව්‍යාප්ත Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට නොහැකි විය. රටවල් දෙකෙහිම අගුලු දැමීමේ තත්ත්වය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා බලපෑ ඇත.

- නඩත්තුව 2021 සැප්තැම්බර් දක්වා නැවත සැලසුම් කරන ලද අතර ලංවීම සහ CMEC අතර ගිවිසුම් අත්සන් කර ඇත. නමුත් CMEC විසින් කරන ලද ඉල්ලීම අනුව චීන විශේෂඥයින් සක්‍රීය සේවයට කැඳවීමට නොහැකි විය. විශේෂයෙන් නිරෝධායන නීතිය, ගමන් බිමන් සීමා කිරීම වැනි දෙරටේම පනවා ඇති Covid-19 සීමා කිරීම්, ඊට හේතු වේ. එම කාර්යය 2022 දක්වා කල් දමා ඇත. කාලසීමාව වෙනස් කිරීම SCAPC වෙත යොමු කර අතර SCAPC වෙනස් කිරීම අනුමත කර ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

- CMEC හි ඉල්ලීම SCAPC අනුමත කරන ලද අතර වැඩ කටයුතු 2022 අප්‍රේල් 23 දිනට නැවත සැළසුම් කර තිබුණි. 2022 ජූනි දක්වා නඩත්තුව කල් දැමීමට ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.
- වන ඒකකය 2022 ජූනි 18 වැනි දින උදෑසන ් මට්ටමේ නඩත්තුවක් සඳහා නවතා තබා ඇත.

විගණන ප්‍රකාශයේ සඳහන් බිඳවැටීම් සංඛ්‍යාව 14කි. අභ්‍යන්තර හා බාහිර දෝෂයන් නිසා සිදුවන බිඳවැටීම් සලකා බැලීමෙන් බිඳවැටීම් ගණන ගණනය කෙරේ. අභ්‍යන්තර දෝෂය කම්හල තුළ ඇති යන්ත්‍රෝපකරණ සහ උපකරණවල සිදුවන දෝෂයයි. බාහිර දෝෂය ජාතික විදුලිබල පද්ධතිය හරහා ඇති වෙන ගැටළු හේතුවෙන් බලාගාරයෙන් පිටත සිදුවන දෝෂයයි.

ඉතා කෙටි කාලයක් තුළ පවතින අභ්‍යන්තර දෝෂ හේතුවෙන් සමහර බිඳවැටීම් සිදුවී ඇති අතර එය නිවැරදි කර පැය කිහිපයක් ඇතුළත බලාගාරය නැවත ආරම්භ කළ හැකිය. තවද මෙම ආකාරයේ බිඳවැටීම සමස්ත බලාගාරයේ ක්‍රියාකාරිත්වයට බලපෑමක් නොමැත. බලාගාරය ආරම්භ කළ දින සිට ඒකක 02 සහ ඒකක 03 මගින් ජනනය කරන ලද මුළු ශුද්ධ බලශක්තිය පිළිවෙලින් ගිගාවොට් 15,482.01 ක් සහ ගිගාවොට් 14,087.50 වේ.

**2 වන ඒකකයේ සහ 3 වන ඒකකයේ බලාගාර ක්‍රියාකාරීත්වය පහත දක්වා ඇත.**

| වර්ෂය | 2 වන ඒකකයේ සහ 3 වන ඒකකයේ උපයෝජ්‍යතා සාධකය (Availability Factor) සහ ධාරිතා සාධකය (Capacity Factor) | | | | අදහස් |
|---|---|---|---|---|---|
| | ධාරිතා සාධකය (%) | | උපයෝජ්‍යතා සාධකය (%) | | |
| | ඒකක 2 | ඒකක 3 | ඒකක 2 | ඒකක 3 | |
| 2014 | 51.27 | 46.88 | 91.45 | 100.00 | |
| 2015 | 73.67 | 75.10 | 93.57 | 94.64 | |
| 2016 | 90.43 | 89.76 | 93.63 | 92.70 | |
| 2017 | 78.66 | 70.36 | 81.66 | 75.60 | |
| 2018 | 62.68 | 79.48 | 87.15 | 93.97 | |
| 2019 | 90.07 | 76.77 | 98.44 | 96.32 | |
| 2020 | 85.68 | 74.17 | 94.83 | 89.60 | |
| 2021 | 79.25 | 73.26 | 96.15 | 86.87 | |
| 2022 | 98.54 | 77.20 | 99.93 | 79.17 | * මැයි දක්වා |

| වර්ෂය | ඒකක 2 | | ඒකක 3 | | එකතුව | | අදහස් |
|---|---|---|---|---|---|---|---|
| | දළ බලශක්තිය (ගි.වො.පැ) | ශුද්ධ බලශක්තිය (ගි.වො.පැ) | දළ බලශක්තිය (ගි.වො.පැ) | ශුද්ධ බලශක්තිය (ගි.වො.පැ) | දළ බලශක්තිය (ගි.වො.පැ) | ශුද්ධ බලශක්තිය (ගි.වො.පැ) | |
| 2014 | 1,347.44 | 1,204.17 | 516.38 | 459.86 | 1,863.82 | 1,664.03 | |
| 2015 | 1,936.09 | 1,741.18 | 973.67 | 1,790.07 | 3,909.76 | 3,531.25 | |
| 2016 | 2,383.01 | 2,158.52 | 2,365.48 | 2,158.08 | 4,748.49 | 4,316.60 | |
| 2017 | 2,067.17 | 1,864.45 | 1,849.13 | 1,687.72 | 3,916.30 | 3,552.17 | |
| 2018 | 1,647.30 | 1,480.34 | 2,088.85 | 1,889.06 | 3,736.15 | 3,369.40 | |
| 2019 | 2,366.91 | 2,150.18 | 2,017.45 | 1,829.95 | 4,384.36 | 3,980.13 | |
| 2020 | 2,257.82 | 2,036.50 | 1,954.65 | 1,769.97 | 4,212.47 | 3,806.47 | |
| 2021 | 2,082.59 | 1,876.56 | 1,925.31 | 1,740.55 | 4,007.90 | 3,617.11 | |
| 2022 | 1,071.34 | 970.12 | 839.27 | 762.24 | 1,910.61 | 1,732.36 | * මැයි දක්වා |
| **එකතුව** | **17,159.67** | **15,482.02** | **15,530.19** | **14,087.50** | **32,689.86** | **29,569.52** | |

**(උ) ලයිටින් ශ්‍රී ලංකා හම්බන්තොට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 15 ක් ගතවී ඇතත් නොවිසඳුණු විරෝධතා හේතුවෙන් තංගල්ල සිට නොනගම දක්වා ගැන්ට්රි මාර්ගයේ (කුළුණ 13 සිට 36 දක්වා) ඉතිරි වැඩ අවසන් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.**

විරෝධතා කිහිපයක් ලැබී ඇත. PHM ශාඛාව විසින් PUCSL මාර්ගෝපදේශයන්ට අනුකූලව නිසියාකාරව මංවර එළිපෙහෙළි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මේ තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෑතකදී තංගල්ල ඩී.ජී සහ අදාළ ජී.එස් හමු වී ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

## 2.3 වෙනත් කරුණු

(අ) 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 44,079 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 6,839 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,928 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

| අංශය | වසර 1 කට වඩා වැඩි වෙළෙඳ ණයගැති ශේෂය | පිළිතුරු |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය (DD)-01 | රු.මිලියන 2318.21 | 2022 අප්‍රේල් 30 වන විට රු. මිලියන 1,208 ක් වූ දිගුකාලීන හිඟ (වසර 5 කට වැඩි) ණය ගැති ශේෂය රු. මිලියන 1,132 ක් දක්වා අඩු වී ඇත. තවද, DD1හි නි.ස විසින් දිගුකාලීන හිඟ මුදල් (වෙළෙඳ ණය) හැකි ඉක්මනින් අයකර ගැනීමට හෝ එවැනි දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත' |
| බෙදාහැරීමේ අංශය-02 | රු.මිලියන 3474.91 | වසර 5 කට වැඩි තොග සැපයුම් අවසන් කළ ගිණුමේ මුළු හිඟ මුදල්වලින්, DD2 විසින් 2022 මැයි වන විට රු. 3,294,126.64 ක් අය කර ගෙන ඇති අතර ආපසු අයකරගත නොහැකි අවසන් ණයගැතියන්ගෙන් රු. 4,712,865.46 ක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.<br><br>තවද, වෙස්ට් කෝස්ට් (පුද්.) සමාගම (ගිණුම් අංක 27799003538) රු. 1,397,841,678.43 ක් (වයස අවුරුදු 1 ට වැඩි) ගාස්තු ආරවුලක් හේතුවෙන් මේ දක්වා ගෙවා නොමැත. ඔවුන්ගේ අංශය යටතේ බිල් කිරීමට සහ ලංවිම බලශක්ති මිලදී ගැනීමේ ශාඛාව වෙස්ට් කෝස්ට් (පුද්.) සමාගමේ බලශක්ති මිලදී ගැනීමේ ගෙවීම් වලින් දැනටමත් සිය සැපයුම් ඒකක පියවා ඇති බැවින් හිඟ මුදල් කපා හැරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සමඟ සාකච්ඡා කරමින් සිටී.<br><br>වාලච්චේන කඩදාසි සමාගම සම්බන්ධයෙන් රු. 361,992,685.22 ක මුදලක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර ඉතිරිය (රු. 122,004,390.45) නැවත ආරම්භ කළ දින සිට වසර දෙකකට පසු මාස හයක කාලයක් තුළ වාරික පදනම මත අයකර ගත යුතුය. කෙසේ වෙතත්, මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට වාලච්චේන කඩදාසි සමාගම සහ ලංවිම අතර මෙම ගිවිසුම තවම අත්සන් කර නොමැත.<br><br>කන්තලේ සීනි සංස්ථාවේ (ගිණුම් අංක 3470100217) රු. 76,331,246.03 සම්බන්ධයෙන්, ඉතිරි හිඟ මුදල පියවීමෙන් පසු රු. 44, 839,186.53 ක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇත. කෙසේ වෙතත්, ලංවිම විසින් ඉදිරිපත් කර ඇති මෙම පියවීම් යෝජනාවට සීනි සංස්ථාව මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැත.<br><br>තවද, 2002 නොවැම්බර් 12 දිනැති අංක DGM(CS) 2002-13 දරන චක්‍රලේඛය අනුව නි.ස (DD02) අනුමැතිය ඇතිව, අවසන් කිරීමෙන් පසු අතිරේකව අය කරන ලද බර සැපයුම් ශේෂවලින් 2022 වර්ෂය තුළ රු. 4,253,487.47 ක් ඉවත් කර ඇත.<br><br>ඉහත ක්‍රියාවලිවලට අමතරව අදාළ ප්‍රදේශයේ ඉංජිනේරුවන් විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර හිඟ මුදල් එකතු කිරීමේ මාසික ප්‍රගතිය පිළිබඳ විස්තර පළාතේ නි.ස වෙත මෙන්ම ගණකාධිකාරී (ආදායම්) ඒකකය වෙත යවනු ලැබේ. තවද, අවසන් කරන ලද ගිණුම් සම්බන්ධයෙන්, අංක: DCC/ COH/ 03/ 2009 දරන චක්‍රලේඛයේ උපදෙස් අනුව හිඟ ශේෂය සුරැකුම් තැන්පතු මුදලට වඩා අඩු නම්, සුරැකුම් තැන්පතුවලට එරෙහිව හිඟ ශේෂයන් පියවීමට කටයුතු කරනු ඇත. |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| අංශය | වසර 1 කට වඩා වැඩි වෙළෙඳ ණයගැති ශේෂය | පිළිතුර |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය-03 | රු.මිලියන 572.95 | 2021.12.31 දිනට DD3 හි වෙළඳ ණය ගැතියන්ගේ මුළු හිඟ මුදලින්, 2022.04.30 දිනට සියයට 80 ක් පහත දැක්වෙන පරිදි අයකරගෙන ඇත. |

| තොග (අවසන් කරන ලද වෙළෙඳ ණය ගැතියන්ද ඇතුළත්ව) | 2021.12.31 දිනට ශේෂය | 2022.04.30 දිනට අයකිරීම් | අයකිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| **අවුරුදු එකකට අඩු** | | | |
| අවුරුදු එකකට අඩු | 2,528,598,322.51 | 2,318,398,753.43 | 92% |
| අවුරුදු 1-5 | 96,052,805.48 | 83,724,189.96 | 87% |
| අවුරුදු 5 ට වැඩි | 85,133,802.96 | 1,463,366.80 | 2% |
| **සමාන්‍ය (අවසන් කරන ලද වෙළෙඳ ණය ගැතියන්ද ඇතුළත්ව** | | | |
| අවුරුදු එකකට අඩු | 2,932,638,336.34 | 2,365,999,305.16 | 81% |
| අවුරුදු 1-5 | 158,386,485.31 | 38,655,915.31 | 24% |
| අවුරුදු 5 ට වැඩි | 233,373,071.62 | 33,360,632.10 | 14% |
| අවිනිශ්චිත | (3,103,753.25) | - | 92% |
| **එකතුව** | 6,031,079,070.97 | 4,841,602,162.76 | 80% |

**අවුරුදු 5 ට වැඩි - තොග**

ප්‍රධාන වශයෙන් ඇඹිලිපිටිය කඩදාසි සංස්ථාවේ අවසන් කරන ලද ශේෂය වූ රු. මිලියන 64 දැක්වේ. රු. මිලියන 15 ක් කපා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, සම්බන්ධතාවය යථා තත්ත්වයට පත් වූ පසු ඉතිරි මුදල වාරික 24 කින් අයකර ගැනීමට නියමිතය. අනුකූල වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අපේක්ෂාවෙන් සිටී. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දුව ලැබුණු පසු එය ක්‍රියාත්මක කරනු ලැබේ

**වසරකට වඩා අඩු**

2022.01.01 සිට 2022.06.15 දක්වා කාලය තුළදී ෂාන්බේ ජීන්ස් කොපරේෂන් (පුද්.) සමාගමෙන් රු.2,203,813.95 ක්, සුපර් පැක් (පුද්.) සමාගමෙන් රු. 3,875,593.79 ක් සහ පීක් ක්ලෝතින් (පුද්.) සමාගමෙන් රු. 629,623.56 ක් වශයෙන් තවත් ශේෂයන් අයකර ගෙන ඇත.

නි.ස (ව්‍යාපෘති) ශාඛාව විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කරන සෑම ගෙවීමකදී බිල්පත් පියවීමක් සිදු කිරීම මගින් උමා ඔය හිඟ බිල්පත් ශේෂය අයකර ගැනීම සඳහා ලංවිම ව්‍යාපෘති ශාඛාව සමඟ එකඟ වූ සැලැස්මක් ඇත. ඒ අනුව මෙම කාලය තුළදී රු. මිලියන 104 ක උමා ඔයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු නි.ස (ව්‍යාපෘති) ශාඛාව මගින් පියවා ඇත.

**ඊට අමතරව පහත සඳහන් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පළාත් විසින් ගනිමින් ඇත.**

- ත්‍රිවිධ හමුදාවෙන් හිඟ බිල්පත් අයකර ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශයට ලිපියක් මගින් දැනුම් දී ඇත. බිල්පත් පියවීමට දින 60 ක ණය කාලයක් ලබාදුන් අතර අනෙකුත් තොග පාරිභෝගිකයින්ට බිල්පත් පියවීමට දින 15ක් පමණක් ලබාදී ඇත.
- පාරිභෝගික සුරැකුම් තැන්පතුවලින් පියවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.
- විසන්ධි කිරීම් වේගවත් කිරීම සඳහා ගාස්තු ගෙවීම ප්‍රමාද වූ පාරිභෝගිකයින්ට වහාම රතු නිවේදනය නිකුත් කරයි.
- නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලංවිම නීති ශාඛාව වෙත යොමු කිරීම.
- සාමාන්‍ය සැපයුම් පැහැර හරින ලද මුදල අයකර ගැනීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී තොග සැපයුම් ගිණුම් වෙත අයනොවූ සාමාන්‍ය සැපයුම් හිඟ ශේෂයන් මාරු කිරීම.
- ගිණුම්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| අංශය | වසර 1 කට වඩා වැඩි වෙළෙඳ ණයගැති ශේෂය | පිළිතුර |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය-04 | රු.මිලියන 473.41 | වසර 1 කට වැඩි ශේෂය සියයට 8 ක් පමණක් නියෝජනය කරයි, එනම් රු. මිලියන 473.41 කි. වසර 5 කට වැඩි ශේෂය රු. මිලියන 179.81 ක් වන අතර එය මුළු ණය ගැතියන්ගෙන් සියයට 3 ක් පමණක් නියෝජනය කරයි. හිඟ ශේෂයන් සහ ලැබිය යුතු තත්ත්වය අඩු කිරීම සඳහා අංශයේ අදාළ සියලුම නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. වත්මන් සන්දර්භය තුළ, විකුණුම්වලින් සියයට 107 ක් එකතු කර ගැනීමට සහ ණයගැති ශේෂය රු. මිලියන 5977.99 සිට රු. මිලියන 5,530 ක් දක්වා අඩුකර ගැනීමට DD4 වෙත හැකි වී ඇත.<br><br>තවද, බස්නාහිර පළාත දකුණ 1 (WPS1) විසින් 2020 වර්ෂයේදී වසර 10 කට වැඩි සාමාන්‍ය පාරිභෝගිකයන්ගේ (4,244) හිඟ ගෙවීම් රු. 30,186,122.06 ක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අතර එය තවමත් අභ්‍යන්තර විගණන ශාඛාවේ නිරීක්ෂණය යටතේ පවතී.<br><br>ඊට අමතරව, අයකර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා කමිටු පිහිටුවා ඇති අතර මණ්ඩලයට ගෙවිය යුතු මුදල් කඩිනමින් පියවා ගැනීමට අදාළ නිලධාරීන් පාරිභෝගිකයන් සමඟ සාකච්ඡා කරමින් සිටී. |
| මුලස්ථානය | රු.මිලියන 10 | අයකර ගැනීමට හැකි ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

(ආ) **2021 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන්ගෙන් සහ අනෙකුත් ණයගැතියන්ගෙන් එකතුව පිළිවෙලින් රු. බිලියන 1.67 ක් සහ රු. මිලියන 897 ක් වූ ණය ශේෂයන් වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව පැවතුණි.**

| අංශය | විවිධ ණයගැති ශේෂය | පිළිතුර |
|---|---|---|
| ජනන | 14,816,859.00 | භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී රු. මිලියන 2.4 ක අත්තිකාරම් ගෙවීම් ලක්විජය බලාගාරයේ පොත්පත්වල වසර 1-2 ක කාලයක් තිස්සේ විවිධ ණයගැති ශේෂයට ඇතුළත් වේ. අදාළ ලියවිලි ලැබීම සමඟ මෙය පියවනු ඇත.<br><br>වසර 1 කට වැඩි මහවැලි සංකීර්ණයේ විවිධ ණයගැති ශේෂය රු. 77,230.08 ක් වේ. වසර 1කට වැඩි මෙම ශේෂය විවිධ ණය ගැතියන්ගෙන් සියයට 0.004 ක් නියෝජනය කරයි. |
| සම්ප්‍රේෂණ | 1,389,862,725.00 | පහත වගුව බලන්න |
| බෙදාහැරීමේ අංශය - 01 | 203,722,181.00 | වසර පහකට වැඩි බොහෝමයක් හිඟ මුදල් රජය වෙනුවෙන් සිදු කරන ලද සවිකිරීම් කටයුතු සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල්වලින් සමන්විත වේ. ඉහත ශේෂයන් හැකි ඉක්මනින් අයකර ගැනීමට හැකි උපරිම උත්සාහයක් ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| බෙදාහැරීමේ අංශය - 02 | 19,128,108.00 | බෙදාහැරීමේ අංශය 02 හි විවිධ ණය ගැතියන්ගේ ඉහත දිගුකාලීන හිඟ ශේෂයන්ගෙන් වැඩි ප්‍රමාණයක් 2000 වර්ෂයේදී ලබා දුන් CFL පාරිභෝගික බල්බ ණයවලින් සහ සේවකයින්ගෙන් අයකර ගත යුතු තොග හිඟ ශේෂයන්ගෙන් සමන්විත විය. |
| බෙදාහැරීමේ අංශය - 03 | 14,369,445.00 | බෙදාහැරීමේ අංශය 03 හි වසර 5 කට වැඩි විවිධ ණයගැති ශේෂයේ වැඩි ප්‍රමාණයක් ඌව සහ සබරගමුව පළාත්වල තොග හිඟ/ මුදල් වංචාවන් සඳහා අයකරගත යුතු මුදල නියෝජනය කරයි. නීතිමය නඩු විභාග වෙමින් පවතින බැවින් ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධිකරණ තීන්දුව මත ගිණුම් පොත්වලින් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. |
| බෙදාහැරීමේ අංශය - 04 | 11,112,638.00 | මෙම ණයගැති ශේෂයට ප්‍රධාන වශයෙන් ගිණුම් ශේෂයෙන් සියයට 90 ක් පිළිබිඹු වන ප්‍රසම්පාදන ද්‍රව්‍ය මත ආනයනය සඳහා ගෙවන අත්තිකාරම් ඇතුළත් වේ. ආනයන අත්තිකාරම් ස්වභාවයෙන්ම පුනරාවර්තනය වන බැවින් ගිණුමේ ශේෂය සම්පූර්ණයෙන් නිරවුල් කළ නොහැක. තවද, විවිධ ණය ගැතියන් අතරට ශාඛා මට්ටමින් නිරීක්ෂණය කරන ස්වභාවයේ සේවයෙහි යෙදවීම සඳහා අත්තිකාරම්, කුලී අත්තිකාරම් සහ වෙනත් විවිධ අත්තිකාරම් ඇතුළත් වේ. |
| මුලස්ථානය | 22,889,143.00 | අයකර හැකි ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **එකතුව** | **1,675,901,099.00** | |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**වසර 5 කට වැඩි ලැබිය යුතු සම්ප්‍රේෂණ අංශයේ විවිධ ණයගැතියන්**

| ණයගැතියාගේ නම | මුදල රු. | වත්මන් තත්ත්වය |
|---|---|---|
| විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 8,264,352/- | ''වුඩ් ගෲප් ගෑස් ටර්බයින් ලිමිටඩ්'' සමාගම තවදුරටත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවන අතර එම නිසා 2012 වසරේ දී මතයක් ලබා ගැනීම සඳහා මෙම ගැටලුව ලංවිම ප්‍රධාන නීති නිලධාරී වෙත යොමු කර ඇත.<br><br>ප්‍රධාන නීති නිලධාරිනියට අනුව, ''කාලාවරෝධ ආඥාපනතට අනුව, එම කොන්ත්‍රාත්තුව/ගිවිසුම අවසන් කළ දින සිට හෝ එවැනි ක්‍රියාමාර්ගයක් පැන නැගී ඇති දින සිට වසර 6 ක් ඇතුළත එම ක්‍රියාමාර්ගය ගෙන එන්නේ නම් මිස, කිසිදු කොන්ත්‍රාත්තුවක්/ගිවිසුමක් මත කිසිදු ක්‍රියාමාර්ගයක් පවත්වාගෙන යා නොහැකි බව ඇය ප්‍රකාශ කර ඇත.''<br><br>ශ්‍රී ලංකාවේ දැනට එවැනි නමින් සමාගමක් නොමැති බැවින් සහ ඉහත සඳහන් කළ නීති නිලධාරිනියගේ පිළිතුර අනුව, මෙම ශේෂය ගිණුම් පොත්වලින් කපා හැරීමට තීරණය විය.<br><br>කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සකස් කරමින් පවතී. |
| විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 6,142,277/- | 2008-09-09 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලැබුණු ලිපියට අනුව කෙරවලපිටියේ Duel Fuel Combined Cycle බලාගාරය විවෘත කිරීමේ උත්සවයට අදාළව මණ්ඩලය විසින් වියදම් දරා ඇත. එය ප්‍රතිපූරණය කිරීම සඳහා විවෘත කිරීමේ උත්සවයේ වියදම්වලට අදාළ බිල්පත් පසුව අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස එම ලිපියේ සඳහන් කර ඇත. එබැවින්, 2011-01-03, 2013-10-01, 2015-10-8 සහ 2017-07-25 යන ලිපි මගින් මණ්ඩලය විසින් බිල්පත් ඉදිරිපත් කර වියදම් ප්‍රතිපූරණය කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.<br><br>විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන සහ පීආර්සී.) විසින් 2018-01-04 දිනැති ඔහුගේ ලිපිය මගින් කෙරවලපිටිය සංයුක්ත විදුලි බලාගාරය විවෘත කිරීමේ උත්සවයට අදාළ හිඟ ගෙවීම ලංවිමට ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමෙන් ඉල්ලා ඇත.<br><br>වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමේහි ප්‍රධාන විධායක නිලධාරීවරයා, 2018.01.30 දිනැති ඔහුගේ ලිපිය මගින් ඉහත ඉල්ලීමට පිළිතුරු දෙමින්, එම බලාගාරයේ ප්‍රතිලාභියා වශයෙන්, මෙම වියදම ලංවිම විසින් දැරිය යුතු බව ප්‍රකාශ කර ඇත. ''ගණුදෙනුවේ යෝග්‍යතාවය තහවුරු කළ නොහැකි බැවින් සමාගම විසින් මෙම වියදම දැරීම සඳහා මණ්ඩලයෙන් උපදෙස් ලබාගැනීමට ඉඩක් නොමැති බව'' ඔහු තවදුරටත් ප්‍රකාශ කර ඇත.<br><br>ඉහත ප්‍රතිචාරයට අනුව. ගෙවීමේ වගකීම භාර ගැනීම සමාගම ප්‍රතික්ෂේප කර ඇත.කෙසේ වෙතත්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 16 සහ 2018 ජනවාරි 04 යන දිනයන්හිදී මේ සම්බන්ධයෙන් වෙස්ට් කෝස්ට් පවර් සමාගමෙන් වෙත යවන ලද ලිපි යොමු කරමින් 2022 අගෝස්තු 22 දිනැති ලිපිය මගින් මෙම වියදම ප්‍රතිපූරණය කරන ලෙස මණ්ඩලය විසින් නැවතත් වෙස්ට් කෝස්ට් පවර් සමාගමෙන් ඉල්ලා ඇත. |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| ණයගැතියාගේ නම | මුදල රු. | වත්මන් තත්ත්වය |
|---|---|---|
| ඒ.ඊ.එස් කැළණිතිස්ස (පුද්) සමාගම | 1,368,964,445/- | ඒඊඑස් කැලණිතිස්ස (පුද්.) සමාගමට අඩු මිලට ඉන්ධන නිකුත් කරන ලෙස අමාත්‍ය මණ්ඩලය පත් කල අනුකමිටුවක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දන්වා තිබුණි. කෙසේවෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මිල අඩු නොකර මුල් මිලටම ඉන්වොයිස් කර තිබුණි.<br><br>ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉන්ධන මිල වෙනස සකස් කර සමාගමට බැර පතක් පිරිනැමීමෙන් පසුව පමණක් මෙම මුදල ඒඊඑස් කැලණිතිස්ස (පුද්.) සමාගම වෙතින් අයකර ගනු ලැබේ.<br><br>නි.ස - බලශක්ති මිළදී ගැනීම් විසින් 2011.11.24 දිනැති ඔහුගේ ලිපිය මගින් පෙර බිල්පත් ඒ අනුව සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉල්ලා ඇත.<br><br>ඉහත ලිපියට සිහිකැඳවීම් 2011.12.21 සහ 2012.01.20 සහ 2022.08.18 යන දිනවල CPC වෙත යවා ඇති අතර මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. |
| නොර්දන් පවර් (පුද්) සමාගම | 358,739/- | 2011 වසරේදී නොර්දන් පවර් (පුද්) සමාගම වෙනුවෙන් සම්පූර්ණ කරන ලද වර්ධනය කිරීමේ කාර්යයක් සඳහා ලැබිය යුතු මුදලකි. ලංවීම පොත්වල සමාගමට දිගුකාලීන හිඟ ගෙවිය යුතු ශේෂයක් ඇති බැවින්, මෙම ශේෂය අයනොවී පවතී.<br><br>ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

**(ඈ)** **මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනයවලින් ලැබිය යුතු දෑ යටතේ පෙන්වා ඇති රු. මිලියන 83.68 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව පැවතුණි.**

ලැබිය යුතු බොහෝමයක් රජයේ රෝහල්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලින් සමන්විත වේ. ලිපි යැවීමෙන් සහ වෙනත් පියවරයන් භාවිතා කිරීමෙන් අයකර ගැනීමට පසු විපරම් කටයුතු කර ඇතත් එම ලැබිය යුතු දෑ අයකර ගැනීමේ හැකියාව සැක සහිතය. එම අයකරගත නොහැකි ශේෂයන් කපා හැරීමට පියවර ගෙන ඇත.

**(ඈ)** **ගල් අඟුරු හිඟය සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අයවිය යුතු රු. මිලියන 714.96 ක මුදලක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට නිසි පියවර නොගෙන හිඟව පැවතුණි.**

මෙම ශේෂය ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමට අදාළ රු. 478,179,795.00 කින් සහ ලිබර්ටි කොමොඩිටීස් සමාගමට අදාළ රු. 236,785,639.43 කින් සමන්විත වේ.

ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කළ අතර නිරාකරණයක් සඳහා අවසන් වාර්තාව වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත භාරදී ඇත.

ලිබර්ටි කොමොඩිටීස් සම්බන්ධයෙන්, ලංකා ගල් අඟරු සමාගම බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ලිබර්ටි කොමොඩිටීස් සමාගමට එරෙහිව ලංකා ගල් අඟරු සමාගම විසින් ගනු ලැබූ බේරුම්කරණ ක්‍රියාවලියේ තීරණය මත මෙය නිරවුල් වනු ඇත.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(ඉ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. බිලියන 4.01 ක් වූ ණය ශේෂයන් දීර්ඝ කාලයක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුණි.**

| ණයහිමියාගේ නම | වටිනාකම රු. | පිළිතුර |
|---|---|---|
| CMEC | 2,820,562,372 | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතිය මත පසු වර්ෂවලදී ලංවිම 2014, 2015, 2016 සහ 2017 වසර සඳහා මෙහෙයුම් සහ නඩත්තු ගාස්තු වාරික වශයෙන් ගෙවා ඇත. රු. 3,800,549,935.75 ට 2017,2018,2019,2020 සහ 2021 වසර සඳහා ගෙවිය යුතු මෙහෙයුම් සහ නඩත්තු ගාස්තු ඇතුළත් වේ. 2022 මැයි මාසය තුළදී ලංවිම ඩොලර් මිලියන 1.25 ක් ගෙවා ඇත. |
| ගෙවිය යුතු උද්දේශිත ලාභාංශ (deemed dividend) බද්ද | 1,270,766,413 | ගෙවිය යුතු රු. 1,270,766,413 ක උද්දේශිත ලාභාංශ බද්ද, 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂ සඳහා ඉල්ලුම් කරන ලද උද්දේශිත ලාභාංශ බදු ආපසු ගෙවීමට එරෙහිව පියවීමට නියමිත 2013/2014 තක්සේරු වර්ෂය සඳහා උද්දේශිත ලාභාංශ බද්දෙහි නොපියවූ වගකීම නියෝජනය කරයි. ගිණුම්වල මෙම වගකීම හිලව් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ආපසු ගෙවීමේ ඉල්ලීම් තවමත් අවසන් කර නොමැත. කෙසේ වෙතත්, අදාළ නීතිය අර්ථකථනය කිරීමේ ආරවුලක් පවතින බැවින් මෙම මුදල පියවීමට ලංවිම එකඟ නොවේ. ලංවිම මේ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග අඛණ්ඩව ගෙන ඇත. |

**(ඊ) නොර්දන් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු රු. බිලියන 2.9 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල සම්ප්‍රේෂණ අංශයේ වෙළෙඳ ණය හිමියන් යටතේ දක්වා තිබුණු අතර එම මුදල වසර තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුණි.**

මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගයක් හේතුවෙන් නොර්දන් පවර් බලාගාරය 2015-01-27 සිට වසා දමා ඇත. කෙසේ වෙතත්, සමාගම මෙය Force Majeure තත්වයක් ලෙස ප්‍රකාශ කරමින් ධාරිතාව ගාස්තු සඳහා මාසික ඉන්වොයිසි නිකුත් කර ඇත. අධිකරණ තීන්දුව ලබා දීමට නියමිතව තිබූ බැවින් ලංවිම මෙම ඉන්වොයිසි වටිනාකම් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර ඇත. පරිසර නීතිය උල්ලංඝණය කරමින් බලාගාරය ක්‍රියාත්මක කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර ඇති බැවින් මෙම ඉන්වොයිසි පියවීමට ලංවිමට වගකීමක් නැත. මෙම මුදල් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත.

**(උ) තොග සත්‍යාපනයේදී හෙළිදරව් වූ රු. මිලියන 571.34 ක (මෙ.ටො 27,049.71 ක) ගල් අඟුරු තොග හිඟය 2021 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශයේ අලාභයක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, පහත හේතූන් මත එම මුදලෙහි නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.**

re-claimer සහ ඩෝසර් භාවිතා කරමින් අංගනයේ භාවිතා කළ හැකි ගල් අඟුරු යම් මට්ටමකට සූරා දැමීම මගින් ගල් අඟුරු අංගනය සත්‍යාපනය කිරීම ලක්විජය විදුලි බලාගාරයේහි වර්තමාන පරිචය වේ. අංගනය යම් මට්ටමකට සූරා දැමූ පසු, ගල් අඟුරු අංගනය ඒකාකාරව සමතලා කර සත්‍යාපනය ආරම්භ කරයි. ගල් අඟුරු අංගනයේ පහළ ස්ථර වන deaf ගල් අඟුරු සහ ගල් ඇතුළත් වීම (feeding) වැළැක්වීම සඳහා මෙම සූදානම සිදු කරයි. අවම දෝෂයකින් නිවැරදි ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා සමීක්ෂණය කිරීමේ නිවැරදි ක්‍රමය මෙය වේ. මූලික වශයෙන්, විශාල තොග ගොඩවල් සමඟ සමීක්ෂණය සිදු කරන විට එය වඩාත් දෝෂ සහිත වේ. එබැවින් මිනුම් දෝෂ අවම කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ඉහත ක්‍රමය අනුගමනය කරයි.

**(i) විශාල ගල් අඟුරු තොගයක් සත්‍යාපනය කිරීම සඳහා ඝන මීටරයකට ගල් අඟුරුවල ක්ෂේත්‍ර ඝනත්වය මැනීම සඳහා වළවල්වලින් කැණීම් කරන ලද ගල් අඟුරු කිලෝග්‍රෑම් 35 ක් පමණක් යොදා ගෙන තිබුණි.**

මනින ලද ගල් අඟුරු අංගන ප්‍රදේශයේ මතුපිට බොහෝ දුරට සමාන, ඒ හා සමානව සංයුක්ත හා සමජාතීය විය. ඊට අමතරව, ක්ෂේත්‍ර ඝනත්වය මැනීම සඳහා සිදු කරන ලද ක්‍රමවේදය ඉතා නිවැරදි විය. එබැවින්, ස්ථානයේ ඝනත්වය මැනීම සඳහා කැණීම් ප්‍රමාණය ප්‍රමාණවත් ලෙස සලකනු ලැබීය.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

**(ii) කැණීම් කරන ලද වළවල්වල පැවති ඝන මීටරයකට ගල් අඟුරුවල ක්ෂේත්‍ර ඝනත්වයේ වෙනස්කම් පැවතුණි.**

ඝනත්ව නියදි ස්ථානවල පිහිටීම විශාල ප්‍රදේශයක් පුරා පැතිර ඇත. මනින ලද උපරිම/අවම (ඝන මීටරයකට කිලෝග්රෑම් 1193.33/1380.95) ක්ෂේත්‍ර ඝනත්වය සහ සාමාන්‍ය ක්ෂේත්‍ර ඝනත්වය (ඝන මීටරයකට කිලෝග්රෑම් 1294.88) අතර වෙනස උපරිම දෝෂ ප්‍රතිශතය ලෙස සැලකිය හැක. එබැවින් උපරිම දෝෂ ප්‍රතිශතය සියයට 7.8 ලෙස ගණනය කළ හැකිය. සමීක්ෂණය සඳහා සලකා බැලූ භෞතික තොගය මෙ.ටොන් 114,290 ක් පමණක් වූ බැවින්, උපරිම දෝෂය 114,290 x සියයට 7.8 ලෙස සැලකිය හැකිය. එය මෙ.ටොන් 8963කි. මෙවැනි දෝෂයක් ඇතිවීමේ සම්භාවිතාව බෙහෙවින් අඩු වුවද, ගල් අඟුරු අංගනයේ හසුරුවන මුළු ගල් අඟුරු ප්‍රමාණය මෙ.ටොන් මිලියන 2 ඉක්මවන බව සලකන විට ඉහත දෝෂ ප්‍රතිශතය පිළිගත හැකි සීමාවක් තුළ ඇතැයි සැලකේ.

**(iii) ගල් අඟුරු තොග පැවතී බැවින් බේ (Bay) "බී" සඳහා සාමාන්‍ය ගල් අඟුරු මතුපිට මිනුම් කර නොතිබුණි.**

ගල් අඟුරු අංගනයේ අඛණ්ඩ මෙහෙයුම් හේතුවෙන් Bay A සහ Bay C පරිදි Bay B සමතලා කිරීමට නොහැකි වූ බැවින් Bay B හි ගල් අඟුරු මතුපිට මැනිය නොහැක.

**(iv) පටවන ලද තොග සහ ගොඩබාන ලද තොග කෙටුම්පත් සමීක්ෂණයක් (Draft survey) මගින් මිනුම් කර තිබුණි.**

මෙම මිනුම මෙවැනි නැව්බඩු මැනීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සුදුසු ක්‍රමයයි. ආකිමිඩීස්ගේ මූලධර්මයට අනුව, දියරයක ගිලී ඇති වස්තුවක් මත ක්‍රියාත්මක වන ඉහළට උත්ප්‍රේරක බලය, සම්පූර්ණ හෝ අර්ධ වශයෙන්, වස්තුව විස්ථාපනය කරන දියරයේ බරට සමාන වේ. එබැවින් විස්ථාපනය කරන ලද මුහුදු ජලයේ බර ගල් අඟුරු බරට සමාන වේ

**(v) ගොඩබාන ලද අඟුරු මැනීමට භාවිතා කරන ශුන්‍ය පටි තරාදියෙන් (Zero belt scale) නිශ්චිත මිනුම්කරණයක් ලබා දී නොතිබුණි.**

අපි මෙම ශූන්‍ය පටි තරාදිය අඛණ්ඩව නිරීක්ෂණය කරමින් සිටී. ලක්විජය විදුලි බලාගාරයේ ගල් අඟුරු හැසිරවීමේ නඩත්තු ඒකකය එක් එක් නැව්ගත කිරීම් අවසන් වූ පසු මෙම තරාදිය ක්‍රමාංකනය කරයි. කෙසේ වෙතත්, වැසි සහිත අවස්ථාවන්හිදී ගොඩබෑම සහ ශූන්‍ය තරාදියේදී ගල් අඟුරුවල තෙතමන මට්ටම් සුළු වශයෙන් වෙනස් වීම හේතුවෙන් බර වෙනස්වීම්වල ඉතා කුඩා ප්‍රතිශතයක් තිබිය හැකිය.

**(vi) බලාගාරයේ ඒකක තුන මගින් පරිභෝජනය කරන ගල් අඟුරු මැනීමට භාවිතා කරන පටි තරාදියෙන් (Belt scale) නිශ්චිත මිනුම්කරණයක් ලබා දී නොතිබුණි.**

ගල් අඟුරු මෝල්වල පරිභෝජනය කරන ගල් අඟුරු පිළිබඳ වඩාත් නිවැරදි මිනුමක් ලබා ගැනීම සඳහා මෙම ගල් අඟුරු මෝල්හි ඇති පටි තරාදි නිර්දේශිත කාල සීමාවන් තුළ එහි ක්‍රමාංකනයට නිතර ලක් වේ.

**(vii) ගල් අඟුරු ගොඩබාන සහ පරිභෝජනය කරන අවස්ථාවේ ගල් අඟුරුවල ඝනත්වය වෙනස් විය හැකි අතර, ගල් අඟුරු තොගය මත ගල් අඟුරුවල ඝනත්වයේ වෙනස්වීම් ගැලපීම් කර නොතිබුණි.**

ගල් අඟුරු ස්වයං දහනය වීම, වාෂ්පශීලී ද්‍රව්‍ය වාෂ්ප වීම සහ ගල් අඟුරු අංගනයට ගොඩබෑමෙන් පසු ගල් අඟුරුවල තෙතමන මට්ටමේ වෙනස්වීම් හේතුවෙන් බර අඩු වීම ඉතා කුඩා ප්‍රතිශතයක් විය හැක. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව වාර්ෂික සත්‍යාපනයේදී ගැලපීම් කර ඇත.

**(ඌ) මණ්ඩලය විසින් වසර ගණනාවක් තිස්සේ LECO වෙත විදුලිය විකිණීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදු කර ඇතත්, මෙම ආයතන දෙක අතර සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ එළඹී විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම් නොතිබුණි.**

1. ලංවිම සහ ලෙකෝ යන දෙපාර්ශවයේම උසස් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් කෙටුම්පත් ගිවිසුමක් සකස් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ (AG) මතය විමසා ඇත.

2. මෙම කමිටුව නීතිපතිවරයාගේ මතය අනුව අවශ්‍ය සංශෝධන සිදු කර ඇති අතර ''අවසන් විදුලිබල විකුණුම් ගිවිසුම (PSA)'' නි.ස (සම්ප්‍රේෂණය) වෙත ඉදිරිපත් කර ඇත.

3. නමුත් නිලධාරීන්/නියෝජිතයින් විසින් අවසන් කරන ලද විදුලිබල විකුණුම් ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර ඇති අතර, පහත දක්වා ඇති පරිදි විදුලිබලය විකුණුම් ගිවිසුම් කෙටුම්පතෙහි ලේකෝ විසින් අනුමත කරන ලද සමහර කරුණු උපුටා දක්වයි.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

''බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) සතු ලේකෝ සැපයුම් ස්ථාන පිළිබඳ ගැටළුව යොමුකිරීම, කර යුතුය.

4. කමිටුව විසින් සාමූහිකව ඉදිරිපත් කරන ලද වාර්තාවට ලෙකෝ හි නිලධාරීන්/ නියෝජිතයින් 03 දෙනෙකු විසින් කරන ලද ඉහත සඳහන් අනුමත කිරීම් සම්බන්ධයෙන් ලංවිම සාමාන්‍යාධිකාරී විසින් ලෙකෝ හි සාමාන්‍යාධිකාරී වෙතින් (26-03-2015) ලිඛිතව විමසා ඇත. එම ලිපියේම ලංවිම සාමාන්‍යාධිකාරී විසින් ලෙකෝ හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මෙම කාරණය සලකා බලන ලෙස යෝජනා කර ඇත.

5. ලංවිම බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටුව (DCC) විසින් ලංවිම සමාන්‍යාධිකාරීගේ ප්‍රතිපත්තිමය එකඟතාවය ලැබීමෙන් පසු කිලෝවෝට් 33 ඉන්ජෙක්ෂන් පොයින්ට්ස් ලේකෝ වෙත ලබා දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම සඳහා (ලේකෝ හි නියෝජිතයෙකු ඇතුළුව) කමිටුවක් පත් කර ඇත.

6. විදුලිබල විකුණුම් ගිවිසුම් අත්සන් කිරීම සඳහා වන ලේකෝ එකඟතාව එකී කමිටුවේ අවසන් වාර්තාව මගින් ඉදිරිපත් කරන ලද යෝජිත මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සඳහා අනිවාර්ය පූර්ව කොන්දේසියක් වන අතර එම කමිටුව වෙත සිය නියෝජිතයා හරහා ලේකෝ විසින් එකඟ වී ඇත.

7. එම කමිටුව විසින් යෝජිත මාර්ග සිතියම 2022-06-06 දින පැවති රැස්වීමේදී DCC විසින් ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන ඇත.

8. මෙම කාර්යය අවසන් කිරීමත් සමඟ, ලෙකෝ නිලධාරීන්/නියෝජිතයින් විසින් 2015 මාර්තු වාර්තාවේ සටහන් කර ඇති පරිදි "බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) සතු ලේකෝ සැපයුම් ස්ථාන පිළිබඳ ගැටළුව යොමුකිරීම" පිළිබඳ දීර්ඝ කාලයක් තිස්සේ බලා සිටි ගැටළුව විසඳනු ලබන අතර විකුණුම් ගිවිසුම අත්සන් කිරීමට මග සලසනු ඇත.

9. ඉහත මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමට සමගාමීව, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර ඇති බලශක්ති විකුණුම් ගිවිසුම් (2022-06-27 දිනැති මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීගේ ලිපිය) සමාලෝචනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. එහිදී මණ්ඩලය සහ ලෙකෝ අතර කෙටුම්පත් බලශක්ති විකුණුම් ගිවිසුම සමාලෝචනය කර වැඩිදියුණු කිරීම සඳහා කමිටුවට පවරා ඇති අතර ඒ අනුව එය පිළියෙළ කරමින් ඇත.

**(එ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට ලබා දී ඇති විදේශ ණයවලින් බැඳීම් ගාස්තු ලෙස 2020 දී රු. මිලියන 61.39 ක මුදලක් ණය දෙන ආයතනය විසින් අඩු කර තිබුණි. මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද බොහෝ ව්‍යාපෘති නියමිත දිනට නිම කර නොතිබූ අතර, එය අතිරේක බැඳීම් ගාස්තුවලට හේතු වී තිබුණි. තවද, බැඳීම් ගාස්තු ගණනය කිරීම පිළිබඳ විස්තර විගණනයට ලැබී නොතිබුණ අතර, ඒ අනුව, බැඳීම් ගාස්තුවල ඇතිවීම සහ නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.**

බැදීම් ගාස්තුව සියලුම ව්‍යාපෘති සඳහා පොදු වන අතර ණය ගිවිසුම්වල දැඩි ණය ගිවිසුම් හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත වේලාවට සිදු වුවද එය වැළැක්විය නොහැක.

**(ඒ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. මිලියන 3.67 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන දින දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම මණ්ඩලයේ වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, පෙර වංචාව සැලකිල්ලට ගැනීමෙන් තොරව වංචාවේ වටිනාකම ලෙස රු. 99, 155 ක් පමණක් අය කර ගැනීමෙන් පසුව ඔහුගේ රාජකාරිය අවසන් කර තිබුණි.**

ආර්.බී.වෙදගෙදර මහතාගෙන් අලාභ අයකර ගැනීම සඳහා නඩු පැවරීමට ලංවිම නිලධාරීන් කිහිප වතාවක්ම අවශ්‍ය ලිපිගොනු සමග නීතිපති දෙපාර්තමේන්තුවට කැඳවා ඇත.

ආර්.බී. වෙදගෙදර මහතාගෙන් තොග හිඟය අයකර ගැනීම සඳහා 2021-11-01 දින නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පූර්ව නීතිමය සාකච්ඡාවක් පවත්වා ඇත. කෙසේ වෙතත්, එම සාකච්ඡාවෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිර්දේශ ප්‍රධාන නීති නිලධාරී (ලංවිම) වෙතින් මෙම කාර්යාලයට මෙතෙක් ලැබී නොමැත.

2022-09-12 දින තොග හිඟය පිළිබඳ ත්‍රිපුද්ගල කමිටු වාර්තාව සාකච්ඡා කිරීම සඳහා මණ්ඩලයේ වැඩබලන සාමාන්‍යාධිකාරී සමඟ රැස්වීමක් පවත්වා ඇති අතර කටයුතු සිදු කරමින් පවතී.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ඔ) **පරීක්ෂණය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කර පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව රු. මිලියන 3.79 ක තොගය හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, එම මුදල අයකර ගැනීමෙන් තොරව ගිණුම් පොත්වල පැවතණි". මෙම මුදල කපා හැරීමට මණ්ඩලය කටයුතු කරමින් සිටි අතර ඔහුට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් නොගෙන ඔහුව විශ්‍රාම ගන්වා තිබුණි.**

එන්.පී.එල් සමරසිංහ මහතාගෙන් අයකර ගැනීමට නියමිත තොග හිඟය විශ්‍රාම වැටුපෙන් අයකර ගන්නේ කෙසේද යන්න පිළිබඳ ත්‍රිපුද්ගල කමිටුවකට යොමු කර එහි නිර්දේශ 2021-04-16 දින ලබා දී ඇත. එහි අඩංගු නිර්දේශ සාමාන්‍යාධිකාරීවරයාගේ (ලංවිම) අනුමැතියට ගෙන ඒමට කටයුතු කරමින් පවතී.

(ඕ) **2018 දෙසැම්බර් 31 දින සිට ජනන අංශයේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ රු. මිලියන 22.88 ක් වූ කිසිදු චලනයකින් තොර අයිතම පැවතුණි.**

2019 වර්ෂය තුළදී ලක්විජය විදුලි බලාගාරයේ යෝජිත සංචාරක බංගලාව සඳහා UDA අනුමැතිය සඳහා ගෙවා ඇති රු. 26,315.65 ක් සහ CEMS අමතර කොටස් ප්‍රසම්පාදනය සහ FGD සඳහා වායු තත්ත්ව සහතික කිරීමේ උපකරණය ස්ථාපනය කිරීම සඳහා ගෙවා ඇති රු. 6,211,035 ක්, ලක්විජය විදුලි බලාගාරයේහි ප්‍රාග්ධන කෙරගෙන යන වැඩ ගිණුමේ චලනය නොවන අයිතම වේ.

සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අරමුදල්වල මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර අරමුදල් වැඩි කරන ලෙස ඉල්ලීමක් කර ඇත. පවතින තත්ත්වය හේතුවෙන් අතිරේක අරමුදල් අනුමත කර නොමැත.

(ක) **2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. බිලියන 62.95 ක් වූ වේලිවල (dams) අයිතිය මණ්ඩලය විසින් පවරාගෙන නොතිබුණි.**

| පිරිවැය මධ්‍යස්ථානය | බලාගාරය | වත්කම් වටිනාකම රු. |
|---|---|---|
| 831.00 | වික්ටෝරියා විදුලි බලාගාරය | 14,412,751,075.25 |
| 832.00 | කොත්මලේ විදුලි බලාගාරය | 22,087,081,294.30 |
| 833.00 | උකුවෙල විදුලි බලාගාරය | 2,581,412,890.05 |
| 834.00 | බෝවතැන්න විදුලි බලාගාරය | 1,968,826,674.74 |
| 835.00 & 836.00 | රන්දෙණිගල සහ රන්ටැඹේ විදුලි බලාගාර | 21,901,386,018.15 |
| | **එකතුව** | **62,951,457,952.49** |

ඉහත සඳහන් බලාගාරවලට අදාළ සියලුම වේලි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම එහි පනත මඟින් සිදු කරයි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ජලාශවලදී විදුලිය ලබා ගැනීම දක්වා වූ ජල මාර්ග පමණක් අත්පත් කරගෙන ඇති අතර ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අදාළ බලාගාර මඟින් සිදු කරයි.

(ග) **2021 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 28.79 ක් වූ පරිභෝජනයට ගත හැකි මුළු තොගයෙන් සියයට 8.5 ක් නියෝජනය වන රු. බිලියන 2.46 ක තොග සෙමින් චලනය වන, චලනය නොවන සහ පළුදු වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. ඒ අනුව, එවැනි වර්ගයේ පරිභෝජනයට ගත හැකි තොග පවත්වාගෙන යාමෙන් තොග හානිවලට, රඳවා ගැනීමේ පිරිවැය වැඩි වීමට සහ වංචාවන් සඳහා ඉඩකඩ නිර්මාණය වීමට හේතු විය හැකිය.**

| අංශය | චලනය නොවන, සෙමින් චලනය වන, පළුදු වූ සහ යල් පැන ගිය තොග සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග |
|---|---|
| ජනන | අවශ්‍යතාවය අනුව ඉතා කලාතුරකින් භාවිතා වන බැවින් ලක්විජය බලාගාරයෙහි සමහර පරිභෝජනය කළ හැකි තොග සෙමෙන් චලනය වේ. මහවැලි සංකීර්ණයේ සහ තාප සංකීර්ණයේ පළුදු වූ සහ යල් පැන ගිය තොග නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇති අතර ලක්ෂපාන සංකීර්ණයේ යල් පැන ගිය සහ පළුදු වූ අයිතම අපහරණය කිරීම සඳහා 2021/10/13 දින සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. පත් කරන ලද කමිටුවක නිර්දේශය ඇතිව, යල් පැන ගිය සහ චලනය නොවන අයිතමවලින් හඳුනාගත් සමහර අයිතම අපහරණය කිරීමට නි.ස (ජනන) වෙතින් දැනටමත් අනුමැතිය ලබාගෙන ඇත. වසර අවසන් වීමට පෙර සමනල සංකීර්ණයේ ශේෂය නිරවුල් කරනු ඇත. |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

| අංශය | චලනය නොවන, සෙමින් චලනය වන, පළුදු වූ සහ යල් පැන ගිය තොග සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග |
|---|---|
| වත්කම් කළමනාකරණ | චලනය නොවන, සෙමින් චලනය වන, යල් පැන ගිය සහ පළුදු වූ තොග වර්ග 3ක් (අයිතම අංක 1ඃ විදුලි බලාගාර ඒකකය, අයිතම අංක 2ඃ වායු සමීකරණ සහ ශීතකරණ ඒකකය සහ අයිතම අංක 3ඃ සෝපාන ඒකකය) ඇත. හදිසි අවස්ථාවන් සඳහා ගබඩා කිරීමට අවශ්‍ය වන සහ සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුව පහසුවෙන් සහ කාලීනව ප්‍රසම්පාදනය කළ නොහැකි ජනක නඩත්තුව සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් අයිතම, අයිතම අංක 1 හි චලනය නොවන සහ සෙමින් චලනය වන තොග නියෝජනය කරයි. පළුදු වූ සහ යල්පැන ගිය තොග වටිනාකම්වලින් අපහරණය කළ යුතු අයිතම නියෝජනය වන අතර අපහරණය කිරීමට කටයුතු කරනු ඇත. හදිසි අවස්ථා සඳහා ගබඩා කිරීමට අවශ්‍ය වන සහ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ පහසුවෙන් සහ කාලීනව ප්‍රසම්පාදනය කළ නොහැකි, චිලර්, AHU, පැකේජ්, සිසිල් කාමර සහ මෘත්‍යාගාර සිසිලන නඩත්තු සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් අයිතම, අයිතම අංක 2 හි චලනය නොවන තොග නියෝජනය කරයි. හදිසි අවස්ථා සඳහා ගබඩා කිරීමට අවශ්‍ය වන සහ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ පහසුවෙන් සහ කාලීනව ප්‍රසම්පාදනය කළ නොහැකි සෝපාන නඩත්තුව සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් අයිතම, අයිතම අංක 3 හි චලනය නොවන සහ සෙමින් චලනය වන තොග නියෝජනය කරයි. පළුදු වූ සහ යල් පැන ගිය තොග වටිනාකම්වලින් අපහරණය කළ යුතු අයිතම නියෝජනය වන අතර අපහරණය කිරීමට කටයුතු කරනු ඇත. |
| බෙදාහැරීමේ අංශය 01 | 2021-12-31 වන විට බෙදාහැරීමේ අංශය 1 හි ගිණුම්වල චලනය නොවන, සෙමින් චලනය වන සහ යල් පැන ගිය මුළු තොග අයිතම වටිනාකම රු. මිලියන 824.14 කි. මෙයට රු. මිලියන 30.28 ක් වන ප්‍රධාන අමතර කොටස් ඇතුළත් වේ. තොග මට්ටම අවම කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගෙන ඇත. වර්තමානයේදී ද්‍රව්‍ය හිඟය හේතුවෙන්, සුදුසු සෑම විටම කාර්යයන් සඳහා සෙමින් චලනය වන අයිතම නිකුත් කර ඇත. |
| බෙදාහැරීමේ අංශය 02 | නැගෙනහිර පළාතේ 2021 වාර්ෂික සත්‍යාපනයේන් පසුව, රු. මිලියන 26.85 ක් වටිනා යල් පැන ගිය සහ පළුදු වූ තොග ගබඩාවලින් ඉවත් කිරීම සඳහා 2022 මාර්තු 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. |
| බෙදාහැරීමේ අංශය 03 | සබරගමුව පළාතේහි රු. 6,167,272.83 ක් වටිනා පළුදු වූ තොග අයිතම් (අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.) 2022 කාලය තුළදී අලෙවි කර ඇත. |
| බෙදාහැරීමේ අංශය 04 | වාර්ෂික සත්‍යාපන ක්‍රියාවලියට සමගාමීව, යල් පැන ගිය/ නිෂ්ක්‍රීය අයිතම හඳුනාගෙන නිර්දේශ කිරීමට භාණ්ඩ සත්‍යාපන/ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. පළුදු වූ සහ භාවිතයට ගත නොහැකි තොග අයිතම අතුරින් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් රු. 3,081,087.50 කට විකිණිය හැකි තොග සහ රු. 683,669.00 ක තොග අයිතම විනාශ කර අපහරණය කළ යුතු බව හඳුනාගෙන ඇත. නිරීක්ෂණ මත පදනම්ව යල් පැන ගිය, නිෂ්ක්‍රීය සහ පළුදු වූ තොග ගිණුම්වලින් කපා හැරීමට සහ සමාන්‍යාධිකාරී චක්‍රලේඛ අංක 2021/GM/39/FM අනුව එම අයිතම විකිණීමට හෝ අපහරණය කිරීමට අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2022 මාර්තු 15 වන දින ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා විගණන කමිටුවේ සමාලෝචන අදියරේ ඇත. එබැවින්, තොග සොරකම් කිරීමේ සහ වැරදි කළමනාකරණයේ අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>2021.09.07 දිනැති අංක. 2021/GM/39/FM දරන සමාන්‍යාධිකාරී චක්‍රලේඛය අනුව, දකුණු පළාත 1 හි සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවට අනුකූලව අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සැකසෙමින් පවතී. දකුණු පළාත 2 හි සෙමින් චලනය වන, චලනය නොවන සහ පළුදු වූ තොග අයිතම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා පිළියෙල කළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා විගණන කමිටුවේ සමාලෝචන අදියරේ ඇත. |

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු (ඉතිරිය...)

(ච) **කුඩා ජලවිදුලි බලාගාර සඳහා මිල නියම කිරීම තථ්‍ය පිරිවැය මත කළ යුතුව තිබුණද වළකාලන ලද පිරිවැය ක්‍රමය (avoided cost method) මත ඇතැම් කුඩා ජල විදුලි බලාගාර සඳහා මිල තීරණය කර තිබුණු අතර මෙම ක්‍රමය කුඩා ජල විදුලි බලාගාරයක තථ්‍ය පිරිවැයට කිසිදු සම්බන්ධයක් නොමැත. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. අංක DGM/SYC/TCH/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව ජල විදුලි බලාගාරයක සාමාන්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2021 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 19.11 ක් සහ වියළි කාලය සඳහා රු. 20.59 ක් විය. තවද, සංඛ්‍යාලේඛන වාර්තා අනුව, 2020 දී මණ්ඩලයේ ජල විදුලි බලාගාරයක ඒකකයක පිරිවැය රු.2.49 ක් විය.**

නැගී එන ක්ෂේත්‍රයක් වන NCRE විදුලි බලාගාර සංවර්ධනය සඳහා ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා ආරම්භයේ දී වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. පසුව, මෙම ක්‍රමයේ අඩුපාඩු හඳුනාගෙන 2008 වර්ෂයේදී ''පිරිවැය පරාවර්තක, තාක්ෂණික විශේෂිත තිත්ව ස්ථර ගාස්තු'' ක්‍රමය ලෙස හඳුනාගත් නව ගාස්තු ක්‍රමයක් හඳුන්වා දී ඇත. වෙළෙඳපොළ බලවේග විසින් ගාස්තු තීරණය කරන තරඟකාරී ලංසු ක්‍රමයකට මෙම ක්‍රමයද පසුව වෙනස් විය.

(ට) **2020 ජූනි 01 දින සිට ආරම්භ කරන ලද මණ්ඩලයට අයත් ඉඩම් හඳුනාගැනීම, මැනීම සහ තක්සේරු කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි, එනම් මැනීම සියයට 34 ක් සහ තක්සේරු කිරීම සියයට 0.4 ක් පමණ විය.**

2022-05-31 වන විට ලංවිම ඉඩම් මැනීමේ සහ තක්සේරු කිරීමේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත. ඉඩම් මැනීමේ සහ තක්සේරු කිරීමේ වත්මන් ප්‍රගතිය පිළිවෙලින් සියයට 70 ක් සහ සියයට 16 ක් වේ. වර්තමානයේදී ලංවිම ඉඩම් 88 ක තක්සේරුව සිදුවෙමින් පවතී. පහත සඳහන් හේතූන් මත ජනන අංශයට අයත් ඉඩම් තක්සේරු කිරීම ප්‍රමාද වේ.

1. අනවසර අත්කර ගැනීම් හේතුවෙන් මායිම් නැවත විවෘත කිරීම සහ තක්සේරු කිරීමේ ගැටළු.
2. ජලාශය ඇතුළත ඉඩම් තක්සේරු කිරීම නිසා ඇතිවන ගැටළු.
3. Covid-19 වසංගත කාලය තුළ රජයේ නිලධාරීන් සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ දුෂ්කරතා

**ලංවිම ඉඩම්වල සාරාංශය**

ලංවිම ඉඩම් හඳුනාගැනීම, මැනීම සහ තක්සේරු කිරීම (2022.05.31 දක්වා ලැබී ඇති) ඇතුළත් ප්‍රධාන ඉඩම්වල සාරාංශය (ඉඩම් ප්‍රමාණය පර්චස් 5 ට වඩා වැඩි)

| අංශය | හඳුනාගත් ඉඩම් සංඛ්‍යාව | මැනුම් සැලසුම් සහිත ඉඩම් ගණන | ලද තක්සේරු වාර්තා ගණන | මුළු තක්සේරු මුදල |
|---|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය 01 | 206 | 176 | 153 | 7,276,141,300.00 |
| බෙදාහැරීමේ අංශය 02 | 398 | 346 | 275 | 4,701,083,600.00 |
| බෙදාහැරීමේ අංශය 03 | 128 | 124 | 107 | 2,172,974,000.00 |
| බෙදාහැරීමේ අංශය 04 | 161 | 151 | 127 | 3,324,137,400.00 |
| වත්කම් කළමණාකාරන අංශය | 5 | 5 | 5 | 5,366,450,000.00 |
| සම්ප්‍රේෂණ අංශය | 123 | 107 | 62 | 5,758,928,500.00 |
| ජනන අංශය | 3086 | 2259 | 8 | 688,700,000.00 |
| 2022.05.31 දිනට එකතුව | 4107 | 3168 | 737 | 29,288,414,800.00 |
| උපකල්පනය කළ මුළු ඉඩම් සංඛ්‍යාව | 4500 | 4500 | 4500 | - |
| 2022.05.31 දිනට ප්‍රගතිය | 91% | 70% | 16% | - |

(ඩ) **ලක්විජය විදුලි බලාගාරයේ ඇතැම් තොග, ගිණුම් පොත්වල සටහන් කර නොතිබූ අතර, එම තොගය සෑම වසරකම අවසානයේ සත්‍යාපනය කර නොතිබුණි.**

අදාල අමතර කොටස්වල කොටස් අංක විස්තර නොමැතිව ලක්විජය බලාගාරයේ I අදියර යටතේ වන ඇතැම් අමතර කොටස් ලංවිමට නොමිලේ ලබා දී ඇත. එය සමූහයක් ලෙස ලැබී ඇත. බොහෝමයක් දෑ ව්‍යාපෘති ඉදිකිරීම්වල ඉතිරි වූ ඒවා වේ. මෙම අමතර කොටස් සඳහා කේත අංක නිකුත් කිරීමේ ක්‍රියාවලියේ පවතින අතර ඒ අනුව ගිණුම්වල සටහන් වනු ඇත.

(ත) **ලක්විජය බලාගාරයේ ඉන්ධන ලැබීම් සහ පරිභෝජනය පිළිබඳ වාර්තා 2021 දෙසැම්බර් 04 සිට 2022 ජනවාරි 11 දක්වා තොග පොත්වල යාවත්කාලීන කර නොතිබුණි. 2021 දෙසැම්බර් 04 සිට 2022 ජනවාරි 11 දක්වා කාලය තුළ** මාසික සාමාන්‍ය ඉන්ධන ලැබීම් සහ පරිභෝජනය පිළිවෙලින් ලීටර 442,200 ක් සහ ලීටර 725,521 ක් විය.

ආරම්භ කිරීම, වසා දැමීම සහ අතිරේක බොයිලේරු පරීක්ෂා කිරීම සඳහා භාවිතා කරන ඩීසල් සඳහා ද්‍රව්‍ය ඉල්ලීම් සෑම මාසයකම අවසානයේදී නිකුත් කරයි. තොග පොත්වලට ඇතුළත් කිරීමට පෙර එක් එක් මාසය අවසානයේදී ගණකාධිකාරී ලෙජර වාර්තා සමඟ ඩීසල් ලැබීම් සහ පරිභෝජනය තොග භාරකරු විසින් නැවත පරීක්ෂා කර ඇත. ඩීසල් ලැබීම් සහ පරිභෝජනය පිළිබඳ සියලූ විස්තර ඉහත සඳහන් කාර්යයන් අවසන් කිරීමත් සමඟ එක් එක් මාසය අවසානයේ තොග පොත්වල සටහන් කර ඇත.

(ද) **වාලච්චේන කඩදාසි සංස්ථාවට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු. 361,992,685 ක අධිභාර සහ පොලී කපා හැරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.**

රු. 361,992,685.22 ක් මුදලක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර ඉතිරි මුදල නැවත ආරම්භ කළ දින සිට වසර දෙකකට පසු මාස හයක කාලයක් තුළ වාරික පදනම මත අයකර ගත යුතුය. කෙසේ වෙතත්, මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඉදිරියට ගෙන යාම සඳහා වාලච්චේන කඩදාසි සමාගම සහ ලංවිම අතර මෙම ගිවිසුම තවමත් අත්සන් කර නොමැත.

**Nalinda Ilangakoon RWP RSP**
Chairman
Ceylon Electricity Board

**Eng. (Dr. D.C.R. Abeysekera**
Actg. General Manager
Ceylon Electricity Board

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ABC | - | සමස්ත පදනම් මග |
| ADB | - | ආසියානු සංවර්ධන බැංකුව |
| AFM | - | අතිරේක මුදල් කළමනාකරු |
| AGC | - | ස්වයංක්‍රීය ජනන පාලනය |
| AGM | - | අතිරේක සාමාන්‍යාධිකාරී |
| APH | - | වායු පෙර තාපකය |
| ATS | - | ස්වයංක්‍රීය මාරු ස්විචය |
| B&OS | - | ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය |
| BFP | - | බොයිලේරු පෝෂක ජල පොම්පය |
| BOD | - | ජෛවරසායන ඔක්සිජන් ඉල්ලුම |
| BSC | - | කැඩුම් ස්විච ධාරිත්‍රකය |
| BST | - | තොග සැපයුම් අය ක්‍රමය |
| CCPP-GT | - | සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය-වායු ටර්බයින |
| CCPP-ST | - | සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය-වාෂ්ප ටර්බයින |
| CDM | - | ඉදිකිරීම් සැලසුම් හා කළමනාකරණ |
| CEA Act. | - | මධ්‍යම පරිසර අධිකාරි පනත |
| CEB | - | ලංකා විදුලිබල මණ්ඩලය |
| CEPSI | - | විදුලිබල සැපයුම් කර්මාන්ත සමුළුව |
| CMEC | - | China Machinery Engineering Corporation |
| CMMS | - | පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතිය |
| CNEEC | - | China National Electric Equipment Corporation |
| CO | - | කාබන් මොනොක්සයිඩ් |
| COD | - | රසායනික ඔක්සිජන් ඉල්ලුම |
| COSEM | - | බලශක්ති මනුකරණය සඳහා වූ සහායක පිරිවිතරය |
| CPC | - | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව |
| CPD | - | අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය |
| CRH | - | ශීත ප්‍රතිතාපකය |
| CS&RA | - | ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු |
| CSC | - | පාරිභෝගික සේවා මධ්‍යස්ථානය |
| CSR | - | ආයතනික සමාජ වගකීම |
| CT | - | ධාරා තරාපැවිය |
| CW | - | සිසිලන ජලය |
| CW&B | - | සිවිල් වැඩ හා ගොඩනැගිලි |
| DD1 | - | බෙදාහැරීමේ අංශය 1 |
| DD2 | - | බෙදාහැරීමේ අංශය 2 |
| DD3 | - | බෙදාහැරීමේ අංශය 3 |
| DD4 | - | බෙදාහැරීමේ අංශය 4 |
| DGM | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| DLMS | - | උපකරණ භාෂා පණිවිඩ පිරිවිතර |
| DSM | - | ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය |
| EMS | - | බලශක්ති කළමනාකරණ පද්ධතිය |
| EMU | - | පරිසර නිරීක්ෂණ ඒකකය |
| EPF | - | සේවක අර්ථසාධක අරමුදල |
| EPL | - | පරිසර ආරක්ෂණ බලපත්‍රය |
| ERD | - | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| ERP | - | ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණය |
| ESP | - | ස්ථිති විද්‍යුත් අවක්ෂේපකරය |
| EV | - | විදුලි වාහනය |
| FAT | - | කර්මාන්තශාලා පිළිගැනුම් පරීක්ෂණය |
| FD | - | බලකළ කෙටුම්පත |
| FGD | - | දුමාර වායු ගෙන්දගම්භරණය |
| FS&PD | - | ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන |
| FSUR | - | පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය |
| GPD & EEIPP | - | හතර විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය |
| GPS | - | ගෝලීය ස්ථානගතකරණ පද්ධතිය |
| GGH | - | වායුවලින් වායුවලට තාපකය |
| GIS | - | වායු පිරිවෘත වහරුපන්න |
| GOSL | - | ශ්‍රී ලංකා රජය |
| GSS | - | ජාල උපපොළ |
| GT | - | වායු තලබමනය |
| HES | - | Head End System |
| HP | - | අධි පීඩනය |
| HR | - | මානව සම්පත |
| ICBC | - | චීන කර්මාන්ත හා වාණිජ බැංකුව |
| ICT | - | පරිගණක තොරතුරු තාක්ෂණය |
| ICTA | - | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණායතනය |
| ID | - | ප්‍රේරිත කෙටුම්පත |
| IESL | - | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය |
| IP | - | අන්තර්ජාල ප්‍රොටෝකෝල |
| IPP | - | ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් |
| IT | - | තොරතුරු තාක්ෂණය |
| ITI | - | කාර්මික තාක්ෂණායතනය |

# කෙටි යෙදුම් (ඉතිරිය...)

| | | |
|---|---|---|
| KCCPS | - | කැළණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය |
| KPI | - | ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
| KPS | - | කැළණිතිස්ස විදුලි බලාගාරය |
| LCLTGEP | - | අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම |
| LECO | - | ලංකා විදුලි (පෞද්ගලික) සමාගම |
| LED | - | ආලෝක විමෝචන දියෝඩ |
| LKR | - | ශ්‍රී ලංකා රුපියල් |
| LOI | - | අභිප්‍රාය ලිපිය |
| LNG | - | ද්‍රව ස්වභාවික වායු |
| LP | - | අඩු පීඩනය |
| LTGEP | - | දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම |
| LTTDP | - | දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම |
| LTL | - | ලංකා ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ් |
| LV | - | අඩු වෝල්ටීයතාව |
| LVPP | - | ලක්විජය විදුලි බලාගාරය |
| MASL | - | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| MDMS | - | මනු දත්ත කළමනාකරණ පද්ධතිය |
| MEPA | - | සාගර පරිසර ආරක්ෂණ අධිකාරිය |
| MHPP | - | මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය |
| MITFIN | - | ලං.වි.ම. මූල්‍ය මොඩියුලය |
| MLKR | - | ශ්‍රී ලංකා රුපියල් මිලියන |
| MLTS | - | මධ්‍යම මට්ටමේ තාක්ෂණික කාර්ය මණ්ඩලය |
| MMT | - | මෙට්‍රික් ටොන් මිලියන |
| MOI | - | වාරිමාර්ග අමාත්‍යාංශය |
| MOIWM | - | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය |
| MOV | - | මෝටරයෙන් ක්‍රියාත්මක වෑල්වය |
| MT | - | ප්‍රධාන තරාපැවිය |
| MV | - | මැදි වෝල්ටීයතා |
| MVA | - | මෙගා වෝල්ට් ඇම්පියර් |
| NARA | - | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය |
| NBQSA | - | ජාතික ඉහළම ගුණාත්මකභාවයට අදාළ මෘදුකාංග සම්මානය |
| NCP | - | උතුරු මැද පළාත |
| NCRE | - | සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය |
| NFC | - | ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදනය |
| NGO | - | රාජ්‍ය නොවන සංවිධානය |
| NOX | - | නයිට්‍රජන් ඔක්සයිඩ් |
| NRV | - | ආපසු නොයන කපාටය |
| NSCC | - | ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය |
| NSDI | - | ජාතික අවකාශ දත්ත යටිතල පහසුකම් |
| NVQ | - | ජාතික වෘත්තීය සුදුසුකම |
| NWP | - | වයඹ පළාත |
| OCCW | - | විවෘත චක්‍ර සිසිලන ජලය |
| ORE | - | සෙසු පුනර්ජනනීය බලශක්තිය |
| PA | - | ප්‍රාථමික වාතය |
| PD | - | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PDC | - | විදුලිය බෙදාහැරීමේ මධ්‍යස්ථානය |
| PEA –NWP | - | පළාත් පරිසර අධිකාරිය - වයඹ පළාත |
| PIV | - | ගෙවුම් වවුචරය |
| PM | - | අංශුමය ද්‍රව්‍ය |
| PMU | - | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| POS | - | අලෙවි මධ්‍යස්ථානය |
| PPA | - | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| PPP | - | රාජ්‍ය පෞද්ගලිකත්ව හවුල්කාරිත්වය |
| PS | - | විදුලි බලාගාරය |
| PSHPP | - | පොම්පගත ගබඩාකරණ ජල විදුලි බලාගාරය |
| PSS/E | - | Power System Simulator for Engineers |
| PUCSL | - | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| PV | - | ප්‍රකාශ වෝල්ටීයතාවය |
| RADAR | - | රේඩා |
| PFP | - | යෝජනාව සඳහා ඉල්ලීම |
| R&D | - | පර්යේෂණ හා සංවර්ධන |
| RCL | - | ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
| RH | - | ප්‍රතිතාපකය |
| SAIDI | - | පද්ධති සාමාන්‍ය බිඳවැටුම් කාල සීමා දර්ශකය |
| SAIFI | - | පද්ධති සාමාන්‍ය බිඳවැටුම් සංඛ්‍යාත දර්ශකය |
| SCADA | - | අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් |
| SCC | - | පද්ධති පාලන මධ්‍යස්ථානය |
| SCU | - | ක්‍රමෝපාය සන්නිවේදන ඒකකය |
| SDDP | - | ආනුමානික ද්විත්ව ගතික වැඩසටහන්කරණය |

# කෙටි යෙදුම් (ඉතිරිය...)

| | | |
|---|---|---|
| SEA Act. | - | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත |
| SESRIP | - | විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට සහාය ලබාදීමේ ව්‍යාපෘතිය |
| SH | - | අධිතාපකය |
| SLE Act. | - | ශ්‍රී ලංකා විදුලිබල පනත |
| SMS | - | කෙටි පණිවිඩ සේවය |
| $SO_X$ | - | සල්ෆර් ඔක්සයිඩ් |
| SPPA | - | ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් |
| SSM | - | සැපයුම් පාර්ශ්ව කළමනාකරණය |
| SST | - | සුදානමින් සිටින ස්ථාන තරාපැවිය |
| SVS | - | ස්ථිතික වාර පද්ධතිය |
| T&D | - | සම්ප්‍රේෂණය හා බෙදාහැරීම |
| TDS | - | සමස්ත ද්‍රාවිත ඝණ ද්‍රව්‍ය |
| TEC | - | තාක්ෂණික ඇගයුම් කමිටුව |
| TL | - | සම්ප්‍රේෂණ මාර්ගය |
| TSS | - | සමස්ත අවලම්බිත ඝණ ද්‍රව්‍ය |
| UAT | - | ඒකක උපකාරක තරාපැවිය |
| UFLS | - | අඩු සංඛ්‍යාත භාර වැගිරීම |
| UG | - | භූගත |
| UNT | - | ඒකාරූපී ජාතික අයක්‍රමය |
| UOMDP | - | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| USD | - | එක්සත් ජනපද ඩොලර් |
| UTS | - | ඒකක තලබමර සේවය |
| VAT | - | එකතු කළ අගය මත බද්ද |
| WPN | - | බස්නාහිර පළාත උතුර |
| WPS | - | බස්නාහිර පළාත දකුණ |
| WRB | - | ජල සම්පත් මණ්ඩලය |
| XLPE | - | Cross Link Polyethlene Cable |

**www.ceb.lk**

*50, Sir Chittampalam A Gardiner Mawatha, Colombo*